ධර්ම දානය පිණිසයි

සබ්බ දානං ධම්ම දානං ජිනාති
(ධර්ම දානය සියලු දානමැ දිනයි)

# වෙසක් සිරිසර

**අනූ වැනි කලාපය**

ප්‍රකාශනය

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**

මුද්‍රණය

**........මුද්‍රණාලය**

ශ්‍රී බු.ව. 2569

ක්‍රි.ව. 2025

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
අංක 115, විජේරාම මාවත, කොළඹ 07
දු.ක. අංකය 0113054800

# කවරයේ කතාව

ඇෆ්ගනිස්ථාන් රාජ්‍යයේ, බාමියන් නිම්නයේ නෙළා තිබුණු ප්‍රධාන බුද්ධ ප්‍රතිමා වහන්සේලා දෙනමකි. එය පිහිටි ගලක නෙලන ලද ලොව අති දැවැන්තම බුද්ධ ප්‍රතිමාවන් ලෙස හඳුන්වා ඇත. ක්‍රිස්තු වර්ෂ 6 වන සියවසේදී පමණ නිමවන්නට ඇතැයි අනුමාන කෙරෙන මෙම බුද්ධ ප්‍රතිමා වහන්සේලා එම ස්ථානයේ නිර්මාණය කරන්නට ඇත්තේ පුරාණයේ ඉතා සශ්‍රීක වෙළඳ මාර්ග යක් එම ස්ථානයෙන් වැටී තිබුනු හෙයින් යැයි පුරා විද්‍යාඥයන්ගේ මතයයි. විවිධ රටවල්වලින් වෙළඳාම් පිණිස එහා මෙහා යන පිරිස් මෙම ස්ථානය පසුකරන හෙයින්, ලොවට විමුක්ති මාර්ගය කියාදුන් ශාස්තෘන් වහන්සේගේ දර්ශනය ප්‍රචලිත කිරීම වස් එකල නිර්මාණකරුවන් විසින් මෙම යෝධ බුද්ධ ප්‍රතිමා වහන්සේලා බාමියන් නිම්නයේ ඉදිකරන ලද බව පිළිගත් මතයයි. මෙම ප්‍රතිමා වහන්සේලා, ලොව ඓතිහාසික සංස්කෘතික වැදගත්කමක් යුතු වගේම සම්බුද්ධ දර්ශනයේ එකල තිබුණු පොහොසත් භාවය පිළිබිඹු කළ දැවැන්ත ප්‍රතිරූපයක්ද විය.

බාමියන් නිම්නයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවන් දෙකකි. එකක් මීටර් 55 ක් උස් වූ අතර, අනෙක මීටර් 38 ක් උසින් යුතු විය. මෙම ප්‍රතිමාවන් එකල ජනයාගේ ගෞරවයට පාත්‍රවිය. ලොව පුරා වන්දනාකරුවෝ අධ්‍යාත්මික ඥානාලෝකය උදෙසා බාමියන් වෙත ගමන් කළහ. මෙම බුද්ධ ප්‍රතිමා ඇෆ්ගනිස්ථානයේ නිධානයන් පමණක් නොව, ග්‍රීක හා බෞද්ධ බලපෑම්වල සම් මිශ්‍රණය පෙන්නුම් කරන මානව උරුමයේ කොටසක් ද විය. පිළිමවලට අමතරව පිළිම බිත්තියේ බුද්ධ චරිතයේ විවිධ අවස්ථාවන් පින්තාරු කර තිබුණි. දැවැන්ත ප්‍රතිමා ද්විත්වයට අමතරව, කඳු බෑවුමේ කැටයම් කර ඇති කුඩා හිඳි බුදු පිළිම වහන්සේලාද රාශියක් තිබුණි. 2008 දී පුරා විද්‍යාඥයෝ එම කඳු පාමුල මීටර් 19 (අඩි 62) ක් පමණ දිග, පොළොවේ ගිලීගොස් ඇති සැතපෙන බුද්ධ ප්‍රතිමාවක්ද තිබෙන බවට තොරතුරු වාර්තා කළහ.

කලක් ගතවන විට ඇෆ්ගනිස්ථාන් අවට ඉස්ලාමීය රාජ්‍යයන් ව්‍යාප්ත වුණු අතර, ඒවායේ බලපෑම් බාමියන් වෙතද එල්ලවිය. ක්‍රි.ව. 1221 පමණ වනවිට ජින්ජිස් ඛාන් විසින් බාමියන් ආක්‍රමණයන් සිදුවිය. ප්‍රදේශයේ ජනතාව සාහසික

ලෙස ඝාතනයට ලක්විය. ජාන පරීක්ෂණ මගින් තහවුරු වන්නේ දැන් බාමියන්හි ජීවත් වන හසාරා ජනතාව මොංගෝලියානුවන්ගෙන් පැවත එන්නන් බවයි. විවිධ ඉස්ලාමීය නායකයන්ගේ ආක්‍රමණවලට බාමියන් පිළිම වහන්සේලා ඉන් අනතුරුවද නතුවිය. පිළිම වහන්සේලා කඩතොළු වීම එලෙස ආරම්භ විය. ප්‍රදේශයේ බොහෝ මුස්ලිම් පාලකයෝ සහ සංචාරකයෝ ප්‍රතිමා ගැන පුදුමය පලකිරීමක් හෝ ඒවා ගැන එතරම් තැකීමක් නොකළහ. නිදසුනක් වශයෙන්, මෝගල් අධිරාජ්‍යයේ නිර්මාතෘ බාබර් 1506-7 දී බාමියන් නිම්නය හරහා ගමන් කළ නමුත් ඔහුගේ දිනපොතේ බාමියන් ප්‍රතිමා ගැන සඳහන් කළේවත් නැත. පසුකාලීන මෝගල් අධිරාජ්‍යයා වූ ඖරංසෙබ් (ක්‍රි.ව. 1658-1707) කාලතුවක්කු භාවිතා කරමින් බුදුවරුන් විනාශ කිරීමට උත්සාහ කළ බවද වාර්තා වේ. ඔහු ප්‍රසිද්ධ ලෙස ගතානුගතික වූ අතර, ඔහුගේ පාලන සමයේදී සංගීතය පවා තහනම් කර තිබුණි.

2001 වසරේ දී තලේබාන් සංවිධානයේ නායක මුල්ලා මොහොමඩ් ඕමාර් විසින්, ඓතිහාසික වටිනාකමකින් යුතු අන්‍යාගමික සිද්ධස්ථාන සහ පිළිමයන් විනාශ කර දමන ලෙස තම සංවිධානයට අණ කරනු ලැබීය. බාමියන් පිළිම විනාශ නොකරන ලෙස ලොවපුරා රටවල් බොහෝ වතාවක් තලේබාන් සංවිධානයෙන් ඉල්ලීම් කළ අතර, අවස්ථාවක් ලබා දෙනවා නම් ඒවා ඉවත් කරගෙන ආරක්ෂිත ස්ථානයක සවි කිරීමට තම රට සූදානම් බවද ඉන්දියාව දැන්වීය. විනාශ කිරීමෙන් වැළක්වීම සඳහා වන්දි මුදලක් අවශ්‍ය නම් එය ගෙවීමට සිය රජය සූදානම් බවද ජපානය ප්‍රකාශ කළේය. මෙම විනාශයට බලවත් විරෝධය එල්ල කළ පිරිස අතරේ ලෝකයේ අරාබි රටවල් ද විය. තලේබාන් සංවිධානය මෙම පිළිම විනාශ කිරීම මගින් ඉස්ලාම් ධර්මයට අත්කර දෙන්නේ නිගාවක් බව ඔවුහු දැන්වූහ. නමුත් මෙම එක් විරෝධතාවයක් වෙත වත් තලේබාන් ත්‍රස්තයෝ සිය සැලකිල්ල යොමු නොකළහ.

2001 මාර්තු 2 වන දින සිට අප්‍රේල් දක්වා කාලය තුළ තලේබාන් සටන්කාමීන් විසින් ඩයිනමයිට්, කාලතුවක්කු, රොකට් සහ ගුවන් යානා නාශක තුවක්කු භාවිතා කරමින් බාමියන් බුදු පිළිම විනාශ කරන ලදී. ඉස්ලාමීය සිරිත පිළිම ප්‍රදර්ශනයට විරුද්ධ වුවද, මුස්ලිම් පාලනය යටතේ වසර 1,000 කට වැඩි කාලයක් පැවති මෙම ප්‍රතිමා සහමුලින්ම බිම හෙළීමට තලේබාන්වරු තෝරා ගෙන තිබුණි. බුදු පිළිම විනාශ කිරීම පිළිබඳව විදේශීය වාර්තාකරුවන් මුල්ලා ඕමාර්ගෙන් ප්‍රශ්න කළ විට, මුල්ලා ඕමාර් පැවසුවේ, ''මම පිළිම කඩා දමන්නෙක්, ඒවා විකුණන්නෙක් නොවේ.'' යන්නයි.

පිටකවරය නිර්මාණය සහ කවරයේ කතාව

**චාරුක කුමාරපේලි**

# ඇතුළාන්තය


කවරයේ කතාව 5

ඇතුළාන්තය 7

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සභාපතිතුමාගේ පණිවිඩය 9

01. වෙසක් සිරිසර සඟරාව 15

02. රාජ්‍ය සේවා බෞද්ධ සංගමය 32

03. බොජ්ඣංග ධර්ම හැදෑරීමට පෙරවදනක් 65

*ශාසන වංශාභිධජ, සද්ධම්මජෝතික, දර්ශන විශාරද, අග්ගමහා පණ්ඩිත, අතිපූජ්‍ය මකුලෑවේ විමලාභිධාන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මහා ස්ථවිර*

04. ථෙරවාදී මූලාශ්‍රවල දැක්වෙන බුද්ධ චරිතයේ විශේෂතා 71

*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික) උතුරාවල ධම්මරතන ස්ථවිර*

05. පුට්ඨස්ස ලෝකධම්මේහි චිත්තං යස්ස නකම්පති 89

*ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය පුවක්පිටියේ ප්‍රඥාරත්න නායක හිමි*

06. සිතීමේ හා විමසීමේ නිදහස 93

*පූජ්‍ය උඩුරුගමුවේ අස්සජී හිමි*

07. අවබෝධයෙන් කෙසේ පින්කම් කළ යුතු ද? 98

*ත්‍රිපිටකාචාර්ය, අභිධර්ම විශාරද, ධර්මකීර්ති ශ්‍රී, පූජ්‍යපාද දිගන සුගතවංස ස්ථවිර*

08. ඵල දරන ශ්‍රාවකත්වය උදෙසා 102

*පූජ්‍ය අඟුණකොළපැලැස්සේ සුධීරානන්ද හිමි*

09. මල වගේ ලස්සන වෙන්න පමා නොවී යමු පෙරටම 109

*ගා/ ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන් පරිවේණාධිපති ශාස්ත්‍රපති, ප්‍රවීණාචාර්ය*

*පූජ්‍ය ලත්පඳුරේ ඉන්දරතන හිමි*

10. විදර්ශනා මාර්ගය 113

*ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි*

11. මාගම යටාලතිස් වෙහෙරේ වැඩ සිටින දළදා වහන්සේ 123

*ආචාර්ය ගාමිණී කාරියවසම්*

12. බුදුහිමි මව්පිය ගුණ පෙන්වත් 129

*ආචාර්ය සිරිපාල මාදුවගේ*

13. මනුලොව උසින්ම වැඩ සිටිනා සධාතුක කරඬු වහන්සේ වඩම්මවන කැළණි ශ්‍රී පාද පෙරහැර 138

*ශාස්ත්‍රපති චසිත නුවන්තික බුලත්සිංහල*

14. බුදුදහම සැබැවින්ම සමාජ හිතකාමී දහමකි 143

*ශාස්ත්‍රපති ඒ.පී. විජේකුමාරි*

15. ආත්මාර්ථය හා පරාර්ථය සාධනය බුදුදහමේ මූලික අරමුණයි 151
*ශාස්ත්‍රපති ඒ.පී. විජේකුමාරි*

16 මාර්ගයේ පරිපූර්ණත්වයට පත් වීම කියාදෙන මහා සළායතනික සූත්‍රය 158
*බී. ඒ. විමලසේන*

17. සච්චානුලෝමික විදර්ශනා ඥාණය 164
*පී.බී. තිලකරත්න*

18. මෙලොව උපදින මනුෂ්‍යයන්ගේ උස්පහත්කම් ඇති වන්නේ ඇයි? 175
*එම්. බී. පේමසේන*

19. සම්මා වාචා 180
*ධර්මාචාර්ය / විද්‍යාවේදී බුද්ධික ඉන්දීර ධනපාල*

20. බොදු අපි සියල්ලෝ ම මේ ජීවිතයේ දී ම සතරඵලයන්ගෙන් එකක් හෝ ලබාගන්නෝ වෙම 190
*කේ.කේ. සුගතපාල*

21. සිරිලක බොදු පුනරුදයක් උදාකළ අමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ඕල්කට්තුමා සිදුකළ ජාතික මෙහෙවර 198
*සෝමදාස විජේසුන්දර*

22. Buddha Dhamma – A Teaching for All Times 203
***Siri Vajirārāmaye Ñāṇasīha - Siri Vajiraramaya,***

23. AVIJJA (DELUSION) – THE GREAT HINDRANCE! 207
***Dr Mass R. Usuf***

24. Buddhism and Crime Prevention 212
***Dr EAD Anusha Edirisinghe,***

25. BUDDHISM AND EMPATHY From Wisdom to Service: Reawakening Buddhist Values in Governance 221
***Dr. Thamara Kandepeliarachchi (LLB) - Attorney at Law***

26. බුදුදහම හා සහකම්පනය සහකම්පනය : සදාචාරාත්මක හා ඵලදායී රාජ්‍ය සේවයක බොදු පදනම 226
*නීතිඥ, ආචාර්ය තමාරා කන්දේපේලිආරච්චි (එල්.එල්.බී)*

27. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තරුණයන් පුනරුත්ථාපනය හා සමාජගත කිරීම 232
*මේජර් ජෙනරාල් (විශ්‍රාමික) දර්ශන හෙට්ටිආරච්චි*

28. ලොවට මග පෙන්වන බොදු නායකත්වය 243
*ආචාර්ය කේ. ඒ. තිලකරත්න*

29. සංකල්පනා 270

# රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ආරම්භය පිළිබඳව සොයා බැලීමේදී පැහැදිලි වන පළමු කරුණ නම් බටහිර යටත් විජිත පාලනය ආරම්භ වන තුරුම මෙහි පැවතියේ රාජාණ්ඩු ක්‍රමය යටතේ සකස් වූ අර්ධ වැඩවසම් රාජ්‍ය සේවයක් බවයි. එහෙත් එය බටහිර යුරෝපීය රටවල පැවති ආකාරයට පූර්ණ වැඩවසම් ක්‍රමයක් තුළ දක්නට ලැබුණු පීඩාකාරී එමෙන්ම මර්ධනකාරී එකක් නොවීය. එය වූ කලී යහ පාලනය සඳහා බෞද්ධ දර්ශණයේ හා රාජ්‍ය පාලනය පිළිබඳ මූල ධර්ම පදනම් කොටගත් ජනහිතකාමී ක්‍රමයකි. ''ජනතාව තමන්ගේම දරුවන්ය. රජු හා රැජින ඔවුන්ගේ පියා හා මවය. පාලකයා නිරන්තරයෙන්ම ක්‍රියා කළ යුත්තේ ජනතාවගේ හිතසුව පිණිසය'' ආදී ධර්මාශෝක රාජ්‍ය පාලන ආකෘතියේ අඩංගු රාජ්‍ය පාලනය පිළිබඳ පරමාදර්ශ මෙන්ම ''ඉමං ගත්තං පිසීනං ශරීරං ධරේමි ලෝකස්ස හිත්තථ මේව'' යන සිරිසඟබෝ සංකල්පය ද, දැහැමෙන් සෙමෙන් රාජ්‍ය පාලනය කිරීමේ බෞද්ධ සංකල්පය ද එම පාලන ක්‍රමයේ අයෝමය පදනම විය. රජතුමා වෙස්වලා ගෙන ජනතා දුක සැප සොයා බැලීමේ යෙදීම රාජ්‍ය නිලධාරීන් නිරන්තරයෙන් දනව් සැරිසරා මහරජුට වාර්තා කිරීමට නියම කිරීම ආදී සම්ප්‍රදායන්ගෙන් ද එදා පැවති රාජ්‍ය පාලන ක්‍රමයේ ප්‍රශස්ථ බව මෙන්ම ජනහිතකාමී බව ද මනාවට පැහැදිලි විය. රජු, මැති, ඇමති හා නිලධාරීන් ඇතුළු සමස්ථ රාජ්‍ය සේවයම මෙම රාජ්‍ය පාලන මූලධර්ම ආත්ම කොටගෙන ක්‍රියාකළ බැවින් ලෝකයේ වෙනත් කිසිම රටක නොතිබුණු ජනහිතකාමී පරමාදර්ශී රාජ්‍ය පාලන ක්‍රමයට අප උරුමකම් කියන බව පැවසිය යුතුය. අදටත් රාජ්‍ය උත්සව අවසානයේදී ගැයෙන ''දේවෝ වස්සතු කාලේන'' යන ගාථාවේ අවසාන පදය වන ''රාජා භවතු ධම්මිකො'' යන්නත් එම දර්ශනයේ කූඨ ප්‍රාප්තිය පෙන්නුම් කරයි. මෙහි ''රාජා'' යනු රජු පමණක් නොව සමස්ථ රාජ්‍ය සේවයටය.

රාජ්‍ය පාලනයෙහි දැහැමි බව බුදුදහමෙහි මනාව පැහැදිලි කෙරේ. බුදුදහම අවධාරණය කරන්නේ පාලකයා සමාජ ආචාර ධර්ම රකින, ධාර්මික පිළිවෙත් අනුගමනය කරන්නකු විය යුතු බවයි. බෞද්ධ දර්ශනය තුළ, දස රාජධර්ම, දස සක්විති වස්, සප්ත අපරිහානීය ධර්ම, සතර අගතියෙන් වැළකීම, සතර බ්‍රහ්ම විහරණ, සතර සංග්‍රහ වස්තු මෙන්ම පඤ්ඤසීල ප්‍රතිපාදාව යන කරුණු රාජ්‍ය පාලනයේදී සුවිශේෂ වේ. මෙම ඉගැන්වීම් තුළින් බෞද්ධ රාජ්‍ය පාලනයක පැවතිය යුතු ශික්ෂනය, සදාචාරාත්මක බව, සමගිය, සමෘද්ධිය, සමානාත්මතාව, නිදහස හා දැහැමි බව අවධාරණය කෙරේ.

රාජ්‍ය පාලනයේදී අනුගමනය කළ යුතු ශ්‍රේෂ්ඨ ගුණධර්ම දහයක් දසරාජ ධර්ම වශයෙන් හැඳින්වේ. එම රාජධර්මයන් වන්නේ දානය, සීලය, පරිත්‍යාගය, ඍජුබව, මෘදුබව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම හා අවිරෝධතාව හෙවත් නොගැටෙන සුළු බවයි. එමෙන්ම ජනතා හිතවාදී පාලන ක්‍රමයක් ඇති කිරීමේදී අනුගමනය කළ යුතු බෞද්ධ ප්‍රතිපත්ති දහයක් දස සක්විති වත් වශයෙන් අර්ථකතනය කොට තිබේ. ඒවා නම්,

1. තමා දස කුසල කර්ම කරමින් ධර්මයෙහි පිහිටා ධර්මානුකූලව තම අඹුදරුවන් ද එහි පිහිටුවීම හා ඔවුන්ට කළ යුතු සංග්‍රහ කරමින් රැක බලාගැනීම.
2. තම බල සේනාව වෙත නිසි පරිදි සංග්‍රහ කොට ඔවුන් ආරක්ෂා කිරීම.
3. රාජ්‍ය තාන්ත්‍රිකයන්ට නිසි පරිදි සංග්‍රහ කොට රැක ගැනීම.
4. බ්‍රාහ්මණ ගෘහපතියන්ද නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම.
5. ගම් දනව් වැසියන්ද නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම.
6. මහණ බමුණන්ද එසේ සංග්‍රහ කොට ආරක්ෂා කිරීම.
7. සිවුපා, පක්ෂී ආදීන්ට අභය දාන දී ආරක්ෂා කිරීම.
8. තම රටෙහි අධාර්මික ක්‍රියා සිදු නොවන අයුරින් ක්‍රියා කිරීම.
9. දිළිඳු ජනයාට ධනය ලබාදෙමින් රැකබලා ගැනීම.
10. සිල්වත් මහණ බමුණන් කරා ගොස් අවවාද අනුශාසනා ලබාගැනීම ලෙස දක්වා තිබේ.

මෙම දස සක්විති වත් සාරාංශ කොට ගතහොත් ධාර්මික රාජ්‍ය පාලනය, ජනජීවිත හා අනෙකුත් සත්ත්ව ජීවිත සුරක්ෂිත කිරීම, ආර්ථික සමෘද්ධිය ගොඩනැගීම හා පිදිය යුත්තන් පිදීම මෙන්ම අවවාද ගරු කොට සැලකීම යනුවෙන් දැක්විය හැකිවේ.

බුදු රජාණන් වහන්සේ ධාර්මික රාජ්‍ය පාලනයට අවශ්‍ය සප්ත අපරිහානීය ධර්ම වජ්ජීන්ට හඳුන්වා දෙන ලද්දේ පහත සඳහන් පරිදිය,

1. නිතර නිතර රැස්වීම.
2. සමගියෙන් රැස්ව සමගියෙන් ක්‍රියාකොට සමගියෙන් විසිර යාම.
3. නොපැනවූ නීති නොපැනවීම, පැනවූ නීති කඩ නොකිරීම.
4. වැඩිහිටියන්ට ගරු කිරීම.
5. විවාහ නොවූ කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීම.
6. වජ්ජි ජනපදයෙහි පිටත පූජනීය ස්ථානවලට ගරු කිරීම.
7. තම ජනපදයට පැමිණෙන රහතන් වහන්සේට පහසුකම් හා ආරක්ෂාව ඇති කිරීම.

තවදුරටත් රාජ්‍ය පාලනයට අවැසි ඡන්දය, ද්වේෂය, භය හා මෝහ යන සතර අගතියනේ වැළැකීමද දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව හා සමානත්මතාව යන සතර සංග්‍රහ වස්තු ද බුදුන් වහන්සේ දේශනා ොකට ඇත. එමෙන්ම බෞද්ධ පාලකයා පඤ්චසීල ප්‍රතිපදාව රැකීම නිසාද තවදුරටත් ධාර්මික වේ. එකී ප්‍රතිපදා වන්නේ,

1. ජීවත් වීම පිළිබඳ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කිරීම.
2. සම්පත්වල සුරක්ෂිතතාව පිළිබඳ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කිරීම.
3. නිරවුල්ව විවාහ ජීවිතයක් පවත්වාගෙන යාමේ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කිරීම.
4. රැවටිලිවලට හසු නොවී ජීවත්වීමට ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කිරීම.
5. නිරෝගී, බුද්ධිමත්, සාමකාමී, ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කිරීම.

මෙම ප්‍රතිපදාවන්ගෙන් සදාචාර සම්පන්න වූ දැහැමි සමාජයක් ගොඩනැගීම ප්‍රාර්ථනා කොට තිබේ.

රාජ්‍ය පරිපාලනය කාර්යක්ෂම කරගැනීම හෙවත් විධිමත්ව පාලනය කිරීමට පත්කරනු ලබන පුද්ගලයින්, නිලධාරීන් ලෙස හඳුන්වනු ලැබේ. එම නිලධාරීන් පාලනයේ අවශ්‍යතා මත පත්කරනු ලැබේ. ආණ්ඩුවේ තීන්දු තීරණ සමස්ථ රාජ්‍යයේම ක්‍රියාත්මක කරවීම එහි අරමුණයි. නිලධාරීන් පත් කිරීමේදී ඔවුන්ගේ දක්ෂතා හා ගුණ සලකා පත් කිරීම හා කාර්යයන් පැවරීම කළ යුතු බව **කෞටිල්‍යගේ** අදහසයි.

ඒ අනුව බලය පිළිබඳ ප්‍රධානියා, රජයේ විවිධ අංශ වල වගකීම දරන්නා, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ හොඳ දැනුමක් සහිත තැනැත්තා අධ්‍යක්ෂවරයෙක් හෝ පරිපාලකයෙක් වේ. තවත් ලෙසකින් කිවහොත් ඉහළ සිට බැලීම, නිරීක්ෂණය කිරීම, ඇසින් සාක්ෂිකරුවෙකු වීම, 'නිරීක්ෂණය කරන්නා' යන අර්ථය සහිත තැනැත්තා අධ්‍යක්ෂවරයෙකු වේ. රජය පහසුවෙන් පවත්වා ගෙන යාම සඳහා කාර්යයන් විභේදනය කිරීම මගින් දෙපාර්තමේන්තුකරණය සිදුකොට ඇත. රාජාඥාව ප්‍රකාරයෙන් එකී දෙපාර්තමේන්තු මගින් ජනතා සුභ සිද්ධිය සැලසීමට ප්‍රධාන නිලධාරීන් පත්කෙරේ. ඔහු එහි බලධාරියා ලෙස රාජාඥාවට අනුගතව ස්වාධීනව ද, සේවකයන් හසුරුවමින් ද ප්‍රතිපත්ති සම්පාදනය කරමින් ක්‍රියාකරයි. ඔහු වනාහි අධ්‍යක්ෂවරයායි. ඒ අනුව දෙපාර්තමේන්තු බලධාරියා 'අධ්‍යක්ෂවරයා' ලෙස දැක්වේ. අධ්‍යක්ෂවරයෙක් වීම සඳහා අවශ්‍ය වැදගත්ම කරුණ වන්නේ සිය විෂය පිළිබඳව ප්‍රවීණත්වයයි. විෂය සර්වඥතාව අධ්‍යක්ෂ ගුණයක් ලෙස දක්වයි. ඒ ඒ විෂයන් පිළිබඳව රාජ්‍යයෙහි සීමිත විද්වතුන් නිසි ලෙස ස්ථානගත කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබිය හැක. පැරණි ඉන්දියාවේ හා ලංකාවේ ආණ්ඩු යටතේ සේවය කළ උසස් නිලධාරීන් පිරිසක් වන 'අධිකාරීවරුන්' රජයේ පාලනාංශවල ප්‍රධානීන් හැටියට ද, යුද්ධ හමුදා ප්‍රධානීන් වශයෙන් ද ඇතැම් විට ඒ දෙපරිද්දෙන්ම ද සේවය කොට ඇති බව පෙනේ. අශෝක යුගයේ සිටි 'මහා මාත්‍ර' නම් නිලධාරී පිරිස කාර්යයෙන් අධ්‍යක්ෂවරුන්ට සමානය. ඔවුහු සමාන අර්ථයෙන් පරිපාලකයන් ලෙස ද නීති නිලධාරීන් ලෙස ද ක්‍රියාකර ඇත. ගුප්ත අධිරාජ්‍යයේදී ද තත් අවශ්‍යතාවයන්ට සාපේක්ෂව අධ්‍යක්ෂවරු පත්කර තිබූ බව ඓතිහාසික මූලාශ්‍ර සනාථ කෙරේ. ඉන්දීය බොහෝ රාජ්‍ය පාලනයන්හි මෙකී අධ්‍යක්ෂවරු පත්කර

තිබූ බව පෙනේ. අධිකාරී ධුරය කවර කලක ලංකාවේ ආරම්භ වී ඇතිදැයි නිශ්චිත වශයෙන් කිව නොහැකි වුවත්, අනුරාධපුර යුගයේ අවසාන භාගයේ රජයේ කාර්යාංශයක හෝ යුද්ධ හමුදාවේ හෝ නායකත්වය දැරුවන් අධිකාරී නමින් හැඳින්වූ බව පෙනේ. සීගිරි පද්‍යයක් ලියූ 'නක්කමාඩම්බියා' නමැති දාස අධිකාරිවරයෙකු ගැන ද ඉතිහාසය සඳහන් කෙරේ. පොළොන්නරු යුගයේ අධිකාරීවරුන් පිළිබඳව ද තොරතුරු සුලභය. අධිකාරිවරුන් ඔටුනු නොපලන් රජවරුන් වැනි වූ බව ද, ඔවුන්ට සෑම රාජකීය සම්මානයක්ම ලැබුණු බව ද සඳහන් වේ.

අධ්‍යක්‍ෂවරු හෙවත් නිලධාරීන් පත් කිරීම පිළිබඳව පැහැදිලි අදහසක් **කෞටිල්‍ය** ඉදිරිපත් නොකරයි. ඇතැම් ප්‍රකාශ තුළින් ඔවුන් පත් කිරීම කවරාකාර වී දැයි හඳුනාගත හැක. අමාත්‍යවරුන් පත් කිරීමේදී භාවිතයට ගැනුනු නිර්ණායකයන් වන කාර්යශූරත්වය, තත්වදර්ශියෙකු වීම, ස්වාමියා හෝ රජු කෙරෙහි අනුරාගීවීම, අවංකත්වය, කාර්ය සම්පාදන සක්‍යතාවය, මුතුන් මිත්තන් රාජ්‍යයේ නිලතල දරා සිටීම, සහචර විද්වතුන් වීම, ස්වදේශිකත්වය හා කුලවත් බව යන කරුණු සැලකිල්ලට ගෙන ඇති බව ද පෙනේ. පැරණි සමාජය තුළ විවිධ විෂයයන් සඳහා අධ්‍යක්‍ෂවරුන් පත්කර තිබූ බව ද පෙනේ. ඒ අතර ආදායම් කොමසාරිස්, ගණන් හිලව් කාර්යාලීය අධ්‍යක්‍ෂ, රාජකීය බදු අධ්‍යක්‍ෂ, අයබදු අධ්‍යක්‍ෂ, කෘෂිකර්ම අධ්‍යක්‍ෂ, ආයුධභාර අධ්‍යක්‍ෂ, පාබල සේනාවේ අධ්‍යක්‍ෂ, සත්ත්ව ඝාතන අධ්‍යක්‍ෂ, සුරා අධ්‍යක්‍ෂ, ගණිකා අධ්‍යක්‍ෂ, ආකර අධ්‍යක්‍ෂ, ස්වරණ අධ්‍යක්‍ෂ, පේෂකර්ම අධ්‍යක්‍ෂ, වෙළඳ අධ්‍යක්‍ෂ, කිරුම් හා මිණුම් කටයුතු අධ්‍යක්‍ෂ, නෞකා අධ්‍යක්‍ෂ, වන සංරක්ෂණ අධ්‍යක්‍ෂ, රථ අධ්‍යක්‍ෂ, ආගමන විගමන අධ්‍යක්‍ෂ, ගෝචර භූමි අධ්‍යක්‍ෂ වැනි තනතුරු වැදගත්ව පැවතුණි. **කෞටිල්‍ය** අර්ථ ශාස්ත්‍රයේ හමුවන මෙම අධ්‍යක්‍ෂවරුන්ට විවිධ වගකීම් පවරා තිබුණි. අදාළ ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා ක්‍රියාකිරීම, කාර්යාල පහසුකම් පොදු ජනතාවට ලැබීමට සැලැස්වීම, නිර්දිෂ්ඨ දඩ මුදල් විධිමත් ලෙස ලබා ගැනීම, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ලිපි ලේඛණ පවත්වාගෙන යාම හා අදාළ ක්ෂේත්‍රය පිළිබඳව නීති රෙගුලාසි ක්‍රියාත්මක කරවීම ඒ අතර වැදගත් වේ. අධ්‍යක්‍ෂවරු හෙවත් නිලධාරීන් පත්කරනුයේ මධ්‍ය බලතල හා කාර්යයන් විධිමත්ව විමධ්‍යගත කිරීම සඳහාය. එයින් අපේක්ෂා කරනුයේ හුදී ජන සුභ සිද්ධියයි. මේ අනුව රටේත් රට වැසියාගේත් සුභ සිද්ධිය උදෙසා සේවයක් ඉහත නිලධාරීන්ගෙන් අපේක්ෂා කළ බව පෙනේ.

විවිධ ක්ෂේත්‍රයන් යටතේ සේවය කළ පරිපාලන සේවයේ විශිෂ්ටයන් ගණනාවක් මේ අවස්ථාවේ මතකයට නැගේ. 1826 දී සිවිල් සේවකයෙකු ලෙස ලංකාවට පැමිණ, මහාවංශය පරිවර්තන කළ, ජෝර්ජ් ටර්නර් ද, සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය, කාව්‍යශේඛරය හා සුභාෂිතය පොත් ඉංග්‍රීසියට පරිවර්තනය කළ, 1854 දී ලංකාවේ සේවය කළ විලියම් චාර්ල්ස් මැක්රීඩ්, පාලි භාෂාව, සිංහල භාෂාව හා සිංහල සංස්කෘතිය පුළුල්ව හැදෑරූ පමණක් නොව, එකල මාතර ප්‍රදේශයේ විසූ ගජමන් නෝනා, ඇලපාත මුදලි වැනි දක්ෂ කවි කිවිඳියන් සමග කටයුතු කළ ජෝන් ඩොයිලි, මහනුවර කන්ද උඩරට හරහා කළුතර තෙක් යෙදුණු චාරිකාවන් පිළිබඳ සටහන් කරමින් පොත පත ලියූ සීමන් සෝවර්ස්, බුදුදහම ඉගෙන කුස ජාතකය පද්‍ය සංග්‍රහයක් සේ එළිදැක්වූ තෝමස් ස්ටීල් මෙන්ම අප කවුරුත් දන්නා ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් වැනි ඉංග්‍රීසි ජාතික නිලධාරීහු සිවිල් සේවය ඔපවත් කළෝය.

රාජ්‍ය සේවය පරමාදර්ශී සේවයක් සේ සැලකූ ලංකා සිවිල් සේවයේ නිලධාරි එන්. ක්‍යු. දියෙස් මහතා රාජ්‍ය සේවා බෞද්ධ සංගමය පිහිටුවීමට මූලිකව ක්‍රියා කළේය. රාජ්‍ය සේවාව යනු උතුම් සේවාවක් යන්න ඔහු තුළ ජනිත වූ අදහසයි. වර්තමානයේදී මිලියනයක් ඉක්මවන ලද රාජ්‍ය සේවාව තුළ ජනහිතකාමී බව ප්‍රචලිත වීමට දියෙස් මහතාගේ උත්සාහය යම් දුරකට සඵල වූ බව නොරහසකි. වර්තමානයේදී එකී ජනහිතකාමී බව වඩාත් සාක්ෂාත් කරගැනීම රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ සුවිශේෂී අරමුණ වී තිබේ.

**ආචාර්ය කේ. ඒ. තිලකරත්න**
**විනිසුරු මණ්ඩල සාමාජික - කාර්මික අධිකරණය**
**හිටපු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්**
**071 4858612**

# වෙසක් සිරිසර සඟරාව 01

## 1.1 ඉතිහාසය

පානදුරේ ශ්‍රී සද්ධර්මදාන සමිතිය මඟින් 1935 වසරේ වෙසක් පුරපසළොස්වක් පෝය නිමිත්තෙන් ධර්ම දානය පිණිස වෙසක් සිරිසර නමින් නව ප්‍රකාශනයක් මුද්‍රණය කර නොමිලේ බෙදා හරින ලදි. එතැන් පටන් මේ දක්වා නොකඩවා වාර්ෂිකව ධර්මකාමීන් අතට පත් කරන ලද මෙම ප්‍රකාශනයෙහි ආරම්භක සංස්කාරකත්වය දරන ලද්දේ පූජ්‍ය කෙසෙල්වත්තේ ජනානන්ද මහ තෙරුන් විසිනි. උන් වහන්සේගේ සොහොයුරකු වූ පසු කලෙක කොළඹ රාජකීය විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ ප්‍රධානාචාර්ය ධුරය දැරූ එවකට 18 හැවිරිදි වූ එච්.පී. ජයවර්ධන මහතා සහකාර සංස්කාරක වශයෙන් උන් වහන්සේට සහාය විය. උන් වහන්සේගේ වැඩිමහල් සොහොයුරා වූ පසු කලෙක කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලත් එච්.බී.පී. ජයවර්ධන මහතා විසින් පිටකවරය සකසා දෙන ලදි.

1984 දී උන් වහන්සේ අපවත් වූ බැවින් පළ කිරීම පිණිස ලිපි සම්පාදනය කරවා ගැනීම, මුද්‍රණ වියදම් සපයා ගැනීම, අනුග්‍රාහක දැන්වීම් ලබා ගැනීම, මුද්‍රණය කරවීම සහ නොමිලේ බෙදා හැරීම යන සියලු කාර්යයන් එච්.පී. ජයවර්ධන මහතා විසින් තනිව ම සිය කර මතට ගත්තේ ය. සිය පැවිදි සොහොයුරා විසින් ආරම්භ කරන ලද මෙම ධර්ම දානමය පින්කම ජයවර්ධන මහතා තම පෞද්ගලික ධනය ද නොමසුරුව වියදම් කරමින් ඉමහත් ධෛර්යයෙන් හා කැපවීමෙන් යුතුව අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේ ය. කෙටියෙන් පවසතොත් එහි පැවැත්ම ශ්‍රී සද්ධර්මදාන සමිතියේ සභාපති වූ ජයවර්ධන මහතාගේ ම උත්සාහය මත රඳා පවතින්නක් බවට පත් විය. කල් ගත වද්දී,

රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෝ කිහිපදෙනෙක් ද තමන්ට ළමා කල මඟ පෙන්වූ ගුරුතුමන්ගේ මහඟු කාර්යයට මුදලින් හා වෙනත් අයුරින් උපකාර කරමින් ඔහුට අත්වැලක් වූහ.

වසරින් වසර ඉදිරියට ම ගිය මෙම ප්‍රකාශනයට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ත්‍රෛභාෂාවෙන් ම රචිත ලිපි ඇතුළත් වූයෙන් බොදු දහම පිළිබඳව ඇල්මක් දැක්වූ මෙරට කාටත් භාෂා භේදයකින් තොරව දැනුම සපයන ප්‍රභවයක් විය. මීට අමතරව දහම් රුචිය ඇති විදේශිකයන් පිළිබඳව ද එච්.පී. ජයවර්ධන මහතාගේ අවධානය යොමු විය. ඉංග්‍රීසි බසින් රචිත ලිපි පමණක් ඇතුළත් වූ විශේෂ මුද්‍රණයක් ද අරඹා එය විදේශීය පාඨකයන් අතර බෙදා දෙමින් වටිනා විදේශ ධර්ම ප්‍රචාරක සේවාවකට ද එතුමා මුල පිරී ය.

තමන් වියපත් වුව ද තවත් දිගු කලක් මේ සේවාව පවත්වා ගෙන යාම ඔහුගේ අභිප්‍රාය විය. ඒ සඳහා සුදුසු අනුප්‍රාප්තිකයකු සෙවීමෙහි ඔහු නිරත වූයේ එබැවිනි. එවකට ඉංග්‍රීසි කොටසෙහි සහකාර සංස්කාරකත්වය දැරූ රාජා කුරුප්පු මහතා රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සමඟ සමීපව කටයුතු කර ගෙන ගිය බැවින් එම සංගමයෙන් මේ සම්බන්ධව ඉල්ලීමක් කිරීමට ජයවර්ධන මහතාගේ එකඟත්වය ලබා ගත්තේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස රාජා කුරුප්පු මහතා ජයවර්ධන මහතා ද කැටුව එවකට රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ සභාපතිත්තය ඉසිලූ ටී.කේ. දසනායක මහතා, නෙවිල් පියදිගම මහතා සහ පී.බී. වේරගොඩ මහතා ඇතුළු පිරිසක් සමඟ සාකච්ඡා වාරයකට සහභාගි වී ය.

එබඳු භාරදූර කාර්යයකට අත ගැසීමට පෙර සලකා බැලිය යුතු ගැටලු රාශියක් සංගමයට තිබිණ. ඒ වන විටත් රජයේ උසස් නිලතල හොබවන සැලකිය යුතු සාමාජික සංඛ්‍යාවකින් යුක්ත සංගමයක් වුවත් සුදුසු සංවිධායකත්වයක් ගොඩ නඟා ගැනීම සහ මූල්‍යමය ගැටලු ඉන් ප්‍රධාන විය. එහෙත් සංගමයේ කවර කටයුත්තක දී වුව ද බලවත් ආත්ම විශ්වාසයකින් අභීතව ඉදිරිපත් වන වේරගොඩ මහතා එම ගැටලු අභිමුඛයේ දී දුර්මුඛ වූයේ නැත. සාකච්ඡා වාරයේ අවසාන ප්‍රතිඵලය වූයේ එතෙක් ජයවර්ධන මහතා තනිව ම කර ගෙන ආ වෙසක් සිරිසර ප්‍රකාශන කටයුත්ත නොනවත්වා කර ගෙන යාමට 1991 අගෝස්තු මාසයේ දී රාජ්‍ය සේවා බෞද්ධ සංගමය විසින් එකඟත්වය පළ කිරීමයි.

මෙහි දී කොන්දේසි වශයෙන් මුල් වසරේ දී පමණක් මුද්‍රණ වියදම් සපයා ගැනීමට සංගමයේ හෝ වෙනත් උපකාර ලබා දෙන ලෙසත්, ජයවර්ධන මහතා සංස්කාරක වශයෙන් තව දුරටත් කටයුතු කළ යුතු බවත් පමණක් එක ම අවශ්‍යතාව ලෙස වේරගොඩ මහතා ඉල්ලා සිටියේ ය. රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුව වෙනුවෙන් එහි ගරු ලේකම් ලෙස සියලු කාර්යයන්ට මූලිකත්වය දෙමින් එම වගකීම ඉටු කිරීමට එක ම සුදුස්සා වූයේ ද වේරගොඩ මහතා ම ය. එවකට සඟරාව සතුව තිබූ රුපියල් එක් ලක්ෂ පනස් දහසක මුදලක් ද සංගමයට ලබා දෙන ලදි. සඟරාව සඳහා අරමුදලක් ගොඩ නඟා ගැනීමේ උත්සාහය ද වේරගොඩ මහතා ඊට සමාන්තරව දියත් කළේ ය.

1992 වෙසක් පෝය නිමිති කර ගෙන රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ප්‍රකාශකත්වයෙන් වෙසක් සිරිසර 57 වන කලාපය එළිදැක්විණ. සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි එහි සංස්කාරකත්වය එච්.පී. ජයවර්ධන මහතා විසින් උසුලන ලදි. එතුමාට එතෙක් සහාය වූ පරිදි ම සිංහල බසින් වූ කොටස සඳහා සිරිසේන මලලසේකර මහතා ද, ඉංග්‍රීසි බසින් වූ කොටස සඳහා රාජා කුරුප්පු මහතා ද, දෙමළ බසින් වූ කොටස සඳහා එම්.එම්. උවයිස් මහතා ද සංස්කරණයෙන් සහාය වූහ. වෙසක් සිරිසර පිටකවරය සකස් කිරීමෙන් දායකත්වය ලබා දුන් එච්.බී.පී. ජයවර්ධන මහතා 1986 දී අභාවප්‍රාප්ත වූ බැවින් ජයවර්ධන පවුලේ ම වෙනත් සහෝදරයකුගේ පුතකු වන දීපාල් ජයවර්ධන මහතා විසින් එතැන් පටන් එම කාර්යය භාර ගෙන තිබිණ. එදා මෙදා තුර දීපාල් ජයවර්ධන මහතා විසින් වර්ෂයකට එක බැගින් ශ්‍රී ලංකාවේ අප්‍රකට විහාරස්ථානවල බිතු සිතුවම් තෝරා ගනිමින් ඒ පිළිබඳව කෙටි හැඳින්වීමක් ද සමඟ නිර්මාණය කරන ලද පිටකවරය මෙම සඟරාවට පුරාවිද්‍යාත්මක වටිනාකමක් ද එක් කිරීමට සමත් විය.

දහම් පාසල් අතර බෙදා දීම සඳහා සිංහල මුද්‍රණයක් ඇරඹීම, සඟරාවේ විසිතුරු බව රැක ගැනීම පිණිස අනුග්‍රාහක දැන්වීම් අඩු කිරීම, උසස් තත්ත්වයේ කඩදාසියේ මුද්‍රණය කිරීම, පළ කරනු ලබන ලිපි සංඛ්‍යාව වැඩි කිරීම යනාදිය රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මඟින් වෙසක් සිරිසර පළ කිරීමට භාර ගැනීමෙන් පසුව ලබා ගත් දියුණුවේ අංග කිහිපයකි. මේ සියලු වැඩි දියුණු කිරීම්වල ගෞරවය

හිමි විය යුත්තේ ඒ සඳහා උදේ‍යාගයෙන් කටයුතු කළ පී. බී. වේරගොඩ මහතාටය.

ගත වූයේ වසරකටත් අඩු කෙටි කාලයකි. අඩ සියවසකට අධික කාලයක් වෙසක් සිරිසර සඟරාව සමඟ ම සිය ජීවිතය බෙදා හදා ගත් එච්.පී. ජයවර්ධන මහතා හැත්තෑ පස් වසරක් ආයු වළඳා 1992 සැප්තැම්බර් මස 03 වන දින සිය ජීවන කතාව නිම කළේ ය. තමන් පණ දෙවැනි කොට කැප වී සුරැකි වෙසක් සිරිසර ධර්ම ප්‍රකාශන කටයුතු සිය දිවිසැරිය නිම කිරීමට ප්‍රථමයෙන් ඊට උචිත ම පාර්ශ්වයක් අතට පත් කිරීමේ සතුට සහ සැහැල්ලුව සහිතව අවසන් හුස්ම හෙළීමට හැකි වීම ජයවර්ධන මහතා ලද භාග්‍යයකි. ඔහුගේ ඇවෑමෙන් රාජා කුරුප්පු මහතා සංස්කාරකත්වය භාර ගත් අතර 58 වන කලාපයේ පටන් වෙසක් සිරිසර සඟරාව පළ වූයේ ඔහුගේ සංස්කරණයෙනි.

ප්‍රකාශන කමිටුවේ ලේකම් පී.බී. වේරගොඩ මහතාගේ බලවත් ප්‍රයත්නය පරිදි මුල් වසරේ දී ම මුද්‍රණ වියදම ඉක්මවා අතිරික්ත මුදලක් රැස් කර ගැනීමට සංගමයට හැකි විය. එවක් පටන් සෑම වසරක දී ම එම වාර්තාව රැක ගැනීමට ඔහු සමත් විය. මෙසේ එකතු වූ අතිරික්ත මුදල් වෙසක් සිරිසර අරමුදල නමින් ස්ථාවර තැන්පත් වශයෙන් බැංකුගත කර ඇත. සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම්වල දී විගණනය කරන ලද වෙසක් සිරිසර අරමුදලේ ගිණුම් වාර්තා ද ඉදිරිපත් කෙරිණ. ස්ථාවර තැන්පත්වලින් ලැබෙන පොලියෙන් පමණක් අනාගතයේ දී ප්‍රකාශන වියදම් දැරීමට හැකි වන සේ ශක්තිමත් අරමුදලක් ගොඩ නඟා ගැනීම සම්බන්ධයෙන් පී.බී. වේරගොඩ මහතාට සංගමයේ කෘතඥතා පූර්වක ස්තුතිය හිමි විය යුතු ය.

කරුණු එසේ වුව ද කාලයත් සමඟ මුද්‍රණ වියදම් සහ තැපැල් ගාස්තු ඉහළ යාම නිසා මුල දී දැරීමට සිදු වූවාට වඩා වැඩි වියදමක් දැරීමට සිදු වී ඇති අතර බැංකුවල ස්ථාවර තැන්පත් සඳහා වූ පොලී අනුපාත අඩු වීමත්, වෙසක් සිරිසර සඳහා ආධාර ලබා දුන් සමහර රාජ්‍ය ආයතනවලට ප්‍රතිපත්තිමය තීරණ මත එලෙස ආධාර ලබා දීමට නොහැකි වීමත් නිසා අයවැය පරතරයක් උද්ගත වී ඇත. මෙම හිඟය පියවා ගැනීමට සංගමයේ සාමාජිකයන්ගෙන්, වෙසක් සිරිසර පාඨකයන්ගෙන් සහ වෙනත් දානපතියන්ගෙන් ආධාර පත්‍ර මඟින් ආධාර එක්රැස් කිරීමට සිදුව ඇත.

ඉස්ලාම් භක්තිකයකු වුව ද අවුරුදු 15ක් තිස්සේ දෙමළ ලිපි සංස්කරණයෙක් සහාය වූ ආචාර්ය එම්.එම්. උවයිස් මහතා වසර 76ක් ආයු වළඳා 1996 වසරේ දී අභාවප්‍රාප්ත වූයෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුස්සකු සොයා ගැනීමට සිදු විය. මෙවර සහායට ඉදිරිපත් වූයේ හින්දු භක්තිකයකු වූ ටී. කනගරත්නම් මහතා ය. රට තුළ විවිධ ආකාරයේ ආගමික හා ජනවාර්ගික ගැටුම් පවත්නා කාල වකවාණුවක් පැවැතිය ද බෞද්ධ සඟරාවක් වූ වෙසක් සිරිසර ධර්ම ප්‍රකාශනය සඳහා අන්‍ය භක්තිකයන්ගේ ද අමිල සහාය ලබා ගැනීමට හැකි වීම තුළින් බුදුදහමේ ඇති ආගමික සහනශීලීත්වය මොනවට පැහැදිලි වේ.

1988 සිට සිංහල කොටසෙහි සංස්කාරකත්වය ඉසිලූ සිරිසේන මලලසේකර මහතාගේ ශරීර සෞඛ්‍ය පිරිහීම නිසා 1999 දී සිංහල කොටස සංස්කරණය කිරීමේ වගකීම ධම්ම වීරකෝන් මහතා විසින් භාර ගන්නා ලදි.

දෙස් විදෙස්හි පුස්තකාලවල තැන්පත් කිරීමට සුදුසු සාරගර්භ ලිපි මෙන් ම ඉහළ තත්ත්වයේ මුද්‍රණයෙන් සඟරාව සකසා ගැනීමට උපකාර වන ලිපි, ධර්ම දානමය අදහසින් සපයන උගත් පැවිදි සහ ගිහි ලේඛකයන් ද, කිසිදු කරදරයක් නැතිව මුද්‍රණ දෝෂවලින් තොර අගනා නිමාවකින් යුක්ත සඟරාවක් ඉතා සාධාරණ මිලකට කලට වේලාවට මුද්‍රණද්වාරයෙන් එළිදක්වන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාණිජ අංශයේ කාර්ය මණ්ඩලය ද මේ මොහොතේ සිහිපත් කරනුයේ ගෞරව පූර්වක කෘතඥතාවකිනි.

වෙසක් සිරිසරට පාඨකයන්ට අතිරේකව තවත් වැදගත් දහම් පොතක් පළ කර බෙදා දීමට ප්‍රකාශන කමිටුව විසින් ගනු ලැබූ තීරණයකට අනුව 2004 වෙසක් සිරිසර සමඟ නිමලව ආරණ්‍යවාසී පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමියන් විසින් සම්පාදිත කර්ම විපාක නමැති පොත බෙදා හරින ලදි. මෙම පොතෙහි පළමුවැනි මුද්‍රණය පිටපත් 3,750ක් වූ නමුත් ඉන්පසුව මතු වූ බලවත් ඉල්ලීම මත රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විධායක කමිටු සාමාජිකයන් කිහිපදෙනකුගේ සහ සැදැහැවතුන් පිරිසකගේ වියදමෙන් තෙමසක් ගත වීමට මත්තෙන් තවත් පිටපත් 1,325ක් නැවත මුද්‍රණය කර බෙදා හරින ලදි.

සංගමයට වෙන් වශයෙන් කාර්යාලයක් නොතිබූ මුල් යුගයේ මුද්‍රණය කරන ලද වෙසක් සිරිසර සඟරා බෙදා හැරීම සිදු කරන තුරු ගබඩා කර තැබීමේ ගැටලුවක් පැවැතිණ. අනෙක් සියලු ම කැප කිරීම්වලට අමතරව එච්.පී. ජයවර්ධන මහතාත්, පී.බී. වේරගොඩ මහතාත් තමන් පදිංචි නිවසේ සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් වෙසක් සිරිසර සඟරාවේ ප්‍රකාශන කටයුතු සඳහා වෙන් කර දීම ද සංගමයට බලවත් උපකාරයකි.

වෙසක් සිරිසර කමිටුවේ ගරු ලේකම් ලෙස 2010 සිට 2017 දක්වා කාලය තුළ සිය අයහපත් සෞඛ්‍ය තත්ත්වය පවා නොතකා ඉතාමත් කැපවීමකින් කටයුතු කොට 2022 මැයි මස 22 වන දින පරලෝ සැපත් ගුණසේන කඩිගමුව මහතා මෙහි දී පුණ්‍යානුමෝදනාත්මකව සිහිපත් කරමු.

ඉන් අනතුරුව වෙසක් සිරිසර කමිටුවක් ද පත් නොකරන ලද අතර සිංහල කොටසෙහි සංස්කරණය ධම්ම වීරකෝන් මහතා අතින් ද, ඉංග්‍රීසි කොටසෙහි සංස්කරණය නෙවිල් පියදිගම මහතා අතින් ද මේ දක්වා සිදු කෙරුණ.

පානදුරේ ශ්‍රී සද්ධර්මදාන සමිතිය මඟින් 1935 ආරම්භ කරන ලද වෙසක් සිරිසර සඟරාවේ 90 වන කලාපය වෙනස් ම මුහුණුවරකින් ඔබ අතට පත් වන්නේ 2024 වර්ෂයේ දී පත් කරන ලද එහි අභිනව සංස්කාරක මණ්ඩලයේ ගරු භාණ්ඩාගාරික චාරුක කුමාරපේලි මහතාගේ අදහසක් අනුව ය. මෙම ධර්ම දානමය පින්කම වෙනුවෙන් වැඩි ම කාලයක් සිය කාලය, ශ්‍රමය, ධනය සහ බුද්ධිමය සම්පත දායක කළ එච්.පී. ජයවර්ධන මහතාගේ උදාර සිතිවිල්ල පරිදි දෙස් විදෙස් බෞද්ධ ධර්ම ප්‍රචාරය සිදු කරමින් නූතන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත වෙමින් කාලයත් සමඟ පරිවර්තනයනට භාජනය වෙමින් වෙසක් සිරිසර චිරාත් කාලයක් වැජඹෙනු ඇතැයි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

---

**තොරතුරු මූලාශ්‍රය**

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ස්වර්ණ ජයන්ති සමරු කලාපයට එවකට වෙසක් සිරිසර සහකාර සංස්කාරක (සිංහල) ධම්ම වීරකෝන් මහතා ලියූ ලිපියක් ඇසුරෙනි.

## 1.2 වෙසක් සිරිසර සඟරාවේ නිර්මාතෘ පූජ්‍ය කෙසෙල්වත්තේ ජිනානන්ද හිමි



සත්පුරුෂයෝ මානව ප්‍රජාවගේ භාග්‍යයට ම කාලානුරූපීව යම් කාර්යයන් තම හිසින් ගෙන පහළ වෙති. එවැන්නන්ගේ දුලබ බව නිසා ම නික්ම ගිය ද මානව ප්‍රජාවකට ම, පරපුරකට ම ආලෝකය විහිදුවයි. අදින් වසර 41කට පෙර අපවත් වී වදාළ වලාන ශ්‍රී සරණපාල මහා විහාරය, කහපොළ සද්ධර්මාරාමය, උඩහමුල්ල සත්තබෝධි විහාරය යන විහාරත්‍රයාධිපතිව වැඩ විසූ සරණපාල වංසාවතංස විමල කීර්ති ශ්‍රී කෙසෙල්වත්තේ ශ්‍රී ජිනානන්ද නාහිමියෝ කරුණා හෘදයක් ඇති උතුම් සත්පුරුෂ සංඝසෝබන පැවැතුම්වලින් හෙබි සංඝපීතෘ නමකි.

වියතුන්ට, දන්පතීන්ට නිජබිමක් වැනි පුනර්ජීවන පානදුරා පුරවරයෙහි කෙසෙල්වත්ත නම් ග්‍රාමයෙහි ශ්‍රද්ධා භක්තියෙනුදු නොඅඩු පරපුරකට උරුමයක් ඇති හල්පවත්තගේ ජේම්ස් ප්‍රැන්සිස් පීරිස් ජයවර්ධන මැතිතුමන් සහ කාන්තලගේ එමලීනා ප්‍රනාන්දු මැතිණිය මෙම පින්වත් කුමරාගේ දෙමව්පියෝ වූහ. මෙම වාසනාවන්ත දම්පතීන්ගේ දෙවැනි පුත්‍ර ලාභය ලෙස 1905 මාර්තු දෙවැනි දින ජන්මලාභය ලැබූ ඔහුට එච්.බී.පී. ජයවර්ධන, සුමනා පීරිස් ජයවර්ධන, ඇඩ්නස් පීරිස් ජයවර්ධන, හෙක්ටර් ජයවර්ධන යනුවෙන් සහෝදර සහෝදරියෝ සිව්දෙනෙක් වූහ. දොළොස් වස එළැඹෙත් ම සසර හුරුවකට මෙන්, ජලය තුළ ගිතෙල් ගිල්වා තැබීමට නොහැක්කා සේ ම පෙර භවයන්හි කුසලය ද, පිරූ මෛත්‍රී කරුණා ගුණය ද පෙරදැරිව ශාසනාලය හද පත්ළෙන් මෝරන්නට විය.

එකල පානදුර වලානේ සරණපාල මහා විහාරයේ ආධිපත්‍යය ඉසිළූ විචිත්‍ර භාණක ශ්‍රී සද්ධර්මාචාර්ය විනය කීර්ති ශ්‍රී වලානේ ධම්මානන්දාභිදාන අමරපුර මහා නිකායේ අධිකරණ නාහිමිපාණන්

වහන්සේගේ ආධාරකත්වයෙන් 1917ක් වූ ජනවාරි මස 29 වන දින කෙසෙල්වත්තේ ජිනානන්ද ප්‍රව්‍රජ්‍යා නාමය ගෙන සසුනට එළඹ සිටියේ ය.

එතැන් පටන් පිරිය යුතු බණ දහමින් හා තිසි වයසින් පරිපූර්ණ වූ පින්වත් සමිඳුන් අම්බලන්ගොඩ දේවානන්දාභිදාන මහා නායක උපසංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා තම ගුරු දේවෝත්තම සද්ධර්මාචාර්ය විනය කීර්ති ශ්‍රී වලානේ ධම්මානන්දාභිදාන අධිකරණ නාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1925ක් වූ ජූලි මස 28 වන දින පානදුරා නදී උදකුක්ඛේප සීමාමාලකයේ දී අතිපරිශුද්ධ වූ උපසම්පදා විනය කර්මය ලදහ.

තම ගුරුදේවෝත්තම නාහිමිපාණන් වහන්සේ යටතේ තව දුරටත් පිරිය යුතු ගුණදහම් උගත් උන් වහන්සේ අතිමහත් ගුරු ගෞරවයකින් කටයුතු කළ සේක. කාලයාගේ ඇවෑමෙන් තම ගුරුදේවෝත්තමයාණන් වහන්සේ අපවත් වීමෙන් අනතුරුව අධිපතීත්වයට පත් ද එලෙස ම ගුරු ගෞරවය දැක්වීමේ අතුරුඵලයක් ලෙස උන් වහන්සේ ජීවත්ව සිටිය දී ම කෘත්‍යාධිකාරී තනතුර පවරන ලදි. වලානේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ අපවත් වීමත් සමඟ වලානේ ශ්‍රී සරණපාල මහා විහාරය, කහපොළ සද්ධර්මාරාමය, උඩහමුල්ල සත්තබෝධි විහාරය යන විහාරත්‍රයේ අධිපතීත්වයට පත් අප නායක හිමිපාණන් වහන්සේ ගිහි පැවිදි සැමදෙනාගේ ම චිත්තාරාධයන හිමි කර ගත් සේක.

සත්පුරුෂ ගුණය සසර හුරුවක්ව ඇති බැවින් තම ගුරුදේවෝත්තමයාණන් වූ වලානේ ධම්මානන්ද අධිකරණ නාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් අනතුරුව උන් වහන්සේගේ මනරම් පිළිරුවක් නිමවා උදය සවස වන්දනාමාන කළ අතර අන්‍යයන්ට ද එයට හුරුවක් ඇති කළ සේක.

පානදුර වලානේ සරණපාල විහාරස්ථ ශ්‍රී සද්ධර්මදාන සමිතිය මඟින් 1935 වසරේ වෙසක් පුර පසළොස්වක් පොහොය නිමිත්තෙන් සඟරාවක් මුද්‍රණය කර ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හරින ලදි. පසු කලෙක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම වාර්ෂිකව පළ කර විදේශයන්හි පවා ධර්ම ප්‍රචාර කටයුතු සිදු කළ මෙම ප්‍රකාශනයෙහි ආරම්භක සංස්කාරකත්වය දරන ලද්දේ පූජ්‍ය

කෙසෙල්වත්තේ ජනානන්ද මහ තෙරුන් විසිනි. වෙසක් සිරිසර නම් වූ මෙම ධර්ම දානමය පුස්තකයේ ආරම්භය සිදු වූයේ ජයවර්ධන පවුලේ කටයුත්තක් ආකාරයෙනි. එනම්, ජනානන්ද මහ තෙරුන්ගේ වැඩිමහල් සොහොයුරා වූ එච්.බී.පී. ජයවර්ධන තරුණයා විසින් එහි පිටකවරය නිර්මාණය කර දුන් අතර ඒ වන විට පාසල් අධ්‍යාපනය නිම කර සිටි බාල සොහොයුරා වූ හෙක්ටර් ජයවර්ධන සිසුවා උන් වහන්සේට සංස්කරණයෙන් සහාය දැක්වූයේ ය. ගිහි කල සිය අයියාමලෝ දෙදෙනාගේ ද උපකාරය ඇතිව මෙම ධර්ම ප්‍රචාරක ශාසනික මෙහෙවර වෙනුවෙන් කැප වී උන් වහන්සේ තම කාර්යය පිරිසිඳ ඉටු කළ සේක.

එවකට ශ්‍රී විජය මරණාධාර සමිතිය පවත්වා ගෙන යාමට භූමියක් නොමැති අර්බුදකාරී තත්ත්වයේ දී නාහිමියන් වහන්සේ ප්‍රදේශයට වන සෙත සලකා විහාරස්ථානය සතු වටිනා භූමි භාගයක් නිර්ලෝභීව පරිත්‍යාග කරමින් සිය ත්‍යාගී ගුණය මොනවට පෙන්වූ සේක.

නාහිමියන් වහන්සේගේ චරිතය ඉදුණු අන්නාසි ගෙඩියක් බඳු ය. එනම් පිටතින් රළු බවක් පෙනුණ ද අභ්‍යන්තරයෙන් ඉතා කාරුණික චිත්ත ස්වභාවයෙන් සමාජයේ කාහට වුව ද සෙත සැලසූ බව ප්‍රසිද්ධ රහසකි. එකල ශ්‍රී පියනන්ද දහම් පාසලෙන් දහම් අධ්‍යාපනය ලද දරුවෝ සහ අතීතය දන්නෝ ඒ බව නිතර සිහිපත් කරති.

සම්බුද්ධ ශාසනයෙහි පැවැත්ම උදෙසා සරණපාල සඟ පරපුරේ ආරම්භක විහාරස්ථානය වන මෙම විහාරස්ථානය තුළින් ශාසන හිතකාමී ගිහි පැවිදි ශිෂ්‍ය පරපුරක් නිර්මාණය කිරීම නාහිමියන් වහන්සේගේ උතුම් ශාසනික කාර්ය භාරයයි. එහි දී තම ශිෂ්‍යයන් නොවූවත් තමන් වහන්සේගෙන් පිහිටක් පතා පැමිණි සියල්ලන් සම සිතින් ඉවසූ උන් වහන්සේ සැමට ම දයාබර ගුරු පියෙක් වූ සේක.

උන් වහන්සේ විසින් තම ශිෂ්‍ය රත්නය ලෙස සසුනට දායාද කළ, අප ගුරුදේවෝත්තම අපවත් වී වදාළ ධර්මාචාර්ය වලානේ සද්ධානන්ද නාහිමිපාණන් වහන්සේ දම් දෙසීමට උපන් හපන්කම් දැක්වූ වාග් චාතුර්යයෙන් හා ඥානයෙන් හෙබි යතිවරයෙකි. එසේ ම දැනට සිංගප්පූරුවේ ලංකාරාමයේ වැඩ සිටින නීතිඥවේදී නාකුළුගමේ සුමන හිමියෝ ද, කඩවත ප්‍රදේශයේ වැඩ සිටින මාවනැල්ලේ

සෝරත හිමියෝ ද, ශාස්ත්‍රවේදී ජී.එම්. සුගතදාස පෙරේරා, ශාස්ත්‍රවේදී සෝමදාස විජේසූරිය යන ගිහි ශිෂ්‍යයෝ ද නාහිමියන් ඇසුරෙහි හැදී වැඩුණ විද්වත්හු වෙති.

නාහිමියන්ගේ මෙකී ශාසනික සේවාව අගයමින් අමරපුර මහා නිකායෙහි කාරක සංඝ සභාව විසින් 1970ක් වූ ජූනි මස 26 වන දින සරණපාල වංශාවතංස විමල කීර්ති ශ්‍රී ගෞරව නාම සම්මුතිය සහිතව සම්මානිත වූ නායක ධුරයක් පිරිනැමීමෙන් ගෞරව උපහාර පුදන ලදි.

වෙසක් සිරිසර ධර්ම පුස්තකයේ සංස්කාරක ධුරය වසර 49ක් හොබවමින් මේ සා විශාල ශාසනික මෙහෙවරක නිරත වූ අප නාහිමියන් වහන්සේ 1984 අප්‍රේල් මස 23 වන දින රාත්‍රී 8.30ට සියලු සංස්කාරකයන්ගේ අනියත භාවය යළිත් පසක් කරවමින් සිහි නුවණින් යුක්තව අපවත් වී වදාළ සේක.

පූජ්‍ය අගුණච්චියේ සුධීරානන්ද හිමි
ශ්‍රී සරණපාල මහා විහාරය
ධම්මානන්ද මාවත වලාන, පානදුර

## 1.3 වෙසක් සිරිසර සඟරාවේ ආරම්භක සංස්කාරක එච්. පී. ජයවර්ධන මහතා



මූලික වශයෙන් තනි පුද්ගලයකුගේ ප්‍රයත්නයකින් ලොව වටා සිටින අනේක පාඨයන් සඳහා භාෂාත්‍රයකින් යුක්ත ධර්ම ප්‍රකාශනයක් වසර 57ක් පුරා සංස්කරණය කරමින් පළ කර ගෙන යාම මින් පෙර නොවූ විරූ සිද්ධියක් විය හැකි ය. ඒ සා විශාල කර්තව්‍යයකට උර දුන් ශාසනහිතකාමී ග්‍රන්ථ ප්‍රකාශකයා නමින් එච්.පී. ජයවර්ධනය.

වෙසක් සිරිසර නම් වූ මෙම ධර්ම දානමය පුස්තකය ආරම්භ කරන ලද්දේ පවුලේ කටයුත්තක් ආකාරයෙනි. පානදුරේ ශ්‍රී සද්ධර්මදාන සමිතිය මඟින් 1935 වසරේ වෙසක් පුර පසළොස්වක් පොහොය නිමිත්තෙන් මුද්‍රණය කර ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හරින ලද මෙම ප්‍රකාශනයෙහි

ආරම්භක සංස්කාරකත්වය දරන ලද්දේ පූජ්‍ය කෙසෙල්වත්තේ ජිනානන්ද මහ තෙරුන් විසිනි. දොළොස් හැවිරිදි වියේ දී ම සසුන්ගත වූ උන් වහන්සේ ජයවර්ධන පවුලේ දෙවැනි පුත්‍රයා විය. උන් වහන්සේගේ බාල සොහොයුරකු වූ අපගේ කතානායක වන 18 හැවිරිදි එච්.පී. ජයවර්ධන තරුණයා සහකාර සංස්කාරක ලෙස උන් වහන්සේට සහාය දැක්වූයේ ය. සඟරාවෙහි පිටකවරය නිර්මාණය කරන ලද්දේ එම පවුලේ වැඩිමහල් ම සොහොයුරා වූ එච්.බී.පී. ජයවර්ධන තරුණයා විසිනි. පසු කලෙක කලාභූෂණ පදවියෙන් පිදුම් ලැබූ ඔහු 1986 දී අභාවප්‍රාප්ත වන තුරු ම වෙසක් සිරිසර සඳහා පිටකවරය නිර්මාණය කළේ ය.

1917 වර්ෂයේ උපත ලද හෙක්ටර් ජයවර්ධන තරුණයා 1940 දී ගුරු වෘත්තියට ඇතුළත් වූයේ අවුරුදු 23ක් තරම් ළපටි වියේ දී ය. රජයේ ගුරු අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පති එච්.එස්. පෙරේරා මහතා විසින් ඉහළින් ම වර්ණනා කරන ලදුව ඔහු 1944 දී කොළඹ රාජකීය ප්‍රාරම්භ විද්‍යාලයේ ගුරු මණ්ඩලයට බැඳුණේ ය.

හෙක්ටර් - කමලා යුවළගේ විවාහය 1950 වසරේ පානදුර දී සිදු වූ අතර ඔහු භාරව සිටි පහේ පන්තියේ දස හැවිරිදි සිසුන් එම උත්සවයේ ආරාධිතයන් වීම ඔහුගේ ජීවිතයේ සිසුන්ට හිමි ස්ථානය කුමක් දැයි පෙන්වා දීමට කදිම උදාහරණයකි. සුවහසක් රාජකීයයන්ගේ ආදරය දිනා ගත් ජයවර්ධන ගුරුතුමා 1970 දී එහි මුල්ගුරු තනතුරට පත් වූ අතර පසු කලෙක රාජකීය කනිෂ්ට විද්‍යාලයේ ප්‍රධානාචාර්ය ධූරය ද හෙබවී ය.

යෞවන හෙක්ටර් ජයවර්ධන කලකට ඉහත දී ජාතික තලයේ මළල ක්‍රීඩකයකුව සිටි බැවින් සිය විදුහලට ජාතික ශූරතාවන් කිහිපයක් ජයග්‍රහණය කර දීමට ඔහු සමත් වූයේ ය. ක්‍රීඩා ගුරුවරයා වශයෙන් ඔහු විසින් සංවිධානය කරන ලද පාසල් ක්‍රීඩා උත්සව ඒ යුගයේ පැවැති සමාජ ක්‍රියාකාරකම් අතර ඉහළ ම තලයක පිළිගැනීමක් ලැබී ය.

ඔහු විසින් ආරම්භ කරන ලද Gateway නම් වූ වාර්ෂික පාසල් සඟරාව පාසලේ සිසුන්ගේ ලිවීමේ හැකියාව දියුණු කර ගැනීමට කදිම වේදිකාවක් විය. ලෝකයේ ප්‍රාරම්භ පාසල් සඟරා අතර ඉහළ ම තැනක තැබිය හැකි සඟරාවක් ලෙස London Times විසින් කරන ලද විචාරයකට ද පාත්‍ර වීමට ඊට හැකි විය.

ආරම්භක Smit-Mundt ශිෂ්‍යත්වලාභීන්ගෙන් අයකු වූ ජයවර්ධන ගුරුතුමා ඇමරිකා එක්සත් ජනපදයේ වසරක කාලයක් ගුරුවරයකු ලෙස සේවය කළේ ය. එහි දී ඔහු උගත් ක්‍රමවේද රැසක් රාජකීය ප්‍රාරම්භ විද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකි විය.

ඔහුගේ ශිෂ්‍යයන් විසින් දේශපාලන, ආර්ථික, සමාජයීය, රාජතාන්ත්‍රික, ශාස්ත්‍රීය සහ සාහිත්‍ය ක්ෂේත්‍රයන්හි ලබා ගෙන ඇති උසස් තත්ත්වයන් වූ කලී ගුරු වෘත්තිය කෙරෙහි ඔහුගේ තිබුණු කැප වීමත් ඔහුගේ හැකියාවත් මැනැවින් කියා පාන සාධකයන් ය.

රාජකීය ප්‍රාරම්භ විද්‍යාලයේ උප ගුරුවරයකු, ක්‍රීඩා ගුරුවරයා, ප්‍රාරම්භයේ මුල් ගුරුවරයා, රාජකීය කනිෂ්ට විද්‍යාලයේ විදුහල්පතිවරයා යන කෙතරම් බරපතල වගකීම් ඇති භූමිකාවක් සිය රාජකාරි ජීවිතය තුළ නිරූපණය කළත් සිය පැවිදි සහෝදරයාගේ සඟරාවේ සහකාර සංස්කාරක ධුරයේ වගකීම් පැහැර හැරීමට එය හේතුවක් කර ගත්තේ නැත. එච්.පී. ජයවර්ධන විදුහල්පතිතුමා 1975 දී විශ්‍රාම ලැබූ බැවින් වෙසක් සිරිසර වෙනුවෙන් වැඩි කාලයක් මිඩංගු කිරීමට ඔහුට හැකියාව ලැබිණ. කල් ගත වද්දී, රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෝ කිහිපදෙනෙක් ද තමන්ට ළමා කල මඟ පෙන්වූ ගුරුතුමන්ගේ මහඟු කාර්යයට මුදලින් හා වෙනත් අයුරින් උපකාර කරමින් ඔහුට අත්වැලක් වූහ.

වෙසක් සිරිසර ප්‍රධාන සංස්කාරක පූජ්‍ය කෙසෙල්වත්තේ ජිනානන්ද ස්වාමීන් වහන්සේ 1984 වර්ෂයේ දී අපවත් වීමෙන් අනතුරුව එම පුරප්පාඩුව පිරවූයේ එච්.පී. ජයවර්ධන මහතා ය. සිය ජීවිතයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි කාලයක් වෙසක් සිරිසර වෙනුවෙන් කැප කළ ඔහුට 80 දශකය අවසන් වන විට තමන් දිවි දෙවෙනි කොට සුරැකි සඟරාවේ අනාගතය පිළිබඳව බියක් දැනෙන්නට විය.

එවකට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බෞද්ධ සංවිධානයක් ලෙස ප්‍රචලිතව පැවැති රාජ්‍ය සේවා බෞද්ධ සංගමය වෙත සඟරාවේ අනාගතය භාර දීම සඳහා 1991 දී කරනු ලැබූ ඔහුගේ තෝරා ගැනීම නිවැරදි විය. ප්‍රකාශන අයිතිය වෙනස් වුවත් සඟරාවේ සංස්කාරක ධුරය හෙබවූයේ ජයවර්ධන මහතා ම විය. රාජ්‍ය සේවා බෞද්ධ සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද පළමු වැනි වෙසක් සිරිසර කලාපය නිකුත් වූවාට පසු, එනම් 1992 සැප්තැම්බර් මස 3 වන දින,

මෙම පරාර්ථකාමී ධර්ම ප්‍රචාරකයා වසර 75ක් වූ සිය දිවි සැරිය නිම කළේ ය. මෙතෙක් සිය හිස මත පැවැති බරක් බිම තැබුවාක් මෙන් සැහැල්ලුවෙන් ඔහුට සමුගැනීමට හැකි වූයේ සිය මරණය පිළිබඳව ඉඟියක් කල් ඇතිව ඔහුගේ විඥ්ඥාණයට ඇතුළු වී තිබුණා දැයි සැකයක් ඉතිරි කරමිනි.

එච්.පී. ජයවර්ධන මහතාගේ අභාවයෙන් පසුව වුව ද ඔහුගේ බිරිඳ වන කමලා ජයවර්ධන මහත්මිය වෙසක් සිරිසර සඟරාව අත් හැරියේ නැත. වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුවෙහි සහකාර ලේකම් තනතුර හොබවමින් සඟරාව බෙදා හැරීම, ආධාර එකතු කිරීම, සඟරා ගබඩා කර තැබීම යනාදී වශයෙන් 2011 මැයි මස අභාවප්‍රාප්ත වන තුරු ම සඟරාවේ චිරස්ථිතිය වෙනුවෙන් ඇය කළ කැපවීම් අමතක කළ නොහැකි ය.

සිය පියාණන්ගේ ධර්ම දානමය පින්කමට උර දෙමින් අදටත් වෙසක් සිරිසර ධර්ම පුස්තකයට ආධාර කරමින් අප හා රැඳෙන ඔහුගේ දරුවන් වන හේමකාන්ති හා විජිත ද මෙල් දෙපළ, හරිත හා ගීතා ජයවර්ධන දෙපළ, ඇන්ජලිකා හා දිනේෂ් සිරිසේන දෙපළ, ඩෙරික් හා දනීෂා ද මෙල් දෙපළ විසින් සිය පියාගේ ජන්ම ශත සංවත්සරය සමරනු වස් වෙසක් සිරිසර සඟරාවට විශාල ධන පරිත්‍යාගයක් කළ බව ද මෙහි දී කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

තමන්ගේ කීර්ති ප්‍රශංසා උදෙසා හුදෙක් ම සැලසුම් කරන ලද අරමුණු ඉටු කර ගැනීමට අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කර සාර්ථක ඵල නෙළා ගත් බොහෝ දෙනෙක් තමන් අයත් සමාජයේ වීරයන් බවට පත් වී ඇත. එහෙත් බෞද්ධ ප්‍රතිපත්ති අනුව නම් නියම වීරයකු වශයෙන් පුළුල් වශයෙන් හැඳින්විය හැක්කේ මිනිස් සංහතියේ යහපත තකා පරාර්ථකාමී උදාර පරමාර්ථ සඳහා ඇපකැප වී, දැඩි අදිටනින් ක්‍රියා කරමින්, විශිෂ්ට ප්‍රතිඵල අත් කර ගන්නා අයෙකි. එච්.පී. ජයවර්ධන මහතා වූ කලී එවැනි ගණයේ වීරවරයෙකි.

ධර්ම ප්‍රචාරය සඳහා තම ජීවිත කාලයේ දී ඉමහත් කැපවීමකින් යුතුව අනගි සේවයක් ඉටු කළ මෙම ආදර්ශවත් බෞද්ධ උපාසකතුමාණන්ට බෞද්ධයකු වශයෙන් බලාපොරොත්තු විය යුතු පරම සැපත වන අජරාමර නිවන් සැපත අත් වේවා!

තොරතුරු මූලාශ්‍රය

පසුගිය වෙසක් සිරිසර කලාපවල එච්.පී. ජයවර්ධන මහතා පිළිබඳව පළ වූ ලිපි ඇසුරෙනි.

- රාජා කුරුප්පු මහතා, වෙසක් සිරිසර සංස්කාරක
- කමලා ජයවර්ධන මහත්මිය, එච්.පී. ජයවර්ධන මහතාගේ බිරිඳ
- නෙවිල් පියදිගම මහතා, වෙසක් සිරිසර සංස්කාරක (ඉංග්‍රීසි)
- හේමකාන්ති ද මෙල් මහත්මිය, එච්.පී. ජයවර්ධන මහතාගේ දියණිය

(ඉහත ලිපිවල පිටපත් ලබා දුන් එච්.පී. ජයවර්ධන මහතාගේ ඥාති පුත් දීපාල් ජයවර්ධන මහතාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.)

## 1.4 වෙසක් සිරිසර සඟරාවේ ආරම්භක කංචුක නිර්මාණ ශිල්පී එච්. පී. ජයවර්ධන මහතා



පානදුරේ ශ්‍රී සද්ධර්මදාන සමිතිය මඟින් 1935 වසරේ වෙසක් පුර පසළොස්වක් පොහොය නිමිත්තෙන් මුද්‍රණය කර ධර්ම දානය පිණිස නොමිලේ ධර්ම පුස්තකයක් බෙදා හරින ලද අතර එම ප්‍රකාශනයෙහි ආරම්භක සංස්කාරකත්වය දරන ලද්දේ පූජ්‍ය කෙසෙල්වත්තේ ජිනානන්ද මහ තෙරුන් විසිනි. වෙසක් සිරිසර නම් වූ මෙම ධර්ම දානමය පුස්තකයේ ආරම්භ සිදු වූයේ පවුලේ කටයුත්තක් ලෙසිනි. එනම් ජයවර්ධන පවුලේ දෙවැනි දරුවා වූ උන් වහන්සේගේ බාල සොහොයුරකු වූ හෙක්ටර් ජයවර්ධන සහකාර සංස්කාරක ලෙස උන් වහන්සේට සහාය දැක්වූ අතර වැඩිමහල් සොහොයුරා වූ එච්.බී.පී. ජයවර්ධන විසින් මෙම පොතෙහි පිටකවරය නිර්මාණය කරන ලදි.

හල්පෙ වත්තෙගේ බැස්ටියන් පීරිස් ජයවර්ධන නම් වූ මෙම චිත්‍ර ශිල්පියා උපත ලැබුවේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුරේ දී 1903 ඔක්තෝබර් මස 16 වැනි දා ය. ඔහු කලාශූරී ජේ.ඩී.ඒ. පෙරේරා, ඩබ්ලිව්.එස්. ද මැල් සහ ජේ.ඩී. මැන්ඩිස් යන මහතුන් යටතේ චිත්‍ර කලාව හැදෑරූ පසුව කොළඹ කාර්මික විද්‍යාලයේ දී චිත්‍ර හා ගෘහනිර්මාණ ශිල්ප ප්‍රගුණ කර එම කලා විෂයයන් පිළිබඳව නිපුණත්වයක් ලබා ගත්තේ ය.

පානදුර ජාතික කලා පෙරමුණේ ලලිත කලායතනය බිහි කර ලීමට පුරෝගාමී වූ ජයවර්ධන මහතා දිගු කලක් එහි අධ්‍යක්ෂ ධුරය හෙබවූයේ ය. ශ්‍රී ලංකා විද්‍යෝදය, විද්‍යාලංකාර සරසවි ආරම්භ කළ මුල් අවස්ථාවේ දී උපාධිධාරී භික්ෂූන් වහන්සේලාට පිළිගැන්වීම සඳහා උපාධි වටාපතක් නිර්මාණය කරන ලද්දේ ඔහු විසිනි. රජයේ අවශ්‍යතාවන් අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කොඩි වරින් වර සකස් කිරීමේ කාර්යය ඔහු වෙත පැවැරී තිබූ අතර පළාත් පාලන අමාත්‍යාංශයේ අවශ්‍යතා අනුව උදාගම් සඳහා ද කොඩි රාශියක් ඔහු විසින් නිර්මාණය කරනු ලැබ ඇත. දේශීය චිත්‍ර කලා අධ්‍යයනය කරමින් ඔහු විසින් සාරගර්භ විචාරාත්මක ලිපි රාශියක් ලියා ඇත. මීට අමතරව බුද්ධ ප්‍රතිමා සහ වීරවරයන්ගේ ප්‍රතිමා ද ඔහු විසින් නිර්මාණය කර ඇත.

ගෘහනිර්මාණ ශිල්පියකු වශයෙන් ඔහු විසින් කලාත්මකව නිර්මාණය කරන ලද සැලැසුම් රාශියක් වේ. කතරගම බෝධිය අබියස විහාර ගෙයි සැලැස්ම, කිරි වෙහෙර අසල දැඩිමුණ්ඩ දේවාලය, පානදුර පල්ලියමුල්ල නිග්‍රෝධාරාමයේ සැලැස්ම, පානදුරේ කෙසෙල්වත්තේ ශ්‍රී බෝධි චෛත්‍යාරාමයේ ප්‍රාකාර පඩිපෙළ යනාදිය ඒ අතර වෙයි.

එච්.බී.පී. ජයවර්ධන මහතා විසින් දක්ෂ ගෝලයන් රාශියක් බිහි කර ඇත. ඔවුන් අතරින් බන්ධුල හරිස්චන්ද්‍ර, ලයනල් පීරිස් යන මහතුන් ප්‍රමුඛත්වය ගනී.

වෙසක් සිරිසර සඟරාව ආරම්භයේ සිට ම එහි පිටකවරය නිර්මාණය කළ බැස්ටියන් ජයවර්ධන මහතා 1986 දී අභාවප්‍රාප්ත වන තුරු ම අඛණ්ඩව එම දායකත්වය සැපයූවේ ය. එයින් අනතුරුව වෙසක් සිරිසර සඟරාවේ පිටකවරය සැරසුණේ ඔහුගේ අඩිපාරේ ම ගිය ඥාති පුත්‍රයකු වූ දීපාල් ජයවර්ධන මහතාගේ සිතුවම්වලිනි.

අඩ සියවසකට අධික කාලයක් එමෙන් ම සිය ජීවිතයෙන් අඩකට වඩා වැඩි කාලයක් වෙසක් සිරිසර සඟරාව වෙනුවෙන් පිටකවර නිර්මාණය කළ එච්.බී.පී. ජයවර්ධන මහතා පිළිබඳව ඉහත තොරතුරු ලබා දුන් ඔහුගේ ඥාති පුත් දීපාල් ජයවර්ධන මහතාට සංස්කාරක කමිටුව වෙනුවෙන් මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි.

## 1.5 වෙසක් සිරිසර සමඟ මුද්‍රණය කරන ලද අතිරේක පොත්

| | පොතේ නම | ලේඛක | වර්ෂය |
|---|---|---|---|
| 1 | කර්ම විපාක | පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි | 2548/ 2004 |
| 2 | පසුපසින් එන කර්මය | පියසේන අදිකාරි මහතා | 2549/ 2005 |
| 3 | ගිම්හානයේ වසන්තය නම් රතන සූත්‍රය | පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමි | 2550/ 2006 |
| 4 | නිවන | පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි | 2551/ 2007 |
| 5 | නොපෙනෙන ලොව සැබෑ තතු | පූජ්‍ය වේදෙනියේ නන්දසීල හිමි | 2552/ 2008 |
| 6 | සිගාලෝවාද සූත්‍රය හෙවත් ගිහි විනය | පූජ්‍ය යටියන මංගල ඉසි හිමි | 2553/ 2009 |
| 7 | පින් - කුසල් | පූජ්‍ය වේදෙනියේ නන්දසීල හිමි | 2554/ 2010 |
| 8 | දෙව්ලොවට ඉනිමඟ | පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි | 2555/ 2011 |
| 9 | කර්ම විපාක | පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි | 2556/ 2012 |
| 10 | බුදුසිරි - බුදුනැණ | පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි | 2557/ 2013 |
| 11 | මහ බෝසතාණෝ | පූජ්‍ය දිගන සුගතවංශ හිමි | 2558/ 2014 |
| 12 | මරණයට බිය නොවෙමු | පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි | 2559/ 2015 |
| 13 | පස්පව් සහ පන්සිල් පිළිවෙත | එම්.බී. පේමසේන මහතා | 2560/ 2016 |
| 14 | කර්මය කර්ම විපාකය පුනර්භවය | පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි | 2561/ 2017 |

| | | | |
|---|---|---|---|
| 15 | සෝතාපත්ති | පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි | 2562/ 2018 |
| 16 | අසිරිමත් සවැදෑරුම් බුදුනැණ | පූජ්‍ය දිගන සුගතවංශ හිමි | 2563/ 2019 |
| 17 | පඤ්චවිධ ඥෙයමණ්ඩල ධර්ම දේශනා | පූජ්‍ය මකුලෑවේ විමල හිමි | 2564/ 2020 |
| 18 | ගිම්හානයේ වසන්තය නම් රතන සූත්‍රය | පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමි | 2565/ 2021 |
| 19 | අප්පමාදෝ අමතපදං | පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි<br>පූජ්‍ය දාස්වත්තේ සුමනසීල හිමි | 2567/ 2023 |

## 1.6 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආරම්භක ප්‍රකාශන කමිටුව

සභාපති - ටී.කේ. දසනායක මහතා

ලේකම් - පී.බී. වේරගොඩ මහතා

භාණ්ඩාගාරික - කේ.ඒ. නන්දසේන මහතා

කමිටු සාමාජික - නෙවිල් පියදිගම මහතා

## 1.7 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආරම්භක වෙසක් සිරිසර සංස්කාරක මණ්ඩලය

සංස්කාරක - එච්.පී. ජයවර්ධන මහතා

සහකාර සංස්කාරක (සිංහල) - සිරිසේන මලලසේකර මහතා

සහකාර සංස්කාරක (ඉංග්‍රීසි) - රාජා කුරුප්පු මහතා

සහකාර සංස්කාරක (දෙමළ) - එම්.එම්. උවයිස් මහතා

# රාජ්‍ය සේවා බෞද්ධ සංගමය 02

## 2.1 ඉතිහාසය

රජයේ සේවයේ නියුතු සහ විශ්‍රාමික සෑම තරාතිරමක ම බෞද්ධ සේවක සේවිකාවන් වෙනුවෙන් පිහිටුවා ඇති, පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපිත පැරණිතම බෞද්ධ සංගමය වන්නේ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයයි. මෙම සංගමය එවකට රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර හෙබවූ එන්.ක්‍යු. දියෙස් මහතාගේ අප්‍රතිහත ධෛර්යයේත්, නොපසුබස්නා උත්සාහයේත් ප්‍රතිඵලයක් ලෙස 1954 ඔක්තෝබර් මස 05 වන දින ආරම්භ කරන ලදි. එහි ආරම්භක ගරු සභාපති දියෙස් මහතා වූ අතර ගරු ලේකම් ධුරය දැරුවේ ගුණසීල විතානගේ මහතා ය. ආරම්භයේ දී රාජ්‍ය සේවා සහ පළාත් පාලන සේවා බෞද්ධ සමිති සම්මේලනය නමින් හැඳින්වූ මෙහි පළමු වන මහා සභා රැස්වීමට රජයේ සහ පළාත් පාලන සේවාවේ බෞද්ධ සමිති සමාගම් 23ක සාමාජිකයෝ 33 දෙනෙක් සහභාගි වූහ.

වසර හාරසියයකට අධික කාලයක් මුළුල්ලේ බටහිර පාලනයකට නතුව තිබූ අප මව්බිමට 1948 දී නිදහස ලැබුණ ද එහි රාජ්‍ය සේවය තුළ ක්‍රිස්තියානි නැඹුරුවක් පැවැතිණ. කතෝලික හා ක්‍රිස්තියානි ලබ්ධික රජයේ සේවකයන් රිසි සේ ආගමික වතාවත්වල නිරත වූවත් රජයේ සේවයේ නියුතු බෞද්ධයන්ට ප්‍රසිද්ධියේ බෞද්ධ වත්පිළිවෙත් ඉටු කිරීමේ හැකියාවක් නොතිබිණ. පන්සල කේන්ද්‍ර කර ගත් අපේ අධ්‍යාපන ක්‍රමයත්, හාමුදුරුවන් හා බැඳුණ ජීවන රටාවත් පාලකයන් විසින් කඩාකප්පල් කර දැමූ බැවින් බෞද්ධ ගිහි පැවිදි අන්‍යෝන්‍ය සම්බන්ධතාව බිඳ වැටී තිබිණ. භේද කොට ආණ්ඩු කිරීමේ බටහිර ප්‍රතිපත්තිය අධිරාජ්‍යවාදීන් විසින් ඉහළින් ම පිළිපැදීම නිසා බෞද්ධයන්

අතර ද උස් පහත්, කුල භේද වැනි කරුණු හේතු කොට ගෙන අසමගිය වර්ධනය වී තිබිණ.

මෙම තත්ත්වයන්ට එරෙහිව නැගී සිටීම සහ ක්‍රිස්තියානි බලවේග යටපත් කර ගෙන බෞද්ධයන් ඒකරාශී කිරීම එවකට පැවැති පාලන තන්ත්‍රය යටතේ ලෙහෙසි පහසු කාර්යයක් නොවී ය. එහෙත් එවැනි අභියෝගාත්මක භාරදූර වගකීමක් සියතට ගෙන කටුකොහොල් මතින් වුව රාජ්‍ය සේවා සහ පළාත් පාලන සේවා බෞද්ධ සමිති සම්මේලනය ආරම්භ කළ දියෙස් මහතා පළමු වසර ඇතුළත ම අති දැවැන්ත වූ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් වූයේ ය. සෑම රජයේ කාර්යාලයක ම මෙම සම්මේලනයේ සාමාජිකත්වය ලබා ගත් බෞද්ධ සමිති ආරම්භ කර ඒ මඟින් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, සර්ව රාත්‍රික පිරිත් දේශනා, ආරෝග්‍යශාලා ගිලානෝපස්ථානය, ශ්‍රමදාන, දුගීමගී යාචකාදීන්ට දානමාන පිරිනැමීම යනාදී පින්කම් සංවිධානය කෙරිණ.

බෞද්ධ සංකල්ප හා බැඳුණ සිංහල සංස්කෘතියට නිසි තැනක් ලබා ගැනීම මෙම සම්මේලනයෙන් ඉටු වූ කර්තව්‍යයන් අතර ප්‍රධාන තැනක් ගනී. අදටත් රටෙහි ප්‍රධාන ම පුද්ගලයා වන ජනාධිපති, උත්තරීතර ම ආයතනය වන පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන් පවා අඳින ආර්ය සිංහල ඇඳුම ජාතික ඇඳුම බවට පිළිගැනීමක් ඇති කිරීම එයින් පළමුවැන්න විය. එවකට කතෝලික හා ක්‍රිස්තියානි උරුවක් ගත් ඉංග්‍රීසි නම්වලින් හැඳින්වුණ සිංහල බෞද්ධ රජයේ සේවකයන්ට සිය නම සිංහල නමකට වෙනස් කර ගැනීමට අවශ්‍ය නම් භාණ්ඩාගාර චක්‍රලේඛයක් මඟින් ඒ සඳහා ප්‍රතිපාදන සැලසීම සහ සිය ඉංග්‍රීසි නම වෙනස් කර ගැනීමට අදහස් කරන සිංහලයන් සඳහා ආර්ය සිංහල නාමාවලියක් සකස් කිරීම දෙවැන්න විය. අදටත් අප භුක්ති විඳින පොහොය නිවාඩුව ද මෙම දැවැන්ත සටනෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබූ තවත් එක් ජයග්‍රහණයකි.

බුදු රජාණන් වහන්සේගේ උත්පත්තියෙහි 2500 වැනි ජයන්තිය සැමරීමේ උත්සවය (බු.ව. 2500) ව්‍යවහාර වර්ෂ වන ක්‍රි.ව. 1956 වසර පුරා ම ලංකාවේ සෑම ප්‍රදේශයක ම අතිඋත්කර්ෂවත් අන්දමින් සැමරීමට මෙම බෞද්ධ පුනරුදය ඉමහත් පිටිවහලක් විය. එන්.ක්‍යු. දියෙස් මහතාගේ මඟ පෙන්වීම අනුව එවකට රාජ්‍ය සේවා සහ පළාත් පාලන

සේවා බෞද්ධ සමිති සම්මේලනය නමින් හැඳින්වූ මෙම සාමූහිකයෙහි සාමාජිකයන් විසින් දියත් කළ එම බලවේගය විවිධ අංශ ඔස්සේ විහිදී ගොස් එතෙක් භේද භින්නව පැවැති ගිහි පැවිදි සම්බන්ධතාව යළි ස්ථාපනය කිරීමට මූලික ශක්තිය බවට පත් විය. පන්සල මූලික කොට ගෙන අතීතයේ පැවැති සමාජ ක්‍රමයට යළි ප්‍රවිෂ්ට වීමේ හැකියාවක් එවකට පැවැති රාජ්‍ය යාන්ත්‍රණය තුළ නොතිබුණ නමුත් යම් තාක් දුරට ගමත් පන්සලත් යා කිරීමට ඒ තුළින් හැකි විය. ගමේ පන්සල අමතක කොට පිට ප්‍රදේශවල ප්‍රසිද්ධ හා සෞභාග්‍යවත් විහාරස්ථාන කරා ඇදී ගිය බෞද්ධ ප්‍රජාව නැවත සිය ගමේ පන්සල වෙත ඇද බැඳ තබා ගැනීමට එයින් මං සැලසිණ.

දැඩි ක්‍රිස්තියානි බලපෑමක් යටතේ බෞද්ධ වත්පිළිවෙත්වලට වැට බැඳි තිබූ යුගය නිමා කර පුදපූජා සඳහා ලැබුණ නිදහස සිත් සේ භුක්ති විඳීමට බෞද්ධයන් රොද බැඳ ගත් බැවින් ශීල භාවනා, වන්දනා ගමන්, පූජා වැඩසටහන්, ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා, දහම් පොත්පත් පළ කිරීම යනාදිය මෙම සම්මේලනයේ මැදිහත් වීමක් සමඟ දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කෙරිණ. එම වැඩසටහන්වලට රාජ්‍ය සේවා සහ පළාත් පාලන සේවා නිලධාරීන්ගේ සහභාගිත්වය ඉතා ඉහළ මට්ටමක පැවැතුන අතර එයින් දිරි ගැන්වුණ සාමාන්‍ය පොදු මහජනතාව ද ප්‍රසිද්ධියේ බෞද්ධ වත්පිළිවෙත්වල නියැලීමට නිර්භීත වූහ.

වැවක වාන්දොරටු විවෘත කළ සැණින් ජලය ගලා බසින වේගය ඉතා අධික වන නමුත් ජල මට්ටම අඩු වන විට එකී වේගය ක්‍රමයෙන් අඩු වී සාමාන්‍ය ඇළක් දොළක් පරිද්දෙන් ජලය බැස යනු ඇත. ඒ ආකාරයට ක්‍රිස්තියානි බලපෑම් යටතේ වත්පිළිවෙත්වල නියැලීමට බෞද්ධ ජනතාවට බැඳ තිබූ වැටකඩොලු විවෘත කර දුන් අලුත, එනම් සම්මේලනයේ ආරම්භක යුගයේ බෞද්ධයන් තුළ තිබුණ උද්‍යෝගය දශක දෙකක පමණ ඇවෑමෙන් ඇල්මැරී යන සෙයක් දක්නට ලැබිණ. බෞද්ධ රාජ්‍ය සේවකයන් පෙළූ දැවෙන ප්‍රශ්න සෑහෙන ප්‍රමාණයක් මේ වන විට විසඳී තිබූ බැවින් ශාඛා සමිතිවල උනන්දුව ක්‍රමයෙන් අඩු වී යාමෙන් සමිති සම්මේලනය අක්‍රිය තත්ත්වයකට පත් වෙමින් තිබිණ.

සමිති සම්මේලන හරහා නොයා කාලයේ තාලයට අනුව වෙනස් වෙමින් රජයේ සේවයේ නියුතු සහ විශ්‍රාමික නිලධාරීන්ට පෞද්ගලිකව

සාමාජිකත්වය ලබා ගත හැකි ආකාරයේ සමිතියක් බවට පරිවර්තනය කිරීම සඳහා වූ නව ව්‍යවස්ථාව 1980.10.28 දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේ දී සම්මත විය. ඒ අනුව වර්තමානයේ භාවිත කරනු ලබන රාජ්‍ය සේවා බෞද්ධ සංගමය යන නමින් 2008 අංක 03 දරණ පාර්ලිමේන්තු පනතක් මඟින් සංස්ථාගත කිරීමට ද කටයුතු යෙදිණ.

---

මූලාශ්‍රයඃ

සංගමයේ 50 සහ 60 සංවත්සර සඳහා පළ කරන ලද සමරු කලාපවල ලිපි

## 2.2 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආදිකර්තෘ එන්. ක්‍යු. දියෙස් මහතා



අද අප සාමාජිකත්වය දරන 70 වසරක් සපිරූ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ නිර්මාතෘ සහ ප්‍රථම සභාපති වූ එන්.ක්‍යු. දියෙස් මහතා ශ්‍රී ලංකා සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

පුතුන් අට දෙනකු සහ දියණියන් තිදෙනකු සිටි පොන්නහැන්නැදිගේ චාල්ස් හෙන්රි ඩයස් මහතා සහ වරුසහැන්නැදිගේ ඇංජිලා ඇලන් ප්‍රනාන්දු යුවලගේ තුන් වැනි පුතා ලෙස නීල් ක්වීන්ටස් නමින් පානදුර කේතුමතී මැදුරේ උපත ලද ඔහු අධ්‍යාපනය ලැබුවේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙනි. එවකට පැවැති අධ්‍යාපන ක්‍රමය අනුව ඔහු ලන්ඩන්හි විශ්වවිද්‍යාලයෙන් උපාධිය සමත්ව මිඩ්ල් ටෙම්පල්හි බැරිස්ටර්වරයකු බවට පත් වූයේ ය. ලංකා සිවිල් සේවා විභාගය සමත් වූ තරුණ නීල් ක්වීන්ටස් 1936 ජනවාරි මාසයේ සිට ලංකාවේ ආණ්ඩුකාරතුමන් වෙතින් ආධුනික සිවිල් සේවා නිලධාරියකු වශයෙන් මඩකලපුවේ කච්චේරියට පත් වීම ලැබුවේ ය.

1937 දී සිවිල් සේවයෙහි II වන ශ්‍රේණියට උසස් කරනු ලැබ මහා භාණ්ඩාගාරයට අනුයුක්ත කරනු ලැබූ මෙම තරුණ නිලධාරියා 1939

දී සන්නිවේදන හා වැඩ අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරෙහි රාජකාරිවල අමතරව සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ගුවන් යානා රෙජිස්ට්‍රාර් යන තනතුරු දෙකෙහි රාජකාරි ද ආවරණය කළේය.

ඉන් අනතුරුව වරින් වර බෙලිඅත්ත, මතුගම, ගම්පොල, මන්නාරම යන කොට්ඨාශවල උපදිසාපති තනතුරු හෙබවූ ඔහු මාතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල පළාත් භාර ආණ්ඩුවේ ඒජන්තගේ (දිසාපති) සහකාර ලෙස කටයුතු කළේ ය.

ආරම්භයේ සිට ම විනයගරුක, නීතිගරුක රජයේ සේවකයකු වූ තරුණ නීල් ක්වීන්ටස් ඉහළ පෙළේ දේශපාලන බලවේගවලට අභියෝග කළේ සිය රැකියාව පවා පරදුවට තබමිනි. එහි පළමු පියවර වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ සේවයෙහි යෙදී සිටිය දී පුරප්පාඩු වූ ගම්මුලාදෑනි තනතුරකට එවකට දෙනියායේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ආධාරකරුවකු නම් කිරීම ප්‍රතික්ෂේප කර නිසි ක්‍රමවේදය යටතේ සුදුස්සකු තෝරා පත් කර ගැනීමට පියවර ගැනීම පෙන්වා දිය හැකි ය. මෙහි දී කෝපයට පත් උක්ත මන්ත්‍රීවරයා ස්වදේශ කටයුතු අමාත්‍යවරයාට පැමිණිලි කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය සේවා කොමිසමේ රෙගුලාසි උල්ලංඝනය කිරීමට විරුද්ධ වූ මෙම තරුණ සිවිල් සේවකයාට ත්‍රිකුණාමලයට ස්ථාන මාරුවක් ලැබිණ.

තමාට සිදු වූ අසාධාරණයට සිය අප්‍රසාදය පළ කිරීමට මෙම කලාකාමී හෙළ වීර පුත්‍රයා තෝරා ගත්තේ අමුතු ම කලාත්මක පැතිකඩකි. බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලැබූ නමුත් තවමත් බ්‍රිතාන්‍ය නෞකා හැසිරවීමේ මූලස්ථානය ත්‍රිකුණාමලය වරාය විය. එබැවින් මෙම නෞකාවල කපිතාන්වරුන් විසින් කැඳවනු ලබන මත්පැන් සාදවලට ත්‍රිකුණාමලය උපදිසාපතිට ද ආරාධනා කිරීම සාමාන්‍ය සිරිතකි. මෙම සාදවලට සහභාගි වන්නන් යුරෝපීය ඇඳුමෙන් සැරසී සිටීම සම්ප්‍රදායක් වුවත් ක්ෂණිකව ක්‍රියාත්මක වූ දියෙස් තරුණයා වැල්ලවත්තේ ඇඳුම් මසන්නකු ලවා උත්සව අවස්ථාවනට සරිලන ආකාරයේ ජාතික ඇඳුම් කට්ටල තුනක් මස්සවා ත්‍රිකුණාමලයට ගෙන්වා ගත්තේ ය. ජාතික ඇඳුමකින් සැරසී රාජකාරි උත්සව අවස්ථාවකට සහභාගි වූ ප්‍රථම සිවිල් සේවා නිලධාරී වශයෙන් දුටු දුටු සියල්ලන්ගේ ඇහිබැම් නළලට නංවා ලීමට ඔහු සමත් විය.

ඔහුගේ සීතල යුද්ධය එයින් නිම වූයේ නැත. නිදහස් ලංකාවේ පළමු අග්‍රාණ්ඩුකාර සර් හෙන්රි මන්ක් මේසන් මුවර් විසින් දිසාපතිවරුන් සහ උපදිසාපතිවරුන් සඳහා එකල ක්වීන්ස් හවුස් නමින් හැඳින්වූ රජගෙදර දී පිරිනමන ලද රාත්‍රී භෝජන සංග්‍රහයට ද දියෙස් මහතා සහභාගි වූයේ ජාතික ඇඳුමෙනි. සම්ප්‍රදායානුකූලව අමුත්තන් පිළිගැනීම සඳහා පෝටිකෝවේ රැඳී සිටි ස්වදේශ කටයුතු අමාත්‍යවරයා මෙම රෙදි බැනියම්කාරයාට අතට අත දීම ප්‍රතික්ෂේප කළ අතර අග්‍රාමාත්‍යවරයා පවා ඉවත බලා ගත්තේ ය. හිතුවක්කාර දියෙස්ගේ පූර්ව ක්‍රියාකාරකම් පිළිබඳව දැන සිටි බ්‍රිතාන්‍ය ජාතික අග්‍රාණ්ඩුකාරවරයා මෙහි දී සිය මහාත්මා ගතිය ප්‍රකට කරමින් සම්ප්‍රදාය පසෙකට ලා දියෙස් යුවළ පිළිගැනීමට ඉදිරියට පැමිණියා පමණක් නොව අතට අත දී උත්සව ශාලාව වෙත පෞද්ගලිකව ම කැඳවා ගෙන ගියේ ය.

එසේ වුවත් ඔවුන් දෙපළට භෝජන මේසයෙහි දී හිමි වූයේ කුඩම්මාගේ සැලකිලි ය. සහෝදර සිවිල් සේවා නිලධාරීන් පවා ඔවුන් සමඟ කතාබහ නොකළ අතර වේටර්වරුන් පවා ඔවුන් ගණන් ගන්නා බවක් නොපෙනිණ. රාත්‍රී භෝජන සංග්‍රහය අවසානයේ එන්.ක්‍යු. දියෙස් මහතා සිය නිවෙස කරා ගියේ කැළැල් වූ ආත්මාභිමානය නිසා ක්‍රෝධයෙන් පිපිරෙමිනි. ඔහු මේ මදිපුංචිකම්වලට මුහුණදුන්නේ තමන් උපන් දේශයේ දී තමන්ගේ ජාතික ඇඳුම ඇඳ උත්සවයකට සහභාගි වූ වරදට ය. බටහිරට නතු වූ එක්සත් ජාතික පක්ෂයේ පාලන තන්ත්‍රය පරදවා සිංහල ජාතියට සහ බුදුසමයට ගරු කරන ජාතික ආණ්ඩුවක් පිහිටුවා මිස ආපසු නොහැරෙමැයි යන ස්ථිර අධිෂ්ඨානය ඔහුගේ සිතෙහි පැළපදියම් වූයේ මේ අවාසනාවන්ත රාත්‍රියේ දී ය.

ශතවර්ෂ හතරහමාරක් පරාධීනව සිට 1948 වර්ෂයේ දී අප රට දේශපාලනික වශයෙන් නිදහස ලැබූවත් එතුමා සිවිල් සේවයෙහි නිරතව සිටි අවධියේ දී රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ රජයේ වගකිව යුතු උසස් පදවිවලට පත් වූවෝ වැඩි ගණනක් කතෝලික හා ක්‍රිස්තියානිහු වූහ. අප රටේ කතෝලික බලය නඟා සිටුවීමට බටහිරෙන් ලැබී ඇති අනුබලය නිසා බෞද්ධයන්ට සෑම අතින් ම බලවත් හානියකට මුහුණපාන්නට සිදු විය. කතෝලික හා ක්‍රිස්තියානි පල්ලි යනු සංවිධානය වූ ආයතන නිසා එවැනි සංවිධාන ශක්තියක් නොමැති බෞද්ධයන්ට ඔවුන් හා තරග කිරීමට ශක්තියක් නැති විය.

1951 දී සබරගමුව පළාත් භාර ආණ්ඩුවේ ඒජන්ත (දිසාපති) වශයෙන් ස්ථාන මාරුවක් ලැබූ එන්.ක්‍යු. දියෙස් මහතා 1952 දී රත්නපුරේ දී පළමුවරට රාජ්‍ය සේවා බෞද්ධ සංගමයක් පිහිටුවූයේ ය. එම සංගමයේ අනුශාසකවරුන් වූ ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ අනුශාසනාව පරිදි දැනට බුදුසමය වැටී ඇති ප්‍රපාතය පිළිබඳව බෞද්ධ මහජනතාවට කරුණු අවබෝධ කරවීම පිණිසත්, ශාසනික දියුණුව ඇති කිරීම පිණිසත් බුද්ධ ශාසන සමිති නමින් සමිති පිහිටුවීම ආරම්භ වූයේ ඉන් අනතුරුවයි. අවසානයේ දී 3,500 ඉක්මවන සමිති සංඛ්‍යාවක් දීපව්‍යාප්තව පිහිටුවනු ලැබූ අතර මෑත යුගයේ ලංකාවේ ඇති වූ බෞද්ධ සංවිධාන අතර මේ තරම් ශීඝ්‍ර ලෙස දියුණු වී ගිය වෙනත් සංවිධානයක් නැතැයි කිව හැකි තරම්.

මේ අතරවාරයේ ඉඩම් සහ උප්පැන්න, විවාහ, මරණ රෙජිස්ට්‍රාර් තනතුරට පත් කරනු ලැබූ දියෙස් මහතාට 1953 ඔක්තෝබර් මාසයේ දී සේවය සඳහා කොළඹට වාර්තා කිරීමට සිදු විය. තම ආගමික කටයුතු වඩාත් පුළුල් ලෙස සංවිධානය කර ගැනීමට මෙය මහඟු අවස්ථාවක් කර ගත් ඔහු සෑම රජයේ කාර්යාලයක ම බෞද්ධ සමිති පිහිටුවීමට රජයේ බෞද්ධ නිලධාරීන් පෙළඹවී ය. අද වන විට රාජ්‍ය සේවා බෞද්ධ සංගමය නමින් රූපාන්තරණය වී ඇති රාජ්‍ය සේවා සහ පළාත් පාලන සේවා බෞද්ධ සමිති සම්මේලනය 1954 ඔක්තෝබර් මස 04 වැනි දා උපත ලැබුවේ එහි අග්‍ර ප්‍රතිඵලය ලෙස ය.

මෙම සම්මේලනයේ පළමු වන ත්‍රෛමාසික සාකච්ඡාව 1955 ජූනි 18 දින කොළඹ නගර ශාලාවේ දී පැවැත්වුණ අතර එහි දී රජයේ සේවකයන්ට කාර්යාලට ඇඳීම සඳහා රටෙහි දේශගුණයට සහ සංස්කෘතියට ගැලපෙන චාම් ඇඳුමක් වශයෙන් ජාතික ඇඳුම සම්මත කර ගන්නා ලදි. තව ද සියලු ම පොහොය දින රජයේ නිවාඩු දින කළ යුතු බවට ද එදින ම යෝජනාවක් ඉදිරිපත් වූ නමුත් එය ප්‍රායෝගිකව ඉටු වූයේ 1966 ජනවාරි මාසයෙන් පසුව ය.

බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී වසර 2500ක් ගත වන බුද්ධ ජයන්තිය යෙදුණේ ව්‍යවහාර වර්ෂ 1956ට ය. මේ වකවානුව තුළ රටෙහි පැවැති බෞද්ධ පුනරුදය තුළින් බුද්ධ ජයන්තිය අතිඋත්කර්ෂවත් අන්දමින් පවත්වන්නට අවශ්‍ය පසුබිම මැනැවින් සකස් විය.

එවකට පැවැති රජය අස්වී පවත්වන ලද මැතිවරණයෙන් එන්.ක්‍යු. දියෙස් මහතා සහයෝගය පළ කළ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩානායක මහතා ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණු රජය ජයග්‍රහණය කළේ ය. 1956 දී පත් වූ අභිනව අමාත්‍ය මණ්ඩලය රෙදි බැනියම් නැතහොත් ජාතික ඇඳුම ඇඳගෙන දිවුරුම් දීමට යාම අප සංගමයේ නිර්මාතෘ වසර ගණනාවක් දුටු සිහිනයක් සැබෑ වීමකි. ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල බවට පත් කිරීමේ බණ්ඩානායක පරිවර්තනය පිටුපස සිටි බලවත් හස්තය ද දියෙස් මහතා ය.

තමාගේ මැතිවරණ ජයග්‍රහණයට ඉමහත් පිටිවහලක් වූ එන්.ක්‍යු. දියෙස් මහතාට කැමති ඕනෑ ම රාජ්‍ය තනතුරක් තෝරා ගැනීමට වරමක් දීමට තරම් බණ්ඩානායක මැතිතුමා පරිත්‍යාගශීලී වූයේ ය. එවකට උසස් ම තනතුරක් වූ භාණ්ඩාගාර ලේකම් තනතුර පවා ලබා ගැනීමට ඒ තුළින් ඔහුට ඉඩ සැලසුනත් සිංහල බෞද්ධයන්ට අහිමි වූ අභිමානය නැවත ලබා දීමේ සිය අරමුණ ඉටු කර ගැනීමට එය උපකාර නොවන බව ඔහු කල්පනා කළේ ය. ඒ අනුව මෙම රජය යටතේ සංස්කෘතික අමාත්‍යාංශයක් සහ සංස්කෘතික දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලද අතර එම දෙපාර්තමේන්තුවේ පළමුවැනි අධ්‍යක්ෂ ලෙස පත් වීම ලැබූ එන්.ක්‍යු. දියෙස් මහතා 1956 සිට 1959 වන තුරු එහි සේවය කළේ ය.

1959 දී බණ්ඩාරනායක මහතා ඝාතනය වීමෙන් අනතුරුව අග්‍රාමාත්‍ය ධුරයට පත් වූ ලොව පළමුවන කාන්තාව ලෙස විරුදාවලිය ලැබූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ නිල නොලත් ප්‍රධාන උපදේශක ලෙස කටයුතු කළේ දියෙස් මහතා ය. මෙම යුගයේ දී ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම තුළින් බුදුසමය වළලා දැමීමට අටවා තිබූ එක් උගුලක් ඉවත් කිරීමට හැකි විය. දියෙස් මහතා සිය උපන් ගම වූ පානදුර ස්ථාපිත ඉතා පැරණි බෞද්ධ පාසලක් වන ශ්‍රී සුමංගල විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ ආරම්භක සාමාජිකයෙක් ද විය.

මැතිණියගේ පාලන සමයේ ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම් තනතුරට 1961 ජූනි මාසයේ දී එන්.ක්‍යු. දියෙස් මහතා පත් කරන ලදි. ඔහු විසින් සන්නද්ධ බලකායේ සංයුතිය ජනවාර්ගික අනුපාතයට අනුකූලව වෙනස් කරමින් සිංහල බෞද්ධ නිලධාරීන් සංඛ්‍යාව වැඩි වන පරිදි උචිත වෙනස්කම් සිදු කරන ලදි.

මෙතෙක් කිසි දිනෙක බෞද්ධයකු අතට පත් නොවූ අග්‍රාණ්ඩුකාර ධුරයට බෞද්ධයකු වූ විලියම් ගොපල්ලව මහතා පත් කොට, රජගෙදර බුදුමැදුරක් පිහිටුවා, සෙත්පිරිත් සජ්ඣායනා කරවා, මහදන් දී බෞද්ධ වත්පිළිවෙත් ඉටු කිරීමට සැලැස්වීම, මෙතෙක් බෞද්ධයන්ට අහිමිව තිබූ රාජ්‍ය සේවා කොමිසම සහ සේනාධිනායක පදවිය යන දෙතැන බෞද්ධයන්ට හිමි වීම යන ජයග්‍රහණ එන්.ක්‍යු. දියෙස් මහතා රෝපණය කළ බීජයේ අග්‍ර ඵල ලෙස සැලකිය හැකි ය.

මෙතෙක් කිසිදු සංවිධාන ශක්තියක් නොමැතිව කතෝලික බලවේග හමුවේ දුර්මුඛ වී සිටි බෞද්ධ රාජ්‍ය නිලධාරීන් එක ධජයක් යටතේ සංවිධානය වී ශක්තිමත්ව සිටීම අන්‍යාගමික සංවිධානවල පැවැත්මට සහ ක්‍රියාකාරිත්වයට තර්ජනයක් ලෙස ඔවුහු සැලකූහ. රාජ්‍ය බලය ද නොමඳව හිමි එම පාර්ශ්වයන්ගේ බලපෑම හේතුවෙන් එන්.ක්‍යු. දියෙස් මහතාට නොයෙකුත් අභූත චෝදනාවලට මුහුණදීමට සිදු විය.

ඉන් ප්‍රධාන ම ස්ථානයක් ගන්නේ අග්‍රාමාත්‍යතුමියගේ දැඩි විශ්වාසය දිනා ගෙන සිටි ඔහු පිළිබඳව අප්‍රසාදයක් ඇති කිරීම සඳහා බණ්ඩාරනායක මහතාගේ ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයට පිලිප් ගුණවර්ධන මහතා සමඟ එක් වී යටිකුට්ටු වැඩ කළ බවට චෝදනා කිරීමය.

එම සියලු චෝදනාවලට පිළිතුරු එතුමා රජයේ සේවයෙන් විශ්‍රාම යාමත් සමඟ ම අප සංගමයේ සභාපති තනතුරෙන් ද ඉවත් වන අවස්ථාවේ දී කරන ලද කතාවෙහි අන්තර්ගත විය. එම කතාව අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ගේ පෙරවදනක් ද සහිතව 1965 දී අප සංගමය මඟින් ප්‍රකාශයට පත් කෙරිණ.

කෙසේ වෙතත් විරුද්ධවාදීන්ගේ ප්‍රබලත්වය කෙතරම් දැයි කිවහොත් 1966 දී බණ්ඩාරනායක මැතිණිය පරාද වීමෙන් පසුව නොකළ වරදකට අත්අඩංගුවට පත් වීමට එන්.ක්‍යු. දියෙස් මහතාට සිදු විය. සාක්ෂි නොමැති වීම නිසා මෙම නඩුව ඉවත් කර ගන්නා ලද නමුත් එයින් දියෙස් මහතාගේ කීර්තිනාමය කෙටි කලකට හෝ පළුදු කරන්නට විරුද්ධවාදීහු සමත් වූහ.

කෙසේ වෙතත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය යළිත් 1970 දී බලයට පත් වීමෙන් අනතුරුව එන්.ක්‍යු. දියෙස් මහතා ලංකාවේ

ඉන්දීය මහකොමසාරිස් ලෙස පත් කරනු ලැබූ බැවින් 1972 වන තුරු ලංකාවට ජාත්‍යන්තර වශයෙන් සේවයක් කිරීමට ද ඔහුට අවස්ථාව සැලසිණ.

එන්.ක්‍යු. දියෙස් මහතාගේ පෞද්ගලික තොරතුරු කිසිවක් සොයා ගත නොහැකි වූ නමුත් අභාවප්‍රාප්ත අධිනීතිඥ ගෝමින් දයාසිරි ඔහුගේ පුතකු බව පමණක් සඳහන් කළ හැකි ය. ආර්ය සිංහල නාම භාවිතය රට තුළ ව්‍යාප්ත කිරීමෙහි නියමුවකු වූ එන්.ක්‍යු. දියෙස් මහතා නීල් ක්වීන්ටස් යන සිය මුල් නමින් හඳුන්වනු ලැබීම අතිශය විරල විය. එසේ ම සිය පියාගේ වාසගම වූ ඩයස් යන්න දියෙස් යනුවෙන් සිංහල ස්වරූපයකින් භාවිත කළ අතර දියෙස් යන වාසගම වෙනුවට ආර්ය සිංහල දයාසිරි යන නාමය සිය දරුවන් උදෙසා භාවිත කළ බව පෙනේ.

කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උදක් ලොව සතුන් සිත දුක් කෙරෙති බර
පසක් රාහු මුව පත් වෙමිනි බියකර
අනෙක් පසින් ලොව එළි කෙරෙ ය හිමකර

යැයි සුභාෂිත කතුවරයා පැවසූ විලසින් ම උතුම් සුදනකු වූ එන්.ක්‍යු. දියෙස් මහතා තමාට කොතෙක් චෝදනා එල්ල වුණත් ලංකාවේ සිංහල බෞද්ධයන්ගේ නැති වූ ජාතික හා සාමයික අයිතිවාසිකම් නැවත දිනා දීමේ සටනින් ජය ලබන තුරු ම උත්සාහය අත් නොහළේ ය. බියකරු රාහුගේ මුවෙහි එක් පසක් ගිල ගනිමින් පැවැතියත් සඳෙහි අනෙක් පස ලෝකය ආලෝකවත් කරන්නාක් මෙනි.

---

**තොරතුරු මූලාශ්‍ර -**

★ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ස්වර්ණ ජයන්ති සමරු කලාපයට එහි හිටපු සභාපති පී. බී. වේරගොඩ මහතා ලියූ ලිපිය

- රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ස්වර්ණ ජයන්ති සමරු කලාපයෙහි පළ වූ එන්. ක්‍යු. දියෙස් මහතා අප සංගමයේ සභාපති තනතුරෙන් ඉවත් වන අවස්ථාවේ දී කරන ලද කතාව
- Wikipedia
- ඩී.බී.එස්. ජෙයරාජ් මහතා විසින් 2022.02.14 දිනැති Daily Mirror පුවත්පතෙහි පළ කරන ලද ලිපිය
- The Karava People of Sri Lanka නමින් වූ Face Book පිටුව

## 2.3 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ හිටපු සභාපති පී.බී. වේරගොඩ මහතා



රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මඟින් ඉටු කරන සේවාවන් ගැන සලකා බලන විට එමඟින් ප්‍රකාශයට පත් කරනු ලබන 'වෙසක් සිරිසර' ධර්ම සඟරාව ප්‍රමුඛ කාර්යයක් වී ඇත. එම ධර්ම පුස්තකය ගැන සලකන විට ඒ හා බැඳුණු භාරකරුවා වූ පී.බී. වේරගොඩ මහතාගේ නාමය කැපී පෙනෙයි. වේරගොඩ මහතා වෙසක් සිරිසර සඟරාවේ සංස්කාරකවරයා හෝ නිර්මාතෘවරයා හෝ නොවේ; වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුවේ ගරු ලේකම් ය. සඟරාවක් නොකඩවා පවත්වා ගෙන යාමට ඊටත් වඩා කැප වූවෙක් අවශ්‍ය කෙරේ. ඒ කාර්යය මැනැවින් ඉටු කළ අප සංගමයේ මහත් ක්‍රියාකාරී පුද්ගලයකු වූ වේරගොඩ මහතා ගැන කෙටි සටහනකි, මේ.

පී.බී. වේරගොඩ මහතා 1929 ඔක්තෝබර් මස 24 දින රුවන්වැල්ල ප්‍රදේශයේ වල්ගම්පත ගමෙහි උපත ලද්දෙකි. ඔහු 1949 සැප්තැම්බර් මස පළමුවැනි දින සිට 1989 ඔක්තෝබර් 31 දක්වා රාජ්‍ය සේවයේ නිරතව සිටියේ ය. 1954 වර්ෂයේ දී ආරම්භ කරන ලද රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආරම්භක සාමාජිකයකු වන වේරගොඩ මහතා කලක් එහි උපසභාපතිවරයකු වශයෙන් ද, ඉන්පසු 1989 වර්ෂයේ දී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යන තෙක් එහි සභාපති ලෙස ද කටයුතු කළේ ය. එම කාලය ඇතුළත සහ ඉන් පසුවත් සංගමය මඟින් සංවිධානය කරන ලද මාසික භාවනා, සීල භාවනා, ගල්දූව ආරණ්‍ය සේනාසනයට පිරිනමන ලද වාර්ෂික දානය, වර්ෂාවසාන පරිත්‍රාණ පින්කම හා පසුදින සංඝගත දක්ෂිණාව වැනි වැඩසටහන්වලට සංගමයේ යාවජීව සාමාජිකයකු වශයෙන් වේරගොඩ මහතා ඉතා උනන්දුවකින් සහභාගි වූයේ ය.

ලන්ඩන් විශ්වවිද්‍යාලයේ උපාධිධරයකු වන වේරගොඩ මහතාගේ රාජ්‍ය සේවා කාලය අවුරුදු 40කට අධික ය. 1959 සැප්තැම්බර් 01 දින සිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරියකු ලෙස

සේවයෙහි නියැලුණ ඔහු 1963 දී සිවිල් සේවයට (වර්තමානයේ ශ්‍රී ලංකා පරිපාලන සේවය) එක් වූයේ ය. සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, ආයුර්වේද කොමසාරිස්, සමාජ සේවා අධ්‍යක්ෂ, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් යන තනතුරු ඔහු දැරූ වැදගත් තනතුරු අතර වේ. ආයුර්වේද ඖෂධ සංස්ථාවේ හා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ සභාපති ලෙස ද වේරගොඩ මහතා සේවය කර ඇත. ඔහු ආයුර්වේද කොමසාරිස් වශයෙන් Journal of Ethnopharmacology නම් සඟරාවට ලියන ලද The Traditional System on Medicine in Sri Lanka යන හිසින් යුතු ලිපිය තුළින් සිංහල වෛද්‍ය ක්‍රම පිළිබඳව ඔහු සතු වූ දැනුම මොනවට විදහා දැක්වේ. තම රාජකාරිවලට අදාළ සාකච්ඡා හා සම්මන්ත්‍රණවලට සහභාගි වීම සඳහා ඔහු විදේශයන් රැසක ද සංචාරය කර ඇත.

වෙසක් සිරිසර යනු 1935 වෙසක් පෝය අරභයා පානදුරේ ශ්‍රී සද්ධර්මදාන සමිතියේ අනුග්‍රහයෙන් පූජ්‍ය කෙසෙල්වත්තේ ජිනානන්ද මහ තෙරුන් වහන්සේ විසින් ආරම්භ කරන ලද ධර්ම දානය පිණිස වූ සඟරාවකි. මෙම සඟරාවේ සහකාර සංස්කාරක වූත්, ඒ හිමියන්ගේ සහෝදර වූත් එච්.පී. ජයවර්ධන නම් තරුණයා ප්‍රධාන සංස්කාරක හිමියන්ගේ අපවත් වීමෙන් පසු 1984 වසරේ දී සඟරාව ප්‍රකාශ කිරීමේ කාර්යභාරය සියතට ගත්තේ ය. එවකට රාජකීය විදුහලේ ප්‍රාථමික අංශයේ ප්‍රධානාචාර්යවරයා වූ ඔහු මෙම සඟරාව නොකඩවා ප්‍රකාශයට පත් කළේය.

ජයවර්ධන මහතා ද වියපත් වන විට 'වෙසක් සිරිසර' සඟරාව නොකඩවා ගෙන යාමේ කාර්යය රාජ්‍ය සේවා බෞද්ධ සංගමයට පැවරුවේ ය. මේ වන විට මෙම සංගමය විසින් මෙවැනි ධර්ම දානයක් පවත්වා නොතිබිණ.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ රාජා කුරුප්පු, ටී.කේ. දසනායක, නෙවිල් පියදිගම හා පී.බී. වේරගොඩ යන නිලධාරී මහතුන් සමඟ ඇති කර ගත් එකඟතාවක් උඩ වෙසක් සිරිසර ප්‍රකාශයට පත් කිරීම රාජ්‍ය සේවා බෞද්ධ සංගමයට පැවරුණි. සඟරාව ප්‍රකාශයට පත් කිරීමේ කාර්ය භාරය පැවරුණේ වේරගොඩ මහතාට ය. සංස්කාරකවරුන්ට ද මෙම කාර්යයේ දී විශාල වගකීමක් හා කාර්ය භාරයක් හිමි වේ. එම කාර්යයන් රාජා කුරුප්පු, ධම්ම වීරකෝන්, ආචාර්ය එම්.එච්. උවයිස්, ටී. කනගරත්නම් යන මහත්වරු ඉටු කළහ.

ජයවර්ධන මහතාගේ භාරකාරත්වයෙන් පසු සඟරාව පළ කිරීමේ කාර්යය ප්‍රධාන වශයෙන් පැටවූයේ වේරගොඩ මහතාට ය. සංස්කාරකවරුන්ට ද එවැනි ම වගකීමක් තිබුණ ද මුද්‍රණයෙන් ගන්නා තෙක් ඔහුට ඇත්තේ මහත් වගකීමකි. වියදම් සපයා ගත යුත්තේ ද ඔහු ම ය. වෙසක් සිරිසර 58 වැනි සඟරාවේ සිට මෙතෙක් ගෙන ඒමට හැකි වූයේ වේරගොඩ මහතාගේ කැපවීම මත ය. සඟරාව පළ කිරීමෙන් පසු පුවත්පත්වලින් මෙන් ම පරිහරණය කළ අය ගෙන් ද ලද ප්‍රසාදයට හිමිකම් ලැබිය යුත්තේ වේරගොඩ මහතාට ය.

වෙසක් සිරිසර අඛණ්ඩව වාර්ෂිකව පළ කිරීම සඳහා ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ කාර්යය පී.බී. වේරගොඩ මහතාගේ අප්‍රතිහත ධෛර්යයෙන් වාර්ෂිකව සපුරා ගත්තේ ය. බෞද්ධ ධර්ම ග්‍රන්ථයක් පළ කිරීමට වෙළෙඳ දැන්වීම් උපයෝගී කර ගැනීම වැළැක්වීම සඳහා වේරගොඩ මහතා මහත් වූ උත්සාහයක් ගෙන අරමුදලක් ආරම්භ කර ඔහු ඒ වගකීමෙන් මිදෙන විට ලක්ෂ 40ක් දක්වා ගොඩ නඟා ගැනීමට සමත් වූයේ ය. වේරගොඩ මහතා ඒ සඳහා කැප වූයේ අන් කිසිවකු එපමණ වෙහෙසක් නොගන්නා තරමට ය.

බෞද්ධ ධර්මාචාර්ය විභාගයට සිසුන් සූදානම් කරන දහම් පාසල්වල සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා වෙසක් සිරිසර 61 වන කලාපයේ විශේෂ මුද්‍රණයක් එළිදැක්වීමට වේරගොඩ මහතා අදහස් කළේ ය. එය සිංහල බසින් ඇති කොටසින් පමණක් සමන්විත වූ බැවින් ලුහුඬු මුද්‍රණයක් ලෙස හැඳින්විණ. ඒ සඳහා අවශ්‍ය වූ දහම් පාසල්වල ලිපිනයන් අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන බෞද්ධ දහම් පාසල් 892කට වාර්ෂික සඟරාව තැපෑලෙන් යැව්වේ ඒවා ලද බව දැනුම් දෙන ලෙස ඉල්ලමිනි. මෙම සඟරාව අදාළ දහම් පාසලට ලැබුණේ ද, එය සිසුන්ට ප්‍රයෝජනවත් වූයේ ද, ඉදිරි වසරවල දී ද එය එවීමට අවශ්‍ය ද යනාදී වශයෙන් යහපත් ප්‍රතිචාර ලැබී ඇත්තේ එයින් 454කින් පමණි. පිළිතුරු නොදුන් දහම් පාසල් අත් හැර සෙසු දහම් පාසල්වලට ඉන් පසු වර්ෂවල දී ද වෙසක් සිරිසර විශේෂ ලුහුඬු මුද්‍රණය යැවීමට කටයුතු කළ වේරගොඩ මහතා, ස්තුති කිරීම තබා ලද බව දැන්වීමක් පවා නොකිරීම සම්බන්ධයෙන් සිය කනගාටුව පළ කරමින් වෙසක් සිරිසර සඟරාවේ ප්‍රකාශක කමිටුවේ ලේකම් වශයෙන් සටහනක් තැබී ය.

මෙම ධර්ම ග්‍රන්ථය සඳහා භාෂා තුනෙන් ම ලිපි සපයා ගැනීම, සංස්කරණය, මුද්‍රණය හා බෙදා හැරීම එහි ප්‍රකාශන කමිටුවේ ලේකම් වූ පී.බී. වේරගොඩ මහතාගේ හිස මත පැවැරුණ බරපතල වගකීමකි. සඟරාව මුද්‍රණය කළ පසු එහි මුල් සංස්කාරක වූ ජයවර්ධන මහතාගේ හෝර්ටන් පෙදෙසෙහි පිහිටි නිවසේත් කඩවත පිහිටි වේරගොඩ මහතාගේ නිවසේත් ගබඩා කර තැපෑලට සූදානම් කිරීමට ඔහුට සහාය වීම සඳහා අප සතිඅන්ත නිවාඩු දින කැප කළ අවස්ථා සිහිපත් වේ.

කඩවත නගරය සමීපයෙහි ජීවත් වූ වේරගොඩ මහතා කඩවත තරුණ බෞද්ධ සංගමයේ නිලතල දරමින් ප්‍රදේශයට විශාල සේවයක් ඉටු කළේ ය. එසේ ම අවට විහාරස්ථාන ගණනාවක ම දායක සභාවලට එක්ව මූලිකත්වය ගෙන කටයුතු කළ එතුමා විවිධ සමාජ සංවිධාන මඟින් ද සමාජයට මහඟු මෙහෙවරක් සිදු කළ සමාජ සේවකයෙකි.

පී.බී. වේරගොඩ මහතා මෙම අත්භවයෙහි බෞද්ධ ක්‍රියාකාරකම් රැසකට ම මූලිකත්වය දී ප්‍රතිපත්ති ගරුක නිවැරදි ජීවිතයක් ගත කරමින් සෙසු අයට ද ආදර්ශවත් වටිනා සාමයික හා සාමාජයික සේවාවන් රැසක් ඉටු කරන ලද බව ඔහු සමීපව ඇසුරු කළ සියලු දෙනා දනිති. එහෙත් ඔහුගේ ජීවිතයේ සැඳෑ භාගය ඉතා අවාසනාවන්ත අයුරින් රෝගීව ගත කරන්නට සිදු වීම දෛවයේ සරදමකි. ගතින් කෙතරම් දුබලව සිටියත් සිතිවිලි මාත්‍රයකින් පවා සංගමයේ සුබ සිද්ධිය ම පතමින් වසර 84ක් තරම් දීර්ඝ වූ ආයු කාලයක් වැළඳූ වේරගොඩ මහතා 2014 මැයි මස 25 දින මෙලොවින් සමු ගත්තේ ය.

බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ශ්‍රී ලංකාද්වීපයෙහි මතු නොව සමස්ත ලෝකයා තුළ ම ප්‍රචලිත කිරීමෙහි ලා උත්කෘෂ්ට මෙහෙයක් ඉටු කරමින් ඒ වෙනුවෙන් සිය තරුණ කාලය කැප කළ පී.බී. වේරගොඩ මැතිතුමාගේ සසර ගමන සැපවත් වී පතන්නා වූ බෝධියකින් නුදුරු භවයක දී ම අජරාමර නිවන් සුව අත් කර ගන්නට ඒ පින් හේතු වාසනා වේවා යැයි පතමි.

ලලිත් හීන්ගම
හිටපු සභාපති - රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
තොරතුරු - වෙසක් සිරිසර ඇසුරෙනි.

## 2.4 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ආදර්ශ පාඨ

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විධායක කමිටු රැස්වීම් ආරම්භයේ දී හා අවසානයේ දී ආදර්ශ පාඨ සජ්ඣායනා කිරීම පූර්වයෙහි සිට ම පැවැත එන සිරිතකි. පාළි ගාථා දෙකක් වන මෙම ආදර්ශ පාඨවල සරල අර්ථය අඩංගු සිංහල කවි දෙකක් ද ඒ සමඟ ගායනා කරනු ලැබේ. සංගමයේ ආදර්ශ පාඨ ලෙස ගෙන ඇත්තේ ත්‍රිපිටකයෙහි සඳහන් පාළි ගාථා වන නමුත් මෙම සිංහල කවිවල නිර්මාතෘ කවරෙක් දැයි ලේඛනගත තොරතුරක් නොමැත.

## ආරම්භයේ දී සජ්ඣායනා කරනු ලබන ආදර්ශ පාඨය

ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනේ
ධුනාථ මච්චුනෝ සේනං නළාගාරං ව කුඤ්ජරෝ

සංයුත්ත නිකායේ සගාථ වග්ගයේ අරුණවතී සූත්‍රයේ හා ථෙරගාථා පාළියේ අභිභූත්තථෙර ගාථාවේ සඳහන් වන ඉහත ගාථාවෙහි සමස්ත බුද්ධ වචනය පිඬු කොට ඉදිරිපත් කර ඇති අතර එමඟින් බෞද්ධයා යා යුතු ගමන් මඟ පිළිබඳව විවරණය වේ.

## මෙහි අර්ථය අඩංගු සිංහල කවිය

අරඹන්න නික්මෙන්න යෙදෙන්න බුදුසසුනේ
සොලවන්න මරසෙනඟ බට ගෙයක ඇතකු සේ

මෙහි අරඹන්න හා නික්මෙන්න යනුවෙන් සරලව සඳහන් කර ඇතත් ඇරඹිය යුත්තේ කුමක් ද, නික්මෙන්නේ කුමකින් ද යන්න පාළි ගාථාවෙහි මතු නොව සිංහල කවියෙහි ද පැහැදිලි ලෙස දක්වා නොමැත.

එහෙත් "ධර්මයෙහි හැසිරීම පිණිස වීර්යය අරඹව්. අකුසලයෙන් බැහැරට නික්මෙව්. බුදුසසුනෙහි යෙදෙව්. බටදඬුයෙන් කළ කුටියක් හස්තියකු විසින් සුණුවිසුණු කරන්නේ යම් සේ ද එලෙසින් මාර සේනාව නසව්." යනු මෙහි ගැඹුරු අදහස වේ.

ඒ අනුව රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විධායක කමිටු සාමාජිකයන් වන අපි, සෑම රැස්වීමක් ආරම්භයේ දී ම ධර්මයෙහි

හැසිරීම පිණිස වීර්යය වැඩීම ආරම්භ කරන්නටත්, අකුසලයෙන් බැහැර වන්නටත්, බුදුසසුනෙහි යෙදෙන්නටත්, ඒ තුළින් මාර සේනාව නසන්නටත් අධිෂ්ඨාන කර ගනිමු.

## අවසානයේ දී සජ්ඣායනා කරනු ලබන ආදර්ශ පාඨය

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරේ
ධම්මචාරී සුඛං සේති අස්මිං ලෝකේ පරම්හි ච

ඛුද්දක නිකායේ කොටසක් වන ධම්මපදයේ ලෝක වග්ගයේ සඳහන් වන ඉහත ගාථාව ධර්මයෙහි හැසිරෙන්නාට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ විවරණයකි.

අප ගෞතම සම්මා සම්බුද්ධයන් වහන්සේ මැදින් පුර පසළොස්වක පෝය දින කිඹුල්වත් නුවරට වැඩි අවස්ථාවේ දී උන් වහන්සේ ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩිනු දුටු පියරජු වූ සුද්ධෝදන රජතුමා කනස්සල්ල පළ කළ විට ඔහුගේ සිත් සනසා ධර්මාවබෝධය ලබා දෙනු වස් බුදු රජාණන් වහන්සේ විසින් මෙම ගාථා ධර්මය දේශනා කළ බව සඳහන් වේ. එහි දී උන් වහන්සේ දේශනා කොට වදාළේ, "ගෙපිළිවෙළින් පිඬු සිඟා ලැබෙන හැන්දක් පමණ අහරෙහි නො පමා වන්නේ ය. පිඬු සිඟා යාම යන භික්ෂාචර්ය ධර්මය සකසා පුරුදු කරන්නේ ය. මෙම භික්ෂාචර්ය ධර්මය අනුව හැසිරෙන මහණ තෙම මෙලොවෙහි ද පරලොවෙහි ද සුව සේ වාසය කරයි" යනුවෙනි. මෙම ධර්ම දේශනාව අවසානයේ දී පිය මහ රජාණෝ සෝවාන් ඵලයට පත් වූහ. රැස්ව සිටි සෙස්සන්ට ද ධර්මාවබෝධය පිණිස මෙම ගාථාව හේතු විය.

ගිහියන් වන අපට මෙම ගාථාවෙන් ගත හැකි අර්ථය වන්නේ, "උට්ඨාන වීර්යය ඇත්තා වූ, අප්‍රමාදී වූ, සුචරිත ධර්මයෙහි ධාර්මිකව නිසි ලෙස හැසිරෙන පුද්ගල තෙමේ මෙලොව පරලොව යන දෙකෙහි ම සුව සේ වාසය කරන්නේ ය" යන්නයි.

## මෙහි අර්ථය අඩංගු සිංහල කවිය

නැඟිටිනු නොපමා වනු හැසිරෙනු සුසිරි දම්හි
මෙලොවත් පරලොවත් සුව සේ වෙසේ දම්සැරි

මෙලෙස රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විධායක කමිටු සාමාජිකයන් වන අපි, සෑම රැස්වීමක් අවසානයේ දී ම, උට්ඨාන වීර්යයෙන් යුතුව අප්‍රමාදීව ධර්මයෙහි හැසිරෙන තැනැත්තා මෙලොව පරලොව දෙකෙහි ම සුව සේ වාසය කරන බව සිහිපත් කර ගනිමු.

## 2.5 රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මඟින් ඉටු කරන ලද විශේෂ බෞද්ධ වත්පිළිවෙත් කිහිපයක්

1. 1960 සිට සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 31 වන දින කොළඹ 7 නිදහස් මන්දිරයේ පැවැත්වෙන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව සහ ඉන් අනතුරුව ජනවාරි පළමුවන දින උදෑසන සංඝගත දක්ෂිණාව
2. 1980 ප්‍රතිසංවිධානය වීමෙන් අනතුරුව ධර්ම දානයක් ලෙස බුදුරැස නමින් ත්‍රෛමාසික පුවත්පතක් මුද්‍රණය කර බෙදා හැරීම
3. 1984 ජූනි මස සිට පවත්වන ලද මාසික භාවනා පන්තිය සහ එහි දී පුහුණුව ලබන කර්මස්ථාන ප්‍රායෝගිකව ක්‍රියාවෙහි යෙදවීම සඳහා වසරකට තෙවරක් පවත්වන ලද ශීල භාවනා වැඩසටහන
4. භාවනා වැඩසටහන්වල උගන්වන දහම් කරුණු සම්පිණ්ඩනය කර පොත් මුද්‍රණය කර ධර්ම දානයක් ලෙස නොමිලේ බෙදා හැරීම
5. 1992 සිට සෑම වසරක ම වෙසක් පුරපසළොස්වක පොහෝ දිනය නිමිති කොට ගෙන මුද්‍රණය කර ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හරිනු ලබන වෙසක් සිරිසර වාර්ෂික ධර්ම පුස්තකය
6. 2004 සිට වෙසක් සිරිසර සඟරාව සමඟ අතිරේක ධර්ම පුස්තකයක් නිකුත් කිරීම
7. 2007 සිට සෑම වසරක ම ඇසළ පුර පසළොස්වක් පොහෝ දින විවිධ විහාරස්ථානවල ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව සජ්ඣායනා කිරීම
8. 2011 මොනරාගල අඩු ආදායම්ලාභී සිසුන් 35 දෙනකු සඳහා මාසික ශිෂ්‍යාධාරයක් ලබා දීම
9. 2014 දී අඩු ආදායම්ලාභී දහම් පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් ලබා දීම

10. 2019 ඔක්තෝබර් මස ගැමුණු ට්‍රැවල්ස් ආයතනය සමඟ 15 දෙනකුගෙන් යුක්ත කණ්ඩායමකින් ආරම්භ කළ 'දඹදිව පුණ්‍ය භූමි' වන්දනා චාරිකාව

11. 2024 පෙබරවාරි මස බත්තරමුල්ලේ සුධර්මාරාම පුරාණ විහාරස්ථානයේ පැවැති දහවල් දානමය පින්කම

12. 2024 පොසොන් පුර පසළොස්වක් පොහෝ දින නිමිත්තෙන් බත්තරමුල්ල වික්‍රමසිංහ වැඩිහිටි නිවාසයේ නේවාසිකයන්ට දෙන ලද පළතුරු දානය සහ සංගීත ප්‍රසංගය

13. 2025 මාර්තු මස 10 වැනි දින වත්තේගෙදර සුජාතා වැඩිහිටි නිවාසයට දහවල් දානය පිරිනැමීම

## 2.6 රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මෙහෙයවූ ප්‍රධාන නියාමකයෝ

### ගරු සභාපතිවරු

- එන්.ක්‍යු. දියෙස් මහතා
- ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා
- ඩග්ලස් උමගිලිය මහතා
- නිශ්ශංක විජයරත්න මහතා
- ධර්මසේන උඩුවෙල මහතා
- පී.එල්. වික්‍රමාරච්චි මහතා
- නලින් රත්නායක මහතා
- ආචාර්ය එච්.ඒ.පී. අභයවර්ධන මහතා
- පී.බී. වේරගොඩ මහතා
- ඩී. විජේසිංහ මහතා
- ටී.කේ. දසනායක මහතා
- නෙවිල් පියදිගම මහතා
- ලලිත් හීන්ගම මහතා

- වෛද්‍ය රාණි ප්‍රනාන්දු මහත්මිය
- පී. වීරහන්දි මහතා
- සීතා විතානාරච්චි මහත්මිය
- වී. එඩ්මන්ඩ් මහතා
- එම්. කේ. බී. දිසානායක මහතා
- කේ. ඒ. තිලකරත්න මහතා

## ගරු ලේකම්වරු

- ගුණසීල විතානගේ මහතා
- ඩී.එස්. කෝට්ටගේ මහතා
- යූ.එස්. මුදලිගේ මහතා
- විජයානන්ද ආබෲ මහතා
- ගුණරත්න තෙන්නකෝන් මහතා
- පී. වීරහන්දි මහතා
- පී.ඒ.එන්. ද සිල්වා මහතා
- දුලනි සකලසූරිය මෙනවිය

## ගරු භාණ්ඩාගාරිකවරු

- ජී.එස්. ද සිල්වා මහතා
- ඩී.එච්. ඇපා මහතා
- කේ.ඒ. නන්දසේන මහතා
- එස්.එච්. ජිනදාස මහතා
- චාරුක කුමාරපේලි මහතා

## 2.7 රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ නිලධාරි මණ්ඩලය - 2025/2026

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | ආචාර්ය කේ.ජ්. තිලකරත්න මහතා<br>උතුරුමැද පළාත් හිටපු ප්‍රධාන ලේකම් (විශ්‍රාමික) | 071-4858612 |
| **ගරු ලේකම්** | දුලනි සකලසූරිය මෙනවිය<br>කළමනාකරණ සේවා නිලධාරි (විශ්‍රාමික) | 071-4393007 |
| **ගරු භාණ්ඩාගාරික** | චාරුක කුමාරපේලි මහතා<br>කළමනාකරණ සේවා නිලධාරි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 071-8464547 |
| **ගරු උපසභාපතිවරු** | එම්.කේ.බී. දිසානායක මහතා<br>බුද්ධශාසන අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ සභාපති, සමාජ ආරක්ෂණ මණ්ඩලය | 077-3065268 |
| | සුනිල් ගලගම මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 071-4441644 |
| | වී. එඩ්මන්ඩ් මහතා<br>හිටපු නියෝජ්‍ය විගණකාධිපති (විශ්‍රාමික) | 071-6335311 |
| | ගුණරත්න තෙන්නකෝන් මහතා<br>රාජ්‍ය කළමනාකරණ සේවය (විශ්‍රාමික) | 077-6508087 |
| | ඉන්දුමතී කැටිපෙආරච්චි මහත්මිය<br>ශ්‍රී ලං.ප.සේ. (විශ්‍රාමික) සහකාර ප්‍රාදේශීය ලේකම්, තිඹිරිගස්යාය | 071-4434369 |
| **නියෝජ්‍ය ලේකම්** | එම්.ඩී. නන්දන කුරේ මහතා<br>අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය (විශ්‍රාමික) | 071-8137968 |
| **උපලේකම්** | ඩබ්ලිව්.ඒ.ඩී. කරුණාතිලක මහතා<br>අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු (විශ්‍රාමික) | 071-4418874 |
| **උප භාණ්ඩාගාරික** | එස්.එච්. ජිනදාස මහතා<br>සමූපකාර සමිති පරීක්ෂක (විශ්‍රාමික) | 071-8323031 |

| | | |
|---|---|---|
| **විධායක මණ්ඩලය සේවයෙහි නියුතු නිලධාරීන්** | **එච්.ඩී. නිල්මිණි දීපිකා සංජීවනී මහත්මිය**<br>රජයේ මුද්‍රණාලය | 078-8767643 |
| | **නීතිඥ, ආචාර්ය තමරා රූපිකා කන්දේපේලිආරච්චි මෙනවිය**<br>අග්‍රාමාත්‍ය කාර්යාලය | 077-8316023 |
| | **ජී.ඩී. ලලිත් ප්‍රියන්ත මහතා**<br>රජයේ මුද්‍රණාලය | 078-8713351 |
| | **එස්.පී.එස්. විජේවර්ධන මහතා**<br>විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 078-3916561 |
| | **එම්.එම්.ආර්.එන්.කේ. ද සිල්වා මහතා**<br>උප පොලිස් පරීක්ෂක, විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 076-7681023 |
| | **එච්.ජී. වියත් රසිනිඳු මහතා**<br>විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 070-3953566 |
| **විධායක මණ්ඩලය විශ්‍රාමික නිලධාරීන්** | **කේ.කේ. සුගතපාල මහතා**<br>(ශ්‍රී ලං.ප.සේ. විශ්‍රාමික) ලේකම්, සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදන මණ්ඩලය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව (බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය) | 071-4497329 |
| | **ජී. ඉන්ද්‍රාණි පෙරේරා මහත්මිය**<br>විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති හිටපු කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය හා විවෘත විශ්වවිද්‍යාලය | 071-8483204 |
| | **මේජර් ජනරාල් ප්‍රියන්ත සමරතුංග**<br>(විශ්‍රාමික) | 077-7589220 |
| | **එච්.එල්. සුගතපාල මහතා**<br>විශ්‍රාමික පරිපාලන නිලධාරි, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 071-8216985 |
| | **පියසීලී නූපෙහේවා මහත්මිය**<br>ගුරු සේවය 1 (විශ්‍රාමික) | 071-8673882 |

| | | |
|---|---|---|
| | **කේ. දොරණෑගොඩ මහත්මිය**<br>හිටපු ප්‍රධාන ගණකාධිකාරි, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 077-6432364 |
| | **රමණි කලෙහේවත්ත මහත්මිය**<br>විශ්‍රාමික ප්‍රධාන සැලසුම් කාර්යාල සහකාර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 071-9515073 |
| | **ඩී. ප්‍රේමතිලක ද සිල්වා මහතා**<br>විශ්‍රාමික අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්) පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය | 071-4269486 |
| | **ඩබ්ලිව්.ඒ. රංජිත් සඳනායක මහතා**<br>ලේකම්, සේවා හා නිපැයුම් ප්‍රවර්ධන කේන්ද්‍රය | 076-3335001 |
| | **ආචාර්ය ගාමිණී කාරියවසම් මහතා**<br>අතිරේක ලේකම් (විශ්‍රාමික) නාගරික සංවර්ධන අමාත්‍යාංශ‍ය | 071-4451044 |

## 2.8 දීර්ඝතම කාලයක් ලේකම් ධුරය හෙබවූ ගුණරත්න තෙන්නකෝන් මහතා

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ මෑත ඉතිහාසයේ දීර්ඝතම කාලයක් ලේකම් ධුරය හෙබවූ ගුණරත්න තෙන්නකෝන් මහතා වර්තමානයේ දී සංගමයේ උප සභාපතිවරයකු වශයෙන් කටයුතු කරයි.



ලලිත් හීන්ගම මහතාගේ හඳුන්වා දීමක් අනුව1987 වර්ෂයේ දී රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ යාවජීව සාමාජිකත්වය ලබා ගත් තෙන්නකෝන් මහතා, වසර හයක් උපලේකම් වශයෙන් ද, වසර 13ක් ගරු ලේකම් වශයෙන් ද, වසර පහක් උප සභාපතිවරයකු වශයෙන් ද සංගමය හා බැඳී සිටී. බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ආසනයේ මැදවෙල ගමේ තෙන්නකෝන් පවුලේ වැඩිමලා ලෙස 1951 දී උපත ලැබූ ගුණරත්න දරුවා, බාල සහෝදර සහෝදරියන් පස්දෙනකුගේ ලොකු අයියා විය. උඩරට අමරපුර සාමග්‍රි සංඝ සභාවේ අනුනායක පූජ්‍ය මැදවෙල සුගතසෝම ස්වාමීන් වහන්සේ තෙන්නකෝන් පවුලෙන් සම්බුද්ධ ශාසනයට දායද කළ එක් පුත් රුවනකි.

බ/ කරගහ උල්පත මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයත්, විදුරුපොළ ගවරම්මාන ශ්‍රී පියතිස්ස මහ පිරිවෙනෙන් උසස් අධ්‍යාපනයත් ලැබූ ගුණරත්න සිසුවා බුද්ධ ධර්මය, බෞද්ධ වත්පිළිවෙත්, බෞද්ධ සදාචාරය යනාදී විෂයයන් පිළිබඳ මනා දැනුමකින් පෝෂණය වූයේ ය.

1979 දී ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් රාජ්‍ය සේවයට පිවිසි ගුණරත්න තෙන්නකෝන් තරුණයා ආනයන අපනයන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, වෙළෙඳ හා නාවික අමාත්‍යාංශය, අලෙවි සංවර්ධන අමාත්‍යාංශය, සමූපකාර අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය යනාදී දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ ගණනාවක සේවය කර 2011 දී විශ්‍රාම ලැබුවේ ය.

සමාජ සේවයට ලැදි සහ කුසලතා පූර්ණ චරිතයක් වූ හෙතෙම සේවය කළ සෑම ආයතනයක ම සමිති සමාගම්වල නිලතල දරමින් කටයුතු කර ඇත. සංගමයේ පැවැත්ම උදෙසා සිය කාර්යාල සගයන් රැසක් සංගමයේ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට ද ඔහු කටයුතු කළේ ය.

සංගමය මඟින් සිරිත් පරිදි සංවිධානය කරන ලද මාසික භාවනා පන්ති, ත්‍රෛමාසික ශීල භාවනා වැඩසටහන්, ධම්මචක්කප්පවත්තන සූත්‍ර සජ්ඣායනය, වාර්ෂික පිරිත් පින්කම හා දානමය පින්කම යනාදී වැඩසටහන්වල ද, කලින් කල දියත් කළ සංවත්සර වැඩසටහන්, ශිෂ්‍යත්ව ප්‍රදානය, පාසල් නිලඇඳුම් රෙදි බෙදා දීම වැනි වැඩසටහන්වල ද කැපී පෙනෙන සේවාවක් ඔහුගෙන් ඉටු විය.

සංගමයේ මෙම සියලු ම කටයුතුවල දී ගරු ලේකම් වශයෙන් සන්නිවේදනය, සංවිධානය, සම්බන්ධීකරණය පමණක් නොව නිවේදන කටයුතු පවා සිදු වූයේ ඔහු අතිනි. ඔහු ගරු ලේකම් ධුරය හෙබවූ යුගයේ අද මෙන් පරිගණක සහ ජංගම දුරකතන පහසුකම් සුලබ නොවූයෙන් සිය කාර්යාල කටයුතු ද නොපිරිහෙළා ඉටු කරමින් රැස්වීම්වල කැඳවීමේ ලිපි ද ඇතුළු සියලු ම ලිපි සකස් කිරීම, කමිටු රැස්වීම් වාර්තා ලිවීම, සාමාජික ලේඛනය නඩත්තු කිරීම, සර්වරාත්‍රික පිරිත වැනි භාරදූර කර්තව්‍යයන් සංවිධානය කිරීම බලවත් අභියෝග යක් වූ නමුත් ඒ සියල්ලට ඔහු සාර්ථකව මුහුණදුන්නේ ය.

තමා ජීවත් වන පානදුර ප්‍රදේශයේ පොදු කටයුතු, සමාජ සේවා කටයුතු යනාදියේ යෙදෙන ඔහු සමිති සමාගම් රැසක නිලතල හොබවයි. විනෝදාංශයක් වශයෙන් කලා කටයුතුවල ද නිරත වන ඔහු වේදිකා නාට්‍ය, රූපවාහිනී ටෙලි නාට්‍ය මෙන් ම අංගුලිමාල වැනි බෞද්ධ චිත්‍රපටවල ද රඟපෑමෙන් දායක වී ඇත.

සිය ජීවිතය පුරා සිදු කරන ලද සමාජ සේවය වෙනුවෙන් දේශාභිමානී ශ්‍රී ලංකා තිලක ශ්‍රී විභූෂණ විශ්වකීර්ති ජනාභිනන්දන යන ගෞරව නාමයෙන් පිදුම් ලබා ඇති ගුණරත්න තෙන්නකෝන් මහතා, කලාව වෙනුවෙන් ඉටු කරන ලද සේවය උදෙසා සමස්ත ලංකා සාමවිනිසුරු, විශ්වාභිනන්දන, පානදුර අභිමානී යන ගෞරව නාමයන්ට ද හිමිකම් කියයි.

පානදුර ප්‍රදේශයේ පිහිටි විහාරස්ථාන රැසක ධර්ම දානාභිලාෂී ධර්මධර ස්වාමීන් වහන්සේලා රැසකගෙන් දීර්ඝ කාලයක් මුළුල්ලේ වෙසක් සිරිසර සඟරාවට ලිපි ලබා ගැනීම සඳහා තෙන්නකෝන් මහතාගෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු වන අතර අදත් උන් වහන්සේලාගේ ලිපිවලින් සඟරාව සැරසී ඇති බව ඔබ දකින්නට ඇත. මෙම 90 වන සංවත්සර කලාපය සඳහා වෙසක් සිරිසර සඟරාවේ නිර්මාතෘ ස්වාමීන් වහන්සේ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට මැදිහත් වූයේ ද ඔහු ම බව කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

සංගමයේ දීර්ඝ කාලීන සක්‍රිය සාමාජිකයකු වූ ගුණරත්න තෙන්නකෝන් මහතා තම පූර්ව අත්දැකීම් පිළිබඳ විස්තර ලබා දෙමින් අඛණ්ඩව සිය සේවය සපයමින් සක්‍රියව අප හා රැඳෙනු ඇතැයි රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ උන්නතිය හා චිරස්ථිතිය උදෙසා ප්‍රාර්ථනා කරමු.

## 2.9 සංගමයේ මෑත කාලීන තොරතුරු

වසර ගණනාවක් මුළුල්ලේ සංගමයේ ගරු සභාපති ධුරය හෙබවූයේ විශ්‍රාමික රජයේ නිලධාරීන් විසින් බැවින් සේවයෙහි නියුක්ත නිලධාරියකු ගරු සභාපති ධුරයට පත් කර ගැනීම සඳහා එවකට ගරු සභාපති ධුරය හෙබවූ පී. වීරහන්දි මහතා මහත් පරිශ්‍රමයක් දැරුවේ ය. මේ අදහස පෙරදැරිව ඔහු විවිධ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අධ්‍යක්ෂ ජනරාල්වරුන් මුණගැසුණ නමුත් මෙම ධුරයට සෑම අතින් ම සුදුසුකම් සපුරා සිටි නියම හිමිකාරයා ඔහුගේ බසට නතු කර ගැනීමට හැකි වූයේ 2015 දී ය. ඒ එවකට බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් එම්.කේ.බී. දිසානායක මහතා ය. ඔහු රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ යාවජීව සාමාජිකත්වය ලබා ගත්තා පමණක් නොව විධායක කමිටු රැස්වීම් කිහිපයකට සහභාගි වී සංගමය පිළිබඳ හැදෑරීමක් ද කළේ ය.

එතෙක් කල් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන ගොඩනැඟිල්ලේ කාමරයක පවත්වා ගෙන යන ලද සංගම් කාර්යාලය සහ එම ගොඩනැඟිල්ලේ ම ශාලාවක පවත්වන ලද කමිටු රැස්වීම් සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයට අයත් ගොඩනැඟිල්ලක කාමරයක් ලැබුණේ වීරහන්දි මහතාගේ ඉල්ලීමක් අනුව දිසානායක මහතාගේ මැදිහත් වීමෙනි. කාර්යාල කාමරයේ ඉඩකඩ සීමිත බව නිරීක්ෂණය කළ ඔහු කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාව

ලබා දීමට පියවර ගත්තේ ය. මෙම පහසුකම් ඔහු විසින් සපයන ලද්දේ ඔහුගේ ධුර කාලය අවසන් වූ පසු ඉවත් වීමට සිදු වන ආකාරයෙන් නොව රජයේ සේවකයන් උදෙසා වන පැරණිතම බෞද්ධ සංගමය වෙනුවෙන් බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් නීත්‍යානුකූලව කරනු ලබන අනුග්‍රහයක් වශයෙනි.

බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් ධුරයෙන් ඉවත් වන තුරු සංගමයේ ගරු සභාපති තනතුර භාර ගැනීමෙන් වැළකී සිටි දිසානායක මහතා 2016 දී එම ධුරයට පත් වීමෙන් අනතුරුව රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ පරිවර්තන යුගයක් උදා විය.

සංගමයට ලැබෙන ආධාර සහ අනෙකුත් ආදායම්වලට වඩා ඉතා අධික මුදලක් වියදම් කර ඇති බව නිරීක්ෂණය කළ මෙම අභිනව ගරු සභාපතිවරයා, 2017 වර්ෂයේ දී ගරු භාණ්ඩාගාරික ධුරයට අභිනවයෙන් පත් වූ හිටපු සමූපකාර සමිති පරීක්ෂක එස්.එච්. ජිනදාස මහතා ද සමඟ ඒ පිළිබඳව විමර්ශනයක් කළේ ය. සංගමයේ මාසික විධායක කමිටු රැස්වීම් හා සෙසු ආගමික වැඩසටහන් සඳහා සහභාගි වන සංගමයේ ප්‍රධාන නිලධාරීන්ට ගමන් වියදම් සහ/හෝ රියදුරු දීමනා ගෙවීම, දුරකතන බිල්පත් ගෙවීම, ආගමික වැඩසටහන්වල දී ආධාර උපකාර කරන සාමාජිකයන්ට දින වැටුප් ගෙවීම වැනි අත්‍යවශ්‍ය නොවන වියදම් රැසක් සඳහා වසරකට ලක්ෂ පහක පමණ වැය බරක් සංගමය මඟින් දරා ඇති බව මෙහි දී අනාවරණය විය. ඒ සඳහා විධායක කමිටුවේ අනුමැතිය ද ලබා ගෙන තිබීම විශේෂත්වයකි. සංගමයේ කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් සහභාගි වන සාමාජිකත්වය එවැනි ගෙවීම් අපේක්ෂා නොකරන බව වර්තමාන විධායක කමිටු සාමාජිකයන් විසින් ඒකමතිකව ප්‍රකාශ කිරීම නිසා 2017 වර්ෂයේ සිට එම ගෙවීම් නවතා දමන ලදි.

කමිටු රැස්වීම් සඳහා කැඳැවීම් ලිපි යැවීම ද නැවැත්වූ ඔහු, ඒ සඳහා දුරකතන පණිවිඩ දෙන ලෙස ගරු ලේකම්වරියට නියම කළේ ය. සංගමයේ කටයුතු සඳහා නූතන තාක්ෂණය යොදා ගැනීමේ එක් පියවරක් වශයෙන් කමිටු සාමාජිකයන් සඳහා අය්වීචච සමූහයක් ආරම්භ කිරීම ද ඔහුගේ ම අදහසකි. ඉන් අනතුරුව කමිටු රැස්වීම් සඳහා වන කැඳැවීම අය්වීචච සමූහයෙහි පළ කරන පණිවිඩයක් මාර්ග යෙන් සන්නිවේදනය කිරීමට කටයුතු කෙරිණ.

වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වෙන දිනය පිළිබඳව එදිනට දෙසතියකට ප්‍රථමයෙන් පුවත්පත් දැන්වීමක් පළ කිරීමට ව්‍යවස්ථාව මඟින් නියම කර තිබීම නිසා ඒ වෙනුවෙන් වාර්ෂිකව සැලකිය යුතු මුදලක් වැය විය. 2018 වර්ෂයේ ගරු ලේකම් ධුරය හෙබවූ පී.ඒ.එන්. ද සිල්වා මහතා විසින් සිය දැනහැඳුනුම්කම් යොදා ගනිමින් එම නිවේදනය ප්‍රවෘත්තියක් වශයෙන් පුවත්පත් කිහිපයක ම නොමිළේ පළ කරවා ගැනීමට කටයුතු කිරීම නිසා එම මුදල ද සංගමයට ඉතිරි කර ගත හැකි විය.

බුදුදහම සහ බුද්ධාගම පටලවා ගෙන ඇති වාතාවරණයක, යටත්පිරිසෙයින් සංගමයේ කමිටු සාමාජිකයන් වත් ශුද්ධ බුද්ධ දේශනාව පිළිබඳව දැනුවත් කරවීමේ මූලික අරමුණ ඇතිව කමිටු රැස්වීම් අවසානයේ දී දිසානායක මහතාගේ මූලිකත්වයෙන් කාලීන ධර්ම සාකච්ඡාවක් ද පැවැත්වීමට කටයුතු කරන ලදි.

සංගමයේ ක්‍රියා මාර්ග පිළිබඳව කමිටු රැස්වීමට සහභාගි නොවූ කමිටු සාමාජිකයන් දැනුවත් කිරීම සහ වාර්තාව කියැවීම සඳහා වැය කරන කාලය ඉතිරි කර ගැනීම අරමුණු කර ගෙන පසුගිය සභාවේ වාර්තාව ද අය්වීචච සමූහයේ පළ කිරීමට යෝජනා කරන ලද්දේ සංගමයේ හිටපු උපලේකම් ආචාර්ය ගාමිණී කාරියවසම් මහතා විසිනි. ඊට අමතරව එදිනෙදා පුවත්පත් කියවීමට අවශ්‍ය අන්තර්ජාල සබැඳියන් මෙන් ම සංගමයේ අරමුණු හා බැඳුණ වැඩසටහන් හා ලිපි යනාදිය ද මෙම සමූහය ඔස්සේ එහි සාමාජිකයන් සමඟ බෙදා ගැනීම ඔහු නොපිරිහෙළා ඉටු කරන දෛනික රාජකාරියකි.

එසේ ම කමිටු රැස්වීම්වලට සහභාගි වන සාමාජිකයන් සඳහා වන තේපැන් සංග්‍රහය ද සංගමයට වැය බරක් නොවන පරිදි එක් එක් මාසයට එක් එක් සාමාජිකයා බැගින් දායකත්වය දැරීමේ ක්‍රමවේදයක් ගරු ලේකම් දුලනි සකලසූරිය මෙනවියගේ යෝජනාවක් අනුව ක්‍රියාවට නංවන ලදි. තව ද දීර්ඝ කාලයක් සංගමයේ උන්නතිය වෙනුවෙන් කැප වී මේ වන විට රෝගාතුර වී හෝ වියපත් වී හෝ දුර්වලව සිටින පූර්වජයන්ගේ දුකසැප බැලීම සහ ඔවුන්ගේ අත්දැකීම් රස විඳීම සඳහා කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ නිවෙස් වෙත යාම ද ඇයගේ ම යෝජනාවකි.

අප සංගම් කාර්යාලයේ දිගු කලක් කටයුතු කළ ගුණසේන කඩිගමුව මහතාගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා ඔහුට විශ්‍රාමයක්

ලබා දී ඔහු වෙනුවට රාජකාරි ඉටු කළ ජී.ඩී.එම්. සිසිර කුමාර මහතා ද අවාසනාවන්ත ලෙස රෝගාතුර වී මිය යාමෙන් පසුව සංගම් කාර්යාලයේ කටයුතු අඩපණ වී ඇත. හිටපු ගරු සභාපති එම්.කේ.බී. දිසානායක මහතාගේ මැදිහත් වීම මත සංගම් කාර්යාලයේ ගොඩ ගසා තිබූ අනවශ්‍ය පරණ බඩුබාහිරාදිය රාශියක් ඉවත් කොට සුද්ධ කරන ලදි. එහි අල්මාරිවල තැන්පත් කොට තිබූ වෙසක් සිරිසර පරණ කලාප සහ වෙනත් දහම් පොත්පත් රැසක් ධර්ම දානයක් වශයෙන් රජයේ කාර්යාලවලට ලබා දීමට ද ඔහු මූලිකත්වය දැරුවේ ය. හිටපු ගරු භාණ්ඩාගාරික එස්.එච්. ජිනදාස මහතාගේ මෙහෙයවීම මත කාර්යාලීය ගොඩනැඟිල්ලේ වහළය අලුත්වැඩියා කිරීමත්, ජනේලවලට දැල් සවි කිරීමත්, බිත්ති හා ජනේලවල තීන්ත ආලේප කිරීමත් සිදු කරන ලදි.

වෙසක් සිරිසර සඟරාවේ පැරණි කලාප සංරක්ෂණය කිරීම සඳහා පරිලෝකනය කර වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ අදහසක් එවකට සංගමයේ විධායක කමිටු සාමාජික සී.එන්. බුලත්සිංහල මහතා විසින් ඉදිරිපත් කරන ලදි. ඒ සඳහා සංගමයේ ඉපැරණි සාමාජිකයකු වූ සිය පියා වන අභාවප්‍රාප්ත එස්.එම්.පී.බී. සකලසූරිය මහතාගේ පුස්තකාලයේ සුරක්ෂිතව ගබඩා කොට තිබූ, 1991 දී සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රථම වෙසක් සිරිසර කලාපය ද ඇතුළත් වෙසක් සිරිසර සඟරා 23ක් ගරු ලේකම් දුලනි සකලසූරිය විසින් ඔහු වෙත භාර දෙන ලදි. මේ වන විට ඒ සඟරාවල සිංහල ලිපි සියල්ල පරිලෝකනය කර ඇති අතර වෙබ් අඩවියට මුදා හැරීම නුදුරේ දී ම සිදු කෙරෙනු ඇත.

වෙසක් සිරිසර සඟරාව ප්‍රකාශන කටයුතු අප සංගමය වෙත පැවරීමටත් පෙර සිට ම එය මුද්‍රණය කටයුතු සිදු වූයේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ලේක්හවුස් ආයතනය මඟිනි. ආධාර මුදල් අඩු වීම සහ මුද්‍රණ වියදම් අධික වීම නිසා සහනදායී මිල ගණන් යටතේ රජයේ මුද්‍රණාලය මඟින් එම කටයුතු ඉටු කර දීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවයහි නියුතු සාමාජිකයන් කිහිප දෙනෙක් පසුගිය වසරේ මැදිහත් වූහ. ඒ, ජී.ඩී. ලලිත් ප්‍රියන්ත මහතා සහ ඔහු විසින් හඳුන්වා දෙන ලදුව සංගමයේ සාමාජිකත්වය ලබා ගත් එච්.එම්. ගුණතිලක මහතා හා ඩී.ඩී. ජගත් රොහාන් මහතා ය.

සංගමය සඳහා වෙබ් අඩවියක්, යූටියුබ් නාලිකාවක් සහ මුහුණුපොත් පිටුවක් ආරම්භ කිරීම සඳහා සියලු කටයුතු සංගමයේ භාණ්ඩාගාරික චාරුක කුමාරපේලි මහතා විසින් සිදු කර ඇති අතර මේ වසර අවසන් වීමට පෙර රාජ්‍ය සේවා බෞද්ධ සංගමයට මෙන් ම වෙසක් සිරිසර සඟරාවට ද අන්තර්ජාල ප්‍රවේශයක් එමඟින් විවෘත වනු ඇත.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මඟින් වාර්ෂිකව පවත්වන ලද වර්ෂාවසාන සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව අඛණ්ඩව පවත්වා ගෙන යාමට ප්‍රධාන ම බාධාවක් වූයේ වියදම් අඩු කිරීම සඳහා රජය විසින් ගෙන එන ලද නීති රෙගුලාසි හේතුවෙන් මෙතෙක් සංගමයට ලැබෙමින් තිබූ ඍජු හා වක්‍ර ආධාර සහ අනුග්‍රහ නොලැබී යාමයි. විදුලිබල මණ්ඩලය මඟින් රාත්‍රිය පුරා ලැබුණ විදුලිබල සැපයුම, ගුවන්විදුලි සංස්ථාව මඟින් කරන ලද සජීව විකාශනය, පිරිත් මණ්ඩපය, භේරිවාදක කණ්ඩායම යන සියල්ලට ම මුදල් ගෙවීමට සිදු වූ අතර ජනාධිපති කාර්යාලය, මහා භාරකාර දෙපාර්තමේන්තුව වැනි රජයේ කාර්යාලවලින් ලැබුණ ආධාර ද නවතා තිබූ බැවින් එකී වියදම් දැරීමට තරම් ප්‍රමාණවත් අරමුදල් සංගමය සතුව නොතිබිණ.

රටට ම සෙත් පතා සිදු කරන මෙම සර්වරාත්‍රික පිරිත සජ්ඣායනය කිරීම සඳහා වඩාත් නිවැරදි ලෙස උච්චාරණය කරන පරිත්‍රාණභාණක ස්වාමීන් වහන්සේලා දිවයිනෙහි නන් දෙසින් වඩම්මවා ගැනීමට සිදු වූ බැවින් ප්‍රවාහන වියදම් ද ඉතා අධික විය.

එසේ ම සංගමයේ සක්‍රිය සාමාජිකයන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වෙමින් පැවැති අතර වාර්ෂික පින්කමට සක්‍රියව සහභාගි වන සියලු දෙනා ඉක්ම ගිය යෞවනත්වයෙන් පසු වූ බැවින් අදාළ සියලු කටයුතු කුලී පදනම යටතේ මුදල් ගෙවා බාහිර පුද්ගලයන් ලවා ඉටු කර ගැනීමට සිදු විය. මේ සියලු හේතූන් නිසා වාර්ෂික පරිත්‍රාණ ධර්ම දේශනා පින්කම තාවකාලිකව නවත්වා දැමීමට තීරණය කරන ලද අතර ඒ වෙනුවට තෝරා ගත් විහාරස්ථානයකට හෝ නිවාසයකට දානයක් පිරිනැමීමට කටයුතු කරන ලදි.

සංගමයට ලැබෙන ආධාර සීමා වී ඇති බැවින් ආදායම් උපයා ගැනීමේ මාර්ගයක් ලෙස ආරම්භ කරන ලද දඹදිව පුණ්‍යභූමි වැඩසටහන එම්.කේ.බී. දිසානායක මහතාගේ සංකල්පයකි. (ඒ පිළිබඳව ලිපියක් මෙම කලාපයේ වෙනත් තැනක පළ කර ඇත.)

වෙසක් සිරිසර සඟරාවෙහි මුද්‍රණ වියදම් ආවරණය කර ගැනීම සඳහා දැන්වීම් පළ කිරීම ද යෝජනා වූ නමුත් වෙළෙඳ කටයුතු සඳහා සඟරාව අවභාවිත කිරීම නොහොබනේ ය යන අදහසක් එවකට සංස්කාරක මණ්ඩලය විසින් දරන ලදි. ඒ වෙනුවට සඟරාවෙහි පළ කරනු ලබන ලිපි සඳහා දානපතියන්ගේ අනුග්‍රාහකත්වය ලබා ගැනීම නියෝජ්‍ය ලේකම් එම්.ඩී. නන්දන කුරේ මහතාගේ යෝජනාවක් අනුව ක්‍රියාත්මක කෙරේ.

වෙසක් සිරිසර සඟරාව රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන බව සඟරාවෙහි සඳහන් කර ඇති නමුත් එහි පාඨකයන්ට එකී සංගමය පිළිබඳව පැහැදිලි අදහසක් නැත. එබැවින් අප සංගමය පිළිබඳව පාඨකයන් දැනුවත් කිරීම සුදුසු යැයි ගරු භාණ්ඩාගාරික චාරුක කුමාරපේලි මහතා විසින් කරන ලද යෝජනාව අනුව මෙවර 90 වැනි සාංවත්සරික වෙසක් සිරිසර සඟරාව තුළින් රාජ්‍ය සේවා බෞද්ධ සංගමය හා වෙසක් සිරිසර සඟරාව යන දෙක ම පිළිබඳ මනා අවබෝධයක් පාඨකයාට ලබා දීමට ලිපි රැසක් සම්පාදනය කරන ලදි.

රජයේ සේවයෙහි නියුතු බෞද්ධයන් 1954 දී සම්මේලනයක ස්වරූපයෙන් ඒකරාශී වීමට හේතු සාධක වූ කාරණය (මෙම සඟරාවේ වෙනත් ලිපියක සවිස්තරව දක්වා ඇත.) අද කාලයට අදාළ නොවන අතර ඉංග්‍රීසි පාලන සමයේ දී මෙන් මෙරට රජයේ සේවයේ නියුක්ත සිංහල බෞද්ධයන්ට සිය වත්පිළිවෙත්වල නිරත වීමට කිසිදු බාධාවක් නැත. එහෙයින් අනෙකුත් සියලු ම බෞද්ධ සංවිධාන මඟින් සිදු කරන ආකාරයට පින්කම් සංවිධානය කිරීම තව දුරටත් රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ කාර්ය භාරය නොවේ.

වර්තමානයේ අපට අවශ්‍යව ඇත්තේ රාජ්‍ය සේවයට බෞද්ධකම ඇතුළත් කර ගන්නා ආකාරය පිළිබඳව රජයේ සේවකයන් දැනුවත් කිරීම ය. එනම් නියම බෞද්ධයන් වශයෙන් රාජ්‍ය සේවයෙහි නිරත වන්නට පුරුදු කිරීම ය. වංචාව, දූෂණය, නාස්තිය, හොරකම ඔඩු දුවා ඇති රාජ්‍ය යාන්ත්‍රණයක මෙය එතරම් පහසු කටයුත්තක් නොවන නමුත් සංගමයේ සාමාජිකත්වයෙන් ආරම්භ කොට ක්‍රමයෙන් ව්‍යාප්ත කිරීමට හැකි නම් එය සංගමයක් වශයෙන් අපට සමස්ත රාජ්‍ය සේවයට ම ඉටු කළ හැකි ඉතා අනර්ඝ සේවාවක් වනු ඇත.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ සාමාජිකයන් වන අපි සෙසු රාජ්‍ය සේවකයන්ට ආදර්ශවත් වෙමු. අපේ ආදර්ශය අනුව සමීපතමයන් තුළ අවංක රාජ්‍ය සේවා සංකල්පය ක්‍රමයෙන් ව්‍යාප්ත කිරීමට උත්සාහ කරමු. එක් එක් කුඩා වේයාගේ කැපවීමෙන් විශාල තුඹසක් තැනෙන්නා සේ, කුඩා මීමැස්සන් රැනක් එක් වී විශාල මීවදයක් බඳින්නා සේ අපි එක් එක් සාමාජිකයා අපේ සේවා ස්ථානය තුළ බෞද්ධ ප්‍රතිපත්ති ස්ථාපනය කිරීමට උත්සාහ කරමු. ඒ තුළින් වඩාත් මිත්‍රශීලී රාජ්‍ය සේවාවක් මහජනතාව වෙත පිරිනැමීමට රජයට සහාය වෙමු.

## 2.10 දඹදිව පුණ්‍ය භූමි වන්දනා චාරිකාව

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය රජයේ සේවකයන් අතර ප්‍රචලිත කිරීමත්, එමඟින් සංගමයේ සාමාජිකත්වය ඉහළ නංවා ගැනීමත් සඳහා ගත හැකි ක්‍රියා මාර්ග කවරේ දැයි දීර්ඝ කාලයක් සෑම අංශයකින් ම අත්හදා බලමින් සිටි සංගමයේ එවකට හිටපු ගරු සභාපති එම්.කේ.බී. දිසානායක මහතාගේ සිතට රාජ්‍ය සේවකයන් උදෙසා දඹදිව වන්දනා චාරිකාවක් සංවිධානය කිරීමේ අදහසක් පහළ විය.

මෙම වන්දනා චාරිකා සඳහා සංගමයේ සාමාජිකයන්ට මෙන් ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ද සහභාගි විය හැකි වූ අතර සහනදායී මිළ ගණන් යටතේ ආරක්ෂිතව, වගකීමක් සහිතව, සැපපහසුකම් ඇතිව, පුහුණු මාර්ගෝපදේශකයන් යටතේ මෙම වන්දනා චාරිකාව සංවිධානය කරන ලදි.

මේ සඳහා 2019 වර්ෂයේ දී පළමුවරට සංගමය සමඟ ගිවිසුම්ගත වූයේ කඳාන, බටගම, ගණේමුල්ල පාරේ ගැමුණු ට්‍රැවල්ස් ආයතනයයි. එක් අයකුගෙන් රු. 97,500/-ක් වැනි සාධාරණ මුදලක් අය කරමින් මෙම වන්දනා චාරිකාව සංවිධානය කළ ගැමුණු ට්‍රැවල්ස් අධිපති ගාමිණී සිරිවර්ධන මහතා එක් සාමාජිකයකු වෙනුවෙන් සංගමයේ අරමුදලට රු. 1,000/-ක මුදලක් ලබා දීමට ගිවිසුම ප්‍රකාරව එකඟතාවකට පත් විය. තව ද සංගමයේ සාමාජිකයන්ට මෙම ගමන් වියදම් සඳහා රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත් ණය පහසුකම් සැලසීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ගිවිසුමක් ද අත්සන් කරන ලදි.

මෙහි ප්‍රථම නියමු ව්‍යාපෘතිය වශයෙන් 2019 ඔක්තෝබර් මස 24 වන දින රජයේ සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්

15 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් දඹදිව බලා ගමන් අරඹන ලදි. මෙම චාරිකා සංවිධානය කිරීමේ මූලික අරමුණ සංගමයේ සාමාජිකත්වය වැඩි කර ගැනීම වුව ද මෙම නියමු ව්‍යාපෘතිය සඳහා සහභාගි වූ රජයේ සේවකයන් කිසිවෙක් සංගමයේ සාමාජිකත්වය ලබා නොගැනීම කනගාටුවට කරුණකි.

මීළඟ කණ්ඩායම එක්රැස් කිරීමට ප්‍රථම ගැමුණු ට්‍රැවල්ස් ආයතනය සමඟ ගිවිසුමකට එළඹිය යුතුව තිබුණ ද 2020 වර්ෂයේ දී මුළු ලෝකයට ම බලපෑ කොරෝනා වසංගතය හා සමගාමීව වන්දනා ගමන් සහ එතෙර ගමන් අත්හිටුවීමට සිදු වූ බැවින් දඹදිව වන්දනා ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දැමිණ.

ඉන් අනතුරුව සංගමය වෙනුවෙන් චාරිකා සංවිධානය කිරීම සඳහා ගිවිසුමකට එළඹියේ ඡජබ ඔර්ෑකි ආයතනයයි. මේ වන විට ගුවන් ප්‍රවේශ පත්‍රවල මිල මෙන් ම අනෙකුත් වියදම් ද ඉහළ ගොස් තිබූ බැවින් වන්දනා ගමනෙහි බරපැණ රු. 250,000/-ක් වූ අතර එක් අයකු වෙනුවෙන් සංගමයට රු. 5,000/-ක් ලබා දීමට එකඟ වෙමින් ගිවිසුමකට එළඹ තිබිණ. ඒ අනුව දඹදිව පුණ්‍ය භූමි යන නමින් ප්‍රචාරය කරන ලද මෙම දඹදිව වන්දනා චාරිකා වැඩසටහන සඳහා නව දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් 2023 ඔක්තෝබර් මස දඹදිව බලා පිටත්ව ගිය අතර ගිවිසුම ප්‍රකාරව රු. 45,000/-ක මුදලක් සංගමයේ අරමුදලට ලැබිණ.

චාරිකා සංවිධානය කිරීමේ කටයුතු බාහිර පාර්ශ්වයක් වෙත නොපවරා සංගමය මඟින් ම සිදු කිරීම වඩා සුදුසු යැයි එවකට සිටි ගරු සභාපති එම්.කේ.බී. දිසානායක මහතා විසින් තීරණය කරන ලද අතර ඒ සඳහා දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරන ආයතනයක් වශයෙන් රාජ්‍ය සේවා බෞද්ධ සංගමය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදි. ඒ සඳහා සුදුසුකම් සපුරා ලීමට නම් දඹදිව වන්දනා ගමන් වාර තුනක් ගොස් තිබිය යුතු වූ අතර ඉන් එක් අවස්ථාවක වත් ආයතනයේ ප්‍රධානියා සහභාගි විය යුතුව තිබිණ.

ඒ අනුව මීළඟ දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාව සංවිධානය කරන ලද්දේ එම්.කේ.බී. දිසානායක මහතා සහ ඩබ්ලිව්.ඒ.ආර්. සඳනායක මහතා ප්‍රමුඛ කණ්ඩායමක් විසිනි. දින 14ක් වන එම වන්දනා චාරිකාව සඳහා වන ගෙවීම රු. 245,000ක් වූ අතර චාරිකාවෙහි

යෙදෙන එක්අයකු වෙනුවෙන් රු. 5,000/-ක් සංගමයේ ගිණුමට බැර කිරීම මෙවර ද ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව තුන් වන වන්දනා නඩය 2024 මාර්තු මස 22 වැනි දින දිවයිනෙන් පිටත් වූ අතර ඒ සඳහා දිසානායක මහතා ද ඇතුළුව 15 දෙනකු සහභාගි වූ බැවින් සංගමයේ අරමුදලට රු. 75,000ක මුදලක් බැර විය.

දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාවේ මීළඟ දඹදිව සැරිසරයන් මෙම වසරේ අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී සංවිධානය කිරීමට සැලසුම් කර ඇත. රාජ්‍ය සේවකයන්ට හා විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ට මෙන් ම ඔවුන්ගේ දෙමව්පියන් ඇතුළු පවුලේ සාමාජිකයන්ට ද සහභාගි විය හැකි මෙම දඹදිව සැරිසරී චාරිකාව මඟින් විශ්වාසය, ආරක්ෂාව, සුවපහසුව, බෞද්ධ විනය ආරක්ෂා වන අන්දමින් විශේෂ දාන, ශීල, සමාධි භාවනා වැඩසටහන් සංවිධානය කෙරෙන අතර පුහුණු සංචාරක උපදේශකවරුන් යොදවා විස්තර කථනයන් ද සිදු කරනු ලැබේ.

සංගමයේ සාමාජිකයන්ට මෙම ගමන් වියදම් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් අඩු පොලියකට රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත් ණය පහසුකම් ද සලසන අතර දඹදිව සැරිසර චාරිකාව පිළිබඳව වැඩි විස්තර පහත සඳහන් සබැඳියන් ඔස්සේ ඔබට ලබා ගත හැකි ය.

ඩබ්ලිව්.ඒ.ආර්. සඳනායක
දඹදිව සැරිසර චාරිකා සම්බන්ධීකාරක

දුරකතන අංකය: 0701599997
විද්‍යුත් තැපෑල : info@gsba.lk
වෙබ් අඩවිය: www.gsba.lk

# බොජ්ඣංග ධර්ම හැදෑරීමට පෙරවදනක් 03


ශාසන වංශාභිධජ, සද්ධම්මජෝතික, දර්ශන විශාරද, අග්ගමහා පණ්ඩිත,

**අතිපූජ්‍ය මකුලෑවේ විමලාභිධාන**

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මහා ස්ථවිර


මහා කස්සප, මහා මොග්ගල්ලාන, මහාචුන්ද නමින් සූත්‍රාන්ත දේශනා තුනක් බෞද්ධ සමාජයේ ව්‍යාප්ත ව පවතී. පිරුවානා පොතේ දෙවැනි බණවරෙහි "බොජ්ඣංග පරිත්ත'' වශයෙන් දැක්වෙන එම සූත්‍රාන්ත දේශනා පිරිත් පොතට එනම් චතුභාණවාර පාලියට උපුටා ගෙන ඇත්තේ සූත්‍ර පිටකයට අයත් සංයුක්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ ගිලාන වර්ගයෙනි. එහි ගිලාන සුත්තං, දුතිය ගිලාන සුත්තං, තතිය ගිලාන සුත්තං ලෙස නම් කර ඇති එම සූත්‍ර තුන චතුභාණවාර පාලියට හෙවත් පිරිත් පොතට ගෙන ඇත්තේ පහත දක්වෙන ආකාරයෙනි.

| සංයුක්ත නිකාය | චතුභාණවාර පාලිය |
|---|---|
| ගිලාන සුත්තං | මහා කස්සපත්ථෙර බොජ්ඣංග පරිත්තං |
| දුතිය ගිලාන සුත්තං | මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග පරිත්තං |
| තත්තිය ගිලාන සුත්තං | මහා චුන්දත්ථෙර බොජ්ඣංග පරිත්තං |

සංයුක්ත නිකායේ සූත්‍රය නම් කර ඇත්තේ එය දේශනා කිරීමට හේතු වූ සිද්ධිය මුල් කර ගෙන ය. පිරිත් පොතේ නම් කර ඇත්තේ පුද්ගලයා මුල් කර ගෙන ය. කෙසේ වුව ද මෙම සූත්‍ර දේශනාවන්ගෙන් කියවෙන්නේ රෝගාතුර ව ආබාධිතව (ආබාධිතෙ) දුකට පත්ව (දුක්ඛිතෝ) දැඩි සේ ගිලන්ව (බාළ්හ ගිලානො) සිටින අවස්ථා තුනක

දී ම සත්ත බොජ්ඣංගය රෝගියාට සිහිපත් කර දීමෙන් සුවපත් වූ අවස්ථා තුනක් ගැන ය. මෙහි රෝගීන් වශයෙන් මහරහත් නමක්, අගසව් නමක්, බුදුවරයෙක් මුණ ගැසෙති. ලොව ජීවත් වූ ඉහළ ම ගණයේ බුද්ධිමතුන් තිදෙන දැඩි රෝගී බැවින් මිදුණේ සත්ත බොජ්ඣංගයන් නාමික වශයෙන් තවකකු කියනු අසා සිටීමෙනි.

එහි බොජ්ඣංග හත ප්‍රකාශ කරන්නේ ".................. සම්බොජ්ඣංගො බො (මොග්ගල්ලාන) මයා සම්ම දක්ඛාතෝ භාවිතො බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති." යන වැකියෙනි. මුලින් ඇති හිස් තැනට අනුපිළිවෙලින් 1. සති 2. ධම්ම විචය 3. වීරිය 4. පීති 5. පස්සද්ධි 6. සමාධි 7. උපේක්ඛා යන වචන යොදනු ලැබේ. ඒ වැකියෙහි යොදා ඇති සම්බොජ්ඣංග, සම්ම දක්ඛාත, භාවිත, බහුලීකත, අභිඤ්ඤාය, සම්බෝධාය, නිබ්බාණාය යන වචන ගැන අට්ඨ කථාවෙන් හා ගුරු ඇසුරින් දැනීමත් ඇති කර ගැනීම අවශ්‍ය ය. එසේ ම බොජ්ඣංග, සම්මා සම්බොජ්ඣංග යන දෙවදන අර්ථ වශයෙන් වෙනස් වන අයුරු ද වටහා ගැනීම මැනවි. (බෝධාය සංවත්තන් තිතී - බොජ්ඣංගා අනුබුජ්ඣන්තීති...... පටිබුජ්ඣන්තීති සම්බුජ්ඣන්තීති බොජ්ඣංගා පසත්ථො සුන්දරො බොජ්ඣංගා සම්බොජ්ඣංගා)

මහා කස්සප මහ රහතන් වහන්සේ රෝගාතුර වුණු දවසක බුදුරජාණන් වහන්සේ පිප්ඵලි ගුහාවට වැඩම කොට පැවැත් වූ දේශනාව (ගිලාන සුත්තං) මහා කස්සපත්ථෙර බොජ්ඣංග පරිත්ත නමිනුත්, මහා මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ රෝගාතුර වුණු දවසක ගිජ්ඣකූට පර්වතයට වැඩම කොට පැවැත් වූ දේශනාව (දුතිය ගිලාන සුත්ත) මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග පරිත්ත නමිනුත් පිරිත් පොතේ දැක්වෙයි. එම සූත්‍ර දෙක්හි ම වචන මාලාවේ වෙනසක් නැත. සුළු වෙනසකට ඇත්තේ ස්ථාන හා පුද්ගල නාමය පමණි. බුදු රජාණන් වහන්සේ මහා කස්සප මහරහතන් වහන්සේගෙන් මෙසේ අසති:-

"කච්චි තෙ කස්සප ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වේදනා? පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්ක මෝසානං පඤ්ඤායති. නො අභික්කමෝති"

(කාශ්‍යප, ඔබ වහන්සේට ඉවසන්නට පුළුවන් ද? යැපෙන්නට පුළුවන් ද? දුක් වේදනාවන්, කැක්කුම් කොහොම ද? අඩු ද? වැඩි නැද්ද? අඩු වන බවක් පෙනේ ද? වැඩි වන බවක් නො පෙනේ ද?)

මහා කසුප් මහ රහතන් වහන්සේ එයට මෙසේ පිළිතුරු දෙති:-

"න මේ භන්තේ ඛමනීයං, න යාපනියං බාළ්හා මේ දුක්ඛා වේදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්ක මෝසනාං පඤ්ඤායති, නෝ පටික්කමොති"

(භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, මට ඉවසන්නට නො හැකියි. හතර ඉරියව්වලින් එක ඉරියව්වකවත් ශරීරය පවත්වා ගන්නට බැරි ය. මගේ දුක් වේදනා ඉතා බලවත් ය. ඒවා වැඩි වෙනවා මිස අඩු වන්නේ නැත. අඩුවක් වන බවක් වත් පෙනෙන්නේ නැත.)

ඒ තොරතුරු විමසීම මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග පරිත්තයේ දැක්වෙන්නේ ද ඒ ආකාරයෙන්මයි. මේ නිදසුනක් පමණි. වෙනසකට ඇත්තේ නම්ගම්වල පමණි. සසඳා බලන්න.

එහෙත් මහා චුන්දත්ථෙර බොජ්ඣංග පරිත්තයේ ඊට වඩා වෙනස්කම් ඇත. බුදු රජාණන් වහන්සේ අසනීපව රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ සිටින බව දැන ගත් මහා චුන්ද තෙරුන් වහන්සේ එහි වැඩම කළහ. එහි දී බුදුරජාණන් වහන්සේ "පටිභන්තු තං චුන්ද බොජ්ඣංගා" (චුන්ද, ඔබට බොජ්ඣංග ධර්මයෝ වැටහෙත්වා) යි වදාරති. "සත්තිමේ භන්තේ බොජ්ඣංගා භගවතා සම්ම දක්ඛාතා, භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය. නිබ්බාණාය සංවත්තන්ති" (ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ සත්ත බොජ්ඣංග ධර්ම මනා කොට වදාරන ලද්දේ ය, වඩන ලද්දේ ය, නැවත නැවතත් වඩන ලද්දේ ය, පුරුදු කරන ලද්දේ ය. ඒවා මනා කොට දැනීම පිණිස, සම්මා සම්බෝධිය පිණිස, නිවන් පිණිස පවතින්නේ ය) යි පවසා, චුන්ද තෙරණුවෝ බුදු රජාණන් වහන්සේට ඇසෙන සේ කියා පෑහ.

මහා කස්සප, මහා මොග්ගල්ලාන යන දෙනමත් බුදුරජාණන් වහන්සේත් දැඩි සේ ගිලන් බවට පත් වූ අවස්ථා තුනක දී සත්ත බොජ්ඣංග ධර්මයන්ට සවන් දීමෙන් සුවපත් වූ බව "වුට්ඨාහිච තම්භා ආබාධා තථා පහීනෝ..........සෝ ආබාධෝ" යි ඒ ඒ සූත්‍ර අවසානයෙහි දැක්වෙයි.

ඉහත දැක්වූ බොජ්ඣංග සූත්‍රවලට අමතරව පිරුවානා පොත් වහන්සේගේ උපග්‍රන්ථයෙහි ද බොජ්ඣංග පිරිතක් දැක්වෙයි. පාලි

භාෂාවෙන් රචිත ගාථා එකොළොසකින් යුත් ඒ පිරිත පශ්චාත් කාලීනයකු විසින් අක්ෂර පිහිටුවා ප්‍රබන්ධ කරන ලද්දකැයි සැලකෙතත් ඒ බොජ්ඣංග පිරිත අවසානයේ "රෝග සුවය සඳහා රෝගීන්ට කියන පිරිතකැ"යි විශේෂයෙන් සටහන් කර ඇත. ඒ බොජ්ඣංග පිරිත මෙසේය.

01. "සංසාරෙ සංසරත්තානං - සබ්බ දුක්ඛ විනාසකේ
සත්ත ධම්මේ ච බොජ්ඣංගේ - මාර සේනප්පමද්දී නෝ

02. බුජ්ඣිත්වා යේ පි මේ සත්තා- තිභවා මුත්තාහි උත්තමා
අජාතිං අජරං ව්‍යාධිං - අමතං නිබ්භයං ගතා

03. ඒවමාදි ගුණෝපේතං - අනේක ගුණ සංගහං
ඕසධංච ඉමං මන්තං - බොජ්ඣංගාච තතෝ පරේ

04. බොජ්ඣංගෝ සති සංඛාතෝ - ධම්මානං විචයෝ තථා
වීරියං පීති පස්සද්ධි - බොජ්ඣංගා ච තතෝ පරේ

05. සමාධිපෙක්ඛා බොජ්ඣංගා - සත්තේ තේ සම්ම දස්සිනා
මුනිනා සම්ම දක්ඛාතා - භාවිතා බහුලීකතා

06. සංවත්තන්ති අභිඤ්ඤාය - නිබ්බානාය ච බෝධියා
ඒතේනසච්ච වජ්ජේන - සොත්ථි තේ හෝතු සබ්බදා

07. ඒකස්මිං සමසේ නාථෝ - මොග්ගල්ලානඤ්ච කස්සපං
ගිලානෝ දුක්ඛිතෝ දිස්වා - බොජ්ඣංගෝ සත්ත දේසයි

08. තේ ච තං අභිනන්දිත්වා - රෝගා මුච්චිංසු තං ඛණේ
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි තේ හෝතු සබ්බදා

09. ඒකදා ධම්ම රාජාපි - ගේලඤ්ඤේනාභි පීළිතෝ
චුන්දත්ථේරේන තංයේව - භණා පෙත්වාන සාදරං

10. සම්මෝදිත්වා ච ආබාධා - තම්හා වුට්ඨාසි ඨානසෝ
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි තේ හෝතු සබ්බදා

11. පහීණා තේ ච ආබාධා - තිණ්ණන්නම්පි මහේසිනං
මග්ගාහත කිලේසාව - පත්තානුපත්ති ධම්මතං

ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි තේ හෝතු සබ්බදා

මෙම බොජ්ඣංග පිරිත එකසිය අටවරක් හෝ ඊට අඩු වැඩි වාර ගණනක් කියා පැරණි තෙරවරු, වෙදවරු, වැඩිහිටියෝ රෝගීන්ට ආශිර්වාද කළහ. මෑතක් වන තුරු රජයේ රෝහල් කරා වැඩම කර පැවැත් වූ භික්ෂූන්ගේ ආරෝග්‍යශාලා සේවයේ දී උන් වහන්සේලා මෙම බොජ්ඣංග පිරිත භාවිත කළහ. තම නිවසේ නැතහොත් රජයේ රෝහලක ඇඳක පැදුරක වැතිරී දුකින් කල් ගෙවන රෝගියාට පන්සලේ හාමුදුරුවන්ගේ මුවින් පිට වන ඒ කාරුණික වදන්වලින් ලැබුණේ මහත් සැනසීමකි. එම සේවය සැලසූ භික්ෂුව ද "යො ගිලානං උපට්ඨහති සො මං උපට්ඨහති" යන බුදු වදන අනුව ක්‍රියා කර කුසල් රැස් කර ගත්තේ ය.

මෙසේ බුදුරජාණන් වහන්සේගේ පටන් සියල්ලන්ට ම රෝගාතුර වූ අවස්ථාවල දී ශ්‍රවණය කළ පමණින් මහත් සැනසිල්ලක් ගෙන දුන් 'බොජ්ඣංග' යන වචනයේ අර්ථය තේරුම් ගැනීම අප කාටත් ප්‍රයෝජනවත් ය. මෙය විවිධ නයින් අටුවාටීකා ග්‍රන්ථයන්හි විස්තර කර ඇත. මුල දී සරලව තේරුම් ගැනීම වඩා පහසු ය. ඒ සඳහා සංයුක්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ ඇතුළත් භික්ෂු සූත්‍රයේ මේ සරල අනුවාදය කියවන්න.

භික්ෂුවක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ නමස්කාර කොට පසෙක හිඳ මෙසේ ඇසුවේය. "ස්වාමීනි, බෝධි අංග, බොජ්ඣංග කියා කියනු අසන්නට ලැබේ. ස්වාමීනි, කොපමණකින් මේ බෝධි අංග කියා කියනු ලැබෙද්ද?"

"මහණ, අවබෝධය පිණිස පවතී යැයි බෝධි අංග (බොජ්ඣංග) කියනු ලැබේ. මහණ, මෙහි විවේක නිස්සිත, විරාග නිස්සිත, නිරෝධ නිස්සිත, වොස්සග්ග පරිණාමනිස්සිතව සති සම්බොජ්ඣංගය, ධම්ම විචය සම්බොජ්ඣංගය, වීරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. මේ සත් බෝධි අංග වඩන ඔහුගේ සිත කාමාසවයෙනුත් මිදෙයි, භවාසවයෙනුත් මිදෙයි, මිථ්‍යාසවයෙනුත්, දිට්ඨා අවිජ්ජාසවයෙනුත් මිදෙයි. මිදුණ කල්හි මිදුණේය කියා ඥාණය වෙයි. ජාතිය අවසන් විය ............ මේ වෙනුවෙන් තව අනෙකක් නැහැ

කියා දැන ගනී. මහණ, අවබෝධය පිණිස පවතී යයි බෝධි අංග කියා කියනු ලැබේ." (සිංහල සංයුක්ත නිකාය 2. 892 පි)

එක් එක් බොජ්ඣංගයන් අනු පිළිවෙළට හැදෑරීමෙන් ද, සංයුක්ත නිකායේ බොජ්ඣංග සංයුක්තය කියවීමෙන් ද සත්ත බොජ්ඣංගය පිළිබඳ දැනීමක් ලබා ගැනීමට මඟ පාදා ගත හැකි ය.

# ථෙරවාදී මූලාශ්‍රවල දැක්වෙන බුද්ධ චරිතයේ විශේෂතා 04

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)
**උතුරාවල ධම්මරතන ස්ථවිර**
චිත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය
අංක 738/01, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ - කැළණිය

බුද්ධ චරිතය සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමේ දී උපයෝගී කර ගත හැකි මූලාශ්‍රයන් දෙකක් පවතී. එනම් ථේරවාදී මූලාශ්‍රයන් හා මහායාන මූලාශ්‍රයන් ය. මෙහි දී මාගේ අපේක්ෂිත අරමුණ වන්නේ ථේරවාදි මූලාශ්‍රයන්හි ප්‍රතීයමාන බුද්ධ චරිතයේ සුවිශේෂතා විමසා බැලීම ය. මහායානය තුළ ඇති මානුෂික තත්ත්වයන් පිළිබිඹු වීමක් සමස්ත බුද්ධ චරිතය පුරාවට දක්නට ඇත. එනමුත් ථේරවාදය මෙකී තත්ත්වය ප්‍රතික්ෂේප කරමින් මානුෂික තත්ත්වාරෝපණයක් බුද්ධ චරිතයට ඇතුළත් කළ අයුරු හැඳිනගත හැකි ය. ඒ බව විවිධ ථේරවාදී මූලාශ්‍රයන් තුළින් ගම්‍යමාන වේ.

බුදුරජාණන් වහන්සේ කවරෙක් ද, යන්න හැඳින ගත හැකි හොඳම සාධකයක් ලෙස

බුදුරජාණන් වහන්සේ හා ද්‍රෝණ බමුණා අතර ඇති වන සංවාදය සැලකිය හැකි ය.

ද්‍රෝණ බමුණා: ඔබ දෙවියෙක් ද?

තථාගතයාණෝ: බමුණ, මම දෙවියෙක් නො වෙමි.

ද්‍රෝණ බමුණා: ඔබ ගාන්ධර්වරයෙක් ද?

තථාගතයාණෝ: බමුණ, මම ගාන්ධර්වයෙක් ද නො වෙමි.

ද්‍රෝණ බමුණා: ඔබ යක්ෂයෙක් ද?

තථාගතයාණෝ: බමුණ, මම යක්ෂයෙක් ද නො වෙමි.

ද්‍රෝණ බමුණා: ඔබ මනුෂ්‍යයෙක් ද?

තථාගතයාණෝ: බමුණ, මම ද නො වෙමි.

බ්‍රාහ්මණය, මම දෙවියෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ යක්ෂයෙක් හෝ මනුෂ්‍යයෙක් වී නම් කාමාදී ආශ්‍රවයන් මා තුළ තිබිය යුතු ය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කළෙමි.

එමෙන් ම බුදුරජාණන් වහන්සේ තව දුරටත් ද්‍රෝණ බමුණාට මෙසේ දේශනා කරති.

"පුණ්ඩරිකං යථා වග්ගු
තොයෙන නූපලිප්පති
නූපලිත්තොම්හි ලෝකේන
තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ"

ඉහත ගාථාවෙන් අදහස් වන්නේ මෙබන්දකි. "බ්‍රාහ්මණය, උපුලක් හෝ පියුමක් හෝ හෙල පියුමක් හෝ දියෙහි ඉපිද දියෙහි වැඩී දියෙන් ඉස්මතු වී දියෙහි නොගැටී පවතින්නාක් මෙන් මමත් ලේකයෙහි මිනිසුන් අතර වැඩී ලෝකයාගෙන් මිනිසුන්ගෙන් ඉස්මතු වී ලෝකයා සමග නොගැටී නොබැඳී සිටිමි. ඒ නිසා මම බුදුවරයෙක්මි", යනුවෙනි.

මෙසේ විස්තර වන සාකච්ඡාව තුළින් තමන් වහන්සේ උත්තර මනුෂ්‍යයෙක් බව ද "බුද්ධ" බව ද විශේෂයෙන් දක්වා ඇත. එපමණක් නොව ලෝක බන්ධනයන්ගෙන් මිදී වාසය කළ තථාගතයන් වහන්සේ 'ආශ්චර්ය මනුෂ්‍ය' නම් වන බව උන් වහන්සේ විසින් ම සඳහන් කර තිබේ.

උදායි හිමියන් බුදුරජාණන් වහන්සේ පිළිබඳ කරනු ලබන විස්තරය තුළින් ද විස්තර වනුයේ බුදු රජාණන් වහන්සේගේ අති උත්තම මනුෂ්‍යත්වයයි.

"මනුස්සභූතං සම්බුද්ධං අත්තදන්තං සමාහිතං
ඉරියමාන බ්‍රහ්මපථෙ චිත්තස්සූපසමෙ රතං
යං මනුස්සා නමස්සන්ති ඉති මෙ අරහතො සුතං"

මෙහි දී, "සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය සිත සන්සුන් කිරීමෙහි නියැලුණු උතුම් මඟ ගමන් කරන සිත තැන්පත් කළ දමනය කළ මනුෂ්‍යයකු වූ යම් සම්බුදු කෙනකුට මනුෂ්‍යයෝ වඳිත් ද, දෙවියෝත් උන් වහන්සේට වඳිතැයි මහරහතන් වහන්සේලාගෙන් අසා තිබේ" යැයි උදායි හිමියෝ ප්‍රකාශ කරති. බුදුරජාණන් වහන්සේගේ මනුෂ්‍යත්වය (මනුස්සභූතං) සලකා ඇති බව පෙනේ. විශේෂයෙන් ථේරවාදයේ දී බුද්ධ චරිතය උදෙසා දේවත්වයක් ආරෝපණය කිරීමට කිසි විටෙකත් උත්සහ නොගෙන ඇති අතර සැම විට ම මනුෂ්‍යයකු ලෙසින් නිරූපණය කොට ඇත. බුදු රජාණන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයකු මෙන් ලෙඩ වීමට පත් වන බව සඳහන් වීම දේවත්වයක් ආරෝපණය නොවුණු බවට සාධකයකි.

"'මම දැන් ජරා දුර්වල වූයෙමි, වෘද්ධයෙක්මි, මහලු වූයෙමි, කලවයස් ගත වූයෙමි, පැසුළු වියට පත් වූයෙමි, අසූවිය පත් වූයෙමි."

"ස්වාමීනි, ආශ්චර්යයි! ස්වාමීනි, පුදුමයි! භාග්‍යවතුන් වහන්සේගේ ඡවි වර්ණය දැන් ඉස්සර මෙන් පිරිසිදුත් නැත, පැහැසරත් නැත. සියලු අවයවයන් ලිහිල්ය. රැලිත් වැටී තිබේ. ශරීරයත් ඉස්සරහට නැමී ගොසිනි. ඇස- කන- නාසය යන ඉන්ද්‍රියවල වෙනසත් මනාව පෙනේ" යනුවෙන් විටෙක දී බුද්ධ උපස්ථායක ආනන්ද තෙරුන් වහන්සේගේ ප්‍රකාශයෙන් හා ඉන් පසුව පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේගේ දේශනාවෙනුත් පොදු මිනිස් සිරුරකට සමානව වෙනස් වීම ස්වභාව කොට ඇති බව විස්තර කෙරේ.

"ආනන්ද, එහෙම තමයි. තරුණකමේ දිරන බව තිබේ. මේ නීරෝගී බවේ රෝගී බව තිබේ. ජීවිතයෙහි මැරෙන බව තිබේ."

මෙවැනි අවස්ථා රාශියක් ම ත්‍රිපිටකය තුළ දක්නට ලැබේ. එක් කලක විසූ භාග්‍යවතුන් වහන්සේට රළු ආබාධයක් ඇතිවිය. මරණ මාත්‍රා බලවත් වේදනා පවතී. භාග්‍යවතුන් වහන්සේ එම වේදනා සිහියෙන් නුවණින් විඩාවට පත් නොවෙමින් ඉවසූහ. "උපස්ථායකයන්ට කථා

නොකොට මම පිරිනිවන් පාන්නෙම් නම් එය මට නොමැනවැ"යි රෝගය වීර්යයෙන් මැඩ ගෙන ජීවිත සංස්කාර අධිෂ්ඨාන කොට ගෙන වාසය කළහ. රෝගයෙන් නැඟී සිට ගිලන් බවින් මිදුණු නොබෝ දිනකින් උන් වහන්සේ විහාර සෙවණැල්ලෙහි වැඩ හුන් සේක.

එවිට ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කොට හිඳ, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ අසනීපයෙන් මාගේ ඇඟ ගල් වූවාක් වගෙයි" යැයි වදාළහ.

එමෙන් ම බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ ගිලන් වූ අවස්ථාවක චුන්ද තෙරුන් ලවා බොජ්ඣංග දේශනා පවත්වා ගෙන සුවය ලැබූ බව සඳහන්ව ඇත.

මේ අනුව බුදු රජාණන් වහන්සේගේ ශරීරය අස්වාභාවික අති මානුෂික තත්ත්වයක් නොවන බව ථේරවාදයේ පිළිගැනීම වෙයි.

ගිජුකුළු පව්වේ සක්මන් කරන බුදුරජාණන් වහන්සේ විනාශ කරන චේතනාවෙන් දෙව්දත් තෙරණුවන් හෙළූ ගලින් තථාගතයාණන්ගේ පා ඇඟිල්ලක් තුවාල විය. ජීවක වෛද්‍යවරයා බෙහෙත් ගැල්වීමෙන් එය සුවපත් වුණි.

දිනක් බුදු රජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩම වන විට නන්දක තෙරුන් දහම් දේශනා කරමින් සිටි හෙයින් ඇතුළට නොපිවිස දොරටුව අසල සිට දෙසුම අවසානයේ උගුර පාදා දොරට තට්ටු කර ඇතුළට පිවිසියහ. නන්ද තෙරුන් අමතා, "ඔබගේ දෙසුම බොහෝ දිග ය. එය අවසන් වන තෙක් බිහි දොරෙහි සිට මාගේ පිට කොන්ද වේදනා සහිත වී යැ"යි පැවසූ සේක.

බුදු රජාණන් වහන්සේ අවසන් වස බේලුව ගමෙහි වැඩ වසද්දී දරුණු ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳුණි.

"ආනන්ද, මට ක්ලාන්තය දැනේ. හිඳගන්න අසුනක් පනවන්න"

"ආනන්ද, මට පිපාසය දැනේ. පානය සඳහා ජලය ගෙන එන්න"

"මගේ වයස ගත වී ඇත. ඉතිරි වී ඇත්තේ ස්වල්පයක් ය. ආනන්ද, මම දිරාගිය මහල්ලෙක්මි. මගේ වයස අසූවකි. දිරාගිය

කරත්තයක් පිළිසකර කොට පවත්නාක් මෙන් මගේ ශරීරය ද පවත්නේ යැයි සිතමි."

මේ අයුරින් ථේරවාදි දහමේ පිළිඹිබු වන්නේ මානුෂීය බුද්ධ චරිතය පිළිබඳ කථා පුවතක් බව පැහැදිලි ය.

සොහං බ්‍රාහ්මණ සම්බුද්ධෝ සලකත්තො අනුත්තරො

(බ්‍රාහ්මණය, සම්‍යක් සම්බුද්ධ වූ මම ශල්‍ය වෛද්‍යවරයෙක්මි.)

මහභිසක්කෝ නරදම්ම සාරථී

(නරදම් සැරි වූ බුදුරජාණන් වහන්සේ මහා භ෴ෂජ්‍ය වෛද්‍යවරයෙකි.)

උක්ත කරුණු තව දුරටත් විවරණය කර ගැනීම උදෙසා මේ අයුරින් නිදර්ශන රාශියක් සොයා ගත හැකි ය.

"මහණෙනි, මම දිව්‍යමය වූත් මනුෂ්‍ය වූත් සියලු බාධකවලින් මිදුණෙමි.'' යනුවෙන් කරන ප්‍රකාශය, මහායානයේ දී බුදුරජාණන් වහන්සේට කරන දේවත්වාරෝපණය ථේරවාදයේ දී ප්‍රතික්ෂේප වෙන්නකි.

ලෝකයෙහි 'ආජඤ්ඤ' පුරුෂ නාමයට සුදුසු එක ම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා ලොව්තුරා බුද්ධත්වයට පැමිණෙන උතුමාණෝ ය.

මේ අතර ප්‍රජාතන්ත්‍රවාදී බව, දර්ශනයේ ගතික බව, සමානාත්මතාවා, ශිෂ්ට නායකත්වය, සුබනම්‍ය ආචාර ධර්ම පද්ධතිය, විද්‍යානුකූලත්වය හා යුක්ති සහගත බව යනාදී සුවිශේෂී ලක්ෂණ රාශියක් ථේවාදි බුද්ධ චරිතයෙන් පිළිබිඹු වනු දක්නට ලැබේ.

ලෝකයේ ප්‍රථම වරට මහජන මතයක් උඩ පාලන ක්‍රමයක් ලොවට විදහා පෙන්වූ එක ම පුද්ගලයා බුදුරජාණන් වහන්සේ බව පෙර-අපර වියතුන්ගේ මතයයි. එබැවින් උන් වහන්සේ ප්‍රජාතන්ත්‍රවාදයේ නිර්මාතෘවරයා යැයි හැඳිනගැනීම නිවැරදිය. ස්ත්‍රී සමූහයාට ද නිදහස ලබා දීමේ ක්‍රමය වදාළහ. ඒ අනුව වත්මන් කාන්තා විමුක්තියේ නිර්මාතෘවරයා ලෙසින් ද බුදු රජාණන් වහන්සේ හැඳින්විය හැකි ය.

එසේ ම ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට ධර්ම දූත පිරිසක් මෙහෙයවා ඇත්තේ බුදු රජාණන් වහන්සේ ය. මෙසේ සුවිශේෂී සමාජීය චරිතයක් වශයෙන් ද ථේරවාද මූලාශ්‍රයන්හි බුද්ධ චරිතය හැඳිනගත හැකි ය.

එමෙන් ම තථාගතයන් වහන්සේ නිහතමානි බව හා උදාර නායකත්වය ද සුවිශේෂ ය.

"මම සංඝයා පරිහරණය කරමි. සංඝයා මා උදෙසා බැඳී සිටිය යුතු ය" යන හැඟීමක් මට නැත.

එපමණක් නොව බුදු රජාණන් වහන්සේගේ නිරපේක්ෂතාව කොතාරම් ද යත් ශ්‍රාවකයන් තමන් පිරිනිවුණු පසු ආදාහන කටයුතුවල නිරත වීම හෝ බලාපොරොත්තු නොවූහ.

තමන්ගේ ධර්මය තෝරා බේරා ගැනීමේ දී ලබා දී ඇති නිදහස වෙනත් ශාස්තෘවරයෙකුගෙන් හිමි නොවුණි. ථේරවාදී මූලාශ්‍රයන්ට අනුව මෙකී සුවිශේෂතාව බුද්ධ චරිතයේ පුරා ම දක්නට ඇත.

නොයෙක් දෙනා තමා ළඟට පැමිණ (රජවරු, සිටුවරු, ධනවතුන්, විද්වතුන්) තමන් සරණ යන බව ප්‍රකාශ කළ විට උන් වහන්සේ ඔවුන්ට නැවත සිතා බලා තීරණයක් ගන්නා ලෙසට අවවාද කළහ. උපාලි ගෘහපතියාට පවසන්නේ බුදුසමය වැළඳ ගත්තත් නිගණ්ඨනාථ පුත්‍රයන්ට සහ ඔහුගේ අනුගාමිකයන්ට කලින් දක්වන ලද අනුග්‍රහය ද නොවෙනස්ව පවත්වා ගෙන යා යුතු බවයි.

ථේරවාදී මූලාශ්‍රයන් අනුව බුදු රජාණන් වහන්සේට දින චරියාවක් තිබීම සුවිශේෂත්වයකි. උන්වහන්සේගේ දින චර්යාවට අනුව දිවා භාගය දෙකොටසකටත් රාත්‍රී භාගය දෙකොටසකටත් බෙදේ. පෙරබත් කිස, පසුබත් කිස යනුවෙන් දිවා භාගය බෙදේ. ඉතා අලුයම අවදි වන උන් වහන්සේට ධ්‍යානයට සම වැදීම ද, සක්මන් කිරීම ද නිමවා සිරුර පිළිදැකුම් කරති. අනතුරුව සමවත් සුවයෙන් කල් යවා පිඬු පිණිස වඩිති. කිසිදු භේදයකින් තොරව ගෙපිළිවලින් දනට වැඩීම උන් වහන්සේට අභිමත විය. අහර කිස නිමවීමෙන් පසු දායකවරුන්ට අනුමෙවෙනි බණ වදාරා විහාරයට වඩිති.

අපර භාගයේ විවේකයෙන් ඵලසමවතින් කල් ගෙවන බුදුරජාණන් වහන්සේ සවස සමවතින් නැඟී, පැමිණෙන සැදැහැවතුන්ට අවවාද දීම, ධර්ම දේශනා කිරීම ආදී බුද්ධ සේවාවන්හි නිරත වෙති. මධ්‍යම රාත්‍රිය වන තුරුත් අන්‍යයන්ගේ යහපත උදෙසා සිය කාලය කැප කරන අතර ම සැතපීම සඳහා වැය කරනුයේ දවසේ ඉතා අඩු ම කාලයකි. සිහියෙන් නුවණින් යුතුව සිංහශෛය්‍යාවෙන් ශයනය කරන සේක. අලුයම සක්මනින් හා මහා කරුණා සමාපත්තියෙන් කල් ගෙවා අරුණ නඟන සේක.

එමෙන් ම චාරිකා චරණය ද උන්වහන්සේ තුළ දැකිය හැකි සුවිශේෂී තවත් ලක්ෂණයකි.

"අංගුත්තර නිකායෙහි පඤ්චක/ දීඝචාරිකාවග්ග/ පඨම, දුතිය දීගචාරිකා සූත්‍රයේ දී ද බුදු රජාණන් වහන්සේ චාරිකා චරණයේ ලද අත්දැකීම් අනුව චාරිකා ක්‍රම දෙකක් ඇති බව ද ඉන් එකක් ආදීනව සහිත වන අතර අනික ආනිශංස දායක වන බව පෙන්වා දුන්හ.

ථේරවාදී මූලාශ්‍රයන්ට අනුව බුද්ධ චරිතයේ ඇති සුවිශේෂතා අතර කැපී පෙනෙන සුවිශේෂත්වය නම් සමයාන්තරයන්හි එක් එක් වශයෙන් ඒ ඒ ශාස්තෘවරුන්ට අරුම වූ දාර්ශනික විරුදාවලි සියල්ල ම බුදුරජාණන් වහන්සේ සතුව පැවතීම ය. ඒ බව පහත විවරණයෙන් පැහැදිලි වේ:-

1. බුදු රජාණන් වහන්සේ කිසි කලෙකත් තමන් නොදත් නොදුටු දෙයක් අනුමානයෙන් පරිකල්ප වශයෙන් හෝ අනුන්ගේ අසා ගත් පමණකින් නොවදාරා සියසින් ම අත් දුටු දෙය ම වදාළ බැවින් ප්‍රත්‍යක්ෂවාදීහු නම් වෙති.

2. සියල්ල ම නිකම් අහේතුක හාස්කම්වලින් නොව සහේතුකව ම වන බව දේශනා කළ බැවින් හේතුවාදීහු නම් වෙති.

3. එහි දී ද එක් ඵලයක් සේ පෙනෙන ධර්ම කලාපයකට එක ම හේතුවක් නොව නොයෙක් හේතුන් ඇති බව දැක්වූ හෙයින් නානාහේතුවාදීහු නම් වෙති.

4. පරස්පර විරෝධී වූ හෙවත් පළමු කී බසට විරුද්ධ වන එකිනෙක නොසැසඳෙන එක වචනයකදු නොයෙදූ බැවින් අද්වයවාදීහු නම් වෙති.

5. සියලු නාම රූප ධර්ම කොටස් නොයෙක් ලෙස සංශ්ලේෂණය කරමින් ද විශ්ලේෂණය කරමින් ද හෙවත් බෙදා වෙන් කර වදාළ හෙයින් විභජ්ජවාදීහු නම් වෙති.

6. ලෝකය තුල පහළ වූ සියලුවාදින් අභිබවා සත්‍ය වූත් ගැඹුරු වූත් න්‍යායානුකූල වූත් උසස් ධර්මයක් චතුර්විධ වෛශාරද්‍යයෙහි සිට වදාළ බැවින් වාදීවර නම් වෙති.

බුදු රජාණන් වහන්සේ කුමන වාදියෙක් දැයි උන් වහන්සේ ම මධුපිණ්ඩක සූත්‍රයේ දී දණ්ඩපාණි ශාක්‍යයාට දේශිත ය.

"ස්වාමිනි, ඔබ කිනම් වාද ඇත්තෙක් ද? කුමක් කියන්නෙහි ද?" යැයි ඇසූ ප්‍රශ්නයට උන් වහන්සේ උත්තර දෙන්නේ මෙසේ යඃ-

"යථාවාදී ඛො ආවුසො, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සායන කේනචි ලෝකේ විගහ්‍යහ තිට්ඨති.

"ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් හා දෙව් මිනිසුන්ගේ ද දෙවියන් සහිත බඹුන් සහිත ලෝකයෙහි කිසිවකු සමඟ ගැටුමක් ඇති නොකොට සිටිමි"යි කියා ය.

ලොව ඇති අන් සියල්ලන්ගේ දැනීමට වඩා සර්වඥතා ඥානය විශේෂ ය. පටිසම්භිදා වග්ගයේ මෙසේ සඳහන් කෙරේඃ-

"නතථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදතං අභිච්ජිකතං පඤ්ඤාය අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බේ ධම්මා සබ්බකාරෙන බුද්ධස්ස භගවතො ඤාණ මුඛෙ අපාථ ආගච්ඡන්ති" යනුවෙන් "භාග්‍යවතුන් විසින් නොදක්නා ලද්දක්, ඥානයෙන් නොපැමිණෙන ලද්දක්, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දක්, ඥානයෙන් ස්පර්ශ නොකරන ලද්දක් නැත. අතීත, වර්තමාන, අනාගත සකල ධර්මයෙන් සර්වාකාරයෙන් භාග්‍යවත් බුදු රජාණන් වහන්සේගේ ඥානයට අරමුණු වේ.

එසේ ම බුදු රජාණන් වහන්සේට සෙස්සන්ට නැති ඥාන බල දහයක් තිබේ. ඒ බලයන්ගෙන් යුක්ත වන බැවින් උන් වහන්සේ

ලෝකයෙහි උත්තමස්ථානයට පැමිණ සිටිති. ඒ නිසා ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චතුර්මාහාරාජික, තාවතිංස, මාර, බ්‍රහ්ම යන අට තැන බුදු රජාණන් වහන්සේ විසින් සිංහ නාද පවත්වනු ලැබේ.

බුදු රජාණන් වහන්සේ සතු දස බලයන් මෙසේ දැක්විය හැකි යඃ-

1. බුදු රජාණන් වහන්සේ හැකි දෙය හැකි ලෙසත් නොහැකි දෙය නොහැකි ලෙසත් දන්නා සේක.
2. අතීත, වර්තමාන, අනාගත කාලයන්හි කර්ම විපාක දන්නා සේක.
3. සියලු ම (හැසිරීමෙහි) මාර්ගයන් අවසන් වන තැන දන්නා සේක.
4. ලෝකයෙහි (භවයෙහි) බොහෝ වූ නොයෙක් ධාතූන් නොයෙක් කාරණාවන් දන්නා සේක.
5. පුද්ගලයන්ගේ නොයෙක් අදහස් දන්නා සේක.
6. අනෙක් සතුන්ගේ ඉන්ද්‍රියන් ක්ෂණික ද, ප්‍රමාද ද යනාදී වශයෙන් දන්නා සේක.
7. බුද්ධිය, සෘද්ධිය, ධ්‍යානයන් වැඩීම, විමුක්තිය සමාධි හා සමාප්ති දන්නා සේක.
8. අනුමාන පූර්ව භවයන් දන්නා සේක.
9. කර්මානුරූපව චුත වන නැවත උපදින සතුන් දිවැසින් දන්නා සේක.
10. ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් මේ ජීවිතයේ දී චෙතො විමුක්තිය හා පඤ්ඤා විමුක්තිය සාක්ෂාත් කොට වෙසෙන සේක.

මෙම දසබල ඥානය අන් සියලු ශාස්තෘවරුන් මැඬ පැවැත්වීමට සමර්ථ විය. මෙසේ

බුදු රජාණන් වහන්සේගේ සුවිශේෂී ඥාණසම්භාරය ගැන ථේරවාදී මූලාශ්‍රයන්හි වර්ග කර ඇති අයුරු දක්නට ලැබේ.

බුදු රජාණන් වහන්සේ පිළිබඳව කෙරෙන නව අරහාදී ගුණ සමුදාය ථේරවාදි මූලාශ්‍රයන් තුළ පවතින බුද්ධ චරිතයේ සුවිශේෂතාව මනාව පිළිඹිබු කරන්නකි.

"ඉතිපිසො භගවා, අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතෝ ලෝකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරති සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවාති.''

මේ ගුණ නවය පිළිබඳව කෙටියෙන් විමසා බැලීමෙන් උන් වහන්සේගේ සුවිශේෂතාව මනාව පිළිබිඹු කර ගත හැකි ය.

## 01. භගවා

"පුඤ්ඤ ඤාණ වෙසාරජ්ජාදයො භගං නාම, තං යොගෙ භගවා"

පින-නුවණ-විශාරද බව ආදී ගුණ 'භග' නම් වේ. සියලු ගුණයන් එක්ව සමුහව පිහිටියේ යන අදහසින් 'භගවා' නම් වන සේක.

එමෙන් ම තවත් තැනක මෙය විග්‍රහ කෙරෙන්නේ මෙසේ යඃ-

"භගවාති වචනං සෙට්ඨං - භගවාති පද මුත්තමං
ගරු ගාරව යුත්තො සො භගවා තෙන වුච්චති"

යනුවෙන් අර්ථ විවරණය කර ඇති පරිදි 'භගවා' යනු ශ්‍රේෂ්ඨ පුද්ගලයකු උත්තම පුද්ගලයකු දැක්වීම සඳහා භාවිතා කරන වචනයකි. ලෝකයේ කිසි ම ගුණයකින් තථාගතයන් වහන්සේට වැඩි ගුණවතකු හෝ සමාන කෙනකු නැත. උන් වහන්සේට, දෙවි, බඹ, මිනිස් ආදී හැමදෙනා විසින් ගරු බුහුමන් කිරීමට සුදුසු ය. එමෙන් ම සියල්ලෝ ම උන්වහන්සේගේ පා වඳිත්.

"භගවන්ති සො භගවාති වුච්චති" යනුවෙන් භගවාන්තයට ගිය උන්වහන්සේට 'භගවා' යැයි කියනු ලැබේ.

## 02. අරහං

මෙහි සාමාන්‍ය අදහස වන්නේ සුදුසු යන්නයි. බුදු රජාණන් වහන්සේ දක්ෂිණාව පිළිගැනීමට සුදුසු ශ්‍රේෂ්ඨතම උත්තමයා ය. එබැවින් අරහං නම් වන සේක.

"ආරකතත්තා හතත්තා ච - ක්ලේශාරී න යො මුනි
හත සංසාර චත්තාරෝ - පච්චයාදීනං චාරහො
න රහෝ කරෝති පාපානි - අරහං තෙන වුච්චති"

ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද, සංසාර චක්‍රයාගේ ගරාදි සිඳ දැමූ හෙයින් ද, විචාරා දී ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු වන හෙයින් ද 'අරහං' යැයි කියනු ලැබේ.

"අනුත්තරං ධම්මචක්කං ආණාචක්කං ච පවත්තෙතුං අරහාතී ති" යනුවෙන් අනුත්තර වූ ධර්ම චක්‍රය හා ආඥා චක්‍රය පැවැත්වීමට සුදුසුය යන අර්ථයෙන් ද තථාගතයන් වහන්සේ අරහං නම් වන සේක.

"තෙ වානෙන කිලෙසාරයො මග්ගේන ගතාති අරීනං හතත්තාපි අරහං"

බුදුරජාණන් වහන්සේ ලෝකෝත්තර මාර්ගයෙන් කෙලෙස් නැමති සතුරන් නැසූ හෙයින් ද අරහං නම් වන සේක.

"ආරකාහි සො සබ්බ කිලෙසෙහි ඨිතො මත්තේන සවාසනාසං කිලෙසානං විද්ධංසිතත්තා ති ආරකත්තා අරහං"

ඒ භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් වාසනාව සහිත ක්ලේශයන් විද්වංශනය කළ බැවින් ද සියලු කෙලෙස් කෙරෙන් දුරුව සිටින බැවින් ද තථාගතයන් වහන්සේ අරහං නම් වන සේක.

## 03. සම්මා සම්බුද්ධ

"සං අත්තනා සබ්බ ධම්මේ අබුජ්ජි බුජ්ඣති බුජ්ජිස්සති තී වා සම්මා සම්බුද්ධෝ"

තමා විසින් ම සර්ව ධර්මයන් මනා කොට අවබෝධ කළේ ය, කරයි, කරන්නේ ය යන අර්ථයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. බුදුරජාණන් වහන්සේ අනාවරණ ඥානය ද ලබමින් ලොව සියල්ලක් ඇතැඹුලක් සේ මනා කොට දැන ගත් හෙයින් ද සම්මා සම්බුද්ධ නම් වන සේක. සියලු පාපයෙන් සියලු ක්ලේශයෙන් විමුක්ති, විමුක්ති ඥාණ දර්ශනය, අසමසම ධර්ම කථාදී ගුණයෙන් යුක්තව දෙව් මිනිසුන්ට

මේ සත්‍යය අවබෝධ කරවන්නට සමර්ථ වූ බැවින් සම්‍යක් සම්බුද්ධ වශයෙන් ථේරවාදී මූලාශ්‍රයන්වල පැහැදිලි කෙරේ.

## 04. විජ්ජාචරණ සම්පන්නො

නිවැරදි ලෙස දන්නා නුවණ විද්‍යා නම් වේ. අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ හෙයින් බුදු රජාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

අෂ්ටවිද්‍යා නම් විදස්සනා ඥානය, මනොමය ඥානය, ඉද්ධිවිධ ඥානය, දිබ්බසොත ඥානය, පරචිත්තවිජානන ඥානය, පුබ්බේනිවාසානුස්සති ඥානය, දිබ්බචක්ඛු ඥානය, ආසවක්ඛය ඥානයයි.

පසළොස් චරණ ධර්ම නම් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය, භෝජනයේ මාත්‍රඥතාවය, ශ්‍රද්ධාව, ඔත්තප්පය, වීර්යය, ප්‍රඥාව, ප්‍රස්මෘතිය, බහුශ්‍රැතභාවය, ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය, ඉන්ද්‍රිය සංවර සීලය, ජාගරානු යෝගය හා හිරියයි.

## 05. සුගතෝ

"සොභනං ගතං ඤාණ මස්සාති සුගතො"

හොඳින් පිරිසිදුව වැඩී ගිය නුවණක් ඇති හෙයින් සුගත නම් වන සේක.

මේ අයුරින් සංසාර වෘත්තිය සම්පූර්ණයෙන් ම තරණය කළ හෙයින් ද, සුන්දර ස්ථාන වන නිවන් පුරයට වැඩම කළ හෙයින් ද, මුල, මැද, අග යන ස්ථාන දැන දහම් දෙසෙන හෙයින් ද, නික්ලේශී හදවතකින් යුක්ත හෙයින් ද බුදු රජාණන් වහන්සේ 'සුගත' වන බවට මූලාශ්‍රයන්හි විවරණය කෙරේ. මෙම 'සුගත' යන පදය 'තථාගත' යන පදයට බොහෝ දුරට සමාන බව පෙනේ.

'තථාගත' ශබ්දය පෙළ දහම මෙසේ විභජනය කර දක්වා ඇත.

"තථා අගතොති තථාගතො, තථා ගතොති තථාගතො, තථා ලක්ඛණං ආගොති තථාගතො, තථා ධම්මේ යථාවතො අභිසම්බුද්ධොති

තථාගතො, තථා දස්සනාය තථාගතො, තථා වාදිතාය තථාගතො, තථා කාරිතාය තථාගතො, අභිභවනට්ඨෙන තථාගතො" යනුවෙනි.

## 06. ලෝකවිදූ

ලෝකය ඉතා විශාලය. සාමාන්‍ය ලෝවැසියා ඒ ගැන දන්නා දේට වඩා නොදන්නා දේ බොහෝ ය. එහෙත් බුදු රජාණන් වහන්සේ විසින් එය තත්ත්වාකාරයෙන් දැනගන්නා ලදි. බුදු දහම තුළ ලෝකය යනුවෙන් සවිඥානක හා අවිඥානක වස්තු වශයෙන් ද ධාතු වශයෙන් ද ගුණ වශයෙන් ද ගත් කල එහි ඇත්තේ නාම රූප දෙක පමණි. නාමය නම් සත්ත්වයා තුළ ඇති වන දැනීම් හැඟීම් උපදින චිත්තයයි. රූපය නම් මහා භූතයන් හා ඒවා නිසා පවත්නා සෙසු රූප කොටස් ය. වෙනත් අයුරකින් කිවහොත් පංචස්කන්ධය, ද්වාදස ආයතන වශයෙන් දැක්වෙන්නේ ඒ ලෝකයයි. මෙකී ලෝකය පිළිබඳ දන්නා එක ම විද්වතාණන් වන්නේ බුදු රජාණන් වහන්සේ යනුවෙන් ථේරවාදී මූලාශ්‍රයන්හි ඉගැන්වේ. මෙසේ ආධ්‍යාත්මික බාහිර වශයෙන් වූ සියලු ලෝකය පිළිබඳ වූ තථාගත නුවණ නිසා ම බුදු රජාණන් වහන්සේ ලෝක විදූ නම් වන සේක.

## 07. අනුත්තරො පුරිසදම්මසාරථී

ලෝකයේ සිටින කුමන තරාතිරමක පුද්ගලයකු වුවත් ඉතා ම ශාන්ත භාවයට පැමිණෙන ලෙස අදණ්ඩෙන්, අශස්ත්‍රයෙන් දමනය කිරීමට සමත් වන බැවින් ද තථාගතයන් වහන්සේ අනුත්තර පුරිසදම්මසාරථී නම් වන සේක.

දමනය කළ යුතු පුද්ගලයන් ඉතා ශීලාචාර වන පරිදි, ඉතා ගුණවත් වන පරිදි, නැවත වෙනස් වී රෞද්‍ර නොවන පරිදි දමනය කිරීමට සමත් වන බැවින් ද රජු විසින් හෝ ශක්‍රයා විසින් හෝ බ්‍රහ්මයන් විසින් දමනය කළ නොහැකි ඉතා චණ්ඩ, අතිමානී කෛරාටිකයන් වුව ද දමනය කිරීමට බුදු රජාණන් වහන්සේ සමර්ථයහ. පන්සාලිස් වසක් තුළ හික්මවූවෝ අපරිමිතයහ. එබැවින් උන්වහන්සේ පුරිසදම්ම සාරථී නම් වන සේක.

## 08. සත්ථා දේව මනුස්සානං

"සාසති විනයති සත්තෙති සත්ථා"

සත්ත්වයන්ට අනුශාසනා කරන්නේ ය යන නයින් සත්ථා හෙවත් 'ශාස්තෘ' නම් වේ. ශාසන ධර්මය නමැති පිරිසිදු වතුරෙන් කෙලෙස් නමැති මඩ සෝදා හරින ලද බැවින් ද, කෙලෙස් හිංසාවන් දුරු කර හරින ලද හෙයින් ද, දේශිත ධර්මයට සත්ත්වයා කැමති වේ ය යන අරුතින් ද 'ශාස්තෘ' නම් වන සේක. බුදුරජාණන් වහන්සේ මෙකී ගුණයට ඇතුළත් වන හෙයින් ශාස්තෘ නම් වන සේක.

## 09. බුද්ධො

"බුජ්ඣිතා සච්චානි ති බුද්ධෝ" යනුවෙන් සතර ආර්යය සත්‍යයන් අවබෝධ කර ගත් තැනැත්තා බුද්ධ නම් වන බව ථේරවාදයේ විවරණය වේ. "සබ්බා බුද්ධවාති බුද්ධෝ" යනුවෙන් සියල්ල අවබෝධ කරගත්තේ ය යන අදහසින් බුද්ධ නම් වන බව ද තවත් තැනක විවරණය කෙරේ. එමෙන් ම "විසිට්ඨා බුද්ධි අස්සා ති වා බුද්ධෝ'' විශිෂ්ට බුද්ධියක් ඇත්තේ ය යන අදහසින් බුද්ධ නම් වේ යැයි ද තව තැනක දැක්වෙන අතර "බොධෙතා පජායති බුද්ධො" සත්ත්ව ප්‍රජාව ගැන හොඳින් දැන ගන්නා ලද්දේ යන අරුතින් ද බුද්ධ නම් වූ සේක. එමෙන් ම "පාරමිතා පරිභාවිතාය පඤ්ඤාය සබ්බම්පි ඤෙය්‍යං අබුජපයීති බුද්ධෝ'' පාරමිතා පුහුණු කිරීමේ නුවණින් සියල්ල ද අවබෝධ කළේය යන අරුතින් ද "සබ්බේ සංඛතාසංඛතා ධම්මේ අබුජ්ජි බුජඣති බුජ්ජිස්සතීති" සියලු සංඛ අසංඛත ධර්මයන් අවබෝධ කළේ ය, අවබෝධ කරන්නේ ය යන අරුතින් ද බුද්ධ නම් වන බව මූලාශ්‍ර ග්‍රන්ථවල විග්‍රහ වේ.

'බුද්ධ' යන නාමය දැරූ සමයාන්තර ශාස්තෘවරු බොහෝ සිටි බවත්, එම බුද්ධ යන්නට වඩා සර්වඥතාවයෙන් යුක්ත 'බුද්ධ' සංකල්පය අත්‍යොත්තම බව ථේරවාදීන් විග්‍රහ කර දක්වනු පෙනේ.

දිනක් සේල බමුණාට තමන් වහන්සේ කවරෙක් දැයි විවරණය කරන අවස්ථාවේ බුද්ධත්වය පිළිබඳව මෙසේ පැහැදිලි කෙරේ:-

"අභිඤ්ඤාතං අභිඤ්ඤෙය්‍යං
භාවේ තබ්බං ච භාවිතං
පහාතබ්බං පහීනමෙම
තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ"

අවබෝධ කළ යුතු දේ අවබෝධ කළ, වැඩිය යුතු දේ වඩන ලද, අත්හළ යුතු දේ අත්හළ බැවින් බ්‍රාහ්මණය, මම බුද්ධ වන බව වදාළ සේක.

මේ අයුරින් බුදු රජාණන් වහන්සේගේ ජීවිතයේ පවතින විවිධ ගුණයන් හකුළා ඉදිරිපත් කළ සාර්ථක විවරණයක් ලෙස මෙම ගුණ නවය හැඳින්විය හැකි ය. තව ද තථාගතයන් වහන්සේ ම අදුතිය, අසහාය, අප්පටිම, අප්පටිසම, අප්පටිභාග වශයෙන් හැඳින්වීමට ද ලක් කර ඇති අයුරු මූලාශ්‍රවලින් තව දුරටත් පැහැදිලි වේ.

දෙවැනි බුදුවරයකු නැති හෙයින් අදුතිය නම් වෙත්. ආත්ම භාරයෙන් හෝ ප්‍රතිලබ්ධ ගුණ විශේෂයෙන් හෝ සහාය කෙනකුත් නොමැති හෙයින් අසහාය නම් වෙත්. පටිමා යනු ආත්ම භාවයයි. බුදු රජාණන් වහන්සේගේ ආත්ම භාවයට සමාන ප්‍රතිමාවක් නොමැති හෙයින් අප්පටිම නම් වෙත්. තථාගතයන් වහන්සේ සතර සතිපට්ඨානයෙන් දේශිත වන සේක. යම් කෙනෙක් ඒවා සතර සතිපට්ඨානයෝ නොවෙත්, ත්‍රිවිධ සතිපට්ඨාන කෙනෙක් වෙත් යැයි ප්‍රතිවිරුද්ධව කියත් නම් එබන්දකු ලෝකයේ කොතැනක වත් නොමැත. එම නිසා බුදුරජාණන් වහන්සේ අප්පටිභාග වේ. 'මම බුද්ධ වෙමි' යි ප්‍රතිඥා දෙන්නට පුද්ගලයකු නැති හෙයින් අප්පටි පුද්ගල නම් වේ.

මේ අයුරින් ථේරවාද මූලාශ්‍රයන්හි බුද්ධ චරිතයේ සුවිශේෂතා ගණනාවක් ම දක්නට ලැබේ. ඒ අතර අටලෝ දහමින් අකම්පිත වූ තාදී ගුණය සුවිශේෂී ය.

"ලාභො - අලාභො, අයසො - යසො ච නින්දා - පසංසා, සුඛං ච දුක්ඛං'' යනුවෙන් දැක්වෙන පරිදි තාදි වු ඒ භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි අසමසම ය.

අම්බපාලි නම් වූ නගර ශෝභනිය තමන් වහන්සේ වෙත සිදු කළ ආරාධනයත් තිබිය දී වජ්ජිපුත්තකයන් කළ ආරාධනය ප්‍රතික්ෂේප කළ බුදු රජාණන් වහන්සේ රාජ්‍යත්වයෙන් ලැබිය හැකි වාසි පිළිබඳව නොතැකූහ. ධනයෙන්, කුළයෙන්, බලයෙන් ආරූඪ වූ පුද්ගලයන් තමන් වෙත පැමිණ දහම් අසා ප්‍රසාදයට පත්ව බුදුන් සරණ යන බව ප්‍රකාශ කළ විට ඔවුන්ගේ කිසිදු ආකාරයේ ගරු සැලකිලි බලාපොරොත්තු නො වූ බුදු රජාණන් වහන්සේ නැවත සිතා බලා එම තීරණය ගන්නා ලෙස දැන්වූහ.

බුදු රජාණන් වහන්සේගේ සසුවිශේෂත්වය උන් වහන්සේ විසින් ම දේශනා කළ අයුරු පෙළ දහමේ මෙසේ දක්නට ලැබේ.

"සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බේසු ධම්මේසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයේ විමුත්තෝ
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං''

මම සියල්ල අභිබවා සිටියෙමි. දත යුතු සියල්ල දන්නේ වෙමි. සියලු ධර්මයේ ඇලුණෙමි. සියලු කෙලෙස් හැර සිටියෙමි. තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි අරමුණු කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදුණෙමි. ඒ මට අන් කවරෙකු ආචාර්ය වශයෙන් උදෙසම් ද?

"න මෙ ආචාරියො අථථි - සදිසො මෙ න විජ්ජති
සදේවකස්මින් ලොකස්මිං - නතථි මේ පටිපුග්ගලො"

මට (ලොව්තුරු දහමේහි ලා) ගුරුවරයෙක් නැත. සමානයෙක් ද නැත. දෙවියන් සහිත ලෝකයෙහි මට සම පුද්ගලයෙක් නැත.

"අහංගි අරහා ලොකෝ අහං සත්තා අනුත්තරො
ඒකොම්හි සම්මා සම්බුද්ධෝ සිතිභූතොස්මි නිබ්බුතො"

ලෝකයෙහි මම රහත් වෙමි. නිරුත්තර වූ ශාස්තෘ වෙමි. එක ම සම්මා සම්බුදු වෙමි. කෙළෙස් ගිනි නිවීමෙන් සිසිල් වූයෙමි. එහෙයින් නිවුණෙමි.

එසේ ම බුදු රජාණන් වහන්සේ ම තමන් වහන්සේගේ සුවිශේෂත්වය පැහැදිලි කළ තවත් අවස්ථාවක් මෙසේ හැඳිනගත හැකි ය.

"උච්ඡින්නභවනෙත්තිකො භික්ඛවෙ තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායා ඨස්සති, තාව නං දක්ඛින්ති දේවමනුස්සා, කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දේවමනුස්සා.

සෙය්‍යාථාපි භික්ඛවෙ අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ටපබ්බද්ධානි, සබ්බානි තානි තදනවයානි භවනති, එව මෙව බො භික්ඛවෙ උච්ඡින්නභවනෙත්තිකො තථාගතස්ස කායො තිට්ඨති."

මෙහි දී බුදු රජාණන් වහන්සේ සතුව පවතින සුවිශේෂී ම කරුණක් මනාව නිරූපනය වනු පෙනේ. තෘෂ්ණාව සිඳින ලද බුදු රජාණන් වහන්සේ යම් තාක් කය තිබෙන්නේ ද, ඒ තාක් දෙව් මිනිස්සු උන් වහන්සේව දකිති. කය බිඳීමෙන් හා ජීවිතයාගේ පරික්ෂීණ වීමෙන් අනතුරුව බුදු රජාණන් වහන්සේව දෙව් මිනිසුන් විසින් දැකිය නොහැකි බව මෙහි දී පැහැදිලි කෙරේ. එය උදාහරණයක් තුළින් මනාව තහවුරු කරනු පෙනේ:-

"මහණෙනි, යම් සේ අඹ කැන නටුවෙන් ගිලිහුණු කල්හි නටුව හා බැඳුණු යම් අඹ සමූහයක් වෙත් නම් ඒ හැම නටුව අනුව යත් ද, ඒ පරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ කය ද මුල් සුන් වූ තෘෂ්ණා ඇතිව සිටින බව පැහැදිලි කෙරේ."

මෙලෙසින් බුදු රජාණන් වහන්සේ තමන් වහන්සේගේ අසමසමත්වය ප්‍රකට කරවන අයුරු පැහැදිලි වේ. එහෙත් එකී විස්තරය තුළින් බුදු රජාණන් වහන්සේ ශුද්ධෝත්තම දෙවියකු වශයෙන් හෝ පරම දෙවියකු වශයෙන් නිරූපණය නොවීම ථේරවාදී මූලාශ්‍ර බුද්ධ චරිතයේ එන සුවිශේෂත්වය ලෙසින් හැඳිනගත හැකි ය.

මේ අයුරින් බුද්ධ චරිතයේ සුවිශේෂත්වය පැතිකඩ කිහිපයක් ඔස්සේ විග්‍රහ කිරීමට හැකි ය. මෙසේ ථේරවාදී මූලාශ්‍රයන්හි සඳහන් වන බුද්ධ චරිතයේ සුවිශේෂත්වය වනාහි උන් වහන්සේ, අන්‍ය ආගම්වල සමයාන්තර දෙවිවරුන් මෙන් ලෝකය නිර්මාණය කරන, ලෝකවාසීන් නිර්මාණය කරන, විනාශ කරන, මෙහෙයවන හෙවත් දුකින් ගලවා ලන, දුකෙහි අලවන හෝ දඬුවම් හෝ සත්ප්‍රසාද දෙන, පලි හෝ බිලි පූජා ගන්නා, ශාප හෝ කෝප කරන, තමන් කෙරෙහි භක්ති මාත්‍රයට උසස් යැයි දක්වන සර්වබලධාරී වූ අදෘශ්‍යමාන වූ පරිකල්පිත වූ ද අප්‍රත්‍යක්ෂ වූ ද සර්වව්‍යාපීව හැම තැන ම වසන අනාත්මික වූ ද දෙවි කෙනෙක් නොවෙති. ථේරවාදී ඉගැන්වීමට අනුව බුදු රජාණන් වහන්සේ යනු දේවත්වය ද ඉක්මවා ගිය ආශ්චර්යය මනුෂ්‍යෝත්තමයාණ කෙනෙකි.

සියවස් ගණනකට පෙර පර්සියාවේ (ඉරානයේ) වාසය කළ 'ඉමක්ජ්යදාහ්' නමැති ඉස්ලාමික ගත්කරු බුදුරජාණන් වහන්සේ පිළිබඳව කරන ප්‍රකාශය ථේරවාදී මූලාශ්‍රයන්හි උක්ත පිළිගැනීම සාධනය කරන්නකි.

"If you desire to see the most noble of mankind, look at the king in beggar's clothing. It is he whose sanctity is great among men."

(මිනිසුන් අතර පහළ වූ උත්තරීතර ම තැනැත්තා දකිනු කැමැත්තෙහු නම් භික්ෂු වේශයෙන් සැරිසැරූ බුදු රජාණන් වහන්සේ දෙස බලන්න. උන් වහන්සේ මිනිසුන් අතර සිටි, පරම පවිත්‍ර උතුමාණෝ ය.)

# 05 පුට්ඨස්ස ලෝකධම්මේහි චිත්තං යස්ස නකම්පති


ගෞරව ශාස්ත්‍රවේදී

**පූජ්‍ය පුවක්පිටියේ ප්‍රඥාරත්න නායක හිමි**

**ශ්‍රී සුභද්‍රාරාම විහාරය**

**පරත්ත, කෙසෙල්වත්ත, පානදුර**


මෙහි 'ලෝක' ශබ්දයෙන් සත්ත්ව ලෝකය වදාරන ලදි. මෙය ඉතා පුළුල් වචනයකි. දෙවියන්, බඹුන්, මරුන්, මිනිසුන් ඇතුළු සියලු ම සත්ත්වයෝ ඊට ඇතුළත් වෙති. මේ සියලු ම සත්ත්වයන්ට මුහුණපෑමට සිදු වන අභියෝග, ප්‍රශ්න, තර්ජන, ගර්ජන, සැප, දුක ආදිය 'ධම්මේහි' යන්නෙන් අදහස් කෙරෙයි. සත්ත්වයා ලෝකයෙන් අන්‍ය කෙනකු නොවන නිසා ම මේ ලෝක ධර්මතා සියල්ල ම ඔවුනට ද සාධාරණ ය. ඒවා ස්පර්ශ කිරීමට ඔවුන්ට සිදු වේ. ඉන් ගැලවීමට නොහැකි ය. එහි දී ලෝක ධර්මතාවලට සත්ත්වයා ප්‍රතිචාර දැක්විය යුතු පිළිවෙළ 'චිත්තං න කම්පති' යන්නෙන් වදාළහ. ලෝක ධර්මතා ඉදිරියේ සිත කම්පා කර ගැනීම නොකළ යුතු බව ඉන් වදාළහ. මේ වූ කලී අතිශයින් ම දුෂ්කර දෙයකි. යමෙක් ඒ දුෂ්කර කාර්යයෙහි සමර්ථ වේ නම් හේ ශෝකය ජය ගත්, පිඹ හළ කෙලෙස් මුල් ඇති, ක්ෂේම හෙවත් නිර්භය ස්ථානයට පත් බවත් 'අසෝකං විරජං ඛේමං' යනුවෙන් වදාළහ. ඔහුගේ ප්‍රගතිය කඩා වැටෙන්නේ ද නැත. එනිසා ම එය මංගල කරුණක් ද වන්නේ ය.

මෙහි 'න කම්පති' යන්න ඔබගේ විශේෂ අවධානයට ලක් විය යුතු සංවචනයකි. මෙය නිදසුනක් ඇසුරින් විමසා බලමු. යම්කිසි කටයුත්තක් සඳහා නිවසින් පිට වී නගරයට යන අයෙකි. මඟ දී පාරේ වැටී ඇති යමක් ඔහු දකී. එය අහුලා ගෙන හුදෙකලා ස්ථානයක

දී පරීක්ෂා කර බලයි. මුදල් කවරයක් සහ තවත් යමක් දැක එය ද පරීක්ෂා කර බලයි. එහි ඇත්තේ මැණික් ගලකි. එය සුරක්ෂිතව රැගෙන නගරයේ රන් ආභරණ විකුණන තැනකට පෙන්වා 'ගන්නවා දැ'යි අසයි. "මෙය වටිනා මැණිකක්. දැන් නම් ගන්න බැහැ. තව ටිකකින් එන්න. මම මුදල් සොයා තබන්නම්." යැයි පිළිතුරු ලැබේ. පසුව එන අදහසින් ඔහු එතැනින් යන්නේ ලොතරැයි විකුණන තැනට ගොස් ඊට පෙර දින එතැනින් ගත් ලොතරැයි පත පෙන්වා 'ඇදිලා දැ'යි අසයි. එය පරීක්ෂා කර බලා, "ෂඃ, ඔයා නම් මාර චාන්ස්කාරයෙක් නේ! ඔයාට පළමුවෙනි දිනුම ඇදිලා නේ. ලක්ෂ දහඅටක් තියෙනවා. මෙන්න දිනුම. පරිස්සමින් යන්න." යැයි පවසයි.

දැන් මේ තැනැත්තා ගැන සිතා බලන්න. ඔහු නිවසින් පිටත් වන විට සිටි මානසික තත්ත්වයෙන් ම ද දැනුත් සිටින්නේ? වෙනස් වීමක් සිදු වෙලා නැද්ද? කිසිදු වෙනසකට පත් වී නැත්නම්, අන්න ඒකයි 'චිත්තං යස්ස න කම්පති' කියන්නේ. අනපේක්ෂිත ලාභයෙන් වෙනසක් වී නැති නිසා. සාමාන්‍ය පෘතග්ජනයන් හදිසි ලාභයෙන් වෙනස් වීම ස්වාභාවිකව සිදු වන සාමාන්‍ය දෙයක්. ඔහු ලාභයෙන් පිස්සු වැටුණා නම්, ඔහු අටලෝ දහමට කම්පා වන්නෙක්. එය දියුණුවට හේතු වන මංගල කරුණක් නොවේ.

මෙය මෙසේ ම විය යුතු ද යන්න සොයා බැලිය යුතු ය. සුඛිත මුදිත ජීවිතයකට සම්පත් අවශ්‍ය ය. සම්පත් සොයා ගත යුතු ය. උට්ඨාන වීර්යයෙන් ක්‍රියා කර සම්පත් රැස් කර ගත යුතු ය. එය 'අත්ථි සුඛ' නමින් වදාළහ. එනිසා සම්පත් රැස් කර ගැනීම වරදක් නොවේ. එසේ ලැබෙන සම්පත් තමාගේ, තම පවුලේ සියලු දෙනාගේ සහ පවුලෙන් පිට ඥාතීන්, හිතවතුන් සහ සමාජ සුබසාධක කටයුතු සඳහාත්, ආගමික අවශ්‍යතා සඳහාත් යෙදවිය යුතු ය. එය 'භෝග සුඛය'යි. එය ද වරදක් නොවේ. එහෙත් ඒ වූ පමණින් අප සම්පත් නිසා උම්මත්තකයන් හෝ ධනයේ වහලුන් නොවිය යුතු ය; බලයේ වහලුන් නොවිය යුතු ය. ධනය නිසා සිය දිවි නසා ගන්නා අය ගැන ද අසන්නට ලැබේ. මෙය මෙසේ වී ඇත්තේ ලෝක ධර්ම පිළිබඳව අප තුළ ඇති නොදැනීම නැති නම් අල්ප දැනීම නිසා ය. මේ වරද නිවැරදි කර ගැනීම සඳහා බුදු රජාණන් වහන්සේ මහා මංගල සූත්‍රයේ දී,

"පුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං"
යනුවෙන් වදාළහ.

එහි ලෝක ධර්ම අටකි. එනම්, ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක යන අට ය. මේ අෂ්ට ලෝක ධර්ම පිළිබඳව යථාවබෝධය සෑම කෙනෙක් ම ලබා ගත යුතු ය. මේවා එක්කෙනකුට දෙන්නෙකුට හෝ එක් ජාතියකට දෙකකට හෝ එක රටකට දෙකකට හෝ සීමා වන්නක් නොවන බවත්, සමස්ත ලෝකයට ම සාධාරණ බවත් අප ඉතා නිවැරදිව තේරුම් ගත යුතු ය. ධනය, කුලය, බලය, දේශපාලනය ආදිය මාධ්‍යය කර ගෙන මොන තරම් අවුල් වියවුල්, ප්‍රශ්න ඇති වී තිබෙනවා ද! ප්‍රශ්නවල නිමක් ඇද්ද? විසඳුම් තිබෙනවා ද? මොන තරම් පරිහානිකර තත්ත්වයකට ද, රට පත් වී ඇත්තේ! ජාතිවාදී අරගල, කම්කරු අරගල, වැඩ වර්ජන, කඩාකප්පල්කාරී ක්‍රියා ආදියෙහි ඉවරයක් ඇද්ද? මේ නිසා රටට ජාතියට වන හානිය සුළුපටු ද! සියල්ලන් ම උන්මත්තකයන් මෙන් ක්‍රියා කරනවා හැර වෙන කරන්නේ මොනවා ද!!

අප අතර උපදින ඇතැම් අය ජාතියේ පිනට සහජ වාසනා ගුණයන්ගෙන්, උපන් හපන්කම්වලින් යුතුව උපදිති. ඇතැම් අය ධනෝපායනයෙහි අතිදක්ෂයෝ ය. ඇතැම් අය දේශපාලනයෙහි දක්ෂයෝ ය. ඇතැම් අය අධ්‍යාපනයෙහි ශූරයෝ ය. මේ සහජ වාසනාවන්ගෙන් යුත් පින්වත් අය උපදින්නේ ජාතියේ පිනට ය. එම සහජ හැකියාවන් ජාතියේ සෞභාග්‍යය සඳහා කැප කිරීම ඔවුන්ගේ පරම යුතුකම විය යුතු ය. මේ බව මනාව තේරුම් ගෙන රටේත් ජාතියේත් උන්නතිය සඳහා ඇපකැප වී ක්‍රියා කළ යුතු ය. මෙය පරම යුතුකමකි; වගකීමකි.

අප රටට ඉංග්‍රීසි අධිරාජ්‍යයෙන් නිදහස ලැබුණ අවධියේ එම නිදහස් සටනේ නියමුවන් වශයෙන් ක්‍රියා කළ ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, ජාතියේ පියා ලෙස විරුදාවලිය ලත් ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ආදී ශ්‍රීමතුන් මේ වගකීම් හා යුතුකම් අමතක කළේ නැත. ඒවා මැනවින් අවබෝධ කර ගත්හ. තමන්ගේ වලව් හා පාරම්පරික ධනස්කන්ධය විසින් උරුම කළ මහත්තත්තකම් අමතක කළහ. මාළිගාවලින් බිමට බැස දුගී දුප්පත් සාමාන්‍ය ජනතාව අතරට ගියහ. ජනතාව සුඛිත

මුදිත කිරීමේ සටන ආරම්භ කළහ. අනුන්ට අතපා ජීවත් වීමේ හීන දීන පහත් පරමාර්ථ බිම තැබූහ. සිංහලයා නිදහස් නිවහල් ජාතියක් කිරීමේ අභිමානවත් අධිෂ්ඨානය නිර්භීතව ම අරගත්හ. මේ සඳහා සිංහලයා ආර්ථික වශයෙන් ශක්තිමත් ස්වයංපෝෂිත ජනතාවක් බවට පත් කිරීමේඅවශ්‍යතාව කිසි ම බියක් චකිතයක් නැතිව අභීතව අරගත්හ; අරගත්තා පමණක් නොව ඒ සඳහා සියලු ම ක්‍රමෝපායයන් අධිෂ්ඨානශීලීව නොබියව අරගත්හ.

පරාක්‍රම සමුද්‍රය ඉදි කර මහ පැරකුම්බාවන් විසින් නැගූ කාහළ නාදය තව ම ලංකා ගුවන් ගැබින් වියැකී නොගිය බව ජාතියේ පියාණන් ප්‍රමුඛ විරුවන් විසින් පසක් කරන ලදි. වන ගහණට යටත්ව තිබූ අපේ රජරට වනය එළිපෙහෙළි කර, කලාවැව, යෝධවැව, පරාක්‍රම සමුද්‍රය, මින්නේරි වැව, කවුඩුලු වැව, යෝධ ඇල ආදී සුවිසල් වාරි කර්මාන්තයන්ගෙන් පොහොසත් කරවා, බැලූ තෙක් මානයේ එක දිගට අක්කර සිය දහස් ගණනක් පැතිරුණ, සිසිල් මඳ පවනින් සැනහෙන කෙත් යායෙන් බබළන භූමි භාගයක් මැවීමට ඒ විරුදරුවන්ට හැකි වීම ජාතියට කෙතරම් ආඩම්බරයක් ද! ඒ කෙත්වතු වගා කළ ගොවි ජනතාව මොන තරම් ස්වාධීන වූවා ද! ඔවුන්ගේ රන් දහඩියෙන් ලක් පොළොව සරුසාර වූ තරම!! ඔවුහු අද ජාතියට ම බතබුලත සපයති. මොන තරම් ආඩම්බරයක් ද!

මේ ආශ්චර්යයන් කිරීමට ගොවි ජනතාවට හැකි වී ඇත්තේ කවර නම් රහසක් නිසා ද? රහස අනෙකක් නොව අටලෝ දහමට කම්පා නොවීමේ අකම්පා ගුණය නිසා ය. 'ගොවියා' යනුවෙන් අදහස් කරන්නේ වී ගොවියා පමණක් නොවේ. ඔහු ප්‍රධාන ය. ජාතියේ ආර්ථිකය පොහොසත් කරන සෙසු වගාවන්හි යෙදෙන අය ද ගොවීහු ය. අටලෝ දහමට කම්පා නොවී ස්වකීය වගා කටයුතු කර ගෙන යෑමට ඔවුහු සියලු දෙනා ම සමර්ථ වෙති. ස්වභාව ධර්මයේ අකාරුණික දඬුවම් විඳින්නෝ ගොවීන් හැර අන් කවරහු ද! මාස ගණන් පවතින ඉඩෝර, වගාවන් සේදී යන තරමේ තද ගංවතුර, තමන් හෝ ස්වකීයයන්ගේ ගෙවල් දොරවල් පවා මහ පොළොවට වැළලී යන තරමේ නාය යෑම්. ගොවීහු මේ සියල්ල උපේක්ෂාවෙන් ඉවසා තමන්ගේ ගොවිතැන් කර ගෙන යෑම කවර ආශ්චර්යයක් ද! අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය හැර වෙන කුමක් ද!!

# සිතීමේ හා විමසීමේ නිදහස 06

**පූජ්‍ය උඩරුගමුවේ අස්සජී හිමි**

මෙලොව උපන් සෑම සත්ත්වයෙකුට ම උපතින් ම යම් නිදහසක් උරුම වී තිබේ. ජීවත්වීමේ නිදහස ඉන් පළමුවැන්නයි. අනවශ්‍ය බැඳීම්, යටත්වීම් සහ පීඩනයන් ගෙන් තොරව නිදහසේ ජීවත්වීමට සැවොම ප්‍රිය කරති.

සියලු සත්ත්ව වර්ගයා ජීවත්වනුයේ එකම සමාජයක ඒකාකාරී රාමුවක් තුළ ය. එක් මිනිස් වර්ගයක නිදහස පිළිබඳ යම් යම් සීමාවන් පැණවීම හෝ නිදහස සහමුලින්ම අහෝසිකර දැමීම මානුෂික වශයෙන් මෙන් ම සදාචාරාත්මක වශයෙන් ද කිසිදු හේතුයුක්ති සහගත ක්‍රියාවක් නොවේ. ලොව ජීවත්වන සියලු සත්ත්ව වර්ගයාට උත්තරීතර මානව නිදහසක් උදාකරදීම සඳහා වූ සර්වකාලීන හා සර්වභෞමික දේශනයක් පළමුවෙන් ම ලෝකයාට ඉදිරිපත් කළේ බුදුරජාණන් වහන්සේ ය. ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී එකල මිනිසුනට යටත් පිරිසෙයින් ජීවිතය පවත්වාගෙන යාමටවත් කිසිදු නිදහසක් උරුමව නොපැවතිණි. බමුණන් විසින් වර්ග කරන ලද චතුර්වර්ණය පදනම් කරගෙන එකල සමාජය සකස්ව තිබුණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යනු එම චතුර්වර්ණය යි. මෙම වර්ගීකරණයට අනුව බමුණන් පූජකයන් හා ගුරුවරුන් ලෙස ද රජු ගේ උපදේශකවරුන් ලෙස ද පෙනී සිටි අතර මිනිස් සමාජය උසස් පහත් වශයෙන් මහා බ්‍රහ්මයා විසින් මවන ලදැයි, යන්න ඔවුන ගේ නිසැක පිළිගැනීම විය. ක්ෂත්‍රිය වංශිකයිනට රාජ්‍ය පාලන තන්ත්‍රය මෙහෙයවීමත්, කෘෂි කර්මාන්තය කරවීමත්, යාග කරවීමත්, නියමිතව

පැවතිණි. වෛශ්‍යයනට වාණිජමය කටයුතු පැවරී තිබුණ අතර ශුද්‍ර වංශිකයාට උරුම වූයේ පූර්වෝක්ත වර්ණත්‍රයට බැලමෙහෙවර කිරීමයි. මෙකී වර්ණත්‍රයට උරුම වූ මිනිස් අයිතිවාසිකම් කිසිවක් ඔවුනට උරුම නො වී ය.

එමතු නො ව තත් යුගය වනවිට භාරතීය සමාජයේ කාන්තාවනට හිමිවූයේ ද ඉතා පහත් තත්ත්වයකි. ශුද්‍රයිනට සේම සාමාන්‍ය මිනිස් අයිතිවාසිකම් වූ ඉගෙනීම හා ආගමික කටයුතුවල යෙදීම ආදිය පවා ඔවුනට අහිමි විය. රටේ පවත්නා පොදු නීති පවා කාන්තාව සම්බන්ධයෙන් වෙනස් වූ අතර එදා සමාජයේ කාන්තාවක මැරීම පිරිමියෙකු මැරීම තරම් බරපතල ක්‍රියාවක් නොවේ ය, යන අදහස ද මුල් බැසගෙන පැවතිණි. එබැවින් එකල ස්ත්‍රියක වී ඉපදීම ද බරපතල පාපයක් සේ සැලකී ය. මෙසේ සකස්ව පැවති විෂම සමාජ රටාවෙහි පවත්නා නිස්සාරත්වය, මනාව මහජනයාට තේරුම් කර දුන් බුදුරජාණන් වහන්සේ උපතින් කෙනෙකු බ්‍රාහ්මණයෙකු හෝ වසලයෙකු නොවන බවත්, එය පුද්ගල ක්‍රියාකාරකම් මත තීරණය වන බවත් තර්කානුකූලව පැහැදිලි කළ හ. ඒ ඇතුලු මිනිස් සමාජයේ නිදහස වෙනුවෙන් උන්වහන්සේ සිදු කළ දේශනා සියල්ල මංමුලා වූ ජන සමාජයකට නිසි මග පෙන්වාදීමක් ම විය.

ඒ අතර සිතීමේ හා විමසීමේ නිදහස වැනි ඉතා සාරවත් ඉගැන්වීමක් එම විෂය පිළිබඳ වූ ආගමික ඉතිහාසයෙහි අන් කවර තැනෙකවත් දක්නට නොමැත. තමාම සත්‍යය අවබෝධ කර ගැනීමෙන් හැර දේවාශිර්වාදය වැනි බාහිර පිළිවෙතක පිහිටෙන් මිනිසෙකුට දුකින් මිදිය නොහැකි බව උන්වහන්සේ දේශනා කළ හ. මෙම දේශනාව සඳහා මුල් වූ පසුබිම මෙසේ ය. වරක් කොසොල් දනව්වෙහි චාරිකා කරන සමයෙක බුදුරජාණන් වහන්සේ කාලාමයන්ගේ කේසපුත්ත නම් නියම් ගමට වැඩම කළ හ. කාලාමයෝ උන්වහන්සේ හමු වී මෙම කරුණ ප්‍රකාශ කළ හ.

ස්වාමීනි, කේසපුත්තයට වරින්වර පැමිණෙන මහණ බමුණෝ වෙති. ඔවුහු ස්වකීය ලබ්ධිය (වැළඳ ගැනීම) ප්‍රකාශ කරති. අන්‍ය ලබ්ධීන් සියල්ල හෙළා දකිති. බැහැර කරති. පරිභව කරති. ස්වාමීනි, මෙහි දී කවුරු ඇත්ත කියත් ද කවුරු බොරු කියත් ද යනුවෙන් අපට සැකයක් ඇති වේ.

මෙහි දී බුදුරදුන් ඔවුනට අවධාරණය කළේ ආගම් පිළිබඳ ඉතිහාසයේ සෙසු කිසිම තැනක දක්නට නොලැබෙන උපදේශයකි.

කාලාමයෙනි, ඔබ සැක කිරීමක් විමතියට පැමිණීමත් සුදුසු ම ය. ඔබ ගේ සැකය ඇති වූයේ සැක ඇති විය යුතු තැනෙක ම ය.

ඉක්බිතිව බුදුරදුන් යමක් නොපිළිගත යුතු ආකාර 10 ක් පෙන්වා දුනි.

එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති

1. අනුශ්‍රැතියෙන් හෙවත් කුඩා කල සිට පුරුදු පමණින් යමක් නො පිළිගන්න.
2. පරපුරෙන් පරපුරට පිළිගෙන පැමිණි පමණින් නො පිළිග න්න.
3. මෙය මෙසේ වී යැයි, මිනිසුන් අතර කතා පැතිර පවතින පමණින් නොපිළිගන්න.
4. තමා උගත් ග්‍රන්ථවල සඳහන් පමණින් හෝ නො පිළිගන්න.
5. තර්කයට එකඟ නිසා හෝ නො පිළිගන්න.
6. කිසියම් න්‍යායකට එකඟ නිසා හෝ නො පිළිගන්න.
7. පෙනෙන හැටියට හරි යැයි කියා හෝ නො පිළිගන්න.
8. තමන් පිළිගෙන ඇති කිසියම් දෘෂ්ටියකට ගැලපෙන නිසා හෝ නො පිළිගන්න.
9. මෙතෙම පූජකයෙකැයි, කියන පුද්ගලයා ගේ යහපත්කම සලකා හෝ නො පිළිගන්න.
10. මේ අපේ ගුරුවරයා යැයි, කියා හෝ නො පිළිගන්න.

මෙහි දී යමක් පිළිගත යුතු ආකාරය මෙසේ දැක් වී ය.

යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤූගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ

කාලාමයෙහි මේ දහම් කුසල් ය. මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගර්හිත ය. මේ දහම් සම්පූර්ණ කිරීම සමාදන්වීම අවැඩ පිණිස දුක් පිණිස පවත්නේය යි, නුඹලා යම් කලෙක නුඹලාම දැනගන්නාහු ද කාලාමයෙනි, එකල්හි නුඹලා එය දුරු කරව.

කාලාමයෝ මෙම දේශනාව මනාව තේරුම් ගත් හ. මෙය ම පිළිගත් හ. දිවිහිමියෙන් තෙරුවන් සරණ ගිය උපාසකයෝ බවට ද පත් වූ හ. විචාර පූර්වකව නිගමනයකට එළඹීමට අනුගාමිකයන්ට අවස්ථාව සලසාදීමක් මෙ මගින් අදහස් වෙයි. ඉතා ප්‍රකට චූල්ලහත්ථිපදෝපම සූත්‍රයට අනුව යමෙකු කිසියම් නිගමනයකට එළඹිය යුත්තේ එකවරම නොව ඒ පිළිබඳව දීර්ඝ අවධානයකින් පසුව යි. එහි දැක්වෙන පරිදි පා සටහන් අනුව ගොස් ඇතා දැකීමෙන් ම මෙම ඇතා නියම හස්තියෙක් යැයි, නිගමනයකට එළඹිය යුතු බව කියවෙයි. මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයට අනුව බුදුරදුන් ගේ අනුගාමිකයෙකු වීමට උපාලි ගෘහපතියා කැමැත්ත පල කළේය. එහි දී බුදුරදුන් ඔහුට අවවාද දෙන්නේ ඹබ වැනි කීර්තිමත් පුද්ගලයෙකු මෙවැනි හදිසි තීරණවලට නො එළඹිය යුතු බවත්, තවදුරටත් දීර්ඝ වශයෙන් සිතා බලා නිගමනවලට එළඹිය යුතු බවත් ය. හදිසි නිගමනවලට එළඹිය යුත්තේ ඒ පිළිබඳ ව තම චින්තනය දීර්ඝ වශයෙන් මෙහෙයවීමෙන් පසුව යැයි භයභේරව සූත්‍රයේ ද දැක්වෙයි.

පූර්වෝක්ත කාලාම සූත්‍රය ලෝකයේ විද්වත් ජනයා අතර ඉමහත් සම්භාවනාවට ලක්වූවකි. බුදුදහම භක්තියට නොව බුද්ධියට මුල්තැන දෙන ඉගැන්වීමක් බව මේ තුළ

විස්තර කෙරෙන හෙයිනි. එහි එක් තැනෙක තර්කය ද යමක් පිළිගැනීමේ මාර්ගය නොවන බව කියැවුණි. තර්කයෙන් එළඹෙන

තීරණ ඇතැම් අවස්ථාවන් හි දී සත්‍ය නො වේ. එය මෙසේ සරලව පෙන්වා දිය හැකි ය.

1. නිවැරදිව තර්ක කොට නිවැරදි නිගමනවලට එළඹීම.

2. නිවැරදිව තර්ක කොට වැරදි නිගමනවලට එළඹීම.

3. වැරදියට තර්ක කොට වැරදි නිගමනවලට එළඹීම.

4. වැරදියට තර්ක කොට නිවැරදි නිගමනවලට එළඹීම.

තර්කය නිවැරදි ඥාන මාර්ගයක් නොවන බව බුදුසමය පවසන්නේ මෙම හේතූන් නිසා ය. සැක නැති කිරීම පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ සෑම විටෙකම දැක්වූයේ දැඩි සැලකිල්ලකි. තමන් වහන්සේ දේශනා කළ ධර්මය ගැන යම්කිසි සැකයක් ශ්‍රාවකයන් ගේ සිතෙහි පැවතියහොත් තමන් ගෙන් ප්‍රශ්න කළ යුතු බව ද සැක දුරු කර ගැනීමට ඉඩක් නොලැබිණැ යි, පසුව විපිළිසර නොවිය යුතු බව ද පිරිනිවන්පෑමට ස්වල්ප වේලාවකට පෙර පවා උන්වහන්සේ ස්වකීය ශ්‍රාවක පිරිසට දේශනා කළ හ. එහෙත් ශ්‍රාවක පිරිස නිහඬව බලා සිටිය හ. එහි දී බුදුරදුන් අවධාරණය කළ කරුණ සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ බෞද්ධ මතය කවරේදැ යි, තීරණය කිරීමට තවත් හොඳම සාක්ෂියකි. එය නම්, ඹඹබ ප්‍රශ්න නො අසන්නේ ශාස්තෘවරයාණන් කෙරෙහි ගෞරවය නිසා නම් එය තම යහලුවෙකුට වත් සැළ කළ යුතු ය,□ යන්න යි.

# අවබෝධයෙන් කෙසේ පින්කම් කළ යුතු ද? 07

ත්‍රිපිටකාචාර්යය, අභිධර්ම විශාරද, ධර්මකීර්ති ශ්‍රී,
**පූජ්‍යපාද දිගන සුගතවංස ස්ථවිර.**

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුද්ධ සම්බුදුරජාණන් වහන්සේගේ සාසනය පිහිට කොට වෙසක් මංගල්‍යය අරමුණු කොට ගෙන ඔබ කළ යුතු වෙසක් සැරසිල්ල කෙසේ විය යුතු ද? බුදුදහම සංකේතවත් කරමින් සිදු කරන ආමිස පූජාවන් අභිභවා ප්‍රතිපත්ති පූජාවෙන් ඔබගේ වෙසක් සැරසිල්ල අවබෝධයෙන් කළ යුතු නොවේද? අහේතුක-ද්විහේතුක උප්පත්තීන්ට වඩා ත්‍රිහේතුක ප්‍රතිසන්ධිලාභී ඔබ ජාතප්‍රඥාවෙන් යුක්ත බැවින් කළ යුතු කුසල් අවබෝධයෙන් කළ හැකි ය. ඔබගේ පින්කමෙහි පූර්ව චේතනාවත් - මුඤ්චන චේතනාවත් - අපර චේතනාවත් යන චිත්ත සම්පත්තිය අකුසලයන්ට ග්‍රහණය වීමට නොදී ත්‍රිවිධ කුසල මූලයන්ගෙන් ස්වයංපෝෂිත වූයේ නම් එය මහත්ඵල - මහත් ආනිසංස ලැබෙන වටිනා කුසලයකි.

බාල-මහලු තරාතිරම් බේදයක් නොමැතිව ඕනෑ ම අයෙකුගේ සිත් සතන් බුද්ධාලම්භන ප්‍රීතියෙන් පිණවන්නා වූ අති-ඉෂ්ඨාරම්මණ සහිත අරමුණු මේ වෙසක් සමයේ අසන්ට-දකින්ට ලැබෙන මුත් ඒ හේතුවෙන් උපදින සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත කුසල් නොපිරිහෙලා අඛණ්ඩව පවත්වා ගැනීමට නම් ඔබ කරන පින්කමෙහි ආනිසංස හොඳින් දැන ගෙන සිටිය යුතුයි. යමෙක් සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සුවඳ මල්, පලතුරු, භෝජන වැනි පූජාවන් සිදු කරන්නේ නම් මල් ආදියෙහි නෙළීමේ පටන් පූජාසනය දක්වා

පියවරෙන් පියවරට සිහිනුවණින් එම කුසලය සිදු කළ යුතුයි. කුඩා මල් බඳුනක් පූජා කළත් ඒ වෙනුවෙන් යෙදූ සිත බලවත් බැවින් කල්ප ගණන් ලෞකික සුගති සම්පත් ලැබෙන්නාක් මෙන් ම එම කුසල් සිත් විදර්ශනා කරමින් ඇති කර ගන්නා අවබෝධය ලෝකෝත්තර සැපය පිණිස ම ය. ලෞකික ආනිසංස සේ ම ලෝකෝත්තර මගඵල පිණිස වඩන කුසලය ඒකාන්තයෙන් පාරමිතාවක් වන බැවින් නුවණ වැඩෙන කුසලයක් සේ අවබෝධයෙන් ම කළ යුතුයි. කෙසේ නම් පාරමිතාවක් වන්නේ ද යත්, තමන්ට වඩා උසස් ගුණ ඇති උත්තමයන් උදෙසා කරන පූජාව පූජා බුද්ධියෙන් යුක්තව සිදු කිරීම දාන පාරමිතාවයි. තමන් සීලයක පිහිටා එම පූජාව සිදු කරන කල්හි සීල පාරමිතාවයි. ලෝභාදී අකුසල් යටපත් කරමින් පින්කමෙහි යෙදීම නෙක්ඛම්ම පාරමිතාවයි. කම්ඵල අදහා සිදු කිරීම ප්‍රඥා පාරමිතාවයි. උත්සහයෙන්-උනන්දුවෙන්-කැපවීමෙන් කුසල් සිත රැක ගනිමින් පින්කමෙහි යෙදීම විරිය පාරමිතාවයි. අවු-වැසි, මැසි-මදුරු රෝගාබාධ ඉවසා දරා ගෙන පින්කමෙහි යෙදීම ඛන්ති පාරමිතාවයි. තමන් කරන පින්කමෙන් ලැබෙන ආනිසංස හොඳින් විශ්වාස ඇතිව කිරීම සත්‍ය පාරමිතාවයි. කෙසේ හෝ මම පින්කම කළ යුතු යැයි අධිෂ්ඨාන පූර්වාඞ්ගම සිත අධිෂ්ඨාන පාරමිතාවයි. පූජාව ලබන පක්ෂය කෙරෙහිත් පූජාව දැක අනුමෝදන් වන්නවුන් කෙරෙහිත් පිහිටුවා ගත් අසීමිත මෛත්‍රිය මෙත්තා පාරමිතාවයි. තමන් කළ කුසලය කෙරෙහි ඇලීමක්-ගැටිමක් නොමැතිව තත්‍රමජ්ඣත්තතා ගුණය වැඩෙන ආකාරයෙන් මධ්‍යස්ථාකාර සිතක් පවත්වා ගැනීම උපෙක්ඛා පාරමිතාවයි.

තව ද පින්කමක් කිරීමේ දී උපදින ශ්‍රද්ධා ආදී පඤ්ච ඉන්ද්‍රිය ධර්මයන් සමබරව පවත්වා ගත යුතු ය. කෙසේ ද යත්, යමෙක් බුදුරජාණන් වහන්සේට ආහාර පූජාවක් සිදු කරන්නේ නම් පළමුවෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහිත්, එම පූජාවෙන් ජනිත වන ආනිසංස කෙරෙහිත් ඔබ තුළ ඇති විශ්වාසය ශ්‍රද්ධාවයි. එම කුසලය සමග නූපන් අකුසල් නූපදවා ගැනීමෙහිත්, උපන් අකුසල් ප්‍රහාණය කිරීමෙහිත් ලා වූ උත්සහය හා නූපන් කුසල් උපද්දවා ගැනීමෙහිත්, උපන් කුසල් බලවත් කරගැනීමෙහිත් ලා වූ උත්සහය වීර්යයයි. පූජාවේ මුල පටන් අග දක්වා පියවරෙන් පියවර බලපවත්තා අවධානය සතියයි. පින්කම සිදු කරන කාලය පුරාවට උපදින කාය-වාග්-මනෝ කර්ම සියල්ලක් ම අකුසල්

ශක්තීන් තදඞ්ග වශයෙන් යටපත් කරමින් සන්තානයෙහි ඇතිවන ඒකාග්‍රතාවය සමාධියයි. කම්ඵල අදහා ගෙන අවබෝධයෙන් යුක්තව පින්කමෙහි යෙදීම ප්‍රඥාවයි.

යමෙක් සිදු කරන ආමිස පූජාවක දී එය සකසුරුවම්ව කිරීම, තවත් කෙනකුට එහි හිඩැසක්-අඩුවක් පිරවීමට නො වන සේ කිරීම සක්කච්චකාරී ගුණයයි. කැප-අකැප යනාදීන් නුවණින් සළකා බලා පින්කමෙහි නිරත වීම සාතච්චකාරී ගුණයයි. සිදු කරන කුසල් පිළිබඳ සෑහීමකට පත් නොවී 'මට මදි'ය යන හැඟීමෙන් යුක්තව නැවත නැවත කුසල් රැස් කිරීම අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු ගුණයයි. කෙලෙස් තවන වීර්යය ඇතිව පටන් ගත් වීර්යයෙන් ම නිමාව දක්වා කුසල් සිදු කිරීමේ ප්‍රයත්නය අප්පටිවානිතා ච පධානස්මිං ගුණයයි. පින්කමෙහි ඇති වටිනාකම හොඳින් අවබෝධ කර ගත් තමන් ම සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත කුසල් වැඩෙන ආකාරයෙන් ම යෙදීම සයංකාර ගුණයයි. අන් අය කරන කුසල් දැක නුවණින් සිත පහදා ගෙන අනුමෝදන් වීම පරංකාර ගුණයයි. සියතින් ම තම පින්කම කිරීම සාහත්ථික ගුණයයි. තවත් කෙනකු ලවා කරවීමේ කුසලය ආණත්තික නම් වේ. නුවණ වැඩෙන ආකාරයෙන් පින්කමෙහි යෙදීම සම්පජඤ්ඤ ගුණයයි. යමෙක් නුවණින් තොරව සිදු කරයි නම් එය අසම්පජඤ්ඤයි. ආණත්තික-අසම්පජඤ්ඤ වශයෙන් මුක්තව සිදු කරන්නා වූ කුසලය මහත් ඵල-මහානිසංස ගෙන දේ.

ඍතු-භෝජන-පුග්ගල යන ත්‍රිවිධ සප්පාය සහිත, කල්‍යාණ මිත්‍රයන් වාසය කරන පතිරූපදේසවාසී ගුණයත්, අතීතයේ කළ පින් ඇති පුබ්බෙ ච කතපුඤ්ඤතා ගුණයත් සහිත ඥාණවන්ත තෙමේ ආත්ම සන්තානය දමනය කර ගනු වස් සුදුසු කල්හි සිදු කරන තම පින්කම සියතින් චිත්තප්‍රසාදය ඇතිව තම ගුණ උසස් කිරීම් - අන් අය ද හෙළා දැකීම් ආදියෙන් තොරව සියතින් සිදු කරන කුසලය නම් තම ආත්මය ජය ගෙන, සසර ජය ගෙන, කෙළෙසුන් ජය ගෙන නිවන් අවබෝධය පිණිස ම හේතු උපනිශ්‍රය වන්නේ ය.

"න ඛො, ආනන්ද, එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතො වා පූජිතො වා අපචිතො වා. යො ඛො, ආනන්ද, භික්ඛු වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා ධම්මානුධම්මප්පටිපන්නො

විහරති සාමීචිප්පටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති ගරුං කරොති මානෙති පූජෙති අපචියති, පරමාය පූජාය. තස්මාතිහානන්ද, ධම්මානුධම්මප්පටිපන්නා විහරිස්සාම සාමීචිප්පටිපන්නා අනුධම්මචාරිනොති. එවඤ්හි වො, ආනන්ද, සික්ඛිතබ්බ''න්ති.

ආනන්දයනි, මේ සාසනයෙහි යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් ආමිසාදී කිසිවකින් සිදු කරන පූජාව මෙන් නොව, ධම්මානුධම්මපටිපන්නව ගරු කටයුතු මාර්ග යට පිළිපන්ව ධම්මානුධම්ම ප්‍රතිපදාවේ යෙදේ නම් එම ප්‍රතිපත්තිය තථාගතයන් වහන්සේට දක්වන්නා වූ නියමාකාර වූ පරම වූ ගරුබුහුමන් දැක්වූවා වන්නේ ය. මෙසේ ලෞකික ප්‍රාර්ථනා ඇතිව සිදු කරන කුසලයන්ට වඩා කම්මක්ඛයගාමී වූ සොතාපත්ති අංගයන් පිරිවරා ගත් ප්‍රතිපත්ති මාර්ගය පුරණය සියලු බුදුන් වහන්සේගේලාගේ දහම් අනුසාසනාවයි-ඇගයීමයි. එනම් ඒකායන නිර්වාණ මාර්ගය පෙන්වාදෙන කල්‍යාණමිත්‍ර ආශ්‍රය, මාර්ගය වැඩීමට හේතු වන පූර්වභාග පටිපදා විදර්ශනා ප්‍රතිසංයුක්ත ධර්මශ්‍රවණය, අනිත්‍ය දුක්ඛ අනාත්ම අසුභ වශයෙන් වශයෙන් ප්‍රගුණ කරන යෝනිසො මනසිකාරය, නවලෝකොත්තර ශ්‍රී සද්ධර්මය අධිගමනය පිණිස වැඩිය යුතු සමථ-විදර්ශනා පිළිවෙත හෙවත් ධම්මානුධම්ම ප්‍රතිපත්තිය යන සෝතාපත්ත්‍යාඞ්ග වැඩෙන ආකාරයට ඔබ වෙසක් සමයෙහි දී ආමිස පූජා අභිභවා ප්‍රතිපත්තියෙහි යෙදේ නම් එය ජීවමාන බුදුන් වහන්සේ සිටියා නම් සාදුකාර නංවමින් අනුමෝදන් වන අග්‍රගණ්‍ය පූජාව වනු ඒකාන්ත ය. මෙසේ අවබෝධයෙන් පිං කරන්න වෙර වඩත්වා!.

පාඨක ඔබට සුභ වෙසක් මංගල්‍යයක් වේවා!

# ඵල දරන ශ්‍රාවකත්වය උදෙසා 08

**පූජ්‍ය අඟුණාච්චියේ සුධීරානන්ද හිමි**
**ශ්‍රී සරණපාල මහා විහාරය**
**ධම්මානන්ද මාවත, වලාන, පානදුර**

ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ දී පහළ වුණ ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ මානව චින්තනයේ අභිවෘද්ධිය, නිරෝධය පිණිස ලොව මෙතෙක් නොඇසූ දහමක් ලෝකානුකම්පිතව දේශනා කළ සේක. එකී දහම විර්මශනාත්මකව අධ්‍යයනය කරන ප්‍රායෝගිකව වැඩ කරන්නා හට ඒකාන්ත වශයෙන් ඵල දරන බවට ද උන්වහන්සේ සතිපට්ඨාන සූත්‍රය තුළ සපථ කළ සේක. ඵල දරන්නට නම් තමා තුළ ගොඩ නැඟිව යුතු වන්නේ නිවැරදි වූත්, නිර්මල වූත් දහමක් ම ය. වත්මනෙහි අප සිත් තුළ එබඳු දහමකට අවකාශයක් තිබේ දැයි සිතා බැලිය යුතු වන්නේ ම ය.

ලෝකය නිර්මාණය වන්නේ ම සාමිසත්වයට ඇති කැමැත්ත නිසා ම ය. නිරාමිස බව තමා තුළට බහා ලන්නට සාමාන්‍ය මනුෂ්‍යයා අතිශය උකටලී වන්නේ ය. මිනිසුන් පමණක් නොව බුදු රජාණන් වහන්සේ "සබ්බේ සංඛාරා අනිච්චාති"යනුවෙන් ලෝකාබිමුඛව දේශනා කරන විට "නිත්‍ය සංඥාවෙන්" සිටි සමහර දෙවිවරු පවා වික්ෂිප්ත වූ බව සඳහන් වේ. සංයුක්ත නිකායේ, සගාථ වර්ගයේ, දේවතා සංයුත්තයේ අච්චෙන්ති සූත්‍රයෙහි එක්තරා දෙවියෙක් බුදුරදුන් අභිමුඛයෙහි,

"අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයෝගුනා අනුපුබ්බං ජහන්ති

ඒතං භයං මරනේ පෙක්ඛමානෝ
පුඤ්ඤානි කයිරාථ සුඛා වහානි"

(පෙරවරු ආදී) කාලයෝ ඉක්මා යති. රාත්‍රීහු පුද්ගලයා මරණය කරා පමුණුවති. වයෝ රාසීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ ත්‍රිවිධ භය මරණයෙහි ලා දන්නේ, සැප එළවන පින් කරන්නේ ම ය." යනුවෙන් කාලය ගෙවී මරණය කරා යන පුද්ගලයා විසින් කළ යුතු එක ම කාර්යය පින් කිරීම පමණකැයි දෙවියන්ගේ අවබෝධය වී ඇත. වත්මනෙහි අප බොහෝ දෙනාගේ අදහස ද මෙය ම දැයි සැකයක් පවතී. බුදුරදුන් ඉහත දෙවියන්ගේ අදහස් තුන්වෙන ගාථා පදය වනතුරු ඉවසූ නමුත් උන්වහන්සේ සතර වැනි පදය පමණක් මෙසේ වෙනස් කළ සේක. "ලෝකාමිසං පජහේසන්ති පෙක්ඛමානො" යනුවෙන් පින් කිරීම පමණක් නොව එතැනින් මතුයෙහි (භවත්‍රය සංඛ්‍යාත) ලෝකාමිසය දුරු කළ යුතු බව පෙන්වා දුන් සේක.

එයින් පින් කළ යුතු නොවේ යැයි පූර්ණ අදහසක් නැත. මන්ද යත්, එහි යම් සැපයක්

අත්විඳිය හැකි වුව ද ඌණ පූර්ණයක් ඇති බව හැඟේ. නිවන යනු කාමාශ්වාද සුඛය ඉක්මවා අවේදයිත සුවය ඇති කරවන්නක් බැවින්, පින විසින් දිව්‍ය මානුස සැපය, බව භෝග සැපය මත සත්ත්වයාව පිහිටුවන බැවින් නිවන් දකිනු කැමැත්තහු විසින් එහි නතර නොවිය යුතු බවයි අදහස විය යුතු වන්නේ. තව ද ප්‍රග් බෞද්ධ ඉතිහාසයෙහි ධ්‍යාන උපදවා ගත හැකි මට්ටමට මනස දියුණු කළ ආචාර්යවරුන් හැර පියා සිදුහත් කුමරා එයිනුදු මෙකී පරමාර්ථය සාධනය කළ නොහැකි බව අවබෝධ වූ නිසා ය, සත්‍යය සොයා පිය නඟන්නට යෙදුණේ.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ සමස්ත ලෝකයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් හෙබි හෙයින් මෙම ධර්ම පර්යාය තුළ නිරාමිස සුවය පිණිස අනුක්‍රමිකව ධර්මය දෙසා වදාරා ඇත. බුදුවරුන් ලොවට පහළ වන්නේ ම අනිච්ච දුක්ඛ අනත්ත ගැන හෙළි කිරීමට ය. එහෙත් එකී දහම සුඛාවබෝධය නොවන පුද්ගලයන් ද ඇති හෙයින් ලොව පියුම් විලක් වැනි යයි දුටු බුදුරදුන් දාන, සීල, භාවනා ආදී අවබෝධයට පත් වන මාර්ගය විවර කර ගත හැකි ප්‍රතිපදාවක් ද පනවා ඇත. වත්මනෙහි අප බොහොමයක් පින මත පමණක් ම ඇල්මක් ඇති,

මතුයෙහි කළ යුත්ත නොකරන හෙයින් ඵල නොදරන ශ්‍රාවකත්වයක් උරුම වී ඇති බව පෙනේ.

අනිත් කරුණ නම් අනවබෝධය හා අන්තගාමීත්වය ය. මරණින් මතු ලොවක සියල්ල අත්විඳීමට ද සූදානම් වෙමින් පවතී. විහාරස්ථානවල කටයුතු කරන විට බොහෝ අර්බුදයන් නිර්මාණය වන්නේ ද අවබෝධයට මුල් තැන නොදෙන, ආනිසංස කතාව ම බුදු දහම යැයි සිතා කටයුතු කරන පිරිසක් ගොඩ නැඟී ඇති හෙයිනි.

ශ්‍රාවකත්වය ඵල දරන්නට නම් ධර්මය ප්‍රත්‍යක්ෂව ජීවිතය තුළ ගොඩ නඟා ගත යුතු ය. එහි දී මේ ජීවිතය ද, මතු ජීවිතයන් ද පල දරනු ඇත. මෙලොව සරු බව යනු ලද මිනිස් ජීවිතයේ චර්යාවන්ගේ අභිවෘද්ධිය වේ. එය ම භෞතික දියුණුවේ හැරවුම් ලක්ෂ්‍යය බවට ද පත් වේ. චරිතය බලවත් වන්නේ, සෑම අතින් ම රැකෙන අභිර්වධනය ගෙන එන්නේ, චර්යාවන් අභිර්වධනය වන විටය. සිතින් සිතා කළ යුත්තක දී සිතට සිතෙන යහපත් සිතුවිලි අරමුණු සෑම විට ම දහමෙහි අපහට සෑම තැනක ම මුණගැසෙනු ඇත. චර්යාවන් බලවත් වන විට එකී චරියාවන් ඇති පුද්ගලයා අභිවෘද්ධියට ලක් වේ. ඔහු හෝ ඇය තුළ ඉවසීම කරුණාව, දයාව, අධිෂ්ඨානය, අප්‍රමාදී බව, වීර්යය, සමානාත්මතාව, අල්පේච්ඡතාව, සරු දේ සරු ලෙස ද, නිසරු දේ නිසරු ලෙස ද දකින මනසක් ඇති බව වැනි බොහෝ කාරණා ගොඩ නැගෙන විට වළාකුලින් මිදුණු පූර්ණ චන්ද්‍රයා මෙන් ඔහුගේ හෝ ඇයගේ චරිතය ආලෝකමත් වේ.

එවැන්නකුගේ ජීවිතයෙහි භෞතික දියුණුව වුව ද නොවන්නේ යැයි කෙසේ නම් කිව හැකි ද? ලෝකය පිළිගත් බටහිර දාර්ශනිකයන් පවා තම චරිතය බලවත්ව ගොඩ නඟා ගැනීමට මෙම දහමෙහි කරුණු තමා තුළ ගොඩ නැඟෙන්න සලස්වා ඇත. ක්‍රිස්තු පූර්ව 135 පමණ විසූ ග්‍රීක දාර්ශනිකයකු වන එපික්ටිටස් (EPICTETUS) තම ප්‍රබල ගෝලයකු වන මාර්කස් එරේලියස් ((MARCUS AURELIUS) වැනි ප්‍රතාපවත් දාර්ශනිකයකු, අධිරාජයකු නිර්මාණය කරන්න යොදා ගත් කැපී පෙනෙන අදහස් අතර ඇත්තේ මෙම දහමෙහි කරුණු ම ය.

ඔහු බලවත් කරනා අදහසක් වන්නේ "MEMENTO MORI" යන්නයි. ග්‍රීක භාෂාවෙන් "මෙමෙන්තෝ මෝරි" යනු 'මැරෙන බව

දැන ගෙන සිටීම' යන්නයි. ඔහු නිතර සිහිපත් කරන තමා බලවත් කරන මෙම සිහිකැඳවීම තම සිත තුළ නිතර මෙනෙහි කළ දෙයකි. එය කොපමණ මට්ටමට තමා තුළට රෝපණය කර ගන්නට උත්සාහ කළේ ද යත් ගමන් ගන්නා කරත්තෙහි මිනිස් හිස්කබලක් තබා ගෙන සිටි බව කියැවේ. එයින් ඔහු අදහස් කළේ "අද කළ යුතු දේ අද ම කිරීමට" යන්නයි. මරණය ඕනෑ ම මොහොතක විය හැකි දෙයකැ යි සිතා තමාටත්, තමාගෙන් ලෝකයටත් විය යුතු දේ කරන්නට යුහුසුලු වී ඇත. එයින් ඔහු බොහෝ වියතුන්, උගතුන්, බලවත් පුද්ගලයන් පිළිගත් දාර්ශනිකයකු බවට පත් විය. අදටත් බටහිර ව්‍යවසායකයන්, උගතුන්, බුද්ධිමතුන් අතර ප්‍රකටව නම රැඳී "MEDITATION MARCUS AURELIUS" ඔහුගේ විශිෂ්ට අදහස් ගැබ්වී ඇති අගනා ග්‍රන්ථයකි.

එකී උක්ත කියමන දහමෙහි 'මරණ සතිය' වැඩීම ලෙස පෙනී යයි. එය වැඩීම තුළින් ම වීර්යය ගොඩ නැගෙනු ඇත. නිවන අරමුණු කරන තැනැත්තා විසින් පදන් වීර්යය හෙවත් කෙලෙස් තවන වීර්යය, අප්‍රමාදය ඇති කරනු ලබන අතර ලෞකික අරමුණ උදෙසා ද බලවත් වීර්යයක් ඇති කරනු ලබයි. අප සැවොම ඉක්මනින් මරණය කරා ඇදෙන්නේ වී නම් ලද මනුසත් භාවය තුළ මෙහි ආ අරමුණ ඉක්මනින් පූර්ණත්වය වෙනුවෙන් වැඩ කළ යුතු වේ. ජීවිතය කළමනාකරණය කර ගත යුතු වේ.

එසේ ම මෙය අනුගමනය කරන කවරෙකු වුව ද ඵලදායීතාව අත්විඳිනු ඇත. වැඩිහිටියකු මෙය මැනවින් පුරුදු කරන්නේ නම් ඊළඟ පරපුර තැනීමේ දී ඔවුන් හොඳින් හසුරුවන්නේ කෙසේ ද යන්න ජීවිතයේ එළැඹෙන දශකවල දී එම දශකයට අදාළ කාර්යභාරය ඉතා හොඳින් කරන්නට පෙළඹෙනු ඇත. ඉගෙන ගන්නට ඇති කාලය ඉක්මනින් ගෙවී යන එකකැයි එකී කාලයේ දී මැනවින් ඉගෙනීමට ද, තරුණ අවදියේ දී මුදල් ඉපයීම, ආවාහා විවාහ වීම ආදිය ද, සැදෑ සමය ආධ්‍යාත්මික බව ඇති කර ගැනීම උදෙසා යන ආකාරයට බමුණන් ජීවිතය කළමනාකරණය කර ගන්නට යොදාගත් ක්‍රමය අනුගමනය කරන්නේ වී නම් ඒ සෑම දශකයක් තුළ ම ඵලදායීතාව ඇති කර ගත හැකි ය. මන්ද යත් ගෙවන කාලය තුළ කළ යුතු දේ නොකළහොත් නැවත එම කාලය තමා වෙත නොඑන බව අප ඇති කරගන්නා නුවණයි.

තථාගතයන් වහන්සේ අංගුත්තර නිකායේ, අට්ඨක නිපාතයේ, සති වර්ගයෙහි සති සම්පජඤ්ඤ සූත්‍රයේ දී මේ සස්නෙහි පල දරන ආකාරය දක්වා තිබේ. ගසක් පල දරන්නට නම් මැනවින් අතු කොළ තිබිය යුතු වන්නා සේ ම, එයින් ගසට අවශ්‍ය පෝෂණය අවශෝෂණය කරගන්නා සේ ම දහම ඵල දරන්නට නම් ස්මෘති සම්පජඤ්ඤය හෙවත් සිහිය සමග යෙදුන නුවණ ඇති කල්හි පුද්ගලයාගේ ජීවිතය තුළ විමුක්තිය ඵල දරන බව පෙන්වා දී ඇත.

"මහණෙනි සති සම්පජඤ්ඤ ඇති කල්හි එය ඇත්තහුගේ හිරි ඔතප් ඇති වේ. හිරි ඔතප් ඇති කල්හි ඉන්ද්‍රිය සංවරය ඇති වේ. ඉන්ද්‍රිය සංවරය ඇති කල්හි සීලය ඇති වේ. සීල සම්පන්නයාගේ සම්‍යක් සමාධිය ඇති වේ. සම්‍යක් සමාධිය ඇති කල්හි යථාභූත ඥාන දර්ශනය ඇති වේ. එය ඇති කල්හි නිබ්බිදා විරාගය ඇති වේ. නිබ්බිදා විරාගය ඇති කල්හි විමුක්ති ඥාන දර්ශනය ඇති වේ."

මේ ආකාරයට සස්නෙහි පිහිටිය යුතු අයකුට සිහිය සමඟ යෙදුන නුවණ ඇති අයකු බවට පත් වන්නේ නම් පල දරන ආකාරය පෙන්වා දී ඇත. එබැවින් අපහට කළ යුතු කාරණාව ලෙස පුංචි දරුවාගේ සිට මහල්ලා දක්වා සිහි නුවණ දියුණු කළ යුතු බව අවධාරණය කරනු ලබයි. අපගේ දෛනික ජීවිතය තුළ කටයුතු කරන විට ද සිහි නුවණ ඇති නම් මහත් ප්‍රයෝජන ඇති කරනු ඇත.

ඉගෙන ගන්නා දරුවකුට සිහිය පුරුදු කරන්නේ නම් ඔහුට මතක ශක්තිය අභිවර්ධනය වේ. සිහියෙහි රසය (අසම්මෝස රසය) හෙවත් කෘත්‍යය, සති කාර්ය භාරය වන්නේ එක දෙයකට පූර්ණ අවධානය යොමු කිරීමේ හැකියාවයි. එක දෙයකට පූර්ණ අවධානය දීම තුළින් මනස ක්‍රමානුකූලව දත්ත ගබඩා කර ගනියි. එවිට එය නැවත සිහි ගන්වා ගැනීමට පහසු කරනු ඇත. "චිරකතම්පි චිර භාසිතම්පි සරිතා අනුස්සරිතා'' යනුවෙන් පෙර කළ දෙයක්, කියූ ඇසූ දෙයක් මතකයට නංවාලීම පහසුවෙන් හා නිවැරදිව සිදු වනු ඇත.

එසේම දෛනික ජීවිතයේ දී සිහිය හා නුවණ අහිමිව වාසය කිරීමේ දී බොහෝ අනර්ථය ගෙන දේ. රෝග පීඩා ඇති කරවීමට ද හේතු සපයනු ඇත. මන්ද යත් අප ජීවිතයේ සිදු කරන බොහෝ කටයුතු සිදු කරනුයේ එළැඹ සිටි සිහියකින් සජීවීව නොවන බව පිළිගන්නට

වන කාරණයක් ය. බොහෝ දේ සිදු කරනුයේ කළ පුරුද්ද දැක පුරුද්ද මත පදනම් බැවින් එකී කාර්යය සජීවී නොවේ. දෛනික ආහාර ගන්නා පුරුද්ද දෙස බලන්න. කෑම බෙදා ගන්නේ ද සිහියකින් නොවේ. ආහාර අනුභව කරන්නේ ද එම කාර්යයට අවධානය නොදීමෙන් ම ය. රූපවාහිනිය හෝ දුරකථනය නරඹමින් නැතහොත්

වෙනත් කාර්යයක නිරත වෙමින් ය. මෙහි ඇති අනර්ථයන් බොහෝ ය.

- ඔබ ආහාර ගිල දමයි.
- මුඛයේ දී සිදු වන කාර්යය බඩේ දී සිදු නොවේ. (දත්වලින් සැපීම 20 වරක් වත් සිදු කොට කෙළ සමග මිශ්‍ර වීමෙන් ආමාශ ගත කර ගත යුතුය. (ඇඹරීම මුඛයෙහි කාර්ය භාරයයි.)
- භෂ්ම උගුරෙන් පහළට ගිය පසු අම්ල බවට හෙවත් රස ඕජාව වෙනුවට විසක් බවට හැරේ.
- පිෂ්ඨය නිවැරදිව ජීර්ණය නොවීමෙන් දියවැඩියාව වැනි රෝග ඇති වේ.
- වේගයෙන් ආහාර ගිල දමන හෙයින් මොළයට ප්‍රතික්‍රියා කිරීමට නොහැකි නිසා ශරීරයට ප්‍රමාණවත් ආහාර නොමැති බව වැරදියට මොළය හඳුනා ගනී. පරිභෝජනය වැඩි වේ.
- විශේෂයෙන් ම ආහාර වල අන්තර්ගත ශක්තිය පෝෂ්‍ය පදාර්ථ කාර්යක්ෂමව අවශෝෂණය වන්නට ආහාර කුඩා කුඩා කැබලිවලට ඇඹරිය යුතු වේ.
- ස්තුලතාව, හෘද රෝග ඇති කරයි.

මෙවැනි නරක ප්‍රතිඵලයන් උදා කරන ජීවිත කාලය ම පීඩා ගෙන දෙන රෝග පීඩා මුඛයෙහි දී ම වළක්වා ගත හැක්කේ සතියෙන් යුතුව ආහාර අනුභව කිරීමෙන් ම ය. බුදු රජාණන් වහන්සේ ආහාර අනුභව කළ ආකාරය විමසා බලමු.

උන් වහන්සේ ආහාර හොඳින් මිශ්‍ර කර, පිඬු කොට, මුවට ළං කොට මහපටැඟිල්ල ආධාරයෙන් මුව තුළට යොමු කළ සේක. ආහාර

අනන විට මුඛයෙන් ඇඹරීම කරන්නේ නැත. අඹරන විට ආහාර අනන්නේ ද නැත. භික්ෂූන් වහන්සේලාට ද ප්‍රත්‍යවේක්ෂා කොට වළඳන්නට අවවාදය ලැබී ඇත්තේ සතියෙන් යුතුව එය කළ යුතු නිසා ය. මෙසේ බොහෝ දෑ ලැබිය හැකි මේ සෑම යහපත් චර්යාවක් ම නිවනට පමුණුවන්නට සූදානම් කරන්නෙකි.

දහම තුළ අවබෝධයට පත් වන්නට කැමති අයකු වේ නම් ඔහු එය ප්‍රාර්ථනා කිරීමකට සීමා නොකොට ප්‍රායෝගික පිළිවෙතක් ඇති කර ගත යුතු ය. මේ අයුරින් ගත් කල තථාගත සස්නෙහි පල දරන්නට, ලෞකික අභිවෘද්ධිය සලසා ගන්නට නම් අවබෝධයෙන් හා සිහිනුවණින් යුතුව චර්යාවන් අභිර්වධනය කළ යුතු බව අවබෝධ කර ගත යුතු වන්නේ ම ය.

# මල වගේ ලස්සන වෙන්න පමා නොවී යමු පෙරටම 09

ගා/ ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන් පරිවේණාධිපති ශාස්ත්‍රපති, ප්‍රවීණාචාර්ය
**පූජ්‍ය ලත්පඳුරේ ඉන්දරතන හිමි**

යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලාගුණේ බහු
ඒවං ජාතේන මච්චේන - කත්තබ්බං කුසලං බහුං(දප)

මල් හරි ම ලස්සනය්, පිරිසිදුයි, සුවඳයි, පිවිතුරුයි. සිත හොඳට පිරිසිදු කර ගත්ත කෙනාත් මේ මලක් වගේ ලස්සන බවට පත් වෙයි. සිත ගැන කොයි තරම් දැනුවත් වුව ද, සමාජයේ ජීවත් වෙන කොට ඒ සිතේ අභ්‍යාසය අමතක වීම මත තරහව, ඊර්ෂ්‍යාව, පළිගැනීම වගේ නරක සිත් පහළ වීමෙන් ඒවා සමඟ මිශ්‍රව අපි කටයුතු කරන්නෙමු. මේ තත්ත්වය මිනිසා තුළ ක්‍රියාත්මක වන විට ඔහු සැහැල්ලු පුද්ගලයෙක් නොවේ. ලස්සන ගතිගුණ තමන්ට නොදැනී ම මැකී යයි.

තමන්ගේ අඩුපාඩු දෙස තිතර ම බලා සිටින පුද්ගලයා අනුන් දිහා බලා විවේචනය කරන්නේ ඉතා අඩුවෙනි. එය උතුම් ක්‍රියාවකි. තමා කළ නොකළ දේ ගැන විමසා බලන පුද්ගලයා අනුන්ගේ අතපසු වීම් දෙස බලන්නේ අඩුවෙනි. එය ද ඉතා හොඳ ය. එනිසා මුලින් තමන් ක්‍රියාත්මක වී සම්පූර්ණ කෙනකු වීම ඉතා වැදගත් වේ. එවිට සිත ද පිරිසිදු වේ. ඒ පිරිසිදු සිතේ සුවඳ, මල් සුවඳ පවා පරදා දස දෙස පැතිරේ. අපි ද මල් මෙන් පිවිතුරු වෙමු. මෙවැනි ජීවිතයක් සකසා ගැනීමට බුදුරදුන් මල් උපමා කර ගෙන ඉහත ගාථාව දේශනා කොට තිබේ.

තමා යා යුතු නිවැරදි මාර්ගය සහ නොයා යුතු නොමඟ කුමක් දැයි දන්නා පුද්ගලයා ඊළඟට පුරුදු විය යුත්තේ පමා නොවී කටයුතු කිරීමටයි.(ද්‍යාද්‍යා) කාලය අප තුළ ද අප සමාජය තුළ ද එතරම් සැලකිල්ලට බඳුන් නොවේ. එහෙත් සැම තැනක ම කාලසටහන්, කාල පරිච්ඡේද හා ඔර්ලෝසු දක්නට ලැබේ. නිසි කලට නිසි දෙය කර නිම කිරීමට පුරුදු වීම ජීවිතයේ අප සිදු කරන සෑම දෙයක ම සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට හැකි පහසු මාර්ගයකි. කාල කළමනාකරණය අපට වැදගත් වන්නේ අසීමිත ඉලක්ක හමුවේ හඹා යන අපට අපේ කටයුතු කිරීමට ද ජීවත් වීමට ද ඇත්තේ සීමිත කාලයක් බැවිනි. ගෙවී යන කිසි ම දවසක් හෝ පැයක් හෝ අපේ ජීවිතයට යළිත් එක් කර ගත නොහැකි ය. සෑම මොහොතක් ම අර්ථවත් දෙයක් සඳහා යොදා ගැනීම වැදගත් වන්නේ ඒ නිසා ය.

සමහර විට එක විනාඩියකින් කළ වරදක් නිවැරදි කිරීමට දවසක් ගත විය හැකි ය. එක මොහොතක් නොසිතා හෝ කළ වරදක දඬුවම අවුරුද්දක් දෙකක් විය හැකි ය. එසේ අප ලබා ඇති උතුම් මිනිස් ජීවිතයේ වටිනා කාලය දුක් විඳිමින් වද විඳිමින් කනගාටු වෙමින් නිකරුණේ ගෙවා දැමීම අපරාධයකි. එසේ දුකින් ගෙවන කාලය නැවත සතුටින් ගෙවීමට අපට හිමි නොවේ. ඒ නිසා සෑම මනුෂ්‍යයෙක් ම තමන්ට ජීවත් වීමට ඇති මේ වටිනා කාලය පණ මෙන් ආරක්ෂා කර ගත යුතු ය. නිකරුණේ ගෙවා නොදැමිය යුතු ය. වැරදි කටයුතු කොට තමා හෝ අනුන් කරදරයක පටලැවීමට යොදා නොගත යුතු ය. එසේ කළහොත් සතුටින් ජීවත් වීමට ඇති වටිනා කාලය දුකින් ගෙවා දැමීමට සිදු වේ.

ඒ නිසා පමා නොවී අප හඳුනාගත් නිවැරදි මාර්ගයේ ගමන් කිරීම අද ම ආරම්භ කළ යුතු ය. එවිට ජීවිතයේ සතුට සැමදා රැකෙන අතර අප අපේක්ෂා කරන ඉලක්ක සපුරා ගනිමින් ඒ තැනට පැමිණීමට හැකියාව ලැබෙනු ඇත. අවශ්‍ය වන්නේ අද කළ යුතු දේ අද ම අලස නොවී ක්‍රමානුකූලව කිරීමයි. ඒවා ජීවිතයට එක් කර ගැනීමෙන් අපේ ප්‍රමාදී බව නැති කර ගත හැකි ය.

පමා නොවී කටයුතු කිරීමේ වටිනාකම දැන ගත් පුද්ගලයාට මේ ලෝක ස්වභාවය අනුව මනසට විවිධ සිතුවිලි පහළ වී කම්මැලි

ගති ඇති වීමේ අවදානම නිතර ම තිබේ. ඕනෑ ම ක්‍රියාවක ප්‍රතිඵල දුර නම් අතරමඟ දී බොහෝ දෙනකුට එය අත්හැරීමට සිතේ. ඉලක්කයක් දැන දැනත් දැක දැකත් ගමන දුර බැවින් කෙටි පිළියම් සොයා ගොස් ජීවිතය අසාර්ථක කර ගත්තෝ බොහෝ වෙති. නිසි පරිදි සැලසුම් කළ දිගු ගමන ද කෙටි ගමන ද නියම ප්‍රතිඵල ලබා දෙයි. එනිසා කළ යුත්තේ ඉක්මනින් ඵලය ගැනීමට ක්‍රමය අවුල් කිරීම නොව සංවරකමින් කඩිසරව වැඩ කිරීමයි.

මෙසේ කටයුතු කරන අතර අලස සිතිවිලි ඇති වන සිත පිළිබඳ අවබෝධයක් අපට තිබේ නම් එබඳු සිතිවිලි අපව මුළා කරන ස්වභාවයක් බව අපට හොඳින් වැටහේ. සිත නමැති අවයවයක් මිනිස් සිරුරේ නොමැත. ශරීරයේ විශේෂ වූ ස්ථානයක් ද සිත සඳහා නොමැත. ශරීරයේ යම් ඉන්ද්‍රියයක හෝ ස්ථානයක යමක් සිදු වේ ද සිත ඒ සිදු වීම සඳහා එක් වේ. එවිට අදාළ තැන සිත ද ක්‍රියාත්මක වේ. එනිසා සිත මුළු සිරුර පුරා ම ඒ ඒ අවස්ථාව අනුව ක්‍රියාත්මක වන බව කිව හැකි ය. සිතේ ස්වභාවය නම් ක්ෂණිකව වෙනස් වීමයි. ඒ මේ අත දිවීමයි. තනිව හැසිරීමයි. ඉතා ඉක්මනින් බොහෝ දුර යාමයි. විවිධ සිතිවිලි නිතර පහළ කිරීමයි.(දායදායදා) මේ සෑම සිතිවිල්ලක් ම මිනිසා ක්‍රියාත්මක නොකරයි. තමන් කරන වැඩ කටයුතුවලට අදාළ අවශ්‍ය හා වැදගත් සිතිවිලි ක්‍රියාත්මක කරයි.

එහෙත් සිත ගැන නොදත් අය සිතට එන සිතිවිලි පසුපස හඹා ගොස් ජීවිතය අතරමං කර ගනිති. මුලින් හඳුනාගත් නිවැරදි මඟ, වැරදි යැයි සිතති. උත්සාහය අත්හරිති. පමා වී කටයුතු කරති. අලස සිතිවිලිවලට ඔවුහු යටත් වෙති. ඒ නිසා මේ සිතේ ස්වභාවය මැනෙවින් තේරුම් ගෙන අලස සිතිවිලි හා නරක සිතිවිලිවල වහලකු නොවී යහපත් උතුම් සිතිවිලිවලට සිතේ රැඳෙන්නට ඉඩ දී සිහියෙන් කටයුතු කිරීමට පුරුදු විය යුතු ය. නිතර සිත ගැන අවධානයෙන් හා සිහියෙන් සිටීම වැදගත් වේ. එවිට ක්ෂණික ආවේග, කළකිරීම්, ආතතිය වැනි දේ ඇති වී ජීවිතයේ අතෘප්තිය ඇති නොවේ. ලෝකයේ සෑම දෙයක් ම අපට අවශ්‍ය විදිහට වෙනස් කළ නොහැකි ය. අපට වඩාත් පහසු වන්නේ අපේ සිත වෙනස් කර ගැනීමයි. යහපත් අන්දමින් සිතා තමා වෙතට යොමු වූ සිතක් ඇති කර ගෙන දිනපතා ඒ සිත ගැන සිහියෙන් බලා අපිරිසිදු කිළිටි සිතිවිලි තෝරා ගෙන බැහැර

කොට පිරිසිදු සිතිවිලිවලින් සිත පිරිසිදු කර ගැනීම ජීවිතයේ සතුට සඳහා හේතු වේ.

---

මූලාශ්‍ර

1. ධම්මපදය - පුප්ඵ වග්ගය - 10 ගාථාව
2. අප්පාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝ පදං
   අප්පමත්තා න මීයන්ති - යේ පමත්තා යථා මතා
   (ධම්මපදය - අප්පමාද වග්ගය - 01 ගාථාව)
3. දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං
   යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා
   (ධම්මපදය - චිත්ත වග්ගය - 05 ගාථාව)

# විදර්ශනා මාර්ගය 10

## ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි

1. ලොව ඇති සියලු දේ සකස්වීම් ය; නැතහොත් සකස් කිරීම් ය. ඒ නිසා සංස්කාර නම් වෙයි.1

2. සියලු ම සිතිවිලි ද සකස් කිරීම් ය. සිතෙන් සිතිවිලි සකස් කිරීම අභිසංස්කරණය කිරීමකැයි කියනු ලැබේ. සියලු සිතිවිලි අභිසංස්කාර ය.

3. සංස්කාරයන්ගේ ස්වභාවය අනිත්‍යතාව ය. අනිත්‍යතාව යනු ඇති වන නැති වන බව යි. ඒ අනුව සංස්කාර යනු ඇති වීම් නැති වීම් ක්‍රියාවලියකි2.

4. ඇති වන්නේ හේතු ප්‍රත්‍ය සහිතව ය. නැති වන්නේ ඒ හේතු ප්‍රත්‍යයන්ගේ නැති වීම හෝ වෙනස්වී ම නිසා ය3. සංස්කාරයන්ගේ මේ ක්‍රියාකාරිත්වය 'නිසා හටගැනීම' යන තේරුමින් 'ප්‍රතීත්‍යසමුත්පන්නතාව' යැයි නම් කළ හැකි ය.4 ඒ අනුව ලොව ඇති සියලු දේ ප්‍රතීත්‍යසමුත්පන්නය; සියලු සිතිවිලි ද ප්‍රතීත්‍යසමුත්පන්න ය.

5. විමුක්තිය සඳහා දැන ගත යුත්තේ බාහිර ලෝකය සම්බන්ධයෙන් නො වේ. නිවන හෙවත් විමුක්තිය සිතිවිලි ලෝකය හා සම්බන්ධ ය. එනිසා කරුණු සොයා බැලිය යුත්තේ ඒ සිතෙන් ගොඩ නඟා ගත් ලෝකය ගැන ය.

6. ඉන්ද්‍රිය හය මාර්ගයෙන් ලැබෙන තොරතුරු සකස් කර ගැනීමෙන් සිතිවිලි ලෝකය ගොඩ නැගෙයි. එසේ ගොඩ නැගෙන ලෝකය ස්කන්ධ පහක් හෙවත් ගොඩවල් පහක් බව පෙන්වා දී තිබේ. ඒ අනුව එය පංචස්කන්ධ ලෝකය නම් වෙයි.

7. පංචස්කන්ධ ලෝකයට අයත් වන්නේ රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය සහ විඤ්ඤාණස්කන්ධය යි.

8. රූපස්කන්ධය යනු ශරීරය ද, ඉන්ද්‍රිය හය මඟින් ගන්නා සියලු අරමුණු ද වේ. ඒ මේවා ය : ඇසට පෙනෙන රූප. (ඒ රූප අනෙකුත් රූපවලින් වෙන් කොට දැක්වීම සඳහා රූපරූප යැයි කියනු ලැබේ.) අනෙකුත් රූප වන්නේ අනෙක් ඉන්ද්‍රියවලට ලැබෙන අරමුණු ය. එනම් : ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, ඵොට්ඨබ්බ (ස්පර්ශ) රූප සහ ධම්ම රූපය. ධම්ම රූප යනු මනින්ද්‍රියට ලැබෙන අරමුණු ය.

9. මේ රූප සිතට ඇතුළත් වන්නේ භෞතික රූප වශයෙන් නොවේ; සිතේ හෙවත් විඤ්ඤාණයේ පිළිබිඹු වන රූප ලෙසිනි. ඒ රූප සඤ්ඤා ලෙසිනි.

10. ඉන්ද්‍රියයන් ද, ඉන්ද්‍රියවලට ගෝචර වන අරමුණු ද, පංචුපාදානක්ඛන්ධ සිතක් හා සම්බන්ධ අනෙකුත් කරුණු ද අනිත්‍ය වශයෙන් දකින තැනැත්තා පෘථග්ජන බව ඉක්මවා ආර්ය මාර්ගයට පිවිසෙන බව ඔක්කන්ති සංයුක්තයේ සඳහන් වෙයි5.

11. නො රහත් සැමදෙනා තුළ ම ස්කන්ධ පහළ වන්නේ කෙලෙස් සහිතව ව; දැඩි සේ සිතින් අල්ලා ගැනීමෙනි. එනම් උපාදානයට ලක් වීමෙනි. එනිසා හුදු ස්කන්ධ වශයෙන් නොව, උපාදානස්කන්ධ ලෙසිනි.

12. පංචුපාදානක්ඛන්ධයට සම්බන්ධ එක අවයවයක අනිත්‍යතාව දැකීමෙන් අනෙකුත් අවයවවල ද අනිත්‍යතාව දැක ගැනීමට හැකි වෙයි.

'චක්ඛුං අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී' යනුවෙන් ඇස ගැන දැන ගැනීම අවශ්‍ය බව චක්ඛු සූත්‍රයෙහි අවධාරණය

වෙයි7. ඇස අනිත්‍යයි, වෙනස් වෙයි, වෙනස් තත්ත්වයකට පත්වෙයි යන්න එහි තේරුම ය.

13. ඇස අනිත්‍ය වන්නේ කෙසේ ද?

"ඇස අනිත්‍යයි, ඇස අනිත්‍යයි" යනුවෙන් මිමිණුව පමණින් ඇස අනිත්‍ය වන ආකාරය වැටහෙන්නේ නැත. ඇස අනිත්‍ය වන ආකාරය සොයා බලා වටහා ගත යුතුව ඇත.

14. මේ සඳහා 'දැකීම' යන ක්‍රියාව සිදුවන ආකාරය සොයා බලමු. රූපයක් දැකීමට නම් රූපයක් තිබිය යුතු ය. රූපය පෙනෙන ඇසක් තිබිය යුතු ය. ඇසත් රූපයත් එකට හමු විය යුතු ය. අවධානය ඒ සඳහා යොමු වී ඇත්නම් සිතක් පහළ වෙයි. ඇසත්, රූපයත්, සිතත් (=විඤ්ඤාණයත්) එක් වීම නිසා හෙවත් ස්පර්ශ වීම නිසා පෙනීමක් සිදු වේ8.

15. ඇස, රූපය, විඤ්ඤාණය, ස්පර්ශය යන මේ කරුණුවලින් එකක් හෝ නැත්නම් රූපයක් නො පෙනේ; 'දැකීමක්' සිදු නොවේ. සෑම දැකීමේ ක්‍රියාවක දී ම මේ සාධකවල එකතුව සිදු වේ. ඒ එකතුවත් සමඟ ඇස හටගනියි; රූපය හටගනියි; සිත හටගනියි; ස්පර්ශය හටගනියි. එසේ සිදු වන හටගැනීමට ඇසේ උපත යයි කියනු ලැබේ. රූපයේ උපත ද එය ම වේ; විඤ්ඤාණයේ ද උපත එය යි.

16. බොහෝ විට අප උපත තේරුම් ගෙන තිබෙන්නේ පුද්ගලයා උපදින විට ලැබෙන ඉන්ද්‍රියාදීන්ගේ උපත හැටියට යි. මෙහි දී වැදගත් වන්නේ ස්කන්ධ සිතක සිදු වන උපතයි. ඒ ස්කන්ධ සිතේ ඇස ආදී ඉන්ද්‍රිය ඉපදීමයි; රූප අරමුණු ඉපදීමයි. ඒ අනුව සිත් (විඤ්ඤාණ) ඉපදීමයි.

17. අනිත්‍යයට භාජනය වන බව තේරුම් ගත යුත්තේ ඒ ඇසේ යි. ඉපදීම ද, වෙනස්වීම ද, නැතිවීම ද වටහා ගත යුත්තේ ඒ ස්කන්ධයේ ඉපදුණු ඇසේ යි.

18. මෙහි දී ප්‍රශ්න කළ හැකි යි:- භෞතික වූ මාංශමය ඇසේ අනිත්‍යතාවක් නැද්ද? තිබේ නම් එය දැක ගත යුතු නැද්ද?

යනුවෙන්. භෞතික වූ සියලු දේ ම - එනම් සියලු සංස්කාර ම - ඇති වන නැති වන ස්වභාවයකින් යුක්ත බව අපි මුල දී ම දැන සිටිමු. එහෙත් ඒ අනිත්‍යතාව දැකීම දහම තේරුම් ගැනීම සඳහා ප්‍රමාණවත් නො වේ. දහම දැකීම සඳහා තේරුම් ගත යුත්තේ ස්කන්ධ සිතේ පහළ වන ඇසේ අනිත්‍යතාව දැකීමයි.

19. මේ අයුරින් ම අනෙකුත් ඉන්ද්‍රියවල උපත, අනෙකුත් අරමුණුවල උපත, අනෙකුත් විඤ්ඤාණයන්ගේ උපත දැක ගත හැකි යි. එසේ දැක ගත යුතු යි.

20. මෙසේ ස්කන්ධ සිතක උපදින ඇස, ඇහිපිල්ලම් ගැසීම තරම් සුළු කාලයක දී බොහෝ වාර ගණනක් ඇති වී නැති වී යා හැකි යි. ඒ ඇස මිය ගොස් වෙන ඇසක් උපදී. ඒ රූපය මිය ගොස් වෙන රූපයක් උපදියි. ඒ සිත (විඤ්ඤාණය) මිය ගොස් වෙන සිතක් උපදියි. මෙසේ එක මොහොතක දී ඉන්ද්‍රිය ගණනාවක්, අරමුණු ගණනාවක්, විඤ්ඤාණ ගණනාවක් ඉපිද නැතිව යන ආකාරය දැක ගැනීම ය, අවශ්‍ය.

21. එසේ දකින අනිත්‍යතාව මාංශමය ඇසේ දැකිය හැකි අනිත්‍යතාවට වඩා ඉතා වේගවත් වූවකි; ඉතා සියුම් එකකි. එසේ අනිත්‍යතාව නො දැක ඇස අනිත්‍යයි, විපරිණාමියි, අඤ්ඤථභාවී යැයි කෙතෙක් වෙලා මුමුණමින් සිටිතත් ඇසේ හෝ රූපයේ හෝ විඤ්ඤාණයේ හෝ අනිත්‍යතාව දැක්මක් සිදු නො වන්නේ ය.

22. එනිසා, දහම් මඟට පැමිණීමට නම්, පුහුදුන් බව ඉක්මවා යාමට නම්, ආර්ය මාර්ගයට අවතීර්ණ වීමට නම්, දැකිය යුත්තේ මෙලෙස ස්කන්ධ සිතක හටගන්නා ඉන්ද්‍රිය ආරම්මණ ආදියේ අනිත්‍යතාවයි9.

23. මේ ඇති වීම් නැති වීම් ක්‍රියාවලිය භෞතික ලෝකයේ අපට පෙනෙන ඇති වීම් නැති වීම් ක්‍රියාවලියට වඩා සිය දහස් වරක් වේගවත් බව මැනැවින් පෙනේ. එතරම් වේගයෙන් සිදුවන වෙනස් වීම් ඇති සංස්කාර කෙසේ නම් නො නැසී තබා ගන්න ද? වෙන් කර ගන්න ද? රැක ගන්න ද? එය

බැරි නම් ඒවා මගේ වන්නේ කෙසේ ද? ඒවායේ 'මම' යයි අයිතිකාරයෙක් පැණවෙන්නේ කෙසේ ද? මෙසේ තේරුම් ගන්නා විට, 'මගේ' යන්න ද, 'මම' යන්න ද හුදෙක් ව්‍යවහාර විනා ඒවායින් සත්‍යය නො කියැවෙන බව පිළිගත හැකි යි.

24. දහම තේරුම් ගැනීමට නම් ව්‍යවහාරයත්, සත්‍යයත් අතර වෙනස අප වටහා ගෙන සිටිය යුතු යි10. ව්‍යවහාරය අනුව අපි දේවල් 'මගේ' යයි වෙන් කර ගනිමු. 'මම' යයි පුද්ගලයන් අන් අයගෙන් වෙන් කර ගනිමු.

25. 'මගේ' යැයි, 'මම' යැයි වෙන් කර ගත්තත් නැතත් ඇති වීම් නැති වීම් ක්‍රියාවලිය ස්වාභාවිකව සිදු වෙයි. ඒ නිසා එසේ වෙනස් වන දේ කෙරෙහි මගේ ආධිපත්‍යය පැවැත්වීමට නුපුළුවන. මේ අනුව බලන කල 'මගේ' යැයි සිතන දේ ඇත්තට ම නම් මගේ නො වේ. මෙසේ කිසිවක් කෙරෙහි තම ආධිපත්‍යය පැවැත්වීමට නො හැකි වීමේ ස්වභාවයට 'අනාත්මතාව' යැයි දහමෙහි කියනු ලැබේ.

26. අනිත්‍ය වූ ද, අනාත්ම වූ ද සංස්කාර 'මගේ' යැයි වෙන් කර ගන්නට, තබා ගන්නට, ආරක්ෂා කර ගන්නට දැඩි වෙහෙසක් දැරුවත් එය ඉටු නො වන විට ඇති වන්නේ අසන්තුෂ්ටියකි; අතෘප්තතාවකි; අසහනයට පත් වීමකි. එසේ අසහනයට පත් වීම බුදුදහමෙහි ව්‍යවහාර වන්නේ 'දුක්ඛ' යනුවෙනි. නිරන්තරයෙන් පංච උපාදානස්කන්ධ සිත් ඇති වන නිසා මේ 'දුක්ඛ' ය ද නිරන්තරයෙන් අත් දැකීමට සිදු වේ. ලොව දුකෙහි පිහිටියේ යැයි බුදුදහම ප්‍රකාශ කරන්නේ එහෙයිනි.

27. මෙසේ, කරන්නට බැරි දෙයක් කිරීමට ගොස් ඉච්ඡාභංගයට පත් වීම දුකට හේතුවයි. 'මගේ' කර ගන්නට බැරි දේ මගේ කර ගන්නට වෙහෙසී අසාර්ථකත්වයට පත්වීම යි. එයින් අසහනය උද්ගත වීම යි. එය යි දුක.

28. කරන්නට බැරි දෙයක් කිරීමට මිනිසා වෙහෙසෙන්නේ ඇයි? එය කරන්නට බැරි දෙයක් බව නො දන්නා නිසයි. නැතහොත් යම් යම් වැටහීමක් ඇතත් ඒ බව නො සලකා හැරීම නිසයි.

මෙය පුද්ගලයාගේ අවිද්‍යාවයි. අවිද්‍යාව නිසා තණ්හාව ඇති වේ. තණ්හාව යනු ඇලීම හා ගැටීම යි.

29. එනිසා අවිද්‍යාවත්, තණ්හාවත් නැති වීම විමුක්තියයි. නිවන් දැකීම යනු ඒ තත්ත්වයට පත්වීමයි. ඒ විමුක්තිය ලෙහෙසියෙන් හෝ ශීඝ්‍රයෙන් ලබා ගත හැක්කක් නො වේ.

30. මුළාවට පත්වීම නිසා දීර්ඝ කාලයක් තිස්සේ පුරුදු වී සිටි පුරුද්දක් එක වර අතහැරීමට නුපුළුවන. කරුණු තේරුම් ගත් පසුව වුව ද ඒ සඳහා දීර්ඝ කාලීන වූ ද ක්‍රමානුකූල වූ ද පිළිවෙතක් අවශ්‍ය ය11. තණ්හාවත්, අවිද්‍යාවත් නැති කිරීම සඳහා බුදුදහම ඉදිරිපත් කරන ඒ වැඩ පිළිවෙළ ත්‍රිශික්ෂාව නමින් හෝ ආර්ය අෂ්ටාංගික මාර්ගය නමින් හැඳින්වේ12.

31. මේ පිළිවෙතෙහි හෙවත් විමුක්තිය සඳහා වන ක්‍රියා මාර්ගයෙහි පළමුවෙන් අවධානය යොමු කරන්නේ බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ය. එහි දී වචනයත්, කායික ක්‍රියාත් නිවැරදි කර ගැනීම අපේක්ෂා කරනු ලැබේ.

32. භාෂාව යහපත් ලෙස භාවිතා කිරීමෙන් වචනය සකසා ගැනීම සිදු වේ. බොරුව, කේළම, එරුස වචනය, ප්‍රලාපය බැහැර ලා, ඒ වෙනුවට සත්‍ය වචන, සමගි කරවන වචන, සිත් සනසන වචන හා අර්ථවත් වචන භාවිතය මඟින් වාග් සංවරය සකස් වෙයි. කායිකව කෙරෙන නුසුදුසු ක්‍රියාවන් වන ඝාතනය, සොරකම, වැරදි කාම සේවනය හා වැරදි ජීවන ක්‍රමය අතහැර දමා යහපත් ජීවන ක්‍රමයකට හැඩ ගැසීමෙන් කායික සංවරය සැකසේ. මෙසේ වාචසිකව හා කායිකව ලබන සංවරයෙන් සීල ශික්ෂාව සපුරා ගැනීම සිදු වේ.

33. ඉන්පසු අවශ්‍ය මානසික සංස්කරණය යි. එය සපුරා ගැනීම ඉතා අපහසු කාර්යයකි. එනිසා එය එකවර කළ නො හැකි ය. පියවර දෙකක් ඒ සඳහා අනුගමනය කරනු ලැබේ. පළමු පියවරේ දී සිත තාවකාලිකව පිරිසිදු කර ගැනීම සිදු වේ. දෙවන පියවරේ දී සිත සම්පූර්ණයෙන් පිරිසිදු වෙයි.

34. සිත බොහෝ සෙයින් විසිරී පවතින්නකි. සිත විසිරී ඇත්තේ කෙලෙස් නිසා ය. සිත එක්තැන් කර ගැනීමෙන් තාවකාලික ව පිරිසිදු කර ගත හැකි ය. සිත කෙලෙසන ප්‍රධාන කෙලෙස් පහක් පංච නීවරණ නමින් හැඳින්වෙයි. පංච නීවරණ තාවකාලික ව යටපත් කළ හැකි ය. එවිට විසිරුණු සිත ඒකාග්‍රතාවට පත් වේ. ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය සමථ භාවනාව නමින් හැඳින් වේ. සමථ භාවනාව සඳහා කිසියම් අරමුණක් ගෙන එය මෙනෙහි කළ යුතු ය. එසේ ගත හැකි අරමුණු 40ක් නම් වශයෙන් දක්වා තිබේ.

35. සිත එකඟ කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි හොඳ ම භාවනා ක්‍රමය ආශ්වාස - ප්‍රශ්වාස පිළිබඳ ආනාපානසති නමින් හැඳින්වෙන භාවනාවයි. මෙහි දී අරමුණු වශයෙන් ගැනෙන්නේ පුද්ගලයා උපන් දා සිට මිය යන තෙක් ම ඔහු හා බැඳුනු හුස්ම යි. එය කාමයෙන් කෙලෙසින් තොර අරමුණක් ද වෙයි. අරමුණු කර ගැනීම ද ඉතා පහසු ය. එනිසා එය හොඳ ම අරමුණ වුණත් වෙනත් අරමුණක් ද ගත හැකි ය. ඒ සඳහා මෛත්‍රී සහගත සිතිවිල්ල, කය ගැන සිතීම, තෙරුවන අරමුණු කිරීම ආදී අරමුණක් සුදුසු ය.

36. සමථ භාවනාව මඟින් සිත සමාධිමත් වූ පසු සිත තුළ සැඟවී තිබෙන කෙලෙස් දැක ගැනීම පහසු ය. එනිසා ඒ කෙලෙස් දෙස බලා ඒවා සදහට ම අවසන් කර ගැනීමේ භාවනා මාර්ගයට පිවිසිය හැකි ය. විදර්ශනා භාවනාව නමින් හැඳින් වෙන්නේ එයයි.

37. කෙලෙස් සපුරා නැති කිරීම සඳහා අවශ්‍ය වන්නේ පංචුපාදානස්කන්ධයේ ත්‍රිලක්ෂණය ද, ප්‍රතීත්‍යසමුත්පන්නතාව ද වටහා ගැනීම ය. රූප, වේදනා, සංඥා, සංඛාර හා විඤ්ඤාණ යන උපාදානස්ඛන්ධයන්ගේ උපත සහ නිරුද්ධ වීම දකිමින් සංස්කාරයන්ගේ අනිත්‍යතාව පිළිබඳව අවබෝධය ලබා ගත හැකි යි. ඒ අනිත්‍යතාව ස්වාභාවික ක්‍රියා මාලාවක් වශයෙන් සිදු වන්නක් විනා කාගේ වත් සහභාගිත්වයකින් සිදු නො වන්නක් බව ද, එනිසා ම ඒ ක්‍රියා මාර්ගය වෙනස්

කොට සංස්කාර තමන්ට කැමති පරිදි තබා ගැනීමට, රැක ගැනීමට හෝ තමාගේ කර ගැනීමට නුපුළුවන් බව ද මෙහි දී පෙනෙන්නට පටන් ගනී. කිසිදු සංස්කාරයක්, මේ නිසා තමන්ගේ කැමැත්ත පරිදි පවත්වා ගෙන යාම නුපුළුවන් බවත් ඒ නිසා ම ඒවා කෙරෙහි තමන්ගේ ආධිපත්‍යය පැවැත්විය නොහෙන බවත් පිළිගන්නට සිදු වේ. එසේ නම් සංස්කාර කිසිවක් 'මගේ' නො වන බව පැහැදිලි වේ. මෙසේ ස්කන්ධ 'මගේ' නො වන බවත්, මගේ නො වන ස්කන්ධයන්ගේ හිමිකරුවා 'මම' යනුවෙන් හැඳින්විය හැකි කිසිවකු නො විය හැකි බව ද ප්‍රකට වෙයි. "නේතං මම, නේත්සෝ හමස්මි" යි දහමෙහි දැක්වෙන්නේ ඒ තත්ත්වය යි. එනිසා අනාත්ම ද වේ යන්න වැටහෙයි. මන්ද? අනිකුත් ආගමිකයන් ආත්ම යන්නෙන් හැඳින්වූයේ ස්ථිර වූ ද, නො වෙනස් වූ ද, දිගින් දිගට අඛණ්ඩව පවතින්නා වූ ද යමක් හෙයිනි. එවැන්නක් සංස්කාරයන්හි දක්නට නො ලැබේ.

38. පංචුපාදානස්කන්ධයන්ගේ හටගැනීම පෙනෙන විට එසේ සිදු වන්නේ හේතු ප්‍රත්‍යයන් නිසා බව අවබෝධ වේ. 'දැකීම' සිදු වන්නේ රූපය ද ඇස ද විඤ්ඤාණය ද යන තුන හටගැනීම නිසා බව පෙනෙන විට මේ හේතු - ප්‍රත්‍ය - ඵල සබඳතාව ප්‍රකට වේ. ප්‍රතීත්‍යසමුප්පාද න්‍යාය යනු එය යි.

39. මේ ස්කන්ධයන් අල්ලා ගෙන තිබෙන කෙලෙස් බැමි දහයකි. සංයෝජන නමින් දන්නා ඒවා නම් වශයෙන් - සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූපරාග, අරූප රාග, මාන, උද්ධච්ච හා අවිජ්ජා ය13. පුද්ගලයා භවයට බැඳ තබන මේවා භව බැමි ය; සංයෝජන යනු ඒ තේරුම සහිත වචනයකි.

40. මේ බැමි බිඳ දැමීම විමුක්තිය ලැබීම සඳහා අත්‍යවශ්‍ය ය. ඒ කෙලෙස් බැමි එකවර ඉවත් නො වේ. ක්‍රමානුකූල මාර්ගයක් ඒ සඳහා අනුගමනය කිරීමට සිදු වේ. විදර්ශනය ඒ සඳහා මඟ යි. ඒ මඟ යන විට පළමුව සංයෝජන තුනක් ප්‍රහීණ වේ14. එනම් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා හා සීලබ්බත පරාමාසය යි.

එවිට ශ්‍රාවකයා සෝතාපන්න යැයි කියනු ලැබේ. එහි තේරුම ස්ථිර ලෙස ම විමුක්ති මාර්ගයට හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස සිටීම යි. ක්‍රමානුකූල මාර්ගයක් වන එහි ඉදිරියට ගමන් කරන විට කාමරාගය හා පටිඝය යන සංයෝජන දෙක තුනී වෙයි. එවිට ශ්‍රාවකයා සකදාගාමී නම් වේ. තව ඉදිරියට යාමේ දී ඒ සංයෝජන දෙක සපුරා ප්‍රහීණ වේ. එවිට ශ්‍රාවකයා අනාගාමී නම ලබයි. ඉතිරි සංයෝජන පහ ම ප්‍රහීණ වන්නේ සතර වන මාර්ග ඵලය වන අර්හත්වයේ දී ය. අර්හත්වයත් සමඟ සියලු කෙලෙස් ඉවත් වී සිත පූර්ණ වශයෙන් පිරිසිදු බවට පත්වීමෙන් විමුක්ති ප්‍රතිලාභය සිදු වේ. බුදුදහමෙන් පෙන්වා දෙන විමුක්තිය එය යි.

## සටහන්

1. දීනි. 3, 304, මහා සුදස්සන සූත්‍රය

   පෙර විසූ මහා සුදස්සන සක්විති රජු අප්‍රමාණ යස ඉසුරු, නගර, ධනය, මාලිගා, ඇත් අස් රථවාහන, ස්ත්‍රීන්, දරුවන් - මේ ඈ කාම වස්තූන් අයිති කරගෙන පුදුම විධියේ සැපවත් ජීවිතයක් දීර්ඝ කාලයක් ගත කළ නමුත් අවසානයේ සියල්ල අතහැර මරණයට පත් වූ බවත් විස්තර කර ඒ සියල්ල සංස්කාර වශයෙන් හඳුන්වා දී තිබේ.

   (ii) O.H. de A. Wijesekara, The Three Signata, B.P.S., Kandy, p.2.

2. එතැන්හි ම,

   සංස්කාරයන්ගෙන් මුළුමනින් මිදීමට සුදුසු යැයි මේ ගාථාව වදාරා ඇතඃ-

   අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ

   උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූපසමෝ සුඛෝ

3. සනි. 1, 244

   හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති

4. පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමි, පටිච්චසමුප්පාද ධර්මය, පළමු වෙළුම, 126 පිටුව

   පටිච්ච - නිසා; සමුප්පාද - හටගැනීම

5. සනි. 3, 442-448, ඔක්කන්ති සංයුක්තය

6. සනි. 3, 84, ඛන්ධ සූත්‍රය

ස්කන්ධ, සාසව, උපාදානීය වීමෙන් උපාදානස්කන්ධ වේ.

7. සනි. 3, 442, චක්ඛු සූත්‍රය

8. මනි. 1, 276, මධුපිණ්ඩික සූත්‍රය

චක්ඛුංචාවුසෝ පටිච්ච රූපේසු උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සංගති

ඵස්සෝ. ඵස්ස පච්චයා වේදනා ...

9. සනි. 3, 442 - 448, ඔක්කන්ති සංයුක්තය

මෙහි අනිත්‍යය දැකිය යුතු ස්ථාන 59ක් නම් කර ඇත.

1. ඉන්ද්‍රිය 6, 2. ආරම්මණ 6, 3. විඤ්ඤාණ 6, 4. ඵස්ස 6, 5. වේදනා 6,

6. සංඥා 6, 7. සංචේතනා 6, 8. තණ්හා 6, 9. ධාතු 6, 10. ස්කන්ධ 5 යනුවෙනි.

10. සත්‍යය හා ව්‍යවහාරය අතර වෙනස සඳහා බලන්න

කර්තෘගේ දහම් ඇස 5, 2004, 2 වන සාකච්ඡාව

11. අනි. 3, 348, ගිහි සූත්‍රය

අනුපුබ්බේන නිබ්බානං අධිගච්ඡන්ති පණ්ඩිතා

12. සනි. 5(2), 70, ධම්මචක්කප්පවත්තන සූත්‍රය

13. අනි. 6, 32, සංයෝජන සූත්‍රය

14. සුනි. ගා. 233, රතන සූත්‍රය ඃ සභාවස්ස දස්සන සම්පදාය ගාථාව

# මාගම යටාලතිස් වෙහෙරේ වැඩ සිටින දළදා වහන්සේ

# 11

**ආචාර්ය ගාමිණී කාරියවසම්**

නන්වන් කුසුම් සුවඳ ගෙනැ බුදු මුවින් දේශිත සියලු සූත්‍ර ධර්ම දේශනා අසූහාර දහසක් ශ්‍රී ධර්මස්කන්ධය ස්පර්ශිත සතර දළදාවන් අතරින් දළදා වහන්සේ නමක් ම මේ දිවයිනෙහි වැඩ වසන බව පුරාවිද්‍යා සාක්ෂි මඟින් තහවුරු වේ. බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙහි වූ රදනක චතුර් දන්තයන් පාලි බසින් හැඳින්වෙන්නේ "දාඨා" යනුවෙනි. බුදුන් වහන්සේගේ සෙසු දන්තයන්ට වඩා සුදු පැහැ දීප්තියෙන් බබළන සතර දළදා වහන්සේගේ ප්‍රභාශ්වරය "දාඨා ප්‍රභා" ලෙසින් පාලි සාහිත්‍යයෙහි වර්ණිත ය.

ක්‍රි.ව 310 වැන්නේ කිත්සිරි මෙවන් රජුගේ 9 වන රාජ්‍ය වර්ෂයේ දී බුදුන් වහන්සේගේ යටි වම් දළදාව කාලිංග දේශයේ සිට ශ්‍රී ලංකාවට වැඩම වීමත් සමඟ මෙරට ජන ජීවිතයේ ඇති වූයේ අසිරිමත් යුග පෙරළියකි. ඒ සමඟ ම නිතැතින් ම දළදා සමිඳුන් රාජ්‍යත්වයේ සංකේතය බවට පත් වේ.

දේශයේ දේශපාලනික, සාමාජයීය හා සංස්කෘතික සමෘද්ධිය උදෙසා දළදා සමිඳුන්ගේ සුසම්ප්‍රාප්තිය තරම් බලපෑ වෙනත් කිසිදු සාධකයක් මිහිපිට නොමැති බැව් විද්වත් මතයයි. දළදා වංශය, දළදා පූජාවලිය, ධාතු වංශය, දළදා සිරිත ආදී කොට දළදා සමිඳු අගයන්නට සුවිශේෂී දළදා සාහිත්‍යයකින් සිංහල සාහිත්‍ය වංශයට ලබා දෙන්නේ නොමද ප්‍රභාශ්වරයකි. මුළු මහත් රටටත් විශේෂයෙන් ම කන්ද උඩරට ප්‍රදේශයටත් දළදා සමිඳුන්ගේ ආශිර්වාදයෙන් ඉමහත් සෙතක් ශාන්තියක් සැලසේ.

මෙවැනි ම අති උතුම් දන්ත ධාතූන් වහන්සේ නමක් ඓතිහාසික රෝහණ දේශයේ මාගම් දනව්වේ ද ජීවමානිතව වැඩ හිඳිනා පුවත මුළු මහත් ජාතියේ ම අවධානය යොමු කිරීම අතිශයන් වැදගත් වේ. පුරාවිද්‍යාඥයන් කිහිප දෙනකු විසින් වසර ගණනාවකට ඉහත ශිලාලේඛන සහ ශාස්ත්‍රීය සාධක අධ්‍යයනයෙන් පසුව, බුදුන් වහන්සේගේ උඩු වම් දළදා සමිඳුන් මාගම් දනව්වේ යටාලතිස්ස චෛත්‍යයේ නිදන් කර ඇති බවට කරුණු හෙළිදරව් කරනු ලැබිණි. එනමුත් අද දක්වා එම හෙළිදරව්ව නිසි පරිදි ජනගත වී නොමැති සෙයක් හැඟෙයි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ශ්‍රී දේහය ආදාහනය කරනු ලැබූ අවස්ථාවේ සර්වඥ ධාතූන් විභේදනය වූ අයුරු ධාතු වංශයෙහි සවිස්තරව දැක්වේ. එහි ලලාට, දෙඅකු සහ සතර දළදා යන ධාතු සප්තමය විසිරී නොගොස් ඒකරාශීව පැවති බව සඳහනි. දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයෙහි, ආදාහනයෙන් පසුව සම සතළිස් දන්ත ධාතූන් ද, කේෂ හා ලෝම ධාතූන් ද දේව සමූහයා රැගෙන ගිය බව සවිස්තරව දක්වා ඇත.

ශේෂ වූ සතර දළදා බෙදී ගිය ආකාරය මහා පරිනිබ්බාන සූත්‍රයහි මැනවින් පැහැදිලි කෙරේ. සතර දළදාවන් අනුපිළිවෙලින් දෙවියන් විසින් දෙව්ලොවට ද, ගන්ධාර පුරයට ද, කළිඟු රටට හා නාලොවටද ගෙන යන ලද බව එම සූත්‍රයේ පැහැදිලිව ම දක්වා ඇත. චිතකයේ ගිනි නිවෙන්නට ද පෙර ඛේම මහ රහතන් වහන්සේ යටි වම් දළදාව කාලිංග දේශයට රැගෙන ගියේ ය. එම දළදා වහන්සේ දන්ත හේමමාලා යුවළ විසින් 5 වන සියවසේ කිත්සිරිමෙවන් රජ දවස මෙරටට වැඩමවන ලදී. වර්තමානයේ කන්ද උඩරට දළදා මාලිගයෙහි වැඩ වසන්නේ එම දන්ත ධාතූන් වහන්සේ ය. කාවන්තිස්ස රජ දවස ගිරි අභය කුමරු විසින් කරවන ලද සෝමාවතී දාගැබෙහි දකුණු දළදාව තැන්පත් කළ බව ධාතුවංශ කතුවරයා ගෙන හැර දක්වයි.

කාවන්තිස්ස රජ සමයෙහි මහාදේව මහ තෙරුන්ගේ ශිෂ්‍යයකු වූ මහින්ද රහත් තෙරණුන් නාග භවනයට වැඩ දකුණු දළදාව මෙරටට වැඩමවන ලද බව ධාතු වංශයෙහි වැඩි දුරටත් සඳහන් වෙයි. එනමුත් මෙම දකුණු දළදාව නාග ලෝකයෙන් නොව ඉන්දියාවේ නාග්පූර්

දේශයෙන් වැඩමවන ලද බවට මේ වන විට ඓතිහාසික තොරතුරු ඉදිරිපත් වෙයි. නාග්පූර් ආසන්නයේ මහාරාෂ්ඨ ප්‍රාන්තයේ පවුනි නම් දනව්වකි. එහි හින්දු කෝවිලක් ඉදිව පැවැති ගොඩැල්ලක් ආශ්‍රිතව ධර්මාශෝක අධිරාජ්‍යයා කළ චෛත්‍යක නටබුන් හමු වූ බව වාර්තා වේ. එවකට මෙම වෙහෙර හඳුන්වා ඇත්තේ ජගත් නාථ නමිනි. ජගත් නාථ යනු බුදුන් වහන්සේ උදෙසා ව්‍යවහාරිත අන්වර්ත නාමයකි.

ඉන්දීය පුරාවිද්‍යා භාරකාර සුරේෂ් ප්‍රේමචන්ද්‍ර මහතා මෙම පුවත අදාළ සාක්ෂි හුවා දක්වමින් තහවුරු කර ඇත. ඔහු දක්වන පරිදි ඔහුගේ පරපුරේ මීමුත්තකුට මෙම නටබුන් පිරික්සීමේ දී තඹ සන්නසක් හමු විය. බුදුන් වහන්සේගේ දකුණු දළදාව එම වෙහෙරේ තැන්පත් කර තිබූ බව එම තඹ සන්නසෙහි සඳහන්ව තිබූ බව ද පැවසේ.

සෝමාවති රජ මහා විහාරාධිපති ආචාර්ය පහමුණේ ශ්‍රී සුමංගල හිමිපාණන් නාග්පූර්හි පිහිටි මෙම පුරාවිද්‍යා නටබුන් පරීක්ෂා කර බැලීමට ගොස් ඉහත පුවත සනාථ කර ඇති බව ද මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මෙම ප්‍රදේශයේ බෞද්ධයන් හා හින්දූන් අතර වාර්ගික ගැටුම් ඇති වූ අවස්ථාවේ අදින් වසර 2200 කට පෙර මෙහි තැන්පත්ව තිබූ දකුණු දළදා සමිඳුන් ආරක්ෂිතව ලංකාවට වැඩමවන ලදි.

මීළඟට අප අවධානය යොමු වන්නේ මාගම ජීවමානිතව වැඩවසන තෙවන දළදා වහන්සේ පිළිබඳව ය.

දේවානම්පියතිස්ස සොහොයුරු මහානාග යුව රජුගේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී සිදු වූ රුහුණු සම්ප්‍රාප්තිය දැක්වෙන මහාවංස විස්තරයේ දී, යට්ඨාලය නම් ස්ථානයේ දී ඔහුගේ බිසව පුත් කුමරකු ජනිත කළ බව සඳහන්ව ඇත. මේ නිසා එම පුත් කුමරාට යටාලතිස්ස යන නාමය තබන ලදි.

1966 වසරේ දී එවකට සිටි පුරාවිද්‍යා කොමසාරිස් සී.ආර්. ගොඩකුඹුර මහතා ශිලාලේඛන සංග්‍රහයෙහි (1966 Vol. V) මෙම දළදා වහන්සේ පිළිබඳව සෙල්ලිපියකින් අනාවරණය වූ තොරතුරු වාර්තා කර ඇත. මාගම්පත්තුව ආශ්‍රිත කිරින්දේ රණකෙළිය නම් ස්ථානයේ කරන ලද පුරාවිද්‍යා කැණීම්වල දී මතු කර ගත් සුවිශේෂී

ශිලාලේඛනයක් පිළිබඳව මෙහි තොරතුරු වාර්තා වේ. දාගැබක් ඇතුළු නටබුන් රාශියක් මධ්‍යයෙන් මතු කර ගත් මෙම සෙල්ලිපිය තිස්ස ස්ථූපයෙහි (යටාලතිස්ස ස්ථූපය පූර්ව අතීතයේ තිස්ස ස්ථූපය ලෙසින් හඳුන්වනු ලැබිණි.) කාවන්තිස්ස රජු විසින් තවත් දළදා වහන්සේ නමක් නිදන් ගත කර ඇති බව සනාථ කරවයි. පසු කාලයේ දී මෙම සෙල්ලිපිය මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා විසින් වඩාත් නිවැරදිව පරිවර්තනය කරනු ලැබී ය.

"ඇපා මිහිඳු විසින් ගෞතම දසබලධාරින්ගේ (උඩු හක්කේ) වම් දළදාව වසා මහා ස්ථූපයක් කළේ පෙර (කප්හි) කකුසඳ, කෝනාගම, කාශ්‍යප යන බුදුවරුන්ගේ ධාතු නිධන් කොට පැවති ස්ථානයෙහි ම බව ය. මෙම සෙල්ලිපියෙහි අවසන් පේළියෙන් පැහැදිලිව ගම්‍ය වන්නේ කකුසඳ, කෝනාගම, කාශ්‍යප යන තුන් බුදුන් වහන්සේලාගේ දළදාවන් ද පූර්ව යුගයන්හි දී මෙහි නිදන් කර ඇති බව ය. ලළාට ධාතු වංශය කෘතියෙන් ද (පිටුව 59) මෙම පුවත තහවුරු කෙරේ. මෙහි සඳහන් තිසරම් වෙහෙර වර්තමානයේ ජනතාවගේ පොදු පිළිගැනීම බවට පත්ව ඇති වත්මන් තිස්සමහාරාම විහාරය නොවන බවත්, ක්‍රිස්තු පූර්ව යුගවල වත්මන් තිස්ස මහ වෙහෙර නොහොත් දළදා සෑය වශයෙන් ව්‍යවහාරිකව පැවතියේ වත්මන් යටාල තිස්ස වෙහෙර බව ද පැහැදිලි වේ. මෙම ටැම් ලිපිය වර්තමානයේ කතරගම පුරාවිද්‍යා කෞතුකාග ාරයෙහි ප්‍රදර්ශනය කෙරේ. මහාචාර්ය රාජ් සෝමදේව මහතා විසින් මෙම සංසිද්ධිය පිළිබඳව පුළුල් ශාස්ත්‍රීය ගවේෂණයක් සිදු කර ඇති බව ද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

වර්තමානයේ තිස්ස මහා විහාරය අතීතයේ හඳුන්වා ඇත්තේ නාගමහා විහාරය යන නමින් බව 1883 වසරේ දී ප්‍රකාශිත එඩ්වඩ් මුලර්ගේ Ancient Inscriptions Of Ceylon නම් කෘතියෙහි සදහනි. තිස්සමහාරාම සෑමළුවේ කළ පුරාවිද්‍යා කැණීමක දී හමු වූ අභිලේඛනයකින් එය තහවුරු වන බව ද මුලර් මහතා සිය කෘතියෙහි සඳහන් කරයි.

එම ශිලා ලේඛනය සහිත ගල් පුවරුව එම දාගැබ සංරක්ෂණය කරන ලද අවස්ථාවේ දී දාගැබ ඇතුළට දමා වසා ඇති බව පරණවිතාන ශූරීන් 'ලංකාවේ ස්තූප' ග්‍රන්ථයෙහි අවධාරණය කර ඇත. එමගින්

ද සනාථ වන්නේ වර්තමාන තිස්සමහාරාම විහාරය, පැරණි නාග මහා විහාරය ලෙස හැඳින්වූ බව ය. වර්තමාන තිස්සමහාරාම විහාරය පැරණි නාග මහා විහාරය ලෙසින් හඳුනාගන්නේ නම් රුහුණේ තිබූ තිස්සමහාරාමය කුමක් ද යන ප්‍රශ්නය මතු වේ. එයට දිය හැකි නිවැරදි ම පිළිතුර නම් පැරණි තිස්සමහාරාම විහාරය වූ කලී වර්තමානයේ යටාල විහාරය ලෙස වරදවා හඳුන්වන විහාරය බවයි.

දළදා සමිඳුන් ජීවමානව නිශ්චිත වශයෙන් වැඩ හිඳිනා දළදා දාගැබක් පිළිබඳ ශිලාලේඛනයක් අපට මීළඟට දෘශ්‍යමාන වනුයේ තිස්ස යටාලතිස්ස විහාර භූමියෙනි.

තත් සෙල්ලිපියෙහි අරුත මෙසේ ගලපා දැක්විය හැකි යː-

“යහපතක්ම වේවා (මම) ජේතවන අග්‍ර විහාරයේ නියාම ජ්‍යෙෂ්ඨ නාගදාඨා වෙමි. අභය ශිලා මේඝවර්ණ රජුගේ (අභිෂේකයෙන්) තුන්වන (වර්ෂයේ) වෙසක් (මස) පුර (පක්ෂයේ) දසවන දින දළදා දාගැබ(ට) ඡත්‍රයක් පූජා කෙරිණි. උතුම් පූජාවක් සේ පවත්නා පරිදි දානගම් කරවූ (මම) නැටුව්පිටියෙහි නාගදාඨ නායක වෙමි.” දළදා දාගැබට ඡත්‍රයක් පූජා කළ පුවතක් මෙම සෙල් ලිපියෙන් ප්‍රකාශිත ය.

1986 වසරේ දී නටඹුන්ව පැවැති යටාලතිස්ස සෑමළුවේ පුරාවිද්‍යා කැණීම් කිරීමේ දී සෑමළුවේ දකුණු කොටසේ තිබී ග්‍රැනයිට් ගල් පුවරුවක කොටන ලද ඉහත දැක්වූ ශිලාලේඛනය මතු විය. මේ වන විට මෙම ශිලාලේඛනය යටාල දාගැබට යාබදව පිහිටි කෞතුකාගාරයේ ප්‍රධාන දොරටුව දකුණු පස එළිමහනේ පුරාවිද්‍යාර්ථීන්ගේ නිරීක්ෂණය සඳහා තැන්පත් කර ඇත. වත්මන් යටාලතිස්ස වෙහෙර අතීතයේ දි දළදා වහන්සේ නිදන්ගතව පැවති බැවින් දළදා දාගැබ යනුවෙන් ව්‍යවහාරිත බව තත් ටැම් සෙල්ලිපියෙන් මැනවින් ස්ඵුට වේ. මාගම රාජධානිය තුළ ඉදි කරන ලද ප්‍රථම දාගැබ ලෙස සැලකෙන යටාලතිස්ස චෛත්‍ය නිර්මාණය කරන ලද්දේ මහානාග නිරිඳුන් විසිනි. එතුමන් යටාලතිස්ස වෙහෙර ත්‍රිපිටකාරිට්ඨ නම් මහ රහතුන් වහන්සේ වෙත අත්පැන් වත්කර පූජා කළ බව ලලාට ධාතුවංශ කතුවරයා සඳහන් කරයි.

යටාලතිස්ස වෙහෙරෙහි නිදන් කිරීම පිණිස උඩු වම් දළදාව මාගම වෙත සම්ප්‍රාප්ත වීම පිළිබඳව මෙ හිදී විමසා බැලීම වැදගති.

ගන්ධාර දේශය වෙත හූන මුස්ලිම් ආක්‍රමණ එල්ල වූ අවස්ථාවල එහි ගොස් සිටි වන්දනාකරුවන් විසින් එරට චෛතිය වනයේ තැන්පත් කර තිබූ වම් දළදාව ඇතුළු පූජනීය බෞද්ධ පූජා වස්තු මෙරට භක්තිමත් රජ දරුවන් වෙත ගෙනැවිත් භාර දෙන්නට ඇතැයි අනුමාන කිරීමට අවකාශයක් පවතී.

ඉන්දීය හිසියං හා පාහියන් හිමිවරුන් ගන්ධාර දේශයේ සංචාරයේ දී තමනට දන්ත ධාතුන් වැඳ පුදා ගැනීමට අවස්ථාව සැලසුනු බවට කරන සඳහන ද මෙහි දී අපගේ අවධානයට ගැනීම වැදගත් වේ.

විද්වත් කතිකාවක් ඇති කොට, යටාල තිස්ස දාගැබේ බුදුන් වහන්සේගේ උඩු වම් දළදා සමිඳුන් තැන්පත් කර ඇති බව පොදු ජනතා සිත්සතන්හි තහවුරු කිරීමට වැඩපිළිවෙලක් යෙදීම කාලීන යුග අවශ්‍යතාවයකි.

ඈත අතීතයේ සිට ම රාජ්‍යත්වය උරුම වුයේ දළදා සමිඳුන්ගේ භාරකාරත්වය හිමි කර ගත් රාජ්‍ය නායකත්වය වෙත ය. මහනුවර දළදා මැඳුරේ තේවාව පවත්වන අයුරින්, යටාලතිස්ස මහා වෙහෙරේ නිතිපතා සාම්ප්‍රදායික තේවාව පැවැත්වීමටත්, පසුව වාර්ෂික දළදා පෙරහරක් පැවැත්වීමේ යෝග්‍යතාවත් කෙරෙහි රාජ්‍ය පාලකයන්ගේ නිසි අවධානය යොමු කිරීම වැදගත් ය. දළදා වහන්සේ කේන්ද්‍ර කොට ගෙන කන්ද උඩරට රාජධානිය ශ්‍රී සමෘද්ධිමත් භාවයට හා අභිමානවත් භාවයට පත් වූ අයුරින් ම, රෝහණ දේශය ද යටාල තිස්ස වෙහෙර වැඩ සිටින දළදා සමිඳුන්ගේ ආශිර්වාදයෙන් ප්‍රමුදිතව මහත් යශෝරාවයට පත් වනු දැක්ම මුළු මහත් ජාතියේ ම දැඩි අපේක්ෂාවයි.

# බුදුහිමි මව්පිය ගුණ පෙන්වත් 12

ආචාර්ය සිරිපාල මාදුවගේ

දරුවන්ට දෙමව්පියනුත් දෙමව්පියන්ට දරුවනුත් තරම් උතුම් අන්‍ය වූ වස්තුවක් නැත්තේ ම ය. මේ පිළිබඳව ඈත කාලයේ සිටි ජන සමාජය අවබෝධ කර ගෙන සිටියහ. සියලු ම ශාස්තෘහු දෙමව්පිය ගුණය හා ඔවුන්ට සැලැකීම ගැන වදාළහ. තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ පමණ මවකගේ පියකුගේ ගුණය පිළිබඳව වදාළ අන් ශාස්තෘවරයෙක් නැති තරම් ය. සමස්ත කාන්තා සමාජයේ ම විශාල වෙනසක් කිරීමේ තුඩු දුන් බුදු සමයේ කාන්තාව මවක, දියණියක, ගෘහනියක, වැන්දඹුවක, සේවිකාවක, උපාසිකාවක ආදී ලෙස වර්ග කරමින් තොරතුරු දක්වන අයුරු පෙනේ. මේ තොරතුරු බලන කල පොදු සමාජය තුළ මවක වන්නා වූ කාන්තාවට ඉතා උසස් තත්ත්වයක් හිමි වන බව පෙනේ. පිය පක්ෂය ගැන ද එසේ ය.

දාරක ප්‍රේමය තරම් සමාන ප්‍රේමයක් ලෝකයේ නොමැත. "නත්ථි පුත්ත සමං පේමං" යනුවෙන් බුදු රජාණන් වහන්සේ වදාළ සේක. සෑම රෝම කූපයක් පාසා ම, ලේ බිඳුවක් පාසා ම, දාරක ස්නේහය ඇත්තේ ය. නන්ද කුමාරයා ද, රාහුල කුමාරයා ද, මහණ කිරීමෙන් පසු සුදොවුන් රජතුමා තුළ හට ගත්තේ අතිමහත් සන්තාපයකි. බුදු හිමියන් වෙත එළඹ සුදොවුන් රජතුමා, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දරුවන් පිළිබඳව මව්පියන් තුළ ඇත්තේ අප්‍රමාණ ස්නේහයකි. දාරක ප්‍රේමය මව්පියන්ගේ ශරීරයේ සිවිය බිඳී ගොස් හමට වදී. හම සිඳී ගෙන ගොස් මසට වදී. මස සිඳී ගෙන ගොස් ඇටවලට වදී. ඇට සිඳී ගෙන ගොස් ඇටමිදුළුවලට වදී" ආදී ලෙසින් සම් මස් ඇට නහර

ඇටමිදුළු ආදී ශරීරයේ සෑම කොටසක් ම සිඳ ගෙන ඇතුළට යන්නේ ය. මේ හේතුවෙන් මාපිය අනුදැන්මෙන් තොරව දරුවන් පැවිදි කිරීම වළක්වන්නැ"යි ඉල්ලා සිටියේ ය. දරුවන් පිළිබඳව දෙමාපියන් තුළ ඇති ස්නේහය, ආදරය, ප්‍රේමය කොතරම් ද යන්න මැනැවින් දත් බුදුරදුහු ඒ ඉල්ලීම පිළිගත්හ. පුතකු විසින් පියකුගේ ඉල්ලීම ගරු කිරීම ද එහි දී පෙන්වා දෙයි.

ඥානවන්ත දරුවන් විසින් දෙමව්පියන් වැඳිය යුතුවා පමණක් නොව ඔවුන්ට ආහාරපාන, වස්ත්‍ර, සයනාසන ආදියෙනුත්, ඇඟ ඉලීම්, නැවීම්, පා දෙවීම් ආදියෙනුත් සත්කාර කළ යුතු යැයි බුදු හිමියෝ වදාළහ.

"අන්නේන අථ පානේන
වත්තේන සයනේන ච
උච්චාදනේ නහා පනේ
පාදානං දෝව නේන ද"1යි සම්බුද්ධ දේශනා විය.

ලෝකයේ හොඳ උතුම් මංගල කරුණු කවරේ දැ යි අසනා දේව පුත්‍රයා හට වදාළ අට තිස් මංගල කරුණු අතර,

"මාතා පිතු උපට්ඨානං ....... ඒතං මංගල මුත්තමං"2යි මව්පිය උපස්ථානය මංගල කරුණක් සේ දක්වා වදාරති.

එපරිද්දෙන් ම යම් දරුවෙක් වයස්ගත දෙමාපියන්ට නොසලකයි නම් එය පිරිහීමේ ලක්ෂණයක් ලෙස,

"යො මාතරං වා පිතරං වා
ජින්නකං ගත යොබ්බනං
පහුසන්තො න භරති

තං පරාභව තො මුඛං"3යි පරාභව සූත්‍රයේ දී වදාළහ. තමන්ට හැකියාව තිබිය දීත් මහලු මව පියා පෝෂණය නොකරන දරුවා වසලයකු ලෙස 'තං ජඤ්ඤා වසලො ඉති' පෙන්වා දෙති.

"යො මාතරං වා පිතරං වා
භානරං භගිනිං සයුං
හන්ති රොසෙති වාචාය

තං ජඤ්ඤා වසලො ඉති"4 යැයි වදාරනුයේ මව්පියන්ට ක්‍රෝධ කරන වෛර කරන බණින දරුවන් තමන්ගෙන් ගැරහුම් ලබන වසලයන් ලෙස ය. බුදු රජාණන් වහන්සේ මේ සියලු ඉගැන්වීම්වලින් පෙන්වා දෙන්නේ මව හා පියා යනු ලෝකයේ සැලකුම් ලැබිය යුතු ඉහළ ම දෙදෙනා බව ය.

සිගාලෝවාද සූත්‍රයේ දී සදිසා නමස්කාරයේ නැගෙනහිර දිසාව ලෙසින් බුදු රජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ මව්පියන් ය. සියලු සචේතනික අචේතනික ලොව පැවැත්මට අවශ්‍ය වන්නා වූ, බලපාන්නා වූ සූර්යයා පායන්නා වූ දිශාව මව්පියන් ලෙස 'මාතා පිතා දිසා පුබ්බා' යැයි දක්වති. සූර්යයා මෙන් දෙමාපියෝ දූපුතුන්ට එළිය දෙති. ඔවුහු දරුවන්ගේ ජීවිත ආලෝකවත් කරති.

සිගාලෝවාද සූත්‍රයේ දී පුතකු විසින්,

(අ) දෙමව්පියන් පෝෂණය කිරීම

(ආ) ඔවුන්ගේ කුදු මහත් සෑම කටයුත්තක් ම කිරීම

(ඇ) ඔවුන්ගේ කුලය හා වංශය ආරක්ෂා කිරීම

(ඈ) තමන් ලැබූ දායාද නිසි ලෙස පරිහරණය කිරීම

(ඉ) මාපිය දෙදෙනා කලුරිය කළ විට පින් පෙත් දීම

යන කරුණු පහෙන් මව්පියෝ උපස්ථාන කරනු ලැබ යුත්තාහ.

පුතකු විසින් කරුණු පහකින් උපස්ථාන කරනු ලබන පෙරදිග නම් මාපියෝ කරුණු පහකින් පුතුට අනුකම්පා කරති.

(අ) පාපයෙන් වළක්වා ලීම

(ආ) යහපතෙහි හික්මවීම

(ඇ) ශිල්ප ඉගැන්වීම

(ඈ) සුදුසු බිරියක පාවා දීම

(ඉ) සුදුසු දායාද පවරා දීම

යන කරුණු පහෙන් මාපියෝ පුතුට සලකති. එසේ කල්හි පුතා ද මාපියන්ට මනාව සලකයි. එසේ වූ පුතුට කිසි බියක් නොපැමිණේ. මව්පියෝ පෙරදිග ලෙසින් සිගාල පුතු හට වදාරමින් වටහා දුන්නේ

මේ ලෝකයේ වැදගත් මුල් තැන හිමි වන්නේ මව්පියන්ට බව ය.

බුදු රජාණන් වහන්සේ "බහුතාරා භික්ඛවේ මාතා පිතරෝ පුත්තානං ආපාදකා පෝසතා ඉමස්ස ලෝකස්ස දස්සේතාර" යනාදී ලෙසින් "මහණෙනි, මව්පියන් දරුවන්ට බොහෝ සේ උපකාර කරත්. මේ ලෝකය දක්වත්. ලෝකය හඳුන්වා දෙත්." යනුවෙන් වදාළහ.

නිමා නොවන ගුණ කඳෙන් යුතු මාපියන්ට දරුවන් කෙසේ කාර්ය භාරයක් තුළින් යම් සෑහීමකට පත් විය හැකි ය. ඒ කාර්ය භාරය ලෙස දුප්පතිකාර සූත්‍රයේ බුදුහිමි,

1. ශ්‍රද්ධාව නැති මාපියන් තුළ ශ්‍රද්ධාව ඇති කිරීම
2. දුස්සීල මව්පියන් ශීලයෙහි පිහිටු වීම
3. මසුරු මව්පියන් පරිත්‍යාගයට හුරු කිරීම
4. ප්‍රඥාව නැති මව්පියන් තුළ ප්‍රඥාව ජනිත කිරීම යන කරුණු සතර දක්වත්.

ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන සම්පත්තියෙහි සිය මාපියන් පිහිටු විය හැකි නම් ඒ දරුවකු විසින් දෙමාපියන්ට උසස් ලෙස ප්‍රත්‍යුපකාර කිරීමෙන් මේ සම්පත් සතර පරලොව සැපතට වඩාත් යෝග්‍ය වේ.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ඒ පිළිබඳව දැක්වෙයි. මව්පියන් පුදන්නා,

1. සත්පුරුෂයන්ගේ ප්‍රශංසාවට ලක් වීම
2. මරණින් පසු සුගති පරායන වීම
3. කරදරවලින් නිදහස් වීම
4. ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වන පංච ධර්ම ළං වීම යන ආනිශංස ලබයි.

බුදු රජාණන් වහන්සේ, "අනුජානාමි භික්ඛවේ මාතා පිතු නං උපට්ඨානං" යනුවෙන් මව්පිය උපස්ථානය භික්ෂූන් වහන්සේට පවා යුතුකමක් සේ දක්වති. යම් මවකට පියකුට සැලකීමට කෙනකු නැත්නම් තමන් වහන්සේ පිණ්ඩපාතයෙන් ලබා ගන්නා දෙයින් දෙමාපියන් රැක බලා ගැනීම කළ යුතු යැයි පෙන්වා දුන්හ. එය මහා පින්කමක් සේ සැලකේ.

"මව්පියන් කෙරෙහි උපාධ්‍යායයන් කෙරෙහි මෙන් පිළිපැදිය යුතු ය. ඉදින් ඔවුහු රාජ්‍යයෙහි පිහිටියාහු නමුදු පුත්‍රයාගෙන් උපස්ථානය බලාපොරොත්තු වේ නම් උපස්ථාන කළ යුතු ම ය. බෙහෙත් නැත්නම් තමන්ට අයත් බෙහෙත් දිය යුතු ය. තමාට නැතිනම් පිඬු සිඟා හෝ සොයා ගෙන දිය යුතු ය." යනාදී ලෙසින් භික්ෂූන් වහන්සේට පවා ගිහි දෙමාපියන්ට උපස්ථාන කිරීම අනුදැන වදාළහ.

වස් විසූ භික්ෂූන් වහන්සේ නමක් වස් විසූ ස්ථානයෙන් බැහැර වැඩියහොත් සත්දිනක් ඉක්මවීමට පෙර වැඩිය යුතු නමුත් දෙමාපිය අවශ්‍යතාවකට, ප්‍රශ්නයකට වැඩම කොට එපරිදි වැඩීමට අපහසු වී වස් ශික්ෂා පදය බිඳුණත් එය වරදක් නොවන බැව් බුදු හිමියෝ වදාළහ. මව්පිය දෙපළ කොතරම් උසස් ද යන්න එබඳු බරපතල විනය නීතියක් කැඩුණත් ප්‍රශ්නයක් නැතැ යි යන්නෙන් පෙනේ.

මහා බ්‍රහ්මයා තුළ ඇතැ යි පැවසෙන කාහටත් පතුරුවන්නා වූ මෛත්‍රිය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව යන සතර බඹ විහරණ දරුවන් පිළිබඳව දෙමාපියන් කෙරේ පවත්නා හෙයින් මව්පියන් මහා බ්‍රහ්ම ලෙස බුදු රජාණන් වහන්සේ 'බ්‍රහ්මාති මාතා පිතරෝ' යනාදී ලෙසින් වදාළහ. එකල ඉන්දියානු රජ සමාජයේ උසස් පුද්ගලයා හඳුන්වන්නට භාවිත කළ බ්‍රහ්ම යන්න දැක්වූයේ සැබැවින් ම ඊට යෝග්‍ය හෙයිනි. බුදු හිමියන් පමණ දෙමව්පියන්ගේ ශ්‍රේෂ්ඨත්වය ලොවට දක්වන ලද අන් කිසිවෙක් නොමැති ය.

බෞද්ධයකුට බුදුවරයකුට වඩා ශ්‍රේෂ්ඨ උත්තමයෙක් තුන් ලොවෙහි ම නැත. ගෙදර සිටින මැණියන් සමාන කරනුයේ ඒ ශ්‍රේෂ්ඨ උත්තම බුදු රජාණන් වහන්සේට ය. ගෙදරක මව් කෙනකුන් සිටීම බුදු කෙනකුන් වැඩ සිටීම වැනි යැයි ව්‍යවහාරයට ආවේ මේ නිසා ය. ගෙදර සිටිනුයේ බුදු අම්මා ය, බුදු තාත්තා ය. ඕනෑ ම කරදරයක දී කියැවෙන්නේ බුදු අම්මේ, බුදු තාත්තේ යනුවෙනි. ගෙදර බුදු අම්මාට සත්කාර සැලකිලි කිරීම බුදු හිමියන්ට කරනු ලබන සත්කාරයක් සේ සැලකිය යුතු ය. මෙබඳු අම්මාට කරන සැලකිල්ල ඉහළින් ම විය යුතු ය. "බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට" යනුවෙන් ජනකවියා ද පවසයි.

දරුවන්ගේ මුල් ගුරුවරු දෙමව්පියෝ ය. හොඳ නරක මුලින් ම වටහා දෙන්නේ ඔවුහු ය. මේ නිසා පූර්වාචාරීන් හෙවත් පුබ්බාචරිය

යන නමින් මව්පියෝ හැඳින්වෙති. අතිවිශාල ගුණ කදම්භයකින් යුතු මාපියෝ 'ආහුණෙය්‍ය' නමින් ද හැඳින්වෙති. ආහුණෙය්‍ය කී කල අපට සිහි වන්නේ මහා සංඝරත්නයේ ස්වභාවය කියැවෙන සුපටිපන්නෝ යනුවෙන් වන්නා වූ සඟ ගුණ ගාථාවයි. ආහුණෙය්‍ය යන්නේ තේරුම මාපියන් රහතන් වහන්සේලාට සමාන ය යන්නයි. උන් වහන්සේලා උත්තම ගුණයෙන් යුතු ය. කොහි සිටියත් වැඳුම් පිදුම් කළ යුතු පිරිසකි. දුර බැහැර සිට වෙහෙස මහන්සි වී පැමිණ සැලකිලි ගෞරව ලැබීමට ඉතාමත් ම සුදුසු යෝග්‍ය දෙපොළකි. මේ නිසා උතුම් වූ අර්හත්වයට පත් වූ මහෝත්තමයාණන් වහන්සේ නමකගේ තත්ත්වයට සමාන කරන අයුරු කල්පනාවට ගත යුත්තේ ය.

රහතන් වහන්සේ නමකගේ දිවි තොර කිරීම, බුදුරදුන්ගේ ඇඟේ ලේ සෙලවීම, සංඝ භේදය ආනන්තරිය පාප කර්මයන් ය. මව මැරීම, පියා මැරීම ද එබඳු බරපතළ ආනන්තරීය පාප කර්මයක් සේ බුදු හිමියෝ පෙන්වා දුන්හ.

දෙමාපියන් තුළ පවත්නා අනුකම්පාව, ආදරය, ස්නේහය විශාල ය. ඒ අනුකම්පාව ඔස්සේ 'පජාය අනුකම්පක' නමින් ද මාපියෝ හැඳින්වෙති.

"මාතා යථා නියං පුත්තං

ආයුසා ඒක පුත්ත මනු රක්ඛේ" යි වදාළ පරිදි මවක් තම එක ම පුතු කෙරේ දක්වන ආකල්පය මහත් බව වටහා දෙති.

මෙලෙස,
"බ්‍රහ්මාති මාතා පිතරෝ
පුබ්බාචරියාති වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං
පජාය අනුකම්පකා"

යනුවෙන් විවිධ අන්වර්ථ නාමයන්ගෙන් බුදුරජාණන් වහන්සේ විසින් මාපියෝ හඳුන්වනු ලැබූහ.

ගෞතම බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන් ම දෙමාපියන්ට සැලකූහ. පළමු දම්දෙසා පසුව තව්තිසා දෙව්ලොව වැඩියේ මාතෘ දිව්‍ය රාජයාණන් ලෙසින් උපත ලැබ සිටි සිය මවට දහම් දෙසීමට ය.

මැණියන් පෙවූ කිරි රසයට බුදු පියාණෝ දහම් රසය පෙවූහ. කිඹුල්වත මහ මඟ වඩිද්දී මඟ දී ම පිය රජුට දහම් දෙසීමෙන් පිය රජු සෝවාන් බවට පත් කැරිණි. සකෘදාගාමී අනාගාමි බවට පත් කළ පිය රජතුමා අසනීප වූ අවස්ථාවේ වැඩි බුදුහිමි උතුම් වූ රහත් බවට පත් කළහ. තම කරුණා මහිමය පිය රජුහට ද පතුරුවා හරිමින් මාර්ගඵල අත්පත් කර දුන්හ. දරුවකුට මීටත් වඩා ඉහළ ම යමක් කරන්නට නැත.

පිය රජුට මව් තුමියට පමණක් නොව තමන් හදා වැඩූ සුළු මව් වන ප්‍රජාපති දේවියට ද කළ යුතු යුතුකම් ඉටු කළහ. මෙහෙණි සසුන ලබා දුන්හ. අර්හත් මඟ ඵල ලබා දුන්හ. මහා ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේ පිරිනිවන් පාන්නට අවසර ගෙන වඩින කල එතුමියට ගෞරව දැක්වීමට මහ රහතන් වහන්සේලා සමඟ එතුමිය පිටුපසින් බුදුහිමියෝ වැඩියහ. කිසිදා කා හටත් පසු ගමන් කොට නොමැති බුදු හිමියන් එසේ එතුමියට පමණක් පසු ගමන් වැඩියේ තම සුළුමව්ට තමා හදා වැඩූ පුංචි අම්මාට සැලකීමක් ගෞරවයක් ලෙසිනි. උන් වහන්සේ ප්‍රජාපති රහත් මෙහෙණින් වහන්සේගේ ආදාහන පෙරහැරේ වැඩියහ. ඇයගේ ගුණ වර්ණනා කළහ. තමන් වහන්සේ ම වැඩ, ඉතිරි ව පැවති ධාතු තම අතින් ම පාත්‍රයට දා රැගෙන ගොස් ඒවා තැන්පත් කොට පිදිය යුතු ස්ථානයක් සෑදීමට කටයුතු කළහ. කුඩා කාලයේ තමන් හැදූ වැඩූ මවට කුමන තරම් ඉහළින් බුදු හිමි සැලකුවේ ද! මේ පරිදි බුදු පියාණන් වහන්සේ මහත් ආදර්ශයෙන් ක්‍රියා කරමින් දෙමාපියන්ට සැලකීමේ වටිනාකම අවබෝධ කරවූහ.

සාකේත නුවර මහ මග වඩින කල පෙර භවයක මාපිය යුවලක් බුදු හිමි දැක පුත්‍ර ස්නේහයෙන්, "පුතේ, පුතේ, වඩිනු මැනව, වඩිනු මැනව" ආදී ලෙසින් කළ ඇරියුම පරිදි ගෙදරට වැඩ දන් වළඳවා ඒ දෙමාපියන් සන්තෝෂයට පත් කළ අයුරු දැක්වෙයි. මහජනතාව ඒ දෙමාපියන් 'බුද්ධ මාතා', 'බුද්ධ පිතා' යනුවෙන් හැඳින්වූහ. පසු කල දහම් අසා නිවන් අවබෝධ කළහ. පිරිනිවන් පෑහ. නගර වැසියන් එම රහතන් වහන්සේලාගේ ආදාහන කටයුතු උත්කර්ෂවත්ව සිදු කළහ. මොවුහු පෙර ආත්ම පන්සියයක දෙමාපියන් බව බුදුහු හිමි ආනන්ද තෙරුන් අමතා වදාළහ. දරුපෙම මතු වී පුතා ලෙස සැලකූ කල ඊට විරුද්ධ නොවී සියලු ආදරය ඉවසා සිටීමත් දෙමාපියන්ට ගරු කිරීමක් ලෙස පෙනී යයි.

මවකට පියකුට පෝෂණය ගෙන දෙන පුද්ගලයන්ට එසේ ම සියලු තන්හි පිහිට වන බව නොයෙක් කථා වස්තූන්ගෙන් පෙන්වා දෙයි. ඕනෑම රුදුරු වග වලසුන්ගෙන් පිරි මහා වනයක වුවද නිර්භයව යා හැක්කේ එබඳු පුද්ගලයන් දෙව් දේවතාවුන් විසින් ආරක්ෂා කරන හෙයිනි.

මහානාම කුලපුතු හට,

"මතාපිතානු කම් පිතස්ය මහානාම කුල පුත්තස්ස

වෘද්ධියේ ච පටිකංඛ තබ්බා නොපරිහා යති" යි මව්පියන්ගේ අනුකම්පාව ලබන කුල පුත්‍රයා හට දියුණුව මිස පිරිහීමක් නොවන්නේ යයි බුදුහිමි වදාළහ.

"යෝ මාතරං වා පිතරං වා
මච්චො ධම්මේ හි පෝසති"

"කායනං පරිවරිගය
මාතාපිතුසු පණ්ඩිතෝ
ඉධෙවානං පස්සන්ති
පෙච්ච සග්ගේ පමොදති"

යි තථාගතාණන් වහන්සේ දේශනය ඔබ වෙත දක්වන්නේ තම පියා හෝ මව ධර්මයෙන්, ආහාර පාන සැපයීමෙන්, ඔවුන් විසින් කළ යුත්තක් පැමිණි කල තමා ම කර දීමෙන්, රෝගී වූ විට ප්‍රතිකාර කරවීමෙන් බලවත් ඕනෑකමින් සොයා බලා කටයුතු කරන සත්පුරුෂයා පිළිබඳව මෙලොව ඇති වන කීර්තිය දස අත විහිදෙන බවත්, මරණයෙන් මතු ද ඒ පිනෙන් දිව්‍ය සම්පත්තියෙන් සතුටු වන බවත් යන කරුණු ය.

දරුවන්ගෙන් සැලකුම් නොලද පියකු විසින් බුදුහිමි වෙත පැමිණ කරුණු කී කල්හි ගාථා පහක් උගන්වා දරුවන් සිටින සභාවක මහත් සේ ශබ්ද නගා කියන්නැ'යි ද, එවිට දරුවන්ගෙන් සැලකුම් ලැබෙනු ඇතැයි ද උපදෙස් දුන් සේක. මහලු පිය දරුවන් සිටින සභාවක ඒ ගාථා කී කල දරුවන්ට සත්‍යය වැටහිණ. පියා ඔසවා ගෙන ගොස් නිසි ලෙස සලකන්නට වූහ. බුදු රජාණන් වහන්සේ මව්පියන් සැලකීම සම්බන්ධයෙන් එබඳු කටයුතු කළ සේක.

අම්බලමක සිටි තම දෙමව්පියන්ට සැලකූ භික්ෂූන් වහන්සේ නමක අරහයා මාතුපෝසක ජාතක දේශනා කළහ. සාම ජාතකය, සාලිකේදාර ජාතකය ආදී නොයෙක් ජාතක කථා වස්තු රාශියකින් ද ගෙන හැර පාන්නේ මව්පියන්ගේ අගයයි. මව්පිය උපස්ථානයේ වැදගත්කමයි. මිනිසුන් අතර පමණක් නොව තිරිසනුන් අතර පවා මව්පිය ගුණය සැලකීම උන් වහන්සේ පෙන්වූහ.

මහා සමුද්‍රයේ ජල රැලි මත තම උර මත ආදරණීය මෑණියන් හිඳුවා පීනූ තරුණයාට, "පුතේ, උඹ බුදු වෙයන්" යැයි මව දුන් ආශිර්වාද ප්‍රාර්ථනා පරිදි බුදු වීමේ සිත පිහිටුවා මනා අධිෂ්ඨානයේ පිහිටා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ගොර බිරම් සසර ගෙවා අවසානයේ උතුම් වූ සම්‍යක් සම්බුද්ධත්වයට පත් වී සකල ප්‍රජාව වෙත මව්පියන්ගේ ගුණ කදම්භය, මව්පිය උපස්ථානයෙහි ආදීනව ගැන බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කළ කරුණු බොහෝ ය. තිරිසන් සතුන් අතර බවා මව්පියන්ට සැලකීමේ උසස් ගුණය පවතී නම් තිරිසන් සත්ත්වයන්ට වඩා සිත දියුණු වූ මිනිසුන්ගෙන් ඉතා වැදගත් ලෙසින් මේ ගුණය ඉටු විය යුත්තේ ය. ගෙදර බුදුන් ලෙස හැඳින්වෙන මව්පියන් ගැන සැලකීම ගිහියන්ගෙන්, භික්ෂූන් වහන්සේලාගෙන් පමණක් නොව බුදු පසේබුදු මහ රහතන් වහන්සේ වැනි නික්ලේශී මහෝත්තමයාණන් වහන්සේලාගෙන් පවා ඉටු විය යුතු මහඟු යුතුකමක් සේ බුදු රජාණන් වහන්සේ පෙන්වා දුන්හ.

# මනුලොව උසින්ම වැඩ සිටිනා සධාතුක කරඬු වහන්සේ වඩම්මවන **කැළණි ශ්‍රී පාද පෙරහැර** 13

**ශාස්ත්‍රපති චසිත නුවන්තික බුලත්සිංහල**

උඳුවප් පොහෝ දිනෙන් ඇරඹෙන ශ්‍රී පාද වන්දනා වාරය තථාගතයන් වහන්සේගේ ශ්‍රී ලංකා ගමනයේ සුවිශේෂී සිද්ධීන් නැවත අනුස්මරණය කරයි. මහාවංශය ප්‍රධාන කොට ඇති බෞද්ධ මූලාශ්‍රයන්ට අනුව, මෙම සිද්ධි දාමය කැළණිය හා සමන්තකූටය යන ස්ථාන දෙක කේන්ද්‍ර කර ගෙන සිදුවි ය. මහාවංශයේ සඳහන් වන පරිදි, මනිඅක්ඛික නාග රජු බුදුරජාණන් වහන්සේට කැළණියට වැඩම කරන මෙන් ආරාධනා කළේය:

"මණිඅක්ඛිකො නාගරාජා බුද්ධං නිමන්තයි කල්‍යාණිං,
සත්තමං දිවසං බුද්ධො ජම්බුදීපා ඉධාගමි." (මහාවංශය, 1:47)

බුදුන් වහන්සේ මෙම ආරාධනාව පිළිගෙන කැළණියට වැඩම කළ සේක. මෙය බුදුන් වහන්සේගේ තෙවන ලංකා ගමනයයි. කැළණියේ දී, සමන්තකූටයෙහි වාසය කරන සුමන (සමන්) දෙව් රජ තෙම බුදුන් වහන්සේ වැඳ, සමන්තකූටයට වැඩම කරන මෙන් එහි දී ආරාධනා කළේය:

"සුමනො නාම දෙවින්දො සමන්තකූටවාසකො,
බුද්ධං වන්දිතුමාගම්ම නිමන්තෙසි තථාගතං." (මහාවංශය, 1:33)

බුදුන් වහන්සේ මෙම ආරාධනාව ද පිළිගෙන සමන්තකූටයට වැඩම කළ සේක:

"සුමනස්ස වචො සුත්වා සමන්තකූටමුත්තමං,
ජලන්තං කනකප්පභං අගමාසි මහාමුනි." (මහාවංශය, 1:34)

සමන්තකූටයේ දී, බුදුන් වහන්සේ සිය ශ්‍රී පාද ලාංඡනය තැබූ සේක:

"සමන්තකූටමුද්ධම්හි ලංකායං ලංකලංකරෙ,
පාදලඤ්ජනමුත්තමං ඨපෙසි පුරිසුත්තමො." (මහාවංශය, 1:37)

මෙම සිද්ධි මාලාව අනුව, කැළණිය හා සමන්තකූටය යන ස්ථාන දෙකම බුදුන් වහන්සේගේ ශ්‍රී ලංකා ගමනයේ අතිශයින් වැදගත් ස්ථාන ලෙස සැලකේ. කැළණිය, මනිඅක්ඛික නාග රජුගේ ආරාධනාවෙන් බුදුන් වහන්සේ වැඩම කළ ස්ථානය වන අතර, එහි දී ම සමන් දෙවියන් පැමිණ සමන්තකූටයට ද වැඩම කරන මෙන් ආරාධනා කළ බව සමන්තපාසාදිකාව, දීපවංසය, රාජාවලිය, සද්ධමාලංකාරය, පූජාවලිය, සමන්තකූටවණ්ණනා වැනි මූලාශ්‍ර ග්‍රන්ථයන් තුළින් තව දුරටත් කරුණු හමු වේ. සද්ධමාලංකාරයේ මෙම සිදුවීම් පිළිබඳව වඩාත් විචිත්‍ර විස්තරයක් ද දක්නට ලැබේ:

"බුදුරජාණන් වහන්සේ කැළණියට වැඩම කළ අවස්ථාවේ, සමන් දෙවියන් දිව්‍ය ආභරණ පැළඳ, දිව්‍ය සුවඳ මල් ගෙන පැමිණ බුදුන් වහන්සේට වැඳ, සමනළ කන්දට වැඩම කරන මෙන් ආරාධනා කළේ ය. බුදු රජාණන් වහන්සේ එම ආරාධනාව පිළිගෙන සමනළ කන්දට වැඩම කොට, එහි සිය ශ්‍රී පාද ලකුණ තැබූ සේක. මෙම ශ්‍රී පාද ලකුණ දැක බලා ගැනීමට සමන් දෙවියන්ට අවසර දුන් සේක. සමන් දෙවියෝ මෙම ශ්‍රී පාද ලකුණ රන් කරඬුවකින් ආවරණය කර ආරක්ෂා කළහ."

මෙම ඓතිහාසික සාධක අනුව, කැළණිය සහ ශ්‍රී පාදස්ථානය යන පූජනීය ස්ථානයන් දෙක ම ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමයේ අත්‍යන්ත වැදගත් ස්ථාන ලෙස සැලකිය යුතු ය. එහි වැදගත්කම තව තවත් වර්ධනය වන පරිද්දෙන් මෙම ඓතිහාසික අවස්ථාව සැමරීම උදෙසා, කැළණි රජමහා විහාරයේ සිට නැවතත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සිරිපා මළුවට වැඩම කරනවා සේ අභිනීල කේශ ධාතූන් වහන්සේලා හා උතුම් ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා වඩම්මවන උතුම් පෙරහැරක් පසුගිය වර්ෂයේ සිට සාර්ථකව ආරම්භ කරන්නට යෙදුණි.

ශ්‍රී කල්‍යාණි උභය රජ මහා විහාරාධිපති, කැළණිය විශ්වවිද්‍යාලයේ ගරු කුලපති, අග්ග මහා පණ්ඩිත, මහෝපාධ්‍යාය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක මහා ස්වාමීන් වහන්සේගේ හා ශ්‍රී පාදස්ථානාධිපති, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ කුලපති, සබරගමු රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝනායක, බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නාහිමිපාණන් වහන්සේගේ පූර්ණ අවවාද අනුශාසනා මත කැළණි ශ්‍රී පාද පෙරහැර එකමුතුව විසින් මෙම රථ පෙරහැර සාර්ථකව සංවිධානය කරන්නට යෙදුණි.

ශ්‍රී පාද වන්දනා වාරය ආරම්භය සිදු වන උඳුවප් පෝයට දින දෙකකට පෙරාතුව කැළණි රජමහා විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ විසින් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අභිනීල කේශ ධාතූන් වහන්සේලා සහිත සධාතුක කරඬු වහන්සේ කැළණි ශ්‍රී පාද පෙරහැර වෙත භාර දෙනු ලබයි. කැළණි ශ්‍රී පාද එකමුතුව විසින් රථ පෙරහරකින් මෙම සධාතුක කරඬු වහන්සේ පැල්මඩුල්ල ගල්පොත්තාවෙල රජමහා විහාරය වෙත ඉතා සුරක්ෂිතව වැඩම කරනු ලබයි. ශ්‍රී පාද නායක හිමිපාණන් වහන්සේ විසින් එම සධාතුක කරඬු වහන්සේ භාර ගනු ලබයි. ඊට පසු දින මෙම සධාතුක කරඬු වහන්සේ සමන් දේව ප්‍රතිමාව ද සමඟ ශ්‍රී පාද පද්මය වෙත රථ පෙරහැරකින් ගමන් ගනු ලබයි.

උඳුවප් පොහොය ලබනවාත් සමඟ ම ශ්‍රී පාද පද්මය වෙත වැඩම කරන මෙම උතුම් සධාතුක කරඬු වහන්සේ ශ්‍රී පාද නායක හිමිපාණන් වහන්සේගේ පින්වත් සුරතින් ගෞතම ශ්‍රී පාද පද්ම කුටියේ අප තථාගතයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මය අසලින් ම තැන්පත් කරනු ලබයි. දහස් සංඛ්‍යාත බැතිමතුන්ගේ පුෂ්පෝපහාර මැදින් හා ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ වන්දනාමානාන මතින් කැළණි රජමහා විහාරයේ සිට වැඩම කරන මෙම උතුම් සධාතුක කරඬු වහන්සේ උඳුවප් පොහෝ දින සිට වෙසක් පුන් පොහෝ දින දක්වා සිරිපා පද්මය අසල සිට නැවතත් තවත් ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ වන්දනාමානයට ලක් වේ.

අතීතයේ සිට කැළණි රජමහා විහාරය සතු මෙම උතුම් අභිනීල කේශ ධාතූන් වහන්සේලා හා උතුම් සර්වඥ ධාතූන් වහන්සේලා,

හෙළ බොදුබල එකමුතුව බෞද්ධ සංවිධානය විසින් පූජා කරන ලද නීලමාණික්‍ය කරඬුවක, ඇත් දළ කරඬුවක, රත්තරං කරඬුවක හා රිදී කරඬුක තැම්පත් කර උතුම් සධාතුක කරඬු වහන්සේ ලෙසින් ශබ්ද විකාශන යන්ත්‍ර, සම්බුදු ගුණ ගායනා රථ, හේවිසි පූජා රථ, සුවඳ දුම් පූජා රථ, මල් ඉසින රථ, සංධාර පූජා රථ, පැන් ඉසින රථ, ආදි වූ රථ පෙරහැරින් මඟ දෙපස දහස් සංඛ්‍යාත බැතිමතුන් ගේ වන්දනාමානයට පාත්‍ර කරමින් වෙසක් පුන් පොහොය ලබනවාත් සමඟ ශ්‍රී පාද පද්මයේ සිට නැවත කැළණි රජමහා විහාරය දක්වා වඩම්මවනු ලබයි. මෙම උතුම් පින්කම තුළින් ශ්‍රී පාද පද්මය වන්දනා කරන බැතිමතුන්ට සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කේශ ධාතූන් වහන්සේලා හා සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනාමානා කිරීමේ අතිරේක කුසලය ද අත් වෙයි. එසේ ම මඟ දෙපස සිට වන්දනාමාන සිදු කරන කැළණි රජමහා විහාරයට හෝ ශ්‍රී පාද පද්මය වෙත යන්නට නොහැකි බාල, තරුණ මහලු කොයි කාටත් විශාල කුසල් ද රැස් වෙයි.

විමානවත්ථු අට්ඨකථාව තුළ සඳහන් පරිදි,
"බුද්ධානං ජීවමානානං යා පූජා ච පසංසා ච,
සාව තෙසං පරිනිබ්බුතානං පූජා ච පසංසා චාති වෙදිතබ්බං."

"බුදුවරුන් ජීවමානව සිටියදී කරන පූජා හා ප්‍රශංසා, ඔවුන් පිරිනිවන් පෑමෙන් පසුව කරන පූජා හා ප්‍රශංසා හා සමාන යැයි දත යුතු ය."

සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අට්ඨකථාව) තුළ සඳහන් පරිදි,
"යථා හි ජීවමානස්ස බුද්ධස්ස පූජා කතා
මහප්ඵලා හොති මහානිසංසා, එවං පරිනිබ්බුතස්සාපි."

"ජීවමාන බුදුරජාණන් වහන්සේට කරන පූජාව මහත් ඵල ඇති, මහත් ආනිසංස ඇති වන්නාක් මෙන්, පිරිනිවන් පෑ බුදුරජාණන් වහන්සේට කරන පූජාව ද එසේ ම ය."

මිලින්දපඤ්ඤයේ නාගසේන හිමියෝ මිලිඳු රජුට මෙසේ පැහැදිලි කරති:

මහරජ, තථාගතයන් වහන්සේ ජීවමානව සිටිය දී යමෙක් මල් හෝ සුවඳ හෝ විලවුන් හෝ සිවුරු හෝ ආහාර හෝ සෙනසුන්

හෝ ගිලන්පස හෝ පූජා කරයි නම්, ඒ පූජාව මහත් ඵල ඇති, මහත් ආනිසංස ඇති, මහත් ප්‍රභාවයක් ඇති, මහත් විපුල බව ඇති වන්නාක් මෙන්, මහරජ, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසුව ද යමෙක් ධාතූන් වහන්සේලාට පූජා කරයි නම්, ඒ පූජාව ද මහත් ඵල ඇති, මහත් ආනිසංස ඇති, මහත් ප්‍රභාවයක් ඇති, මහත් විපුල බව ඇති වන්නේ ය."

මෙම සාධක අනුව පැහැදිලි වන්නේ සර්වඥ ධාතූන් වහන්සේලාට වන්දනා මාන කිරීම ජීවමාන බුදුරජාණන් වහන්සේට වන්දනාමාන කිරීමක් හා සමාන බවයි. මෙය බෞද්ධ සම්ප්‍රදායේ ධාතු වන්දනාවේ වැදගත්කම තහවුරු කරන සාධක ලෙස සැලකිය හැකි ය. මේ අනුව මෙම කැළණි ශ්‍රී පාද පෙරහැර ලක්ෂ සංඛ්‍යාත සැදැහැවතුනට සුගතියේ දොරගුළු විවර කර දී නිවන් මඟ සමීප කරනු ලබයි. එනම් සර්වඥ ධාතූන් වහන්සේලාට වන්දනා මාන කිරීම තුළ සැදැහැවතුන්ගේ සිත තුළ බුද්ධානුස්සතිය උපදින අතර, එම ශ්‍රද්ධාව නිවන සඳහා ම හේතු වෙයි.

මෙම උතුම් සධාතුක කරඬු වහන්සේ, මනුලොව උසින්ම වැඩ සිටින උතුම් ධාතූන් වහන්සේලා ලෙසින් මේ වන විටත් ඉතිහාසයට එක් වී ඇත. 2025 වර්ෂය තුළ ද කැළණි රජ මහා විහාරයේ ගරු නාහිමිපාණන් වහන්සේගේ හා, ශ්‍රී පාද විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේගේ කාරුණික උපදෙස් මත කැළණි ශ්‍රී පාද පෙරහැර එකමුතුව විසින් කැළණි රජමහා විහාරයේ සිට කඩුවෙල, පාදුක්ක, ඉංගිරිය, රත්නපුර හරහා පැල්මඩුල්ල ශ්‍රී පාද රජමහා විහාරය වෙත හා ශ්‍රී පාදස්ථානය වැඩම කර නැවත සිරිපාද සමය අවසන් වීමෙන් පසු වෙසක් මස නැවත කැළණි විහාරය වෙත සධාතුක කරඬු වහන්සේ වැඩම කිරීමේ පෙරහැර ද සංවිධානය කරනු ලබයි. මඟ දෙපස සිටින බැතිමතුන්ගෙන් කැළණි ශ්‍රී පාද පෙරහැර එකමුතුව ඉල්ලා සිටින්නේ මුදල් පරිත්‍යාගවලින් වැළකී මල් පමණක් සධාතුක කරඬු වහන්සේ වෙත පූජා කරන ලෙසයි.

# බුදුදහම සැබැවින්ම සමාජ හිතකාමී දහමකි 14

ශාස්ත්‍රපති ඒ.පී. විජේකුමාරි

බුදුදහම කිසිසේත්ම සමාජ විරෝධී නොවේ. එය සමාජ හිතකාමී දහමකි. බුදුදහමේ මූලික අරමුණ පුද්ගලයා යහමඟට යොමු කරමින් උදාරතර පුද්ගලයකු බිහි කිරීමයි. යහපත් ගුණයෙන් හෙබි පුද්ගලයකු නිර්මාණය වීම තුළ යහපත් සමාජයකුත් රටකුත් නිර්මාණය වේ. බුදුසමය විද්‍යාවක් මෙන් ම චරණයක් ද වේ. බුදුදහම පැහැදිලිව ම ගිහි-පැවිදි දෙපක්ෂයේ ම අර්ථ සාධනය කරන්නකි.

පඤ්චශීලය ගිහියාගේ නිත්‍ය ශීලය වේ. එය පෞද්ගලිකව එක්එක්කෙනා සුරකින බව ඇත්ත ය. එහෙත් එහි ඇති සමාජ අවධානය ඉතා විශාල ය.

"පාණාතිපාතා වේරමණී" - පණ ඇති සතුන් නොමරමි.

එසේ නම් තනි පුද්ගලයකුට මෙම ශික්ෂා පදය සමාදන් වීමේ අවශ්‍යතාවක් නොමැත. මෙයින් අදහස් කරන්නේ පුද්ගලයා කේන්ද්‍ර කර ගත් මුළු මහත් සමාජයට ම හිතකාමී වූ ක්‍රියාවකි. ප්‍රාණඝාතයෙන් වැළැකීමෙන් පමණක් එම ශික්ෂාව සම්පූර්ණ නොවේ.

නිහීත දණ්ඩො නිහීත සත්තො ලජ්ජි දයා පන්නො සබ්බ පාණභූත හිතානුකම්පි හොති

දඬුමුගුරු, අවිආයුධ බහා තබා සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කිරීම චුල්ලකම්ම විභංග සූත්‍රයේ දී අනුශාසනා කර ඇත. එය දීර්ඝායුෂ ලැබීමට ද හේතු වන බව බුදු රජාණන්

වහන්සේ දේශනා කොට ඇත. ප්‍රාණඝාතයෙන් වැළැකීම තුළින් සියලු සත්ත්වයන්හට ම අභය දානය හිමි වේ. මරණ බිය දුරු වේ.

එසේ ම ධම්මපදයෙහි ද මේ බව අවධාරණය කර ඇත.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමංකත්වා
න හනෙය්‍ය න ඝාතයෙ

සියල්ලෝ ම දඬුවමට බිය වෙති.
සියල්ලෝ ම මරණයට බිය වෙති.
එබැවින් අනුන් තමාට සමාන යැයි සිතා (අත්තූපනායික)
අනුන්ට හිංසා නොකරන්න; අනුන් ලවා කරවීමෙන් ද වළකින්න.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙසං ජීවිතං පියං
අත්තානං උපමංකත්වා
න හනෙය්‍ය න ඝාතයෙ

සියල්ලෝ ම දඬුවමට බිය වෙති.
සියල්ලෝ ම ජීවිතයට ප්‍රිය කරති.
එබැවින් අනුන් තමාට සමාන යැයි සිතා (අත්තූපනායික)
තවෙකකුගේ දිවි තොර නොකරන්න; අනුන් ලවා කරවීමෙන් ද වළකින්න.

අදත්තාදානය හෙවත් සොරකමින් වැළැකීම තුළින් අන් අයගේ වස්තුවෙහි සුරක්ෂිත භාවය ද ඇති වේ. එසේ ම වැරදි කාම සේවනය නොකිරීමෙන් යහපත් වූ පවුල් සංස්ථාවක්, අඹුසැමි සම්බන්ධතාවක් ගොඩ නඟා ගැනීමට හැකි වන අතර තමාට ද සමාජයට ද ඉන් වන අහිතකර බලපෑම්වලින් තොර වීමට හැකියාව ඇත.

යහපත් වූ පුද්ගලයකු සමාජගත වන්නේ යහපත් වූ පවුල් සංස්ථාවක් තුළිනි. බොරු කීමෙන් වළකින පුද්ගලයා සත්‍ය වචනය කතා කරමින් විශ්වාසය සුරකී. බොරු කීමෙන් හා බොරු කිරීමෙන් අනුන්ට සිදු වන පාඩු පිළිකුල් කරයි. එසේ ම මද්‍යසාර භාවිතයෙන්

වළකින හෙතෙම ඒ හේතුවෙන් සමාජයේ නිදහස, සාමය, සෞඛ්‍යය, ශිෂ්ට බව ආදී සියලු දෙය සුරකී.

මේ ආකාරයට විරමණය හා සමාදානය යන දෙඅංශය තුළින් තමා තුළ ශික්ෂණයත්, තමා අවට සිටින සියලු දෙනාහට යහපතකුත් සිදු වන බව පැහැදිලි වේ.

ගිහියකු වශයෙන් මෙලොව පරලොව දෙලොව ම ජය ගත හැකි ක්‍රියාදාමයක් බුදු රජාණන් වහන්සේ සූත්‍ර ධර්ම රාශියක ම දේශනා කර ඇත. ඒ අතර සිගාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පරාභව සූත්‍රය ප්‍රධාන වේ. ශීලය මෙන් ම සමාධිය ද, ප්‍රඥාව ද ප්‍රගුණ කිරීමෙන් පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද යහපැවැත්ම සැලසේ.

මහා මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය ආදී සූත්‍රයන්හි පුද්ගලයා ආත්මාර්ථය සාධනය කර ගන්නා ආකාරයත්, එයින් සමස්ත සමාජයට ම සිදු වන යහපත් බලපෑමත් ඉතා පැහැදිලි ය.

බුදු රජාණන් වහන්සේ වදාළ දහමෙහි කේන්ද්‍රීය සාරධර්ම ලෙස හැඳින්විය හැක්කේ සතර බඹ විහරණයන් ය. එය චතු අප්පමඤ්ඤ ලෙස ද හඳුන්වයි. සිව් බඹ විහරණ ප්‍රගුණ කරන්නේ නම් ඔහු තුළ සියලු ම ගුණධර්ම සාරධර්ම ඇත. බ්‍රහ්ම විහාර සැබෑවට ම පිළිපදින පුද්ගලයා අතින් සිතින් හෝ මනසින් වරදක් සිදු නොවේ.

සිව් බඹ විහරණවල පළමුවැන්න වන්නේ මෙත්තා හෙවත් මෛත්‍රියයි. 'මිත්තස්ස භාවො මෙත්තා' මිතුරුකම හෙවත් හිතවත්කම මෛත්‍රිය නම් වේ. අනුන්ගේ සුවපත් බව කැමති වීමයි. කරණීය මෙත්ත සූත්‍රය, මෙත්තානිසංස සූත්‍රය ආදී සූත්‍ර දේශනාවල මෛත්‍රිය වඩන අයුරුත්, මෛත්‍රිය වැඩීමේ ආනිශංසත් පෙන්වා දී ඇත. එසේ ම ඛන්ධ පිරිතෙහි සඳහන් වන ආකාරයට අපා, දෙපා, සිව්පා, බුහුපා, සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා ච කෙවලා වශයෙන් සියලු ප්‍රාණීන් අයත් වන ආකාරයට මෛත්‍රිය ප්‍රගුණ කළ යුතු බව දේශනා කර ඇත.

එසේ ම කරණීය මෙත්ත සූත්‍රයේ දී තසා, ථාවර, දීඝ, මහන්තා, මජ්ඣිම, රස්ස, අණුක, ථූල, දිට්ඨ, අදිට්ඨ, දූරෙ, අවිදූරෙ, භූත, සම්භවේසි වශයෙන් මෛත්‍රිය වැඩිය යුතු කොටස් පිළිබඳව විග්‍රහ කොට ඇති අතර සියලු ප්‍රාණීන් ඇතුළු සියලු දෙනා මෙම විග්‍රහයට ද අයත් වේ.

අන් අයකු විවේචනය කරන විට දී එය සිදු කළ යුත්තේ මෛත්‍රී සහගත සිතින් යුතුව බව ද පෙන්වා දී ඇත. මෛත්‍රී සහගත සිතිවිලි තුළින් පුද්ගලයකු නිවුණ බවට ශාන්ත බවට පත් වේ.

එමෙන් ම අනුන්ගේ දුකේ දී කම්පාවට පත් වීම කරුණාව වේ. "පර දුක්ඛෙ සති සාධුනං හදය කම්පනං කරොතීති කරුණා" කරුණාවෙහි ලක්ෂණය නම් අන් අයගේ දුක ඉවත් කිරීමට ඇති බලවත් ඕනෑකමයි. අන් අයගේ දුක දෙස බල බලා නිකම් නොසිට එහි ක්‍රියාකාරී වේ. පාරමී දම් පුරන බෝධිසත්ත්ව උතුමකු තුළ සංසාරගත දුක් විඳින පුද්ගලයන් පිළිබඳ මහත් කරුණාවක් හට ගනී. බුද්ධත්වයේ පදනම කරුණාවයි.

බුද්ධොහං බොධඉස්සාමි
මුත්තොහං මොචයෙ පරෙ
තිණ්ණොහං තාරඉස්සාමි
සංසාරොගා මහබ්භයා

ආත්මාර්ථය ම අපේක්ෂා නොකර පරාර්ථය උදෙසා ම ජීවිතය කැප කරන්නේ කරුණාවන්ත පුද්ගලයන් ය. මේ අයුරින් කරුණාවන්ත පුද්ගලයන්ගෙන් පිරි සමාජයක අන්‍යෝන්‍ය සබැඳියාව හා භෞතික ආධ්‍යාත්මික දියුණුව ද ඇති වේ.

මුදිතාව යනු අනුන්ගේ සැපත, දියුණුව, ජයග්‍රහණය දැක ඊර්ෂ්‍යා නොකිරීමයි; එය දැක සැබැවින් ම සතුටු වීමයි. "පර සුඛොසාති හදයං පිනාතීති මුදිතා"

උපෙක්ඛා හෙවත් උපේක්ෂාව යනු සිතෙහි ඇති වන නොසැලෙන මැදහත් බවයි. අෂ්ටලෝක ධර්මයන්හි නොසැලීම ලෙස ද හැඳින්විය හැකි ය. විවිධ සිතුම් පැතුම් ගතිගුණ, අදහස්, රුචි අරුචිකම් ඇති ලෝකයේ අන්තගාමීව පක්ෂ විපක්ෂ නොවී මධ්‍යස්ථව සිටීමයි. මෙලෙස සමාජ හිතකාමී සමාජ අවධානයක් ඇති මිනිසුන් තැනීමට බ්‍රහ්ම විහාර වැඩීම ඉවහල් වන බවත් එහි යහපත මුළු මහත් සමාජයට ම බලපාන බවත් පැහැදිලි වේ.

සමාජයේ යහපැවැත්ම අරමුණු කර ගෙන බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කර ඇති සතර සංග්‍රහ වස්තු ද සුවිශේෂ වේ.

■ දානය

■ ප්‍රියවචනය

■ අර්ථචර්යාව

■ සමානාත්මතාව එම සතර සංග්‍රහ වස්තු වේ.

අයිතිය අත හැර මතු අපේක්ෂාවන් නොමැතිව අතින් මෙන් ම සිතින් ද දීම දානයයි. සමාජයට යහපතක් වේවායි සිතා දීම දානයයි.

රාජ්‍ය පාලනයේ දී ද රටේ ජනතාවගේ ආර්ථිකය දියුණු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම දානයට අයත් වේ. රාජ්‍යය තුළ ස්වයංපෝෂණයක් ඇති වේ නම් එම රාජ්‍යය තුළ අපාරාධ, විෂමාචාර දුරු කර ගැනීමට හැකියාව ඇත. කූටදන්ත සූත්‍රයේ ඒ බව පැහැදිලි කර ඇත.

දස පාරමිතා තුළ ද, දස රාජධර්ම තුළ ද මෙම දානමය සංකල්පය අන්තර්ගත වේ. නිර්වාණගාමී මාර්ගයේ පළමු පඩිය දානයයි.

“ලබා ගැනීමට වඩා අත් හැරීම ශ්‍රේෂ්ඨ වේ.”

තමා ඇලුම් කරන, දීමට අපහසු දේ දීමට හැකි නම් එය උතුම් ය. අත් හැරීම තුළින් ලබන සැනසීම මෙලොවට මෙන් ම නිර්වාණග ාමී ඵලයට ද ළඟා වීමට උපකාරී වේ.

සතර සංග්‍රහ වස්තුවේ දෙවැන්න ප්‍රිය වචනයයි. වචනයට විශාල බලයක් ඇත. දරුණු පුද්ගලයන් මෙන් ම දරුණු සතුන් ද ප්‍රිය වචනයෙන් මෙල්ල කිරීමට හැකි වනු ඇත. බොරුව, කේළම, හිස් වචන, පරුෂ වචන මඟින් සමාජයේ අඬදබර, කළකෝලාහල, අසමඟිකම් ඇති වේ. මෙම වාචසික අකුසල් හතරෙන් තොර වී සමාජයට හානි නොවන වචන භාවිත කිරීම ප්‍රිය වචනයයි. නොදැමුණු, නොහික්මුණු, අදාන්ත වචනවලට කිසිවෙක් ප්‍රිය නොකරති. ප්‍රිය වචන තුළින් සතුරෝ ද මිතුරෝ වෙති.

මහිලාමුඛ ජාතකය

සත්තිගුම්බ ජාතකය

නන්දිවිසාල ජාතකය තුළින් ඒ බව මොනවට පැහැදිලි වේ.

රටක් පාලනය කරන රජු හා රටවැසියන් අතර ද, සේව්‍ය-සේවකයන් අතර ද, ස්වාමි-භාර්යා අතර ද විශාල දියුණුවක් ඇති වීමට මෙම ප්‍රිය වචනය ඉවහල් වේ.

නෙලා, කණ්ණ, සුඛා, හදයංගමා, පෙමනීයා .....

මධුභාණී

ථුප්පභාණී

මිතභාණී වශයෙන් කතා කළ යුතු අයුරු සූත්‍ර දේශනාවන්හි දී පැහැදිලි කර ඇත.

අර්ථචර්යාව යනු අනුන්ගේ යහපතට දියුණුවට උපකාර කිරීම ය. උස්පහත්කම් නොසලකා කටයුතු කිරීම සමානාත්මතාව වේ. අර්ථචර්යාව මඟින් හුදෙක් ආර්ථික දියුණුව පමණක් ම නොසැලකේ. ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන සතර සම්පත්තියෙහි ම පිහිටීම අදාළ වේ. මෙමඟින් පරාර්ථචර්යාව උද්දීපනය වේ. එය සමාජයේ යහපැවැත්මට මෙන් ම අභිවෘද්ධියට ද, අන්‍යෝන්‍ය සබැඳියාව වර්ධනය වීමට ද හේතු වේ. මේ සඳහා වන කදිම නිදසුන බෝසත් සිරිතයි.

උපත ඇතුළු විවිධ සාධක පදනම් කර ගෙන පුද්ගලයා උස්පහත් කොට සැලකීම බමුණු මතය වන්නා සේ ම සෑම පුද්ගලයෙක් ම සමාන වන බව දීඝනිකායේ වාසෙට්ඨ සූත්‍රය තුළ දී කරුණු ඉදිරිපත් කර ඇත. කුල භේද, ආගම් භේද පසෙක ලා මනුෂ්‍යත්වයට ගරු කරන මානව හිතවාදී සමාජයක් බිහි කිරීම, මානව හිතවාදී පුද්ගලයන් බිහි කිරීම බුදුසමයේ අපේක්ෂාවයි. සමාජ විෂමතාව නොමැති තැන මානය, අහංකාරය, උඩඟුකම වැනි දුර්ගුණයන් ඇති නොවේ. සමාජ සාධාරණත්වය අගය කරන, පුද්ගල ශක්‍යතා අගය කරන ලොව ඇති එක ම දර්ශනය බෞද්ධ දර්ශනයයි.

ස්ත්‍රී පුරුෂ සෑම අයකුට ම සමාජයේ මූලික අවශ්‍යතාවන් ලැබීමේ අයිතියක් ඇත. එසේ ම පුද්ගලයාගේ මෙලොව පරලොව හිතසුව පිණිස ක්‍රියා කිරීමට හැකියාව ඇත. නීතිය, ධර්මය, කර්මය ආදී මෙම කරුණු හමුවේ සෑම අයකුට ම එක සේ මුහුණ දීමට සිදු වේ. කුල භේද, ආගම් භේද, ජාති භේද ඒ තුළ නොමැත.

මෙසේ සඳහන් කරන්නට යෙදුණ සිව් බඹ විහරණ මෙන් ම සතර සංග්‍රහ වස්තු ද සමාජයේ යහපැවැත්මට ඉවහල් වේ. එය සමාජ හිතකාමී බවට ප්‍රබල සාධක දෙකකි.

ඒ ගැන බුදුරදුන් වදාළේ සමාජය නමැති කරත්තය සමබරව ක්‍රමානුකූලව ඉදිරියට ගෙන යාම සඳහා උපකාරී වන කඩඇණ දෙක ලෙස සිව් බඹ විහරණ හා සිව් සඟරාවත් හඳුන්වා දී ඇත.

"රථසසානී ව යායතො"

මෙතුළින් මොනවට විද්‍යමාන වන්නේ බුදුදහම සමාජ හිතකාමී දහමක් බවයි.

බුද්ධ ආදර්ශය, භික්ෂු ආදර්ශය තුළින් ද ඒ බව පැහැදිලි වේ. සාමූහික සහජීවනයේ ආදර්ශය යථාර්ථයෙන් ම ප්‍රකට කරන සමාජයක් වශයෙන් භික්ෂු සමාජය පැවැතිය යුතු යැයි බුදු රජාණන් වහන්සේ වෙසෙසින් ම කල්පනා කළ බවට සාධක ධර්ම විනයෙහි එමට දක්නට ලැබේ.

භික්ෂූන් එකිනෙකා කෙරෙහි ප්‍රියශීලීව විසිය යුතු බවත්, අන්‍යෝන්‍ය විශ්වාසයෙන් විසිය යුතු ආකාරයත් පෙන්වා දී ඇත. දීඝනිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ දී භික්ෂු සමාජයේ පිරිහීම වළකා දියුණුව ඇති කර ගැනීමට අදාළ කරුණු සතක් ද වදාළ අතර සංඝ සාමග්‍රියට මුල් තැන දී ඇත.

මජ්ඣිම නිකායේ චූලගෝසිංහ සූත්‍රයේ දී අනුරුද්ධ හිමියන් ඇමතූ උන් වහන්සේ, "අනුරුද්ධයනි, තෙපි සමඟියෙන් හා සතුටින් වාද විවාද රහිතව එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් කිරි හා දිය මෙන් එක්ව වසව් දැ"යි විමසූහ. "සත්තකින් ම ස්වාමීනි, අපි එලෙස ම වසමු"යැයි අනුරුද්ධ හිමියෝ පිළිතුරු දුන්හ.

"තගස මයං භන්තෙ සමග්ගා සම්මොදමානා අවිවාදමානා ඛීරොදකී භූතා අඤ්ඤමඤ්ඤං පිය චක්ඛුහි සම්පස්සමානා විහරාම"

චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්තා හිතා ය සුඛාය දෙව මනුස්සානං වශයෙන් පළමු රහත් සැටනම

වහන්සේලාට දුන් ඔවදනින් ද බුදුදහම සමාජ හිතකාමී වූ දහමක් බව තහවුරු වේ.

මේ අයුරින් කරුණු විමසා බැලීමේ දී බුදුදහම සමාජ විරෝධී නොවන බවත්, එය සමාජ හිතකාමී, මානව හිතකාමි දහමක් බවත් මොනවට පැහැදිලි වේ.

# ආත්මාර්ථය හා පරාර්ථය සාධනය බුදුදහමේ මූලික අරමුණයි 15

ශාස්ත්‍රපති ඒ.පී. විජේකුමාරි

මේ පිළිබඳව සාකච්ඡා කිරීමේ දී වෙසෙසින් ම අපගේ අවධානය යොමු විය යුත්තේ බෞද්ධ ආචාර ධර්මයන් පිළිබඳව ය. සදාචාර ධර්ම, පින්-පව්, කුසල්-අකුසල් සහ චාරිත්‍ර-වාරිත්‍ර යන පදවලින් හඳුන්වනු ලබන්නේ එයට අදාළ විෂය ක්ෂේත්‍රයයි. පුද්ගලයා විසින් සිදු කරන, සිදු කළ යුතු යැයි පිළිගනු ලබන යහපත් චර්යා රටාව හෙවත් කල්ක්‍රියාව ආචාර ධර්ම වේ. මෙම ආචාර ධර්ම පිළිපැදීමෙන් පුද්ගල ආත්මාර්ථය ද පරාර්ථය ද සලසා ගත හැකි ආකාරය ගැන විමසා බලමු.

පුඤ්ඤ සංකල්පය බුදුදහමේ ඉතා පෘථුලව සාකච්ඡා වී තිබේ. ඒ තුළ රැස් කිරීම පිළිබඳ අර්ථයක් ගැබ් වේ. පින පිළිබඳව බුදුදහමේ සාකච්ඡා කිරීමේ දී එය සැපය වශයෙන් දක්වා ඇත. මා පුඤ්ඤභායි සූත්‍රයේ දී "මා භික්ඛවෙ පුඤ්ඤානං භායිත්ථ. සුඛස්සෙතං භික්ඛවෙ, අධිවචනං යදිදං පුඤ්ඤන්ති" "භික්ෂුනි, පිනට බිය නොවන්න. පින යනු සැපයට ම පවසන තවත් නමකි". මේ අනුව පින හෝ සැපය අතර වෙනසක් දැකිය හැකි නොවේ. පුඤ්ඤ ක්‍රියාවක ලක්ෂණය බුදුසමය ඉදිරිපත් කරන්නේ තමන්ටත් අනුන්ටත් හිත පිණිස පවත්නා වූ ක්‍රියාවක් වශයෙනි. එබඳු වූ සතරාකාර ක්‍රියාදාමයක් පිළිබඳව බුදුසමයේ කරුණු ඉදිරිපත් වී ඇත.

1) අත්ත හිතාය පටිපන්නො හොති. නො පරහිතාය.
   තමන්ගේ හිතසුව පිණිස ක්‍රියා කරයි.
   අනුන්ගේ හිතසුව පිණිස ක්‍රියා නොකරයි.

2) පරහිතාය පටිපන්නො හොති. නො අත්ත හිතාය.
තමන්ගේ යහපතට කටයුතු නොකරයි.
අනුන්ගේ යහපතට කටයුතු කරයි.

3) අත්ත හිතායි ච පටිපන්නො හොති. පරහිතායි ච.
තමාට ද අනුන්ට ද හිතසුව පිණිස කටයුතු කරයි.

4) නෙව අත්ත හිතාය පටිපන්නො හොති. නො පරහිතාය.

මෙම සිව් වැදෑරුම් ක්‍රියා අංගයන් තුළ තෙවනුව සඳහන් කරන්නට යෙදුන ක්‍රියාව පින් පිණිස පවතී. එබඳු වූ සමාජයට හිතකර තමන්ටත් හිත පිණිස පවතින ක්‍රියාදාමයන් ලෝක සම්මත වශයෙන් ද, සම්මුති වශයෙන් ද, නිවැරදි හෝ යහපත් ක්‍රියාවන් වශයෙන් ද අගැයීමට ලක් කරනු ලැබේ. මේ තුළ ගොඩනැඟෙන මානසිකත්වය සිත සැහැල්ලු බවට පත් කරන, ප්‍රීතියට පත් කරන ප්‍රසන්නාත්මක වූවකි. යම් ක්‍රියාවලියක් තුළ එබඳු මානසික සන්තුෂ්ටියක් ඇති වේ ද, එය පින වශයෙන් අටුවාවෙහි දැක්වේ.

"චිත්තං පුනාතීති පුඤ්ඤං - හදයං පුනාතීති පුඤ්ඤං"

සිත පිනා යෑම, හදවත පිනා යෑම පින නම් වේ. යම් කිසි නිවැරදි ක්‍රියාවක් සිදු කිරීම තුළ හදෙහි ඇති වන්නා වූ සන්තෘෂ්ටිය පුද්ගලයා තුළ නිරෝගී භාවය ඇති වීමට ද හේතු වේ.

මේ ආකාරයට සිදු කරන්නා වූ පුණ්‍යකර්මය කර්ම ස්ථර ගණයට අදාළ වේ. මෙසේ ක්‍රියාත්මක වන ස්ථර තුනකි:-

1. කර්ම ස්ථරය
2. මාර්ග ස්ථරය
3. බෝධි ස්ථරය

## කර්ම ස්ථරය

කර්ම ස්ථරය තුළ සිදු කෙරෙන්නේ පුණ්‍ය ක්‍රියාවන් ය. ඒ තුළ ක්‍රියාත්මක වන පුද්ගලයා දාන, ශීල, භාවනා ආදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා සිදු කළ ද ඒවායින් යමක් බලාපොරොත්තු වේ. නිර්වාණාධිග මය අවසානයට ඇති දෙව් මිනිස් සැප සම්පත් එම ප්‍රාර්ථනාව තුළ

ඇත. එයිනිදු නිර්වාණය පිළිබඳව ඇත්තේ අල්ප වූ ප්‍රාර්ථනාවකි. කාම සම්පත් ප්‍රාර්ථනයෙන් සිදු කරන්නා වූ නිවැරදි ක්‍රියාවන් කර්ම ස්ථරයට අයත් වේ.

## මාර්ග ස්ථරය

මාර්ග ස්ථරය තුළ යම් අවබෝධයක් මත පිහිටි පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වයෙහි හා අරමුණෙහි පැහැදිලි වෙනසක් දැකිය හැකි ය. ඔහු දාන, ශීල, භාවනා ආදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි නියුක්ත වන්නේ ලෝභ, දෝස, මෝහ ආදී අකුසල් මුල් මැඬීමේ අදහසිනුත් නිර්වාණාධිගමය සඳහා වූ කුසල් වැඩීමේ අදහසිනුත් ය. එබැවින් මාර්ග ස්ථරය තුළ කුසල කර්මයන් සිදු කෙරේ.

## බෝධි ස්ථරය

බෝධි ස්ථරය තුළ ක්‍රියාත්මක වන පුද්ගලයා සාමාන්‍ය පුහුදුන් අයෙක් නොවේ. ඔහු නිර්වාණාවබෝධය කර ගත් උතුමෙක් වේ. එබඳු පුද්ගලයෙක් කුසල් සිත් හා විපාක සිත් ඉතුරු නොවන පරිද්දෙන් නිරුද්ධ කොට ඇති බැවින් පින් හෝ කුසල් සිදු නොකරයි.

මෙහි දී පුඤ්ඤ සංකල්පය යටතේ අර්ථවත් වනුයේ කර්ම ස්ථරයයි. පින්කම් සිදු කරන පුද්ගලයා තමන්ටත් අනුන්ටත් හිත පිණිස පවතින්නා වූ දෙයක් ම සිදු කරයි. මෙහි දී පුඤ්ඤ සංකල්පය යටතේ අර්ථවත් වනුයේ කර්ම ස්ථරයයි. පින්කම් සිදු කරන පුද්ගලයා තමන්ටත් අනුන්ටත් හිත පිණිස පවතින්නා වූ දෙයක් ම සිදු කරයි. පින්කම් පිළිබඳව බුදුදහමේ දැක්වෙන කරුණු කාරණා දෙස බලන විට ප්‍රධාන වශයෙන් ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් පිළිබඳව සඳහන් වේ. එනම් දාන, ශීල, භාවනා වශයෙනි. ඊට අමතරව පින් වැඩෙන ක්‍රියාවන් අතර ආරාම සැකසීම, වන උයන් නිර්මාණය කිරීම, ඒදඬු පාලම් තැනීම, පින්තාලි, පැන් පොකුණු ආදිය තැනීම වශයෙන් දක්වා ඇත.

"තීනිමානි භික්ඛවෙ පුඤ්ඤකිරිය වත්ථූනි
කතමානි තීනිඃ - දානමයා, සීලමයා, භාවනාමයා"

"කෙසං දිවා ච රත්තො ච - සදා පුඤ්ඤං පවඩ්ඪති
ධම්මට්ඨා සීල සම්පන්නො - කෙ ජනා සග්ගගාමිනො"

"කවරකුට දිවාරෑ පින් වැඩේ ද? ධර්මයෙහි පිහිටි ශීල සම්පන්න කිනම් ජනයෝ ස්වර්ගයට යත් ද?" යනුවෙන් දෙවියකු විමසූ කල එයට පිළිතුරු වශයෙන් බුදු රජාණන් වහන්සේ වදාළේ,

"ආරාම රොපා වන රොපා - යෙ ජනා සෙතු කාරකා
පපඤ්ච උදපානඤ්ඤ - යෙ දදන්ති උපස්සයං

"තෙසං දිවා ච රත්තො ච - සදා පුඤ්ඤං පවඩ්ඪති

ධම්මට්ඨා සීල සම්පන්නො - තෙ ජනා සග්ගගාමිනො ති" වශයෙනි.

අංගුත්තර නිකායේ අට්ටක නිපාතයේ දේශනා වී ඇති ඉහත ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්ට අමතරව පුණ්‍ය ක්‍රියා 10ක් ව්‍යවහාරයේ පවතී. එනම් :-

1. දාන - දන් දීම
2. සීල - සිල් රැකීම
3. භාවනා - සිත වැඩීම
4. පත්තිදාන - පින් දීම
5. පත්තානුමෝදනා - පින් අනුමෝදන් කිරීම
6. වෙයයාවච්ච - වත් පිළිවෙත් ඉටු කිරීම
7. අපචායනය - වැඩිහිටියන්ට සැලකීම
8. ධම්ම දෙසනා - බණ කීම
9. ධම්ම සවණ - බණ ඇසීම
10. දිට්ඨිජුකම්ම - සම්මා දිට්ඨිය ඇති කර ගැනීම

දක්ෂ මාලාකරුවෙක් ඉතා අලංකාර අන්දමින් මල්මාලයක් සකසා ගන්නේ යම් සේ ද, එසේ ම තම ජීවිතය පින්වලින් සරසා ගත යුතු බව බුදු රජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

"යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලා ගුණෙ බහු
එවං ජාතෙන මච්චෙන - කත්තබ්බං කුසලං බහුං"

නිරන්තරයෙන් රාගාදී එකොළොස් ගින්නකින් දැවෙන මෙම පුද්ගල ජීවිතයෙහි ස්වල්ප හෝ පිනක් සිදු කර ගැනීම, ගිනි ගෙන

දැවෙන ගෙයින් යම් උපකරණයක් පිටතට ගැනීම හා සමාන කර ඇත.

බුදු සමයේ ආචාර ධර්ම පද්ධතියේ ඉතා ම වැදගත් සංකල්පය වන්නේ කුසල සංකල්පයයි. චර්යා ධර්මයන්ගේ ප්‍රාථමික විග්‍රහය පුණ්‍ය හා පාප සංකල්පය වන අතර උත්තරීතර චර්යා ධර්මය ලෙස කුසල සංකල්පය හැඳින්විය හැකි ය.

"සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියො දපනං - එතං බුද්ධානසාසනං"

සියලු පව් නොකිරීම, කුසල් රැස් කිරීම සහ සිත දමනය කර ගැනීම බුදුරදුන්ගේ අනුශාසනය වේ. පුද්ගලයාටත් සමාජයටත් හානිකර ක්‍රියා පාප වන අතර හිතකර ක්‍රියා කුසල යන නමින් ද හැඳින්වේ.

බුදු දහම පිළිගන්නා අයෙක් ප්‍රථමයෙන් ම තිසරණය සහිත පඤ්චශීලය සමාදන් වීම සිදු කරයි. එයින් අරඹන බෞද්ධ චර්යාවේ නික්ම යාම වන්නේ නිර්වාණාවබෝධයයි.

සිත හෙවත් මනස තුළ ඇති ශක්තිය චේතනාව ලෙස හඳුන්වයි. චේතනාව මුල් කර ගෙන සිදු වන ක්‍රියා කර්ම ලෙස හඳුන්වයි. " චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"

මනසෙහි මූලික අගය චේතනාව වන බැවින් ආකාරාත්මක ක්‍රියාවන්හි ආධිපත්‍යය උසුලන්නේ මනස ම බව අවධාරණය කෙරේ. "මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා" ධම්මපදයේ චිත්ත වග්ගය තුළින් මේ බව තව දුරටත් පැහැදිලි වේ.

මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී ද,

- පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා
  කායෙන කම්මං කාතබ්බං
- පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා
  වාචාය කම්මං කාතබ්බං
- පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා
  මනසා කම්මං කාතබ්බං

සිතින්, කයින්, වචනයෙන් යම් ක්‍රියාවක් සිදු කිරීමට පෙරාතුව ඒ පිළිබඳව නැවත නැවත සිතා බැලිය යුතු බව ඉන් අදහස් වේ.

"ඉදං මෙ කාය කම්මං
අත්තවහබාධායපි සංවත්ථෙය්‍ය
පරව්‍යාබාධායපි සංවත්ථෙය්‍ය
උභයව්‍යාබාධායපි සංවත්ථෙය්‍ය"

තමාටත් අනුන්ටත් හිතසුව පිණිස පවතින කර්ම සිදු කළ යුතු බවත්, තමන්ටත් අනුන්ටත් අහිතකර දේ නොකළ යුතු බවත් ය.

බුදු දහමෙහි පරම නිට්ඨාව නිර්වාණාවබෝධයයි. එය පරම කුසල නම් වේ. දුක් කෙළවර කිරීම, නිර්වාණාවබෝධය යනුවෙන් අරමුණු දෙකකි. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ පරිදි,

නිබ්බිදාය - කළකිරීම පිණිස

විරාගාය - නොඇලීම පිණිස

නිරොධාය - නැති කිරීම පිණිස

උපසමාය - සංසිඳීම පිණිස

අභිඤ්ඤාය - මනාව දැන ගැනීම පිණිස

සම්බොධාය - යථාවබෝධය පිණිස

නිබ්බානාය - විමුක්තිය පිණිස ධර්මය හේතු වේ.

තව ද, සත්ත්වයාගේ පාරිශුද්ධිය සඳහා, ශෝකය දුරු කිරීම සඳහා, දුක් දොම්නස් දුරු කිරීමට, අධිගමය සඳහා, නිවන් සුවය සඳහා, මෙලොව සැප සඳහා, මරණින් මතු සැපවත් ජීවිතයක් ගත කිරීමට, ස්වාර්ථ පරාර්ථ සාධනය ද බෞද්ධ ආචාර ධර්මයන්හි අරමුණු වේ. මංගල, පරාභව, සිගාලෝවාද, වසල, රතන වැනි සූත්‍ර ඉගැන්වීම පාදක කර ගත හැකි ය. එම සූත්‍ර දේශනා උභයාර්ථ සාධනය පිණිස බෙහෙවින් ඉවහල් වන ආචාර විද්‍යාත්මක අගයක් ගනු ලබන සූත්‍ර දේශනාවන් වේ.

ක්‍රියාවක හොඳ නරක නිශ්චය කිරීමේ දී කරුණු තුනක් ගැන සැලකීම වැදගත් වේ:-

අත්තාධිපතෙය්‍ය - තමාගේ හෘද සාක්ෂිය

ලොකාධිපතෙය්‍ය - ලෝක සම්මතය

ධම්මාධිපතෙය්‍ය - ධර්මෝපදේශය

මෙම කරුණු නොසලකා කටයුතු කිරීම තමන්ටත් සමාජයටත් අහිතකර වේ.

මේ ආකාරයට කරුණු විමසීමේ දී පතිරූප දේශයක විසීම ද මෙලොව පරලොව සුබසිද්ධියට හේතු වේ.

පඤ්චශීලයෙන් ආරම්භ වන බෞද්ධ ප්‍රතිපදාවේ අවසානය හෙවත් නිර්වාණය අත් කර ගැනීම ආත්මාර්ථය සාධනය කර ගැනීමයි. එසේ ආත්මාර්ථය සාධනය කර ගනු ලබන පුද්ගලයා පරාර්ථ සාධනය ද සිදු කරයි. සමස්ත බුද්ධ දේශනාවන් ම ඒ සඳහා උපයෝගී කර ගත හැකි ය. සසර දුක් විඳින සත්ත්වයා දුකින් මුදවා ගැනීමට යහපත් බුද්ධත්වයට (බෞද්ධ ප්‍රතිපදාවේ කූටප්‍රාප්තියට) පත් වූ පුද්ගලයෙක් සැබැවින් ම උභයාර්ථ සාධකය කර ගත් අයෙකි.

# මාර්ගයේ පරිපූර්ණත්වයට පත් වීම කියාදෙන මහා සළායතනික සූත්‍රය 16

බී. ඒ. විමලසේන

මෙලොව වාසය කරන සියලු සත්ත්වයෝ පංච ඉන්ද්‍රියයන් පිනවීම මත දිවි ගමන (සසර ගමන) පවත්වා ගෙන යති. ඇස - කන - නාසය - දිව - ශරීරය යන ආයතනයන් තමා හා ලෝකය හඳුනාග න්නට උදව් කරන අතර, එකී පසිඳුරන් පාලනය කරන ලද 'සිත' මඟින් මිනිසාට උසස් ජයග්‍රහණ අත් කර ගත හැකි ය. මෙහි දී ඉතා වැදගත් කරුණක් බුදු දහමේ ඉගැන්වීම හරය කොට පවතී. ඒ කුමක් ද? ඉඳුරන් පිනවීමේ ආශ්වාදනීය බව තුළ එහි ආදීනව තත්ත්වය පරීක්ෂා කිරීමෙන් ඉන්ද්‍රිය සංවරය සලසා ගත යුතු බවට කරන ඉගැන්වීමයි. එය දුකින් මිදීමට නැතහොත් නිස්සරණයට ද හේතු වෙයි. මෙය යථා තත්ත්වාවබෝධය හෙවත් 'ඇති සැටියෙන් දැකීම' මත පදනම් වී තිබේ.

මාතෘකාගත සූත්‍රය(1) අයත් මජ්ඣිම නිකායේ දී ආර්ය මාර්ගය අවබෝධ කර ගන්නට ඉන්ද්‍රිය පාලනය කළ යුතු ආකාරයත්, සසර දුකින් මිදීමට නැතහොත් මාර්ගයේ පරිපූර්ණත්වයට පුද්ගලයා යොමු කරන අයුරුත් අපි විමසීමට ලක් කරමු. නිර්බාධික ඉඳුරන් ඇතිව සිටිමින්, ලෝකයේ ඇති අරමුණු ගෙන, ඒවා තමාගේ ම බවට (සක්කාය දිට්ඨිය මත) පත් කර ගන්නා විට සසර වැඩේ. ඊට බැස ගනී. භවය නමින් හඳුන්වන එහි වඩ වඩාත් ඇල්මෙන් (භව රාමා) එහි ප්‍රමෝදයට පත්ව (භව රතා) ඉන් ආනන්දයට පත්ව (භව සමුද්දිතා) විසීම මත මේ ලෝකයට බැඳී සිටිති.

මෙසේ ක්‍රියා කරන තැනැත්තාට සසරින් මිදීමට කැමැත්තක් ඇත්තේ ම නැත. ඉතිවුත්තක පාළි දිට්ඨිගත සූත්‍රයේ දී ඔහුට භව

නිරෝධය සඳහා සිතක් උපදවා ගන්නට (චිත්තං පක්ඛන්දති) පැහැදීමට පත්වන්නට (පසීදති) ඒ මගෙහි සිත පිහිටුවීමට (සන්තිට්ඨති) වුවමනාවක් උපදින්නේ නැත. ඒ සසර ගත සත්ත්වයාගේ එක් පැත්තකි.

තවත් තැනැත්තෙක් සසර පැවැත්ම ගැන බලවත් කළකිරීමට පත්ව, බොහෝ අකැමැත්තෙන් හා පිළිකුළෙන් යුතුව (අට්ටියති - හරායති - ජිගුච්ඡති) භව නිරෝධය හදිසියේ ප්‍රාර්ථනා කරති. මේ කය බිඳීමෙන්, නැසීමෙන් පසු මතු එවැන්නක් නොවේවා'යි මරණය පතා අතිධාවනයෙන් ක්‍රියා කරති. මේ දෙදෙනා ම ඇස් ඇතිව (චක්ඛුමන්තෝ) ඇති දේ ඇති සැටියෙන් අවබෝධ නොකරති. (යථා භූතව අවබෝධ නොකරති.)(2)

සිත දකින්නට, සිත හඳුනාගන්නට, සිත දියුණු කර ගන්නට ඉඩ නොදෙමින් ලෝකයේ ඉඳුරන්ට ගොදුරු වෙන අරමුණු වෙත ම බැඳ ලන්නට, වෙළා ගන්නට මිනිසා පෙළඹෙන සැටි මොහොතක් සිතා බලන්න. ඇස - කන - නාසය - දිව - ශරීරය ඉඳුරන් මඟින් ඉල්ලා සිටින දේ සපයා දෙන්නට 'සිත' හැඩ ගැසී ඇත. ඒත් අපි හිතට දෙන්නේ අප්‍රමාණ දේ ලබා දෙමින්, දුටු-නුදුටු දේත්, ඇසූ පමණින් දන්නා දේත්, ලබා දෙන්නට විධානය කරන, සකසන ලද සිතක් නම්, ඒ හිත අප මෙහෙය වන්නේ රාගයට ගැතිව (අවිගත රාගෝ), ඡන්දයට ගැතිව (අවිගත ඡන්දෝ) පහ නොවූ ප්‍රේමය ඇතිව (අවිගත පේමෝ), පහ නොවූ පිපාසය ඇතිව (අවිගත පිපාසෝ), පහ නොවූ තණ්හා ඇතිව (අවිගත තණ්හෝ), පහ නොවූ දැවිලි ඇතිව (අවිගත පරිලාහෝ) මෙබඳු නොහික්මුණු මහිච්ඡතාවන් දෙසට නම්, මේ කාමාස්වාදය අප ගෙන යන්නේ සසර දුකට මයි.

ශරීරය පිනවන්නට, ශරීරය හැඩ කර ගන්නට, අනුන්ගේ ප්‍රදර්ශනයට තියන්නට, අලංකාර කර ගන්නට උත්සාහ කරන අය, තම සිතින් අප්‍රමාණ විධාන ලබා ගන්නේ, වඩ වඩාත් හොඳ ආශ්වාදජනක, සුපිරි පන්තියේ මෙවලම්, සුවඳ වර්ග, ආලේපන, සම්බාහන, වර්ණ හෝ බෙහෙත් ද්‍රව්‍ය, ඇතැම් විට හැඩය වෙනස් කරන ශල්‍යකර්මවලට පවා තල්ලු කරනු ලබයි. එසේ නම් දෙතිස් කුණපයන් රැගත් ශරීරයක්, ජීවිතය නඩත්තු කර ගන්නට ආධාරයක් ලෙස සුවපත්ව තබා ගන්නවා හැර කාමාතුර සත්ත්වයන්ගේ තැනට මිනිසා පත් වන්නේ කය ගැන මිස සිත ගැන නොසිතන බැවින් ම ය.

පරිසරයෙන් වටපිටාවෙන් හමු වන, තමාගෙන් බැහැර රූප කරා බැඳී සිටින මිනිසුන් ඒවා ලබා ගැනීමට, ඒවායේ රස විඳ ගැනීමට, ඒවා තමන් අයත් කර ගැනීමට ඒවා නොලැබෙන විට තම ජීවිතය වුවත් විනාශයට තල්ලු කර ගෙන යන්නේ, හදා නොගත් සිත ම බව නුවණින් දකින්න. ඇතැමෙක් ජීවත් වනවා යනු කා බී සැනසෙන, ලිංගික සන්තර්පනය ලබන, සුවදායක නිවාස වාහන ලබන, ප්‍රමුදිත ජීවිතයක්, දහසක් හිරිහැර කරදර ගැටලු ඇති මේ ලෝකයේ දී ලබා ගන්නට පොර බදන සැටි ද සිතා බලන්න. මේවා අපේ සිත ලෝකෝත්තර මාර්ගයට ගෙන යන්නට උදව් නොකරන සංසාර බන්ධන ලෙස සලකා අප්‍රමාදව යථා තත්ත්වයෙන් තමා දකින්නට උනන්දු වෙමු.(3)

මේ අදහස අපේ බෞද්ධ සමාජය කොපමණ කාලයක් දැන හඳුනාගෙන ඉන්නට ඇද්ද! අසා, කියවා, හිතේ තබා ගෙන සිටියා ද! කොපමණ දුරට ක්‍රියාත්මක කළේ ද!

බලන්න, ධම්මපද ගාථාවක එන මේ ඉගැන්වීම:-

සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු අසංවුතං

භොජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීනවීරියං

තං වෙ පසහති මාරො - වාතො රුක්ඛං ච දුබ්බලං

"සුභ අරමුණු යයි සිතා අසංවර ඉන්ද්‍රියයන් මඟ පෙන්වන, වැරැද්දට බැඳී සිටිමින්, ආහාරයේ පමණ නොදැන, කුසීත වූ, හීන වීර්යය ඇතිව, (කාම - ව්‍යාපාද - විහිංසා - විතර්කයන්ට බැඳී) මරු වසඟයට යන්නේ දුර්වල ගසක් වාත වේගයෙන් පෙරළා දමන්නා සේ ය."(4)

මෙයින් අපට දෙන ඔවදන කදිමයි නේ ද?

බුදු රදුහු මහා සළායතනික සූත්‍රයේ දී ඉන්ද්‍රිය සංවරය පවත්වා ගත යුතු ආකාරය මෙසේ ශ්‍රාවකයාගේ අවධානයට ලක් කළහ. " ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් චක්ඛු සම්ඵස්සයත් නිසා තමාට දැනෙන සුව සහගත (සුඛ) දුක් සහගත (දුක්ඛ) මැදහත් වූ (උපේක්ඛා) වේදනාවන් ගැන ඇති සැටියෙන් සිතන්නටත්, එහි ආදීනව දැන ගෙන එහි නොඇලී සිටින්නටත් ලැබෙන පුහුණුව ලබා ගන්නට" උගන්වයි. මෙසේ කන (සෝත) නාසය (ඝාන) දිව (ජිව්හා) ශරීරය

(කාය) හැසිරෙන හැටි සිතන්නට ඉඩ සලසයි. සිත - සිතිවිලි - මනෝ විඤ්ඤාණය - මනෝ සම්ඵස්සය නිසා ඇති වන සුඛ-දුක්ඛ-උපේක්ඛා වේදනා ගැනත් සිතන්න. ඇති සැටියෙන් දන්නා වූත්, ඇති සැටියෙන් දක්නා වූත් ඔහු එයට නොඇලෙයි. සංයෝජනයන්ට බැඳෙන්නේ නැත. මුලාවට පත් නොවී සසර දුක මෙනෙහි කර ගෙන තණ්හාව හා පඤ්චස්කන්ධයට (නාම-රූප) උපාදානය නැති කෙරෙයි. පුනර්භවයට ඉවහල් වන තෘෂ්ණාව නැසීමෙන් මානසික හා චෛතසික සොම්නස උපදී. මෙතැන දී ඔහුට විමුක්ති මාර්ගයට දොරටු විවෘත වෙයි.

එවැනි කෙනකු තුළ යම් දැකීමක් වේ ද? එය සම්මා දිට්ඨියයි. යම් සංකල්පයක් වේ ද? එය සම්මා සංකල්පයයි. සමාහිත වචන ඇත්තේ වේ ද? එය සම්මා වාචායි. යම් දැමුණු කර්මාන්ත ඇත්තේ වේ ද? එය සම්මා කම්මන්තයි. යම් ආජීවයක් වේ ද? එය සම්මා ආජීවයයි. යම් ප්‍රධාන වීර්යයක් වේ ද? එය සම්මා වායාමයයි. ඇති සැටියෙන් දකිනා සිතක් වේ ද? එය සම්මා සතියයි. යම් සමාධියක් වේ ද? එය සම්මා සමාධියයි.

මෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගය තමන් තුළ වර්ධනය කරනුයේ මතු දැක්වෙන ධර්ම උපදවා ගැනීමට ද අවස්ථාව සලසා ගනී. සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධාන වීර්යය, සතර ඍද්ධිපාද ධර්ම, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල ධර්ම, සප්ත බෝධ්‍යංග ධර්ම මඟින් ඔහු පූර්ණත්වයට පත් කෙරෙයි.

බෞද්ධ විශ්වකෝෂය(5) මේ සූත්‍රාගත ඉගැන්වීම මෙසේ පිඬු කොට දක්වා ඇතः-

1. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් (විදර්ශනාව) දැන ගත යුතු ධර්ම කවරේ ද?
    - උපාදානය සඳහා අරමුණු වන රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යන පංචස්කන්ධයයි.
2. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් පහ කළ යුතු දේ මොනවා ද?
    - මුළාව (අවිජ්ජා) සහ පැවැත්මට ඇති ආශාව (භව තණ්හා)

3. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් අවබෝධ කළ යුතු දේ මොනවා ද?

- ප්‍රඥාව (විජ්ජා) සහ විමුක්ති ඥාන (විමුත්ති)

4. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් වැඩිය යුතු දේ මොනවා ද?

- සමථ හා විපස්සනා භාවනා ය.

පස්කම් සැප විඳින්නන් හැටියට එයින් මිදෙන්නට හැකි විමුක්ති මාර්ගය ද දැන සිටිය යුත්තේ මරණින් මතු ජීවිතයක දී තමා කෙරෙහි සතුටුදායකව මුහුණදීමට හැකි අධිෂ්ඨාන සහගත භාවයකිනි. (පරලොව ඇතත් නැතත් කුසල සේවනය (පින්කම් කිරීම) කළ යුතු බව හඳුනාග ැනීම වැදගත් ය.)

දිනක් බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටිය දී ආයුෂ්මත් සංග්‍රාම ජිත් හිමි(6) ඊට යාබද කුටි සෙනසුනක සිට එහි පැමිණ සිට අතර විවේක කාලය තුළ රුක් මුලක විවේක සුවයෙන් වැඩ සිටියේ ය. මේ අවස්ථාවේ ඔහුගේ පුරාණ භාර්යාව කුඩා දරුවකු රැගෙන ඇවිත් ඒ හිමියන් ඉදිරියේ කුඩා දරුවා තබා, "ශ්‍රමණයන් වහන්ස, කුඩා පුතකු ඇත්තෙමි; මා පුස්නේ යැ"යි කීවා ය. (බුද්ද පුත්තාම්හි සමණ, පෝසමන්ති.) එක් වරක්, දෙවරක්, තුන් වරක් නොව කිහිප වාරයක් කීවත් ඔහු භාවනාවෙහි යෙදී සිටියා මිස ඒ දෙසවත් නොබැලුවේ ය. ඒ මව දරුවා එතැන ම තබා මඳ දුරක් ගොස් සැඟවී සිට නැවත හැරී අවුත් තම දරුවා ද රැගෙන යන්නට ගියා ය. භාග්‍යවතුන් වහන්සේට මෙම කරුණ දැන ගන්නට ලැබී බොහෝ භික්ෂූන් අතර මෙම උදානය පළ කළ සේක:-

"ආයන්තිං නාභිනන්දති - පක්කමන්තිං න සෝචති
සංගා සංගාමජිං මුත්තං - තම්හං බෲහි බ්‍රාහ්මණන්ති"

එන්නියට ද සතුටු නොවෙයි; බැහැර යන්නිය දැක ද ශෝක නොකරයි. (රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි යන පඤ්ච විධ) සංගයන්ගෙ න් මිදුණ ඒ සංග්‍රාමජිත් භික්ෂුව බ්‍රාහ්මණයෙකැ'යි මම කියමි.

ලොවට බැඳී සිටීමෙන් මිදීම විමුක්ති මාර්ගය ලෙස දැක යථා තත්ත්වාවබෝධය ඇති කර ගෙන කටයුතු කරමු.

පාදක සටහන්

1. මජ්ඣිම නිකාය - මහා සළායතනික සූත්‍රය
2. ඛුද්දක නිකාය - ඉතිවුත්තක පාළි - දිට්ඨිගත සූත්‍රය
3. අංගුත්තර නිකාය - 5 නිපාතය - විනිබන්ධ සූත්‍රය
4. ධම්මපද - යමක වග්ග - 7 ගාථාව
5. බෞද්ධ විශ්වකෝෂය - පූජ්‍ය ඥානතිලෝක හිමි (පිටු 440-441)
6. ඛුද්දක නිකාය - උදාන පාළි - බෝධි වග්ග - සංගාමජී සූත්‍රය (පිටු 138-140)

# සච්චානුලෝමික විදර්ශනා ඤාණය 17

පී.බී. තිලකරත්න

තමා අදහන ආගම තුළ සත්‍යය ඇතැයි මිනිස්සු විශ්වාස කරන අතර අනෙක් ආගම් පිළිබඳ විශ්වාසයක් තබා නොගනිති. මෙයින් අදහස් වන්නේ ආගමක් තුළින් සත්‍යය දැකිය නොහැකි බවයි. බුදු රජාණන් වහන්සේ දෙසූ දහම තුළ ඇත්තේ නිර්වාණගාමී ප්‍රතිපදාවයි. එනම් සත්‍යය දැකීමට කියා දුන් මාර්ගයයි. උන් වහන්සේ දේශනා කළේ කාහට වත් බොරු කළ නොහැකි පරම සත්‍ය හතරකි. එනම් චතුරාර්ය සත්‍යයයි. එය විවිධ ආගම් අදහන සියලු මනුෂ්‍ය වර්ගයාට ම පොදු වූ ධර්මතාවකි.

මෙම සත්‍ය සතර අවබෝධ කිරීමට අවශ්‍ය වන ප්‍රධාන කාරණය නම් විමංසන බුද්ධියයි. එහි දී ආශාවන්ගෙන් තොර වූ පිවිතුරු මනසක් ඇති වෙයි. එවිට ඇති වන යහපත් හැසිරීම සියල්ලන් කෙරෙහි මෛත්‍රිය පතුරවයි. එහි තුළ කරුණාව දයාව ඇති වෙයි. මෙහි දී තමන්ගේ හදවතට හා මනසට දැනෙන්නේ තමා පැවිදි ජීවිතයක් ගත කරන බවකි. මේ සියල්ල ලබා ගත හැක්කේ සියල්ල අතහැරිය තරමට ය.

මනුෂ්‍ය ස්වභාවය නම් සෑම දෙයකින් ම වේදනාවන්ගෙන් පෙළීමයි. මෙහි දී ඇති වන ප්‍රතික්‍රියා නම් යහපත්, දුෂ්ඨ හා මධ්‍යස්ථ වශයෙන් මිනිසුන් බෙදීමයි. බෙදීමකින් තොරව සෑමට ම එක සේ මෛත්‍රී කළ හැකි තැනැත්තා ය, උතුම් පුද්ගලයා වන්නේ, ආශාවන් නිසා ඇති වන ආදරය නම් වූ මිථ්‍යාව ලෝභ මූලිකව සිදු වන නිසා එහි ඇත්තේ රාගය බව තේරුම් ගත යුතු ය.

ව්‍යවහාරික 'ආදරය' යනු ආත්මාර්ථය තුළින් බිහි වන ලෝභ සහගත සිතකි. එබැවින් කෙනෙකුට අවශ්‍ය වන්නේ එම ආදරය නොව මෛත්‍රිය හා කරුණාව ය. සියලු සත්ත්වයන්ටම එය පොදු ය. මිනීමරුවකුට පවා එය අවශ්‍ය ය. අංගුලිමාල නම් වූ අහිංසක, රහතන් වහන්සේ කෙනකු වූයේ බුදු රජාණන් වහන්සේගේ මෛත්‍රිය හා කරුණාව නිසා ය. ආදරය නමින් බොහෝ විට ඇත්තේ මිථ්‍යාවක් බව තේරුම් ගත හැකි ය. ආදරය කිරීම හෝ ලැබීම ලෝභ මූලිකව සිදු වන බැවින් දුකට හේතුවක් වෙයි. තිරිසන් සතකුට වුව ද අවශ්‍ය වන්නේ ආදරය නොව මෛත්‍රිය හා කරුණාව ය. දෙමව්පියන් දරුවන් කෙරෙහි පැවැතිය යුත්තේ, මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සිව් බඹ විහරණයයි. එය බැඳීම්වලින් තොර ය. බැඳීම්වලට මූලික වූ ආදරය සසරට හේතු වෙයි. ලෝභ සහගත සිතක් වන බැවිනි.

විෂය දැනුමක් හැටියට බුදු දහම ඉගෙනීමට, වඩා අවශ්‍ය වන්නේ එය ඉක්මවා ගිය අවබෝධයක අවශ්‍යතාවයි. එය අන් සියල්ලට ම වඩා වැදගත් ය. ජාති, ආගම්, කුල වශයෙන් සාම්ප්‍රදායිකව සත්ත්වයා බෙදී ඇති මුත් අවබෝධය ලද තැනැත්තාට එසේ බෙදිය නොහැකි ය. විද්‍යාත්මකව ද මිනිසා එසේ බෙදිය නොහැකි ය. බෙදීම තුළ තරගයක් නිර්මාණය වෙයි. තරගය තුළින් අකාරුණික මනුෂ්‍යයෝ බිහි වෙති. මෙය තේරුම් ගැනීමට ආගමික සම්ප්‍රදායයන් හෝ දෙවියන් වෙත යාමට වඩා අවශ්‍ය වන්නේ තමාගේ අභ්‍යන්තරය දෙසට යාම ය. සියලු ම ධර්මතාවන්ට වඩා වැදගත් වන්නේ ආත්මඥානය ලබා ගැනීම හෙවත් තමා තේරුම් ගැනීම ය. එහි දී තමා බලාපොරොත්තු වන සහනශීලී ජීවිතයේ ආරම්භය උදා වෙයි. දෙවියන් තමා යයි සිතෙන තරමට හෝ දෙවියන් ද සිටින්නේ තමා තුළ යයි අවබෝධයේ ආරම්භය ද ඇති වෙයි.

සියලු ම ජීවිහු ලෝකයේ ම කොටසකි. වෙන් වෙන්ව වාසය කලත් සත්‍යය නම් එයයි. මානසික ස්වභාවයන් ද එක හා සමාන ය. ලෝකයේ කොතැනක හෝ මිය යන තැනැත්තා පිටස්තර අයකු නොවන බව මින් පැහැදිලි ය. එවිට තමා යන්නෙන් වෙන් වූ අයකු නොමැති බවත්, තමාගේ නොවන අයෙක් නොමැති බවත් වැටහෙයි. මෙහි දී දුක පිළිබඳව තේරුම් ගැනීම පහසු ය. එම අවබෝධය ලැබීමේ සියලු අවශ්‍යතාවන් ඇත්තේ ද මිනිසා තුළ ම ය. බුදු දහමින් පෙන්වා දෙන්නේ ඊට මාර්ගයයි.

විෂය දැනුම තුළින් ද අප ලබා ගන්නේ යම් යම් දේ පිළිබඳ සංඥාවන් ය. මේ සංඥාවන්, දැනුම ලෙසත්, ඥානය ලෙසත් සසරට හේතු වන සංඥා උපාදානස්කන්ධය ඇති

කිරීමට හේතු වෙයි. අප තුළ ගොඩ නැඟෙන, ලෝකය පිළිබඳ සියලු සංඥාවන්ගෙන් නිදහස් වීම අසීරු කරුණක් නිසා සත්ත්වයා භවයෙන් භවයට ගොස් දුක් විඳියි.

මේ ලෝකය හැඟීම් සහ විශ්වාසයන් මත ගොඩනැගුණ සම්මතය බව අවබෝධ වන විට සත්‍ය වූ ලෝකය කුමක් දැයි දැකීමට යොමු වන්නේ විදර්ශනාව පිළිබඳව ක්‍රියාත්මක වීමේ දී ය. එහි දී තමා යන්නෙන් ඇති සියලු දේ තමාගේ තිබූ සියලු සංකල්පවලින් නිදහස් වෙයි. තමා යන්නෙන් අදහස් වූයේ, මෙතෙක් කල් සංසාරයේ, අරමුණු හා බැඳුණ පංචේන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරී බවයි. එය අක්‍රිය වූ විට සත්‍යය ක්‍රියාත්මක වෙයි. පුද පූජා හා ඇදහිලි මඟින් ද සිදු වන්නේ අරමුණු හා බැඳුණ පංචේන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරී බවයි. සත්‍යය ක්‍රියාකාරී වීමට නම් සියල්ලෙන් මිදිය යුතු ය.

අරමුණු හා නොබැඳුණ සිත පින් හෝ පව් කියා දෙයක් නොකරයි. එහෙත් අරමුණු ඇති ලොවක ජීවත් වෙමින් ලෝකයෙන් එතෙරව වෙසෙයි. වර්තමාන ක්ෂණ මාත්‍රයේ ජීවත් වෙමින් අතීත අනාගත සංකල්පවලින් සම්පූර්ණයෙන් මිදෙයි.

සිත, කය, වචනය යන තුන් දොර සංවර කර ගත් සිල්වත් තැනැත්තකුට සිල් රැකීමට යයි අමුතු උත්සාහයක යෙදුණොත් එය අවබෝධයට බාධාවක් විය හැකි ය. යමක්

දැකීමේ දී හෝ ඇසීමේ දී ඇති වන ක්‍රියාවලියට උත්සාහයක් අවශ්‍ය නොවන්නාක් මෙනි. එහි දී පව් හෝ පින් කියා දෙයක් සිදු නොවේ. තුන් දොර සංවර වූ විට එසේ සිදු වන්නේ නම් "පුඤ්ඤාපාපපහීන" යන අර්ථය දිය නොහැකි ය. නිවනෙහි පින් හෝ පව් යන දෙක ම නැති බැවිනි.

ඇසින් රූපයක් දැකීම, කනින් ශබ්දයක් ඇසීම යන ක්‍රියාවලියන්හී දී තමා තුළ යම් මනාපයක් හෝ අමනාපයක් ඇති වන්නේ නම් ඒ ගැන විමසීමෙන් සිටීම භාවනාවයි. එදිනෙදා ජීවිතයේ දී සිදු වන දේ ගැන

පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් නොකර උපේක්ෂා සහගතව විමසිල්ලෙන් සිටිය යුතු ය. සිදුහත් බෝසතාණන් වහන්සේ සත්‍යය දුටුවේ සියලු ආගම්, දර්ශන, ඇතුළු සියලු දෘෂ්ටීන්ගෙන් ඉවත් වූ පසුව ය. වැරදි දෘෂ්ටීන්ට, නොදැනුවත්කම බලපාන අතර ආගමික චාරිත්‍රාදිය ද ආධ්‍යාත්මික සංවර්ධනයට බාධාවක් විය හැකි ය. සිදුහත් චරිතයෙන් එය අපට වටහා ගත හැකි ය.

මිනිසාට පෞද්ගලික ප්‍රතිරූපයක් ගොඩ නැඟීමට අවශ්‍ය වෙන්නේ ආරක්ෂක වැටක් හැටියට ය. එය මිනිසා විසින් ආගමික වශයෙන් හෝ දේශපාලනික වශයෙන් ද ගොඩ නගා ගනී.

විෂය දැනුමට වඩා අවශ්‍ය වන්නේ ආත්මාවබෝධය ය. ආගමික සම්ප්‍රදායයන් හෝ දෙවියන් වෙතට යාමෙන් වත් තමා පිළිබඳ අවබෝධය ලබා ගත නොහැකි ය. දයාන්විත වූත් සරල වූත් ජීවිතයක් ලබා ගත හැක්කේ තමා පිළිබද අවබෝධයෙනි. එය ලබා ගත් අය පණ්ඩිත භාවය හැර දමා කුඩා දරුවන් සේ ජීවත් වෙති.

තමා පිළිබඳ නිරීක්ෂණයෙන් තොරව අන්‍යයන් නිරීක්ෂණය කරන්නට යාමේ දී ඇති වන්නේ ගැටුම් ස්වරූපයකි. මිනිස් ගැටුම්වලට ප්‍රධාන ම හේතුව ද මෙයයි. නිතර ම තමා විසින් ම තමාව නිරීක්ෂණය කරන්න. එවිට ගැටුම් නවතී. තව ද මෙසේ කිරීමේ දී විශ්වයත් තමාත් අතර වෙනසක් නැති බවත්, තමාත් විශ්වයේ ම කොටසක් බවත් අවබෝධ වෙයි. මෙය නම් ඥානයේ උසස් ම ඵලයයි. තමා ලෝකයෙන් ද ලෝකය තමාගෙන් ද වෙන් කළ නොහැකි ය.

“ආදරය” තේරුම් ගත නොහැකි බව හැම දෙනාට ම ඇති වන ගැටලුවකි. එසේ වන්නේ එහි තුළ දුක වේදනාව, සුවය සහ ඊර්ෂ්‍යාව ඇති බැවිනි. ආශාව තුළ ආදරය ඇති බවත්, එහි තුළ තරගකාරී බවත් තිබෙන බවත්, ඒ අතර ම එහි තුළ ඇති මෘදු බවත් තිබෙන බවත් සිතයි. එහෙත් ඇත්තේ දුකක් බව නොසිතයි. සෑම දෙයකින් ම වේදනාවන්ගෙන් පෙළෙන මිනිසා පිළිබඳ හරි අවබෝධය තමා තුළින් ම දැක ගත හොත් සැබෑ ආදරය හඳුනාගත හැකි වේ. කෙනකුට අව්‍යාජ ලෙස ආදරය කළ හැක්කේ එවිට ය. සැබෑ සතුට ලබා ගත හැක්කේ සැමට සාධාරන වූ හඳුනා ගැනීමෙනි. අනුන්ගේ වේදනාව තමන්ගේ වේදනාව යයි දෙකක් නොවේ. එය වටහා ගැනීම සැබෑ ආදරයේ පදනමයි.

තනිකම, අවිනිශ්චිත බව, ඊර්ෂ්‍යාව, අනාගතය ගැන බිය, ලෝභය, අනුන් තුළ මෙන් ම තමා තුළ ද සමානව පවතී. එසේ වූ විට තමා අනුන්ගෙන් ද අනුන් තමාගෙන් ද වෙන් කළ නොහැකි ය. මේ බව තේරුම් ගත් විට අමුතු ශක්තියක් තමා තුළ ඇති වන බව වටහා ගත හැකි ය. ජාති ජරා මරණ ආදී සියලු දුක් සියලු දෙනාට ම එක සමාන ය. එය මරණය තෙක් ගෙවන දුඃඛිත ජීවිතයයි. සෑම කෙනෙක් ම එක ම පංචස්කන්ධයන් ම ය. එහෙත් තමා පිළිබඳවත් අන්‍යයන් පිළිබඳවත්, බෞද්ධ, අබෞද්ධ, සිංහල, දෙමළ උගත්, නූගත්, දුප්පත්, පොහොසක්, ආදී වශයෙන් ඇති කර ගන්නා සංඥා කීපයකි. මේ සංඥාවෝ යථාවබෝධයට මහත් ම බාධාවකි, දුකට හේතුවකි.

සියලු සංස්කාර ධර්යයෝ ම දුකට හේතු වෙති. සැප යයි සිතන සියලු දේ තුළ ද දුක ඇති බව එයින් වටහා ගත හැකි ය. සැප යයි සිතා රැස් කළ සියලු ධනය, කීර්ති ප්‍රශංසා, ගරු නම්බුනාම, උගත්කම් සියල්ල අත හැර යෑමට සිදු වෙයි. එහෙයින් සැපයද දුකකි. මගේ ය යන සියලු දෙයින් දුක ඇති වෙයි.

මගේ ය කියා දෙයක් නොවන විට ද අයිති කර ගැනීමේ දුක ඇති වෙයි. මෙය මට අයත් දේ ය, මෙය මට අයත් නොවන අනුන්ගේ දේ ය යන හැඟිමෙන් මිදුණ කල ශෝකයෙන් හා දුකෙන් මිදිය හැකි වේ.

අනන්ත සංසාරයේ සිට නොකඩා පැවැත ආ මම ය මාගේ ය යන සංඥාව උපාදානස්කන්ධයක් බවට පත් වී ඉදිරි භවයන් ද තහවුරු වේ. අවිද්‍යාව ප්‍රධාන වී සිදු වන මෙම ක්‍රියාවලිය නවතා ලිය හැක්කේ අවිද්‍යාවෙන් මිදී ප්‍රඥාව ඇති කර ගැනීමෙනි. රහතන් වහන්සේට ද ඒ තත්ත්වට පත් විය හැක්කේ අන්තිම වශයෙන් වූ සංයෝජන ධර්මය වන අවිද්‍යාව ද ප්‍රහීන කිරීමෙනි.

උපදින විට බිළිඳාට ජාති, කුල, ආගම, පක්ෂ ආදී භේද පිළිබඳ හැඟීමක් නැත. සිංහල මවකගේ බිළිඳකු මුස්ලිම් මවකට භාර කළොත් ඒ ළමයාගේ කුලය, ජාතිය, ආගම, සියල්ල ඒ අනුව ගොඩ නැඟේ. මේ ගොඩ නඟා ගත් තමාගේ ලෝකය පිළිබඳ සත්‍යය හෝ ඊට විරුද්ධ යයි නැඟෙන යම් දෙයක් ප්‍රකාශ කළහොත් වේදනාවට පත් වෙයි. කෝපයට පත් වී ගැටුම්කාරී තත්ත්වයට ද පත් විය හැකි ය. එහෙත්

සත්‍ය වශයෙන් ම ඇත්තේ දෘෂ්ටිමය ලෝකයකි. තමා යන මේ දෘෂ්ටිය ලෝකය මැන ගැනීමේ දී තෘෂ්ණාව මුල් වේ. දෘෂ්ටිය තහවුරු කර ගැනීමට ක්‍රියා කරයි. එය උපාදානය බවට පත් වෙයි. මෙය වැඩෙන විට සතුටට පත් වෙමින් ද, බිඳ වැටෙන විට දුක් වෙමින් ද විවිධ අවුල් වියවුල් හා ගැටුම් ඇති කර ගනිමින් සිය මරණය තෙක් ම අනේක විධ දුක් දොම්නස්වලින් ගහන දුක්ඛිත ජීවිතයක් ම ගෙන යයි. සත්‍ය වශයෙන් ම තමාට තමා අවබෝධ කර ගන්නා තෙක් ජීවත් වන්නට සිදු වන්නේ නොයෙක් ආකාරයේ ගැටුම් මැද දුකින් පිරුණු ලෝකයක ය.

දස අකුසලයෙන් මිදී ධාර්මික ජීවිතයක් ගත කළත් රහත් බව ලබන තෙක් ම අනුසය වශයෙන් වූ කෙලෙස් සත්ත්ව සංතානය තුළ ඇත. ඇස් කන් නාසා ආදී පංචේන්ද්‍රියයන් යළි යළිත් අරමුණු කෙරෙහි තෘෂ්ණාවන් උපදවයි. මේ බව ඒ ඒ අවස්ථාවේ දී ම දැකිය හැකි නම් තෘෂ්ණාවෙන් මිදී දුකට හේතු වන සිත්වලින් මිදිය හැකි ය.

චාරිත්‍ර ධර්මයක් හැටියට හෝ අභ්‍යාසයක් ලැබීමේ ක්‍රමයක් හැටියට හෝ ශීල ව්‍රතයක යෙදීම බෞද්ධ ඉගෙන්වීමක් හැටියට සැලකිය නොහැකි ය. ඒ ඒ අවස්ථාවේ දී සිත කය වචනය ක්‍රියාත්මක වීම පිළිබඳ අවදියෙන් සිට ඇලීමකින් හෝ ගැටීමකින් තොරව උපේක්ෂා වීම ශීලය හැටියට සැලකිය හැකි ය. එහි දී අභ්‍යන්තරික වශයෙන් සියලු දෙයින් නිදහස් වූ විට භය රහිත, යහපත් ජීවිතයක් ගත කළ හැකි වේ. එහි දී බලයට ඇති කෑදරකම, නොයෙක් ආශාවන්, සිත් තැවුල්, හැසිරෙන ආකාරය, වචනය හසුරුවන ආකාරය ආදී තමා සම්බන්ධ වූ සියල්ල තේරුම් ගත හැකි ය. තමාගේ යථා තත්ත්වය තේරුම් ගැනීම මිස, තමා මෙසේ විය යුතු යයි බලාපොරොත්තු වන සැටි ගැන සිතීම නොකළ යුතු ය.

ආගම, ජාතිය, කුලය, පක්ෂ හා දෙවියන් පිළිබඳව තමන් ආරෝපිතව සිටින තත්ත්වයේ, උසස් බව පෙන්වීමට උත්සාහ ගැනීම මනුෂ්‍ය ස්වභාවයයි. සත්‍ය නොවූ මෙම ක්‍රියාව තුළ ප්‍රශ්න විසඳීමක් සිදු නොවන අතර, විනාශකාරී ගැටුම්වලට මූලික වෙයි.

තමාගේ අභ්‍යන්තරයේ සත්‍යය අවබෝධ කර ගැනීමට බුදුදහම මාර්ගය කියා දෙයි. එම මාර්ගයේ නොගොසින් එම මාර්ගය තුළ ඇති අදහස්, තමන්ගේ දෘෂ්ටීන් අතරට තවත් දෘෂ්ටියක් ලෙස එකතු කර

ගනිමින් වන්දනා මාන කරන, පුද පූජා කරන, ආගමක් නිර්මාණය කර ගනියි. මෙසේ නිර්මාණය කර ගත් ආගම් අතර ගැටුම් ඇති වෙයි. සත්‍යාවබෝධයට මහත් ම බාධාවක් වී ඇත්තේ ද මෙයයි. බුදු දහමට සම්බන්ධ සාහිත්‍යයේ එන කාලාම සූත්‍රය සත්‍යාවබෝධයට හොඳ පිටිවහලක් වෙයි.

කුඩා කල සිට ලබාගත් විෂය දැනුම තමාගේ ජීවනෝපායයට පිටිවහලක් විය හැකි ය. එසේ ම එය උසස් ලෙස සලකමින් උගතුන් ලෙස පෙනී සිටිමට ද හැකි ය. එහෙත් එම උගත් බව තුළ යථාවබෝධය නොමැති නම් එහි ඇත්තේ අවිද්‍යාව බව තේරුම් ගත යුතු ය.

සුදුසු අරමුණක් ගෙන භාවනානුයෝගී වීමෙන් රාග සිත්වලින් මිදිය හැකි ය. සමථ භාවනාවෙන් එසේ සිදු වන අතර, විදර්ශනා භාවනානුයෝගි වීම ප්‍රඥාව වඩවා ගැනීමට අවශ්‍ය ම ය. අවිද්‍යාව ප්‍රහීණ කළ හැක්කේ ඒ තුළින් පමණි. එවිට එතෙක් ජීවත් වූ මායා ලෝකය පිළිබඳ සත්‍යය දකිනු ඇත. මෙසේ ප්‍රඥාව ලද පසු ලෝකය පිළිබඳ සැබෑ දැනුමින් යුතු ඥානය ද, විද්‍යාව ද, ඒ තුළින් පහළ වන ආලෝකය ද උදා වෙයි. මේ ආලෝකය තුළින්, සැබෑ ලෝකය දෙස අලුත් ඇසකින් බැලිය හැකි ය. මෙතෙක් කල් තමා තුළ සිර කර ගෙන සිටි, සම්මත වශයෙන් බදා ගෙන සිටි, ආගම්, ජාති, කුල, දර්ශන පක්ෂ ආදී සියලු දෙයෙහි සැබෑ අරුත වැටහෙයි. සිතට නිදහසක් නොදෙන එම බැඳීම්වලින් මිදීමේ මනසක් තුළින් මනසට ම ආලෝකයක් වෙයි.

සිදුහත් බෝසතාණන් වහන්සේ එවකට තිබූ භාවනා ක්‍රම සියල්ල ම වාගේ නිරීක්ෂණය කළ උතුමෙකි. භාවනාවෙන් ලබන සමාධීන් තුළින් ද විමුක්තිය ලබා ගත නොහැකි බව උන්වහන්සේට වැටහිණ. මේ සාමාධීන් උත්සාහයෙන් සකස් කළ දේ ය. මේ සමාධීන් ඉක්මවා යන තත්ත්වයක් ඇති බව වැටහුණ උන් වහන්සේ එම තත්ත්වය තනියම සොයා ගෙන උතුම් වූ බුද්ධත්ත්වයට පත් වූ සේක. එහි කිසිවක් නැත. කිසිවක් තිබුණේ නම් එතැන නිවන ද නැත. මේ සඳහා "ශූන්‍යතාව" යන වචනය යෙදිය හැකි නමුදු එය වචනයෙන් විස්තර කළ නොහැකි පරමාර්ථ සත්‍යයයි.

මෙම සත්‍යය පැහැදිලි කර ගැනීමට සරලව සිතිය හැකි ය. අපගේ ශරීරය තුළ ලේ ගමන් කරයි. හෘදය ස්පන්දනය වෙයි. ආශ්වාස

ප්‍රශ්වාස කරයි. ඉන්ද්‍රියයන් ක්‍රියාකාරී වෙයි. මෙය තමා යයි කියන අය විසින් කරන දෙයක් නොවේ. අන්‍යයන් කරන දෙයක් ද නොවේ. තද නින්දේ සිටියත් ක්‍රියාත්මක වේ. මෙසේ ස්කන්ධයන්ගේ ක්‍රියාකාරී බව මුත් ක්‍රියා කරවන කෙනෙක් නැත. එසේ නම් අප සිතනවා යයි කීවත් සිතන කෙනෙක් ද නැත. මෙහි දී "මම" යයි කෙනෙක් සිටිනවා ද යන්නට පිළිතුරු ලැබෙයි. "මම" යන්නෙන් අදහස් වන්නේ ව්‍යවහාරික හෙවත් සම්මුතියෙන් ඇති කර ගත් මතයක් පමණක් බව වැටහෙයි.

නිතර නිතර වෙනස් වෙමින් පවතින මේ ලෝකයේ නිත්‍ය වන රූපයක් හෝ වෙනස් නොවන මානසික ස්වභාවයක් ද නැත. එසේ නම් නිත්‍ය වූ දෙවි කෙනෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ සිටිය නොහැකි ය. සියලු සංස්කාර ධර්මයන් ම අනිත්‍ය යයි පැවසෙන්නේ එබැවිනි. මෙය ප්‍රඥාවෙන් බැලීමේ දී දුක පිළිබඳ අවබෝධ ඥානය ඇති වෙයි. අනිත්‍ය වූ මේ ශරීරය යයි කියනු ලබන රූපය මරණය ද රැගෙන උපදියි. ඒ සමඟ ම ඇති වන දුක් පරම්පරාවත්, සැප යයි සිත සිතා දුක ම බදා ගැනීමක් හැර මම යයි කියා දෙයක් තිබිය නොහැකි ය.

බාල, තරුණ, මහලු යනු වෙනස් වෙමින් ගලා යන ජීවිතයේ අවස්ථායි. පෙර තිබූ තත්ත්වය හා පසු තත්ත්වය බාල මහලු වශයෙන් අපට පෙනුනත් ගලා යෑම හෙවත් ක්ෂණයක් පාසා වන වෙනස් වීම අපට නොපෙනේ. එබැවින් නිත්‍ය වූ දෙයක් හැටියට සලකා මම යන්න රැක ගැනීමට ප්‍රබල උත්සාහයක යෙදෙයි. ජරා, මරණ, ශෝක, පරිදේව ආදී සියලු දුක්වලට මුහුණ දෙමින් ම ඊළඟ භවයක් සඳහා අවශ්‍ය දේ රැස් කරයි. මෙම ක්‍රියාවලිය අවබෝධ කර ගත් විට මම යනුවෙන් ගැනීම මුලාවක් බව වැටහෙයි. එවිට නිතර නිතර ඇති වන මම යන්න පෝෂණය වන ආකාරය වැටහී එයට යොදවන ක්ෂණික කාලයෙන් මිදෙයි. එවිට අතීතය හා අනාගත සම්බන්ධතාවලින් ද මිදීමේ හැකියාව ලබයි. ඉන්ද්‍රියයන් හා ගැටෙන ස්පර්ශයන්, ඇලීමෙන් ගැටීමෙන් තොරව උපේක්ෂා වෙයි. එහි දී ඇති වන දුකින් මිදීමේ සංසිඳීම ඉවසයි. එහි දී ඇති වන්නේ ප්‍රීතියත් ශෝකයත් අත් හරින බව ය.

"මම මෙසේ වෙම්වා!" යි සිතා භාවනාක් කිරීමේ දී ද මම යන්න ම මූලික වෙයි. මෙහි දී මුක්තිය ලැබීමට යැයි සිතා එසේ කළත් විමුක්ති වෙනුවට තමාට ලැබෙන්නේ මම යන්න ම තහවුරු කර ගැනීමයි. එහි

දී ඇති වන්නේ සක්කාය දිට්ඨියයි. ඇත්තෙන් ම භාවනාවකින් සිදු විය යුත්තේ අක්‍රිය වීමයි. එහි දී සත්‍යය ක්‍රියාත්මක වෙයි.

භාවනාවෙන් ලැබෙන සමාධියේ දී සිතිවිලිවලින් නිදහස් වෙයි. මෙහි දී අප ලබා ගත් දැනුමෙන් ද නිදහස් වෙයි. එවිට ඇති වන්නේ ප්‍රඥාවයි. එනම් නිවැරදි අවබෝධයයි. විමුක්තිය නම් එයයි. ඇත්ත වශයෙන් ම සමාධියක් ලබා ගත හැක්කේ කිසිවක් හෝ අයිති කර ගැනීමේ හැඟීමෙන් තොර පෞද්ගලිකත්වයෙන් මිදුණ උසස් මට්ටමේ සිතක් ඇති පුද්ගලයන්ට ය.

ලෝභ, ද්වේෂ, මෝහ ආදී අකුසල ධර්මයන් සිය චිත්ත සංතානයේ කැරකෙමින් තිබිය දී කාල නියමයක් කොට මෛත්‍රී භාවනාව කරමින් අහිංසක තත්ත්වයක් පෙන්නුම් කළ හැකි වේ. ඒ ඒ අවස්ථාවේ දී සිදු වන ඕනෑ ම කරුණක දී මෛත්‍රී සිතක් ඇති කර ගැනීම නිරායාසයෙන් ම සිදු වේ නම් එතැන මෛත්‍රී සිතක් ඇත. භාවනාවකින් ද මෙය කළ හැකි යැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. තමන් තමන්ට ම අවංක වී සත්‍යය මතු කර ගත යුතු ය. මෙම ස්වඅධ්‍යයනයෙන් තමා තුළ සිටිනවා යයි කියන ඉෂ්ට දේවතාවා කවුරුන්දැයි හඳුනාගත හැකි ය.

ඇස, කණ ආදී ඉන්ද්‍රියයන්ට අරමුණු වන දේ පිළිබඳ නොයෙක් ආකාරයේ සිතිවිලි දෙස සැබෑ නිරීක්ෂණයක් කළ හොත්, ඒ තුළ වඩා ඇත්තේ ලෝභ, ද්වේෂ, මෝහ ආදී නොසන්සුන් සිත් ය. ඇත්ත වශයෙන් ම මෙහි දී සිදු වන්නේ අනන්ත සංසාරයේ සිට පැවැත එන එම සිත් පරම්පරාව තව තවත් වර්ධනය වීමයි. මෙහි ප්‍රතිඵලය සසර දික් වීමයි. අරමුණු පිළිබඳ සැබෑ තත්ත්වය හෙවත් එය දුකට හේතු වන හැටි පිළිබඳ සැබෑ තත්ත්වය වටහා ගත් විට අරමුණු හා බැඳුණු සිතක් ඇති නොවී ඉන්ද්‍රියයන්ගේ දමනය සිදු වෙයි. මෙහි දී ලෝකය හා බැඳුණු සිත් ක්‍රමයෙන් ඉවත් වී ලෝකයෙන් එතෙර වීමේ සිත් ඇති වෙයි. එහි දී සියලු බැඳීම්වලින් නිදහස් වූ විමුක්තියට පත් වෙයි. ප්‍රඥාවෙන් ලැබිය හැකි මෙම විමුක්තිය සර්ව සම්පූර්ණ වන්නේ තමා ලත් දැනුමට ඇති බැඳීමෙන් ද නිදහස් වූ විට ය.

සසරට හේතු වන චිත්ත පරම්පරාවක් ඇති වෙන්නේ පංචේන්ද්‍රියයන් අරමුණු හා එක් වීමේ මූලික හේතුව නිසා ය. මේ මූලික හේතුවට ඉඩ නොදී සිතෙහි සැබෑ තත්ත්වය අවබෝධ කිරීමෙන්

දුකට හේතු වන සියල්ල අත්හැරීමේ නිවන් මඟ වූ උතුම් තත්ත්වයට පත් විය හැකි ය. එහි දී දමනය වූ සිත නිසා ඉන්ද්‍රියයන්ගේ දමනය ද නිරායාශයෙන් සිදු වෙයි.

ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ගෙන සතුටු වීමේ ක්‍රමයකට අපි ඇබ්බැහි වී සිටිමු. ආනාපානාසති වැනි භාවනාවකින් ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ගැනීමෙන් වෙන් වූ විට ඇති වන සුවය ඊට වඩා කොතරම් සැහැල්ලු දැයි ඔබට ම අවබෝධ කර ගත හැකි වේ.

එදිනෙදා ජීවිතයේ සිදු වන ක්‍රියාකාරකම් හා සිතිවිලි පිළිබඳව නිවැරදිව තේරුම් ගැනීමේ දී ඇති වන තමා පිළිබඳ අවබෝධය සිත නිසල කර ගැනීමේ සුවය ලබා ගැනීමට බෙහෙවින් උපකාරී වෙයි.

මගේ ය කියන ගේ දොර, දූ දරුවන්, වස්තු සම්පත් පිළිබඳ සැබෑ අවබෝධය ලද හැකි වේ නම් ඒ පිළිබඳව ඇත්තේ සංඥා ස්කන්ධයක් පමණක් බවත්, එහි ඇලීමෙන් සිදු වන්නේ සංඥා උපාදානය බවත්, එය ම සසරට හේතු වන බවත් වටහා ගත හැකි ය. පූර්ව සංඥා හා පදනම් වූ ඇලීම් ගැටිම්වලින් මිදිය හැකි නම් සිත නිදහස් වීමේ සමාධිමය තත්ත්වයට පත්වීමෙන් සදාකාලික සුවය නම් කුමක් දැයි අවබෝධ කරගත හැකි ය. එවිට මරණය තෙක් ජීවත් වීමේ ක්‍රියාවලියේ දී විපාක දෙන කර්ම සිදු නොවේ.

භාවනාමය තත්ත්වයකට පත්වීමෙන් සිතේ සැනසිල්ල ළඟා කර ගැනීම සඳහා කරන උත්සාහය ගෞරවණීය දෙයක් යැයි කෙනකුට සිතෙන්නට පිළිවන. එහෙත් උත්සාහය ඇති තැන දී භාවනාමය තත්ත්වයක් ඇති විය නොහැකි ය. භාවනා අභ්‍යාස ක්‍රමවලින් කෙරෙනුයේ කෙනකුගේ දැන් පවතින තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයකට යාමට ඇති උත්සාහයයි.

එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් පිළිබඳව ඇලීම් හා ගැටීම් දෙකින් තොරව අවදියෙන් බලා සිටිම ම භාවනාවේ ප්‍රධාන ම අංගය වෙයි. මෙසේ නැතිව පිළිමයක් වැනි ඉරියව්වකින් සිට කෙරෙන උත්සාහයකින් පමණක් යථාවබෝධය ලැබිය නොහැකි ය. සිදුහත් තවුසාණන්ටද මේ බව අවබෝධ වූයේ එවකට සිටි ඉතා ම උසස් ගණයෙහි ලා සැලකූ උග්‍ර භාවනායෝගීන් වෙතින් බව සඳහන් වෙයි.

සත්‍යාවබෝධය නොලබන තාක් කල් මිනිසා උපතේ සිට මරණය දක්වා ම එතෙක් තමාට ලබා ගත නොහැකි වූ දේ ගැන ළතවෙයි. තමාට අයත් කර ගත යුතු යයි සිතෙන සියලු දේ පිළිබඳව අනේකවිධ බලාපොරොත්තු සහගත වෙයි. පස්පව් දස අකුසලයෙන් වෙන් වූව ද භවගාමී දස පුණ්‍ය ක්‍රියා කොට භව තණ්හාවෙන් පසු වෙයි.

"රාගං උපනිස්සාය දානං දේති. සිලං සමාධියති උපොසථ කම්මං කරොති ඣානං උප්පාදෙති" යනුවෙන් අභිධර්මයේ සඳහන් වන්නේ, රාගය ප්‍රධාන ලෝභ මූල චිත්තය උපනිශ්‍රය ප්‍රත්‍ය කොට ගෙන දන් දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකියි, ධ්‍යාන උපදවයි, යන පුණ්‍යාභි සංස්කාරයන් ය. මේ සියලු දේ අවිද්‍යාව නිසා සිදු කෙරෙමින් භවය තහවුරු වීමේ ක්‍රියාවලිය නිවැරදිව අවබෝධ කොට සියලු කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාර සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වූ ක්ෂණ මාත්‍රය ඔබගේ උතුම් වූ රහත් බවයි; නිවන නම් වූ භව ගමනේ අවසානයයි.

(පඤ්ඤාවන්තස්සායං ධම්මො - නායං ධම්මො දුප්පඤ්ඤස්ස)

---

ආශ්‍රිත ග්‍රන්ථ

1. ධම්මචක්කප්පවත්තන සූත්‍රය
2. මෙත්තානිසංස සූත්‍රය
3. සතර සතිපට්ඨානය ඇතුළු සත්තිස් බෝධිපාක්ෂික ධර්ම
4. නව මහා විදර්ශනා ඥාන
5. අභිධර්ම පිටකය

# මෙලොව උපදින මනුෂ්‍යයන්ගේ උස්පහත්කම් ඇති වන්නේ ඇයි? 18

**එම්. බී. පේමසේන**

එක් කලෙක භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන කලෙක තෝදෙය්‍ය නමැති බමුණුතුමන්ගේ පුත්‍රයකු වූ සුභ නමැති එක් තරුණයෙක් බුදු රදුන් හමු වීමට පැමිණ ඇත. සතුටු සාමීචි කතාබහෙන් පසු ප්‍රශ්නයක් උපදවන සුභ නමැති තරුණයා, "භවත් ගෞතමයන් වහන්ස, මේ මිනිස් ලොව උපත ලද පුද්ගලයන්ගේ උස්-පහත්කම් බොහෝ ය. ඊට හේතු කුමක් ද? ස්වාමීනි, ගෞතමයන් වහන්ස, අඩු ආයුෂ ඇති අය, වැඩි ආයුෂ ඇති අය, රෝග ාබාධ වැඩි අය, රෝගාබාධ අඩු අය, අවලස්සන අය, හැඩරුව ඇති අය, පිරිස් සම්පත් ඇති අය, පිරිස් සම්පත් නැති අය, බොහෝ වස්තුව ඇති අය, කොහෙත් ම වස්තුව නැති අය, පහත් කුලවල අය, නුවණ දියුණු අය, මෝඩ අය යන මෙසේ මේ මිනිස් ලොව පුද්ගලයන් අතර ස්ත්‍රී-පුරුෂ භේදයක් නැතිව වෙනස්කම් දක්නට ලැබේ. ස්වාමීනි, එයට හේතුව කුමක් ද? අනුකම්පා කර කියා දෙනු මැනවි," යැයි විමසා සිටියේ ය.

එවිට බුදු රජාණන් වහන්සේ මෙසේ වදාළහ:-

"හිතවත් මානවකය, සත්ත්වයාට ඇති එක ම දේ කර්මයයි. සත්ත්වයාට ඇති එක ම දායාදයත්, එක ම උදව්වත්, උපකාරයත්, එක ම පිහිටත් කර්මය මැ යි. කර්මය ම සත්ත්වයා මෙසේ උස්, පහත් කොට උපදවයි."

"බුදු රජාණන් වහන්ස, ඔබ වහන්සේ මතක් කළ කාරණය මට පැහැදිලි වූවා මදි ය. එබැවින් මේ කාරණය වඩා විස්තර සහිතව දේශනා කරනු මැනවි"

"පින්වත් මානවකය, මේ ලෝකයෙහි යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් රෞද්‍රව, ලේ තැවරුණ අත් ඇතිව ප්‍රාණඝාතය කරත් ද, සත්ත්වයන් කෙරෙහි අනුකම්පාවක් නැත් ද, සතුන්ට හිංසා පීඩා කරත් ද, ඔවුහු ඒ පාපය කරණ කොට ගෙන මරණින් මතු දුක් ඇති ආත්ම භවයන් ලබති. තිරිසන් අපාය, ප්‍රේත ලෝකය, අසුර නිකාය, අවීචි මහා නරකයත් එබඳු පව් කළ අය උපදින ස්ථානයෝ වෙති. ඉදින් මනුෂ්‍ය ආත්මයක් ලැබුව ද ඉතා දුක්ඛිත පවුල්වල උපත ලබති. නිතර රෝග ාබාධ සහිතව ජීවත් වෙති. අංගවිකලව උපදිති. අඩු ආයුෂෙන් මරණයට පත් වෙති.

"මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සතුන්ට හිංසා පීඩා කිරීමෙන් වළකී ද, එවැනි දේට අනුබල දීමෙන් වළකී ද, ප්‍රාණඝාත කිරීමෙන් වළකී ද, ප්‍රාණඝාතයට අනුබල දීමෙන් වළකී ද, සියලු සත්ත්වයන් කෙරෙහි කරුණා මෛත්‍රී පෙරදැරිව ජීවත් වේ ද, එබඳු අය මරණින් මතු දිව්‍යලෝකවල උපදිති. මනුෂ්‍ය ලෝකයෙහි වුව ද උසස් යමක් කමක් ඇති පවුල්වල ම ඉපදීම ලබති. නිතර ලෙඩ රෝගවලින් නොපෙළෙන, දීර්ඝ ආයුෂ ඇති, යහපත් පුද්ගලයන් වශයෙන් ම උත්පත්තිය ලබති. මිනිසුන් අතර උසස් මිනිසුන් වශයෙන් උපත ලබන්නේ මොවුහු ම ය. මෙබඳු ප්‍රාණඝාතවලින් වැළකුණ අය ම වෙති.

"මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් කෝපය හෝ තරහව නිතර පවත්වත් ද, කිපීමෙන් සුළු දෙයක් වුව ද පටලවා ගෙන රණ්ඩු සරුවල් ඇති කර ගනිත් ද, නිතර ම තරහ ගතියෙන් වෙසෙත් ද, ඒ තරහව නිසා ම අනුන්ට හිරිහැර, කරදර, කයිකතන්දර හදමින් කරමින් පාපක්‍රියා කරන්නේ ද, ඔවුහු මරණින් මතු සතර අපායෙන් එකකට වැටෙති. කල්ප ගණන් එහි දුක් විඳිති. එයින් මිදී මනුෂ්‍ය ආත්ම භාවයක් ලැබුවත් අවලස්සන ශරීර ඇතිව, අප්‍රිය කටහඬක් ඇතිව, කතා කරන විට අනිත් අය කලකිරෙන ස්වභාවය ඇතිව, එක වරකින් කර ගත යුතු වැඩේට දහදොළොස් වාරයක් කරදර විය යුතු ඇත්තන් වශයෙන් උපදිති. ඔවුන්ට ඉබේ ම තරහකාරයෝ ද ඇති වෙති. තමා

කරන කියන දෙයක් වුව ද සේවකයෝ දරුවෝ පවා නොපිළිගනිති. කොතැනකට ගියත් තමාට සැලකිලිමත් බවක් විශේෂත්වයක් දක්වනු නොලබයි.

"මානවකය, යමෙක් ද්වේෂයෙන් තොරව කරුණා පෙරදැරිව මෛත්‍රී සහගතව ඉවසීමෙන් යුතුව කටයුතු කෙරේ ද, හෙතෙම මරණින් මතු දිව්‍යලෝකයක උපත ලබයි. මිනිස් ලොව උපනත් කාගේත් ගරු සැලකිලි ලබන, ප්‍රියශීලී බවින් යුත්, රූපශෝභාව ඇති, කථිකත්වයෙන් හෙබි, තම අදහසට තව බොහෝ දෙනා නම්මවා ගත හැකි පුද්ගලයකුව උපත ලබයි. කීකරු දරුවන් ඥාති මිත්‍රාදීන් ලැබෙන්නේ ද මෙබඳු පුද්ගලයන්ට ම ය.

"මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඊර්ෂ්‍යා සහගත සිතින් අනුන්ට ලැබෙන ලාභ සත්කාර ගරු බුහුමන් නොඉවසන්නේ ද, 'අහෝ, අපට මේ තරම් ලැබෙන්නේ නෑ; ඒ පුද්ගලයන්ට මේ මේ තරම් දේ ලැබේ. ඔවුහු අපට වඩා සැප සේ වෙසෙති; අපට වඩා ගරු සැලකිලි ලබතැ'යි ඊර්ෂ්‍යා කෙරේ ද ඔවුහු එම කර්මය හේතු කොට ගෙන යහපත්කම්වලින් තොර සතර අපායෙන් එකක උත්පත්තිය ලබති. එහි බොහෝ කලක් දුක් විඳිති. ඉන් මිදී මිනිසත් බව ලැබුවත් පින් අඩු, අනුන්ගෙන් ගරු සත්කාර නොලබන, අතට ලැබෙන දේ වුව ද ඉතිරියක් නොවන, දුක් විඳින ජීවිත ලබති. දුෂ්කර කර්කෂ ප්‍රදේශවල උපදිති. කාගේ වත් කරුණාවට, අනුකම්පාවට යොමු නොවන, බොහෝ විට මඳ පිරිස් ඇති, නැමිතුරන් විසින් කොන් කරන ලද අය වෙති. ඇස්, කන්, නාසා ආදී ඉන්ද්‍රියයෝ ද බොහෝ විට විකල වී උපත ලබති. නිතර පීඩා දෙන මානසික ප්‍රශ්නවලින් පෙළෙති. මේ ඊර්ෂ්‍යා කිරීමේ විපාකයෝ ය.

"යමෙක් ඊර්ෂ්‍යා කිරීමෙන් තොරව අනුන්ගේ සැපතට කැමැතිව ක්‍රියා කෙරෙත් නම්, මරණින් පසු ඒ ස්ත්‍රිය හෝ පුරුෂයා දෙව්ලොව උපදියි. මනුෂ්‍ය ලෝකයෙහි උපත ලද විට ද මහේශාක්‍ය, වැදගත්, උසස්, අනුන්ගෙන් ගරු බුහුමන් ලබන, රූප සම්පත්තියෙන් යුත්, මිහිරි කටහඬක් ඇති, සැම විටක දී ම අන් අයගේ ප්‍රසාදයට ලක් වූ අය වෙති.

"එසේ ම මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දානාදී සිව්පසයෙන් උපස්ථාන නොකෙරේ ද, එබඳු

ඇත්තෝ ද මරණින් පසු දුකින් යුත් අකමැත්තෙන් ම වැටෙන්නා වූ නරකයෙහි උපදිති. නැත්නම් මිනිසත් බව ලැබුව ද ඉතා දුගී දුප්පත්ව උපත ලබති.

"මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සිල්වත් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට සිව්පසයෙන් උපස්ථාන කෙරේ ද, හෙතෙම ඒ කුසල බලය හේතු කොට ගෙන මරණින් මතු දෙව්ලොව උපදී. මිනිසත්ව උපන් විට ද වත් පොහොසත්කම් ඇති, ආයුෂ, වර්ණ, සැප, බල, ප්‍රඥා යන කරුණු පහෙන් යුතුව උපත ලබයි.

"යමෙක් අධික මානයෙන් යුතුව අනුන් හෙළා තලා කතා කරයි ද, අනුන් පහත් කොට සලකයි ද, කුලය නිසා, බලය නිසා, ධනය නිසා, රූපය නිසා, උගත්කම් නිසා එසේ අධික මානයෙන් අන් අය පහත් කොට සලකන්නා මරණින් මතු සතර අපායෙන් එකක උත්පත්තිය ලබයි. මිනිසත් බව ලැබුව ද පහත් පුද්ගලයකුව ම උත්පත්තිය ලබයි. සුනබයන්ව බොහෝ උත්පත්තිය ලබයි. මානයෙන් තොරව නිහතමානීව කටයුතු කරන්නා මරණින් මතු දෙව්ලොව උපදී. මිනිසත් බව ලැබූ විට ද උසස් කෙනකු වශයෙන් ම උපත ලබයි.

"මානවකය, යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සිල්වත් උගත් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් වෙත පැමිණ හොඳ නරක මොනවා දැයි දැන කියා ගෙන වරදින් වැළැකී ගුණ ධර්මයන්හි යෙදෙන්නේ නැත්නම් ඔවුහු උපනුපන් භවයන්හි නුවණ මඳ, සිහි විකල් අය වශයෙන් උපත ලබති. කල්‍යාණ මිත්‍ර සේවනයෙන් යුතුව, ගුණවතුන්ගේ ඇසුර ලබා ගෙන, කර්මය කර්ම ඵලය යන දෙක කෙරෙහි විශ්වාසයක් ඇතිව යහපත් ක්‍රියාවල යෙදෙන්නේ නම් ඔහු හෝ ඇය උපනුපන් ආත්ම භවයන්හි දී ප්‍රඥාවෙන් යුක්තව, දියුණු බුද්ධියක් ඇතිව, ඉවසිලිවන්ත, කරන කියන දේ සාර්ථක බවට පත් කර ගන්නා වාසනාවන්ත පුද්ගලයකු වශයෙන් ම උපත ලබයි.

"මහණෙනි, මේ අනුව යුෂ්මතුන් වහන්සේලා ද, මානවකය, ඔබ ද මෙසේ සිත්හි තබා ගත යුතු ය. ආයුෂ අඩු වන පාපකර්ම කරන්නෝ ඊට අනුරූප ප්‍රතිවිපාක ලබති. ආයුෂ වැඩි වීමට වුවමනා පින්කම් කරන්නෝ ඊට අනුරූප කුසල විපාක උපනුපන් භවයන්හි දී ලබති. නිරෝගී භාවය සහ දීර්ඝායු සම්පත් ලැබීමට උවමනා කරන පුණ්‍ය

කර්ම කරන්නෝ උපනුපන් භවයන්හි දී ඊට අනුරූප කුසල විපාක ලබති. කෝපය, ඊර්ෂ්‍යාව බහුල කොට ඇත්තෝ සසරේ දී අවලස්සන, අල්පේශාක්‍ය, පින් අඩු ඇත්තන්ව උපත ලබති. මෛත්‍රී සහගත සිතින් පරිත්‍යාගශීලීව කටයුතු කරන පුද්ගලයෝ ඊට අනුරූප වූ උසස් කුසල විපාක උපනුපන් භවයන්හි දී ලබති."

මෙසේ සත්ත්වයන් ස්වකීය කර්මය උරුම කොට ඇත්තාහයි, දායාද කොට ඇත්තාහයි කරුණු සහිතව වදාළ මෙම සූත්‍රය ඇසීමෙන් මහත් සේ පැහැදීමට පත් තෝදෙය්‍ය පුත්‍ර වූ සුභ මානවක තෙම බුදු රජාණන් වහන්සේට මුව නොසෑහෙන සේ ප්‍රශංසා කළේ ය.

"ස්වාමීනි, බුදු රජාණන් වහන්ස, ඔබ වහන්සේ මංමුලා වූ කෙනකුට පාර කියා දෙන්නාක් මෙන්, වසා තිබූ දෙයක් විවෘත කොට පැහැදිලිව පෙන්වන්නාක් මෙන්, යටිකුරුව තබන ලද දෙයක් උඩුකුරු කොට තබන්නාක් මෙන්, අන්ධකාරයෙහි සිටි කෙනකුට ආලෝකයක් ලබා දෙන්නාක් මෙන්, විවිධ ආකාරයෙන් අතිශය සවිස්තරාත්මකව කරුණු පැහැදිලි කළ සේක. මම අද පටන් ඔබ වහන්සේ සරණ යමි; ධර්මය ද සංඝය ද සරණ යමි. අද පටන් මා ඔබ වහන්සේ සරණ ගිය දායකයකු සේ සලකනු මැනැව"යි ඉල්ලා සිටියේ ය.

---

**පාදක සටහන**

මජ්ඣිම නිකාය තුන්වන කොටස උපරි පණ්ණාසය

ක්‍රි.ව. 2007 : චූල කම්ම විභංග සූත්‍රය - පූජ්‍යපාද කොටුගොඩ ධම්මාවාස ස්වාමීන්ද්‍රයන් වහන්සේ

# සම්මා වාචා 19

ධර්මාචාර්ය / විද්‍යාවේදී
**බුද්ධික ඉන්දීර ධනපාල**

තත්ථ කතමො සම්මා වාචාඃ මුසාවාදා වෙරමණී, පිසුණාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති සම්මා වාචා1

ඉහත දේශනා පාඨය, තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුද්ධ දසබලධාරී සර්වඥ රාජෝත්තමයන් වහන්සේ විසින් තව්තිසා දිව්‍ය ලෝකයේ දී මාතෘ දිව්‍ය රාජ්‍යා කාය සාක්ෂි කොට වදාළ පරම ගාම්භීර අභිධර්ම දේශනාවේ පළමුව ධම්මසංගනී ප්‍රකරණය දේශනා කොට දෙවනුව විභංග ප්‍රකරණය දේශනා කරමින්, එහි සච්ච විභංගයේ සම්මා වාචා යනු කුමක්දැයි විස්තර කරන කල්හි වදාළ දේශනා පාඨයයි.

එහි සරල අදහස මෙසේ යඃ-

ආර්ය අෂ්ඨාංගික මාර්ගය අතුරෙන් සම්මා වාචා හෙවත් යහපත් වචනය යනු කුමක් ද?, බොරු කීමෙන් වැළැකීම, කේළාම් කීමෙන් වැළැකීම, සැර පරුෂ වචන කීමෙන් වැළැකීම, නිෂ්ප්‍රයෝජන කතාවෙන් වැළැකීම ය යන විරති චෛසිකයක් ඇත් ද, එය සම්මා වාචා වේ.

සම්මා වදන්ති එතායාති සම්මා වාචා2 යන අභිධර්මාර්ථ සංග්‍රහ පාඨය අනුව යමක් හේතු කර ගෙන සෝභන මධුර මනෝහර වචනයෙන් කතා කරයි නම්, එවැනි කතාවට හේතු වූ ධර්මය සම්‍යග්

වචනය හෙවත් යහපත් වචනය මැයි. බොරු කීමෙන් වැළැකීම, කේළාම් කීමෙන් වැළැකීම, සැර පරුෂ වචන කීමෙන් වැළැකීම, නිෂ්ප්‍රයෝජන කතාවෙන් වැළැකීම යන චතුර්විධ වාග් දුෂ්චරිතයෙන් වැළැකී වචන කීම විරති සම්මා වාචාව ය. මේ මාර්ග අවස්ථාවේ ගනු ලබන්නේ ද විරති සම්මා වාචාව ය. මෙම සම්‍යග් වචනය අනෙකුත් තමහට සතුරු වූ කෙළෙසුන් සමඟ මිථ්‍යා වචනය හෙවත් බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම, නිෂ්ප්‍රයෝජන වචන කීම දුරු කරයි, නිවන අරමුණු කරයි. විශේෂයෙන් තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට සංග්‍රහ කරයි. මෙය සම්‍යග් වචනයේ ත්‍රිවිධ කෘත්‍යයයි. සම්‍යග් වචනය යන විරති චෛතසික ධර්මය පූර්ව භාගයෙහි ලෞකික වන අතර මාර්ග ක්ෂණයෙහි ලෝකෝත්තර වේ.

සම්මා වාචා යනු විරති චෛතසික ධර්මයකි. මෙහි විරතිය, සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡේද විරති යැයි තෙවැදෑරුම් වෙයි.

සමාදන් වීමක් නැතිව මුසාවාදා ආදී චතුර්විධ වාග් දුෂ්චරිත කිරීමට වුවමනාවක් ඇති කල්හි පවා ඒ පාපයන් නොකොට වැළැකීම සම්පත්ත විරතියයි. ශික්ෂා පද සමාදන් වීමෙන් පව්වලින් වැළැකීම සමාදාන විරතියයි. ආර්ය මාර්ගයෙන් මුල් සිඳ දමා වැළැකීම සමුච්ඡේද විරතියයි. සමුච්ඡේද විරතිය ලෝකෝත්තර පක්ෂයෙහි මිස ලෞකික පක්ෂයෙහි නොයෙදේ.

මුසාවාදා ආදී විරති සතර නොයෙක් අරමුණුවල නන් අයුරින් ලැබෙන නිසා ඒ මුසාවාදා ආදී කරුණු සතර පිළිබඳ පළමු කොට අවබෝධයක් ඇති කර ගත යුතු ය. එහෙයින් ඔවුන් පිළිබඳ සාමාන්‍ය විස්තරයක් කරනු ලැබේ.

## 1. මුසාවාදය

මුසාවාදාති අලිකවචනා තුච්ඡවචනා3

මුසාවාදා යනු අසත්‍ය වචනයි; හිස් නිෂ්ඵල තුච්ඡ වචනයකි. අනුන් රවටන අදහසින් ඇත්ත නැති කොට නැත්ත ඇති කොට බොරු කීම මුසාවාදයයි. මුසාවාදයක් වීමට අංග සතරක් සම්පූර්ණ විය යුතුයි.

i. කියන කාරණය බොරුවක් වීම

ii. අනුන් රවටන අදහස

iii. ඊට උත්සාහය

iv. කී දෙය අසන්නා පිළිගැනීම, තේරුම් ගැනීම

බොරු කීම මහා වරදකි. බොරු කියන්නා හට නොකළ හැකි පවක් නැත. එහෙයින් ඉතිවුත්තක පාලියෙහි,

එකධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනො

විතිණ්ණ පරලොකස්ස - නත්ථි පාපං අකාරියං4 යැයි සඳහන් වේ.

සත්‍ය වචනය යැයි කියන ලද එක ම ධර්මය ඉක්ම වූ, බොරු කියන ස්වභාවය ඇති, පරලොව ගැන බලාපොරොත්තු රහිත තැනැත්තාට, නොකළ හැකි පාපයක් නැත යනු මෙහි අදහසයි.

කියන දෙය බොරුවක් වුව ද නොදත් භාෂාවකින් කීමෙන් හෝ සවන් දෙන්නා හොඳින් සවන් නොදීමෙන් හෝ තේරුම් නොගත හොත් හෝ මුසාවාදා කර්මය සිදු නොවේ. වැරදීමකින් කියැවෙන බොරුවලින් ද මුසාවාදා කර්මය සිදු නොවේ. ඉෂ්ඨ කිරීමේ ශීර්ෂයෙන් යම් පොරොන්දුවක් වී, එය ඉටු කර ගැනීමට නොහැකි වීමෙන්, දුන් පොරොන්දුව මුසාවාදයක් නොවේ.

එහෙත් ඉටු නොකරන අදහසින් පොරොන්දු දීමේ දී එකෙනෙහි ම මුසාවාදය වේ. පසුව ඉටු කළේ ද, මුසාවාදයෙන් නොමිදේ.

තව කෙනකු උපකාර ඇතිව බොරු කීමේ දී දෙදෙනාට ම මුසාවාදය වේ. එහෙත් තව කෙනකුගේ නියෝගයකින් කෙනකු බොරු පණිවිඩයක් කියන්නා එහි සැබෑ ස්වරූපය බොරුවක් බව නොදැන නියෝගය ඉටු කරන අදහසින් කියන කල්හි, නියෝගය දුන් තැනැත්තා මිස පණිවිඩය කියන තැනැත්තාට මුසාවාදය නොවේ.

දීර්ඝ කාලයක් පොත්පත්, සඟරා, බිත්ති, ගල්පුවරු ආදියෙහි බොරු ලියා තැබීම, මුසාවාදය පිළිබඳ ස්ථාවර ප්‍රයෝග වන අතර ඒවා කියවා රැවටෙන මිනිසුන් ගණනට මුසාවාදා අකුසලය සිදු වේ.

කෙළිකවට පිණිස, දරුවන් නැළවීම් ආදිය පිණිස බොරු කීම අල්ප සාවද්‍ය වන අතර අනුන් රවටනු පිණිස බොරු කීම මහා සාවද්‍ය වේ. අන් අයට අහිතක් කරන අදහසින් බොරු කීම ද මහා සාවද්‍ය වේ. රවටන පුද්ගලයාගේ ගුණවල ස්වභාවය අනුව ද, සිතේ ඇති වූ කෙළෙස් ප්‍රමාණය අනුව ද අල්ප සාවද්‍ය හෝ මහා සාවද්‍ය හෝ වෙයි.

බොරු කීමේ විපාක ලෙස, බොරු කියන්නා මෙලොව ම නින්දාවට භාජනය වෙයි. දඬුවම් ලබයි. සමාජයෙන් ගැරහුම්වලට, විශ්වාස නොකළ හැකි පුද්ගලයකු බවට පත් වේ. මරණින් මතු නරක, තිරිසන්, ප්‍රේතව ඉපිද අනේක දුක් කම්කටොලු විඳී.

වාග් දුෂ්චරිත ආදීනව දක්වන සූකර මුඛ ප්‍රේත, ප්‍රතිමුඛ ප්‍රේත, පංචපුත්‍ර ඛාදක ප්‍රේත, සප්තපුත්‍ර ඛාදක ප්‍රේත, භුස ප්‍රේත ආදිය ප්‍රේත වස්තු ප්‍රකරණයේ සඳහන් මෙම ප්‍රේත වස්තු කියවීම යහපති.

මෙසේ අනේක දුක් විඳ මනුසත් බව ලැබූ කල්හි නින්දා ලැබීම, අඥානයකු වීම, දුප්පත්ව ඉපදීම, ගොත හෝ ගොළු වීම, මුඛය දුර්ගන්ධ වීම, අශෝභන දත් ඇත්තන් වීම, මුඛ රෝග බහුල බව, විරූපී වීම, අවිශ්වාසවන්තයකු වීම, අමිහිරි කටහඬ ඇත්තකු වීම ආදී දුක් කම්කටොලු ලබන්නෙක් වේ.

මුසාබසින් වෙන් වීමේ ආනිශංස ලෙස, උඩගු නොවන බව, පහසු ස්පර්ශ ඇත්තකු වීම, ප්‍රසන්න ඉඳුරන් ඇත්තකු වීම, අශෝභන උස ශරීර, අශෝභන මිටි ශරීර නොලබන්නකු වීම, විශ්වාස කළ හැකි වචන ඇත්තකු වීම, අශෝභන කෘෂ ශරීර නොලබන්නකු වීම, අශෝභන මහත ශරීර නොලබන්නකු වීම, දුගඳ නැති මහනෙල් මල් සුවඳ විහිදෙන මුඛයක් ලැබීම, සමානව පිහිටි සුදු වන් දත් දෙපළක් ලැබීම, චපල නැත්තකු වීම, මිහිරි කටහඬ ඇත්තකු වීම, සුවච කීකරු පිරිවර ලබන්නකු වීම දැක්විය හැකි ය.

මුසාවාදයෙන් වැළකීම මෙන් ම සත්‍ය වචන කතා කිරීම ද කළ යුත්තකි. සත්‍යය පාරමිතාවකි. කණ්හදීපායන ජාතකය, භාරිතතාපස චරිතය, මත්ස්‍යරාජ චරිත, වට්ටක ජාතක ආදී ජාතක කතාවෝ ද උදාහරණයි. තව ද අධිමුත්ත සාමණේරයන් වහන්සේගේ චරිත කතා ද, දුටුගැමුණු - තිස්ස රජ දවස සමහර සිදු වීම් ද මීට උදාහරණ සපයයි.

## 2. කේළාම් කීම

පිසුණ වචනය හෙවත් කේළාම් කීම යනු තමන් කෙරෙහි ප්‍රිය බව ඇති කර ගනු කැමැත්තෙන් හෝ ඔවුනොවුන් අතර පවතින සමගිය නැති කරන අදහසින් හෝ වචන කියා බිඳවීම ය. මෙය ද බලවත් අකුසලයකි. මෙය සිදු වන්නේ අංග හතරක් සම්පූර්ණ වීමෙනි.

i. භේද කළ යුතු අනිකකු සිටීම
ii. කෙනකකු බිඳවන අදහස
iii. බිඳවීම පිණිස කරන උත්සාහය
iv. ඇසූ තැනැත්තා විසින් එය පිළිගැනීම, තේරුම් ගැනීම

මෙම අංග හතර සම්පූර්ණ වීමෙන් කේළාම් කීම යැයි කියන ලද අකුසලය සිදු වේ.

සමගි සම්පන්න දෙදෙනකු කේළාම් කියා බිඳවීමෙන් කියන්නාට අකුසල කර්ම පථය සිදු වේ. එසේ කේළාම් කියද්දී ද බිඳී නොගියහොත් භේද නොවුණ හොත් කර්මයක් පමණක් සිදු වේ.

කේළාම් කියා බිඳවනු ලබන්නෝ ගුණහීනයෝ නම් කර්මය අල්ප සාවද්‍ය වේ. ගුණවතුන් බිඳවීම මහා සාවද්‍ය වේ. අමුතුවෙන් බොරු ගොතා කියා බිඳවීම ද මහා සාවද්‍ය වේ. කේළාම් කීමට හේතු වූ කෙලෙස් ප්‍රමාණය අනුව මහා සාවද්‍ය හෝ අල්ප සාවද්‍ය හෝ වේ.

කේළාම් කීමේ විපාක මුසාවාදයේ විපාක හා සමාන වේ. මෙහි දී ප්‍රේත වස්තු අටුවාවෙහි දැක්වෙන ප්‍රතිමුඛ ප්‍රේත වස්තුව කෙටියෙන් දක්වමුː-

සනාරාමර ලෝකශිවංකර සම්මා සම්බුදු රජාණන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වාසය කරන කල්හි ප්‍රතිමුඛ ප්‍රේතයා අරභයා දේශනා කළ සේක.

පෙර කාශ්‍යප බුදු රජාණන් වහන්සේ ලොව පහළ වී වැඩ වාසය කරන සමයෙහි එම ශාසනයෙහි කුළ දරුවෝ දෙදෙනෙක් පැවිදිව ශීලාචාර සම්පන්නව සැහැල්ලු පැවතුම් ඇතිව එක්තරා ගමක ආවාසයක සමගි සම්පන්නව සසුන් පිළිවෙත් පුරමින් විසූහ.

එකල්හි ලාමක අදහස් ඇති කේළාම් කීමෙහි ඇලුණා වූ එක්තරා මහණ කෙනෙක් ඒ භික්ෂූන් වහන්සේලා සිටි ආවාසයට පැමිණියේ ය. ආවාසවාසී හිමිවරු ඔහු හා පිළිසඳර කතා කොට සෙනසුනක් ලබා දුන්හ. පසුව ආගන්තුකව පැමිණි භික්ෂූන් වහන්සේ විසින් මේ දෙදෙනා වහන්සේලා ප්‍රයෝගයෙන් කේළාම් කියා බිඳවන ලදහ. පසු කලෙක මෙම ආගන්තුකව පැමිණි භික්ෂූන් වහන්සේ, බොහෝ ලාමක බොරු කීම්, කේළාම් කීම් ආදියේ විපාක ලෙස කලුරිය කොට අවීචි මහා නරකයේ උපන්හ. බුද්ධාන්තරයක් මුළුල්ලේ නිරයේ පැසී ගෞතම බුදුන් සමයේ දී රජගහ නුවරට නුදුරු තැනක ප්‍රතිමුඛ ප්‍රේතව උපන්නේ ය. ඔහුගේ ශරීරය ස්වර්ණ වර්ණ විය. කටින් පණුවෝ නික්මී මුඛය තැනින් තැන කති. මුඛයෙන් දුගඳ වහනය වේ. නාරද මහ රහතන් වහන්සේ මේ ප්‍රතිමුඛ ප්‍රේතයා දැක කර්මය විචාරා එම පුවත බුදු රජාණන් වහන්සේට සැල කළ සේක.

කේළාම් කීමේ විපාක මෙසේ භයානක බව දත යුතුයි. සැම දෙනා කේළාම් කීමෙන් වළකිත්වා, ඔවුනොවුන් සමගි කෙරෙත්වා, සැවොම සමඟ සමගිව වෙසෙත්වා!

## 3. පරුෂ වචන කීම

අසන්නහුගේ සිත් රිදවන්නා වූ කියතක් මෙන් රළු වූ කර්ණකයෝර වචන කීම පරුෂ වචන කීමයි. කනට අප්‍රියකර වූ රළු වචන ද්වේෂය මුල් කොට ගෙන උපදී. කොටින් කියත හොත් අනුන්ගේ සිත් රිදවන වදනින් කතා කිරීම පරුෂ වචන නම් වේ.

විනය පිටකයේ "ඔමසවාදෙ පාචිත්තියං"5 යයි උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට එරුෂ වචන කීම සම්බන්ධව ශික්ෂා පදයක් පනවා තිබේ. ආක්‍රෝෂ කිරීමේ ආකාර දහයක් විනය පිටකයේ පාචිත්තිය පාලියෙහි දක්වා තිබේ.

i. ජාතියෙන් ආක්‍රෝෂ කිරීම - පහත් යැයි සම්මත ජාතියෙන් ආක්‍රෝෂ කිරීම, උසස් යැයි සම්මත ජාතියෙන් ආක්‍රෝෂ කිරීම

ii. නාමයෙන් ආක්‍රෝෂ කිරීම - උසස් හා පහත් කොට සලකන නම් ඇත. නිග්‍රහ කරනු පිණිස එම නම් ගෙන කතා කිරීම

iii. ගෝත්‍රයෙන් ආක්‍රෝෂ කිරීම - උසස් හා පහත් යයි සම්මත ගෝත්‍ර ඇත. ඒ ඒ අයට පහත් යැයි සම්මත ගෝත්‍රවලින් කතා කිරීම

iv. කර්මයෙන් ආක්‍රෝෂ කිරීම - උසස් හා පහත් යයි සම්මත කර්මාන්ත ඇත. අවමන් කිරීමට ඒ ඒ අයට පහත් යැයි සම්මත කර්මාන්ත ගෙන ආක්‍රෝෂ කිරීම

v. ශිල්පයෙන් ආක්‍රෝෂ කිරීම - උසස් හා පහත් යයි සම්මත ශිල්ප ඇත. ආක්‍රෝෂ කිරීම පිණිස ඒ ඒ අයට පහත් යයි සම්මත ශිල්පයෙන් කතා කිරීම

vi. ආබාධයෙන් ආක්‍රෝෂ කිරීම - යම් ආබාධයක් ඇති තැනැත්තකුට ඒ ආබාධය ගෙන නින්දා අපහාස ආක්‍රෝෂ කිරීම

vii. ලිංගයෙන් ආක්‍රෝෂ කිරීම - ශරීරාකාරය අනුව අනුන්ට අපහාස කිරීම

viii. ක්ලේශයෙන් ආක්‍රෝෂ කිරීම - පෙරේතයා, ගොරකයා, යකා, ගොනා, මෝඩයා ආදී ලෙස අපහාස කිරීම

ix. ආපත්තියෙන් ආක්‍රෝෂ කිරීම - කළ හෝ නොකළ වරද ගෙන අපහාස කිරීම

x. ආක්‍රෝෂයෙන් ආක්‍රෝෂ කිරීම - ලෝකයේ අනුන්ට රිදවන පිණිස ලාමක පහත් සෝර කටුක වචන ඇත. ඒවා ගෙන අනුන්ට ආක්‍රෝෂ කිරීම

අංග තුනක් සම්පූර්ණ වීමෙන් පරුෂ වචන කර්මය සිදු වේ:-

i. ආක්‍රෝෂ කළ යුතු කෙනකු සිටීම

ii. ක්‍රෝධ සහගත සිතක් ඇති වීම

iii. අනුන්ගේ සිත් රිදවන වචන කීම

පරුෂ වචන කීම නරකය, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායට වැටීමට හේතු වේ.

පුරිසස්ස හි ජාතස්ස - කුඨාරි ජායතෙ මුඛෙ
යාය ඡින්දති අත්තානං - බාලො දුබ්භාසිතං භණං6

"මෙලොව උපන් මිනිසාගේ මුඛයෙහි පරුෂ වචන නමැති කෙටේරියක් ඇත්තේ ය. නපුරු වචන කියන්නා වූ අඥාන තෙම ඉන් තමාගේ ආත්ම භාවය විනාශ කර ගනී" යනු එහි තේරුමයි.

සෑම පුද්ගලයකු ම මෘදු මොළොක් බසට කැමති ය. නන්දිවිසාල ජාතකයේ එබඳු වාර්තාවක් සපයයි. දෙලොව දියුණුවට පැවැත්මට හේතු වන මෘදු මොළොක් වචන සෑම දෙනා ම තෙපලත්වා!

## 4. සම්ප්‍රප්පලාපය

කියන්නාගේ හා අසන්නාගේ මෙලොව පරලොව යහපතට හේතු නොවන අනර්ථ වූ හිස් ප්‍රලාප කීම සම්ඵප්‍රලාපයයි. නිරර්ථක හිස් ප්‍රලාප දෙඩීම කියන අසන දෙපක්ෂයේ ම අයහපත පිණිස පවතී. සම්ඵප්‍රලාප කීමෙන් වන්නේ යහපතක් කර ගැනීමට තිබෙන කාලය නිකම් ම ගෙවී යාමයි.

සම්ඵප්‍රලාපය සිදු වීමට අංග දෙකක් සම්පූර්ණ විය යුතු යඃ-

i. අසන කියන දෙපක්ෂයට ම වැඩක් නැති කථා කියන අදහස

ii. එබඳු කථා කීම

සම්ඵප්‍රලාපය සාමාන්‍යයෙන් කීම අල්ප සාවද්‍ය වන අතර වර්ණනා කර කර කීම මහා සාවද්‍ය වේ. අසන්නාගේ අර්ථ හානිය හැටියට ද අල්ප සාවද්‍ය මහා සාවද්‍ය වේ.

යම් කිසි උපදේශයක් දීම පිණිස උගැන්වීම පිණිස ගොතා තිබෙන කථා අසත්‍ය වුව ද ප්‍රයෝජනවත් බැවින් සම්ඵප්‍රලාප නොවේ.

සම්ඵප්‍රලාප කීම විපාක වශයෙන් අපාගාමී වීමට හේතු වේ. මිනිසත් බව ලැබූ කල්හි අසරණ වෙයි. නොඇදහිය යුතු වචන ඇත්තේ වෙයි, කෙලතොලු වෙයි.

එබැවින් සම්පප්‍රලාපයෙන් වැළැකී මෙලොව හෝ පරලොව හෝ අර්ථය පිණිස පවතින කථාවක් කළ යුතු ය.

මෙසේ මුසාවාද, පිසුණ වචන, පරුෂ වචන, සම්ඵප්‍රලාප ආදී දුෂ්චරිතයන්ගෙන් වැළැකී යහපත් වචන කීම සම්‍යග් වචනය හෙවත් සම්මා වාචා වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ තුන් වන මාර්ගාංගයයි.

සම්මා වාචා විරති චෛතසිකයකි. එය ලක්ෂණාදී වශයෙන් මෙසේ දත යුතු යː-

සම්මා වාචා, වචී දුච්චරිත වත්ථූනං අවීතික්කම
ලක්ඛණා, වචී දුච්චරිත වත්ථූතො සංකොචන
රසා, අකිරිය පච්චුපට්ඨානා, සද්ධාහිරොත්තප්ප
අප්පිච්ඡතාදීගුණ පදට්ඨානා7

වචී දුෂ්චරිත ඇසුරු කරන වස්තූන් නොඉක්මවීම ලක්ෂණයයි. වචී දුෂ්චරිත වස්තූන් කෙරෙහි හැකිළීම කෘත්‍යයයි. වචී දුෂ්චරිත නොකිරීම සිතට වැටහෙන ආකාරය හෙවත් පච්චුපට්ඨානයයි. සද්ධා හිරි ඔත්තප්ප අප්පිච්ඡතා ආදී ගුණ ආසන්න කාරණය හෙවත් පදට්ඨානයයි.

සම්මා වාචා මාර්ගාංගය, විරති සම්මා වාචා හා චේතනා සම්මා වාචා යයි දෙආකාර වේ. ඉහත සඳහන් වූ මුසාවාද, පිසුණ වචන, පරුෂ වචන, සම්ඵප්‍රලාප යන වචී දුෂ්චරිතයන්ගෙන් වැළැකීම විරති සම්මා වාචා වේ. මෛත්‍රියෙන් කරුණාවෙන් මුදිතාවෙන් සිසිල් වූ ද, සත්‍ය වූ ද, මිහිරි වූ ද, අර්ථාන්විත වූ ද, ධර්මාන්විත වූ ද, විනයාන්විත වූ ද, වැඩදායක වූ ද, වචන කීම, කතා කිරීම, බණ කීම, සිල් දීම, අවවාද අනුශාසනා කිරීම, ශිල්ප ශාස්ත්‍ර, ධර්ම විනය ඉගැන්වීම ආදී සුභාෂිත වචන කීම, ලිවීම, සිතීම චේතනා සම්මා වාචා වේ.

අසන්නවුන් ඒකාත්මික කරවීම හා චිත්ත චෛතසික ඒකරාශි කරවීම නම් සම්මා පරිග්‍රහය නිවන් අරමුණු කිරීමත් සිදු කරන සම්මා වාචා මාර්ගාංගය සැම කල් මාගේ සිතත් ඔබගේ සිතත් ලෝකවාසී සැමගේ සිතත් ප්‍රබෝධ කරත්වා!

එහෙයින් අන්තද්වය වර්ජිත මධ්‍යම ප්‍රතිපදාව පිළිපදිමින්, ප්‍රඥා ස්කන්ධයෙන් මෝහ ස්කන්ධය ද, සීල සමාධි ස්කන්ධ දෙකෙන් ලෝභ ස්කන්ධය ද පළා දමා, අධිපඤ්ඤා ශික්ෂාවෙන් ප්‍රඥා සම්පත්තිය ද, අධිශීල ශික්ෂාවෙන් ශීල සම්පත්තිය ද, අධිචිත්ත ශික්ෂාවෙන් සමාධි සම්පත්තිය ද යන ත්‍රිවිධ සම්පත්තියට පැමිණ, ජාති ජරා ව්‍යාධි මරණ

නැති සදාකාලික සුවය ඇති ශාන්ත සීතල අමා මහ නිවන් සුව අවබෝධ කර ගැනීමට අප සැමට හැකි වේවා! යි ප්‍රාර්ථනා කරමු.

තෙරුවන් සරණයි!!!

---

**පාදක සටහන්**

1. විභඞ්ගප්පකරණ (1) - 192 පිටුව බු.ජ.ත්‍රි.මු. 1975
2. අභිධම්මත්ථසංගහො - 53 පිටුව - තොටගමුවේ පඤ්ඤාමොලිතිස්ස මහා ස්ථවිර සංස්කරණය 1960
3. අඞ්ගුත්තරනිකායට්ඨකතා - 430 පිටුව - හේ.වි.මු. 1923
4. ඉතිවුත්තක පාලි - 344 පිටුව - බු.ජ.ත්‍රි.මු. 1960
5. පාචිත්තිය පාලි (භික්ඛු විභංගය) - 16 පිටුව බු.ජ.ත්‍රි.මු. 1981
6. සංයුක්ත නිකාය 1 - 270 පිටුව - බු.ජ.ත්‍රි.මු. 1960
7. ධම්මසඞ්ගනීප්පකරණට්ඨකථා - 135 පිටුව- හේ.වි.මු. 1940

---

**ආශ්‍රිත ග්‍රන්ථ**


| | |
|---|---|
| 1. විභඞ්ගප්පකරණං (1) | බු.ජ.ත්‍රි.මු. 1975 |
| 2. පටිසම්භිදාමග්ගප්පකරණයං | බු.ජ.ත්‍රි.මු. 1971 |
| 3. විභඞ්ගට්ඨකථා | හේ.වි.මු. 1932 |
| 4. ධම්මසඞ්ගනීප්පකරණට්ඨකථා | හේ.වි.මු. 1940 |
| 5. ඉතිවුත්තකට්ඨකථා | හේ.වි.මු. 1928 |
| 6. ජාතකට්ඨකථා | 1931 |
| 7. පෙතවත්ථු අට්ඨකථා | 1917 |
| 8. ඛුද්දකපාඨට්ඨකථා | හේ.වි.මු. 1922 |
| 9. විසුද්ධිමග්ගො | හේ.වි.මු. 1919 |

10. බෞද්ධයාගේ අත්පොත මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1996

බොදු අපි සියල්ලෝ ම මේ ජීවිතයේ දී ම

# සතරඵලයන්ගෙන් එකක් හෝ ලබාගන්නෝ වෙම

(සම්මා සම්බුදුරදුන්ගේ අනුශාසනාව ද මෙය ම ය)

# 20

**කේ.කේ. සුගතපාල**
**පාලි ත්‍රිපිටකයේ සරල පරිවර්තන මණ්ඩලයේ ලේකම්**
**බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**
**(බුද්ධ ශාසන ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය)**
**- (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික)**

ත්‍රිපිටකාගත බුදු වදන් තුළ අප බොහෝ දෙනාගේ අවධානය යොමු නොවූ දහම් පද දෙකක් ඇත. ඒ ශ්‍රැතවත් හා අශ්‍රැතවත් යන දෙපදයෝ ය. දීර්ඝ විස්තරයකට නොයා බුදුවදන් අනුව ම ගතහොත් කෙටි අර්ථයක් ලෙස මෙසේ ය:- බුදු බණ අසා තිබීම (ඇසීමෙන්, කියවීමෙන් හා ලිවීමෙන්) ශ්‍රැතවත් බව ලෙසත්, බොහෝ බුදුබණ අසා නොතිබීම අශ්‍රැතවත් බව ලෙසත් ශ්‍රී මුඛ දේශනා තුළ ම සඳහන්ව ඇත. මෙහි දී, අසා තිබුණත් ඒවා සිද්ධිධාරණය කර නොගන්නේනම් ධාරණය කරගෙන ඒවා සිත්හි ධාරණය කර නොගත්තේ නම්, ධාරණය කර ගෙන තිබුණත් නැවත නැවත නුවණින් මෙනෙහි නොකරන්නේ නම් ඔවුන් ද අශ්‍රැතවත් ගණයෙහි ලා ම යෙදේ.

තව ද මෝහය හා අවිජ්ජා යනුවෙන් දෙපදයෙකි. මේ පද දෙකෙහි ම නුනුවණ බව - නොදැනීම යන සමාන අර්ථයක් ඇත. බුදු දහමට අනුව ගලපා ගතහොත් අකුසල මූලයන් වූ ලෝභ, ද්වේෂ දෙක මෝහය නිසා මෙන් ම අවිජ්ජාව නිසා ද පහළ කර ගන්නෙක් බව ධර්මයේ ම සඳහන් වේ.

මේ අනුව අවිජ්ජා-මෝහ නොදන්නාහු අශ්‍රැතවත්හු වෙත්. දැන

සිටින්නහු හෝ දැන ගැනීමට වීර්යය කරන්නහු හෝ දැන ගැනීමට කැමැත්ත ඇත්තහු ශ්‍රැතවත්හු ගණයෙහි ලා ගැණෙති. ඒ මක් නිසා ද? ඔවුහු අලෝභ-අද්වේෂ-අමෝහ-විජ්ජා ධර්මතා සොයා යන කුසල සහගත සිතින් දාන, සීල භාවනාදියෙහි යෙදෙන්නහු හෙයිනි. තව ද අවිජ්ජා යන්නට චතුරාර්ය සත්‍යය නොදැනීම ද ඇතුළත් වේ. මේ සිව්සස් දහම සොයා යන්නා විජ්ජා සහගත ය, ශ්‍රැතවත් වූවකි, බුදු මඟ ගවේෂණය කරන්නෙකි.

මෙතැන් සිට අපි තෙරුවන් සරණ ගිය ශ්‍රද්ධාවත්, ශික්ෂාකාමී, ශ්‍රැතවත් බෞද්ධ පසුබිමක පිහිටි ශ්‍රාවකයන් සේ සිතට ගෙන බුදු මඟ සොයා යන්නෝ වෙමු. ඉතා දුර්ලභ මිනිස් ආත්මයක් ලබා ඇති අපි ඒ සඳහා මේ ප්‍රතිසන්ධියේ දී පෙර කළ පින් ඇත්තෝ වෙමු. අපි දහමේ දක්වන පරිදි දුෂ්ට අට තැනකින් මිදුණු ක්ෂණ සම්පත්ති ලාභියෝ වෙමු. ඒ කවරේ ද?

1.නරකයෙන් 2.ප්‍රේත ලෝකයෙන් 3. තිරිසන් ආත්මයන්ගෙන් 4.දීර්ඝ ආයු ඇති බ්‍රහ්ම-දිව්‍ය ආත්මයන්හි නො ඉපදී මේ මනුෂ්‍ය ආත්මය ලැබුවෝ වෙමු. 5. පරන්තප දේශයක (තුනුරුවන් පහසුවෙන් මුණ නොග ැසෙන දේශයක) නොඉපදීම ක්ෂණ සම්පත්තියකි. 6. මන්ද බුද්ධික හෝ අංග විකලත්වයෙන් තොර උපතක් ලැබීම. 7. මිථ්‍යාදෘෂ්ටික මවුපියන් නොලැබීම 8. බුද්ධෝත්පාද කාලයක (චතුස්සත්‍යාවබෝධියෙන් අරහත් භාවය සාක්ෂාත් කළ හැකි සද්ධර්මය නොනැසී පවත්නා කාලයක) ඉපිද සිටීම ආදී මේ ක්ෂණ සම්පත්ති ලාභීත්වයයි.

මේ ක්ෂණ සම්පත්තිය අපට ලැබුණේ පෙර ආත්මයන්හි අප කර ඇති දශ පාරමිතා කුසලයන්හි ආනිසංස ලෙස ගැනීමෙහි වරදක් නැත. අපට මෙම ආත්මය තුළ විසි පාරමිතා පිරූ පසේ බුද්ධත්වයෙන් හෝ සමතිස් පෙරුම් දම් සපුරාලූ සම්මා සම්බුද්ධත්වයක් හෝ දහමට අනුව කිසි සේත් සාක්ෂාත් කිරීමට හැකියාවක් නැත. එහෙත් තුන්තරා බෝධියෙන් ඉතිරි බෝධිය (බුදුබව) වූ අරහත් බුද්ධත්වය සඵල කර ගත හැකි ය. ඒ සඳහා ම ය බුද්ධෝත්පාද කාලයක අපට මේ උපත ලැබුණේ. බුදු රජාණන් වහන්සේ නමක් කල්ප ගණනකට වරක් ඉතා කලාතුරකින් ලොව පහළ වන්නේ ද ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයන් සංසාර දුකින් මුදවන මග-පල සංඛ්‍යාත ඒ අති මහත් ප්‍රතිලාභය තිළිණ කර

දීමට ම ය.

මෙපමණක් නොව අට තැන ක්ෂණ සම්පත්තීන්ට හිමිකරුවන් වන අපි තෙරුවන් සරණ ගිය සද්ධා සම්පන්න ශ්‍රැතවත් ශ්‍රාවකයන් ලෙසින් තවත් අට තැනක සැකයෙන් මිදී සැදැහැවත් ශ්‍රාවකයෝ ද වන්නෙමු.

පින්වත් ඔබත් මමත් පෙරදා සිට මේ දක්වා, ළමා වියෙහි දී ම පැවිද්ද ලබා තමාගේ මුළු ජීවිත කාලය ම අනේක බාධා විඳිමින් කල් ගෙවන මහා සංඝරත්නය වෙතින් බුදු වදන් ඉගෙන ගෙන (පරතෝඝෝෂයෙන් දෙසූ සද්ධර්මය අසා) අට තැනක ඇති වන සැකය මේ වන විට දුරු කළෝ වෙමු.

1. බුද්ධ රත්නය (නව අරහාදි බුදුගුණ) ගැන 2. ස්වාක්ඛාත සන්දිට්ඨික ධර්මරත්නය ගැන 3. මේ සද්ධර්මය අසා මගඵල සාක්ෂාත් කළ මහා සංඝරත්නය ගැන ශ්‍රැතවත් වූ අපට කිසිදු සැකයක් නැත. 4. පෙර භවයක් 5. මතු භවයක් 6. පෙර- මතු භව දෙකමත් ගැන (පුනර්භව) අපට සැක නැත. 7. කායික වාචසික මානසික පුණ්‍ය- අපුණ්‍ය කර්මවලට විපාක ලැබෙන බව 8. චතුරාර්ය සත්‍යය අවබෝධය ලබා සංසාර ගමන නිම කළ හැක්කේ පටිච්චසමුප්පාද ධර්මතා අවබෝධයෙන් බව අපට සැක නැත.

මනුෂ්‍යත්වය ලැබුවත් අශ්‍රැතවත්හුහට මෙවන් සම්පත් ලැබී නැත. අශ්‍රැතවත් බවේ ආදීනව වටහා ගන්නා තුරු ලැබෙන්නේ ද නැත. එතෙක් ඔවුහු ්සත්ත්ව, පුද්ගල, ආත්මයක් ඇතී යන සංකල්ප ගෙන නිත්‍ය-සුඛ ස්වභාවයෙන් තමන් උපන් සම්මත ලෝකය ඇසුරු කරති. මේ ඇසුර මම-මාගේ සිතුවිලිවලින් සමීපයට ගන්නා ප්‍රමාණයට ශෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්ස හා හැඬීම්-වැළපීම් සහිත උපායාස ඇති වන්නේ ම ය. එවන් මම-මගේ වස්තුන්හි (මව-පියා, දුව-පුතා, නංගි-මල්ලි, බිරිඳ-ස්වාමියා) යථාර්ථය ඇති තතු පරිදි අවබෝධ කර ගන්නේ නම් ඒ කිසිදු දුකක් හට නොගනී.

බුදු රජාණන් වහන්සේගේ අවබෝධය තුළ සම්මත ලොව ඇති ජීව-අජීව වස්තූන් සංස්කාරයෝ ය. ්සංස්කාරයෝී යනු් තම තමා විසින් සකස් කර ගතී යන අදහසයි. අප ස්පර්ශ කරන සම්මත ලෝකයේ

ඇති සියලු වස්තූන් හට නමක් දී ඇත්තේ අපි වෙමු. තව ද ඒ ඒ වස්තූන්වලට ස්ථිර-නිත්‍ය-සුඛ සංකල්ප ද ආදේශ කර ඇත්තේ ද අපි ම ය. මවගේ හෝ පියාගේ මරණයට පෙර තම දුව හෝ පුතා මළොත් ඒ නිත්‍ය-සුඛ සංකල්පය නිමිති වශයෙන් ගෙන පොළොවේ වැතිරී පපුවට පහර දෙමින් සෝෂා සහිතව හඬා වැළපෙන්නේ යථාර්ථය නොදැනීම නිසා ය. පූර්ව කර්ම දායාද කොට මෙලොවට ආ අපි කර්මයෝ ආයු ගෙවී ගිය දා පෙර-පසු නොසලකා මෙලොව හැර යන්නෙමු. අනමත්තග්ග සංයුක්තයේ සඳහන් පරිදි අනවරාග්‍ර සසරේ මෙවන් දෙමව්පියන්, සොයුරු-සොයුරියන්, දුවා-දරුවන් මැරී අපි හැඬූ කඳුළු මහ සයුරේ ජල බිඳුවලට වඩා වැඩිය.

මේ සත්ත්ව පුද්ගල ආත්ම සංකල්පයන්ගෙන් මිදෙන අයුරු ශෝක දුක් ඇති නොවන තථාගත (ඇති තතු) දහමක් සම්බුදුවරයකු ලොව පහළව දේශනා කොට ඇත්තේ ඉමහත් මෙත් සිතිනි, මහා කරුණාවෙනි. ඒ බුද්ධ දර්ශනයේ ප්‍රතිපත්ති ධර්මයන් වටහා ගන්නට මෙතැන් සිට උත්සාහ කරමු. සම්මත භෞතික ලෝකයේ මව-පියා, දුව-පුතා සිටිති. ඒවා සම්මුතියෙන් ගත් සත්‍යයකි. ගහ-කොළ-පෘථිවිය-සාගර තිබේ. ඒවා ද ඇත්තකි. එහෙත් ඒ කිසිවක් නිත්‍ය නැත. ස්වභාවය අනිත්‍ය වූවකි.

ඉහතින් දැක්වූ පරිදි පෙර පින් ඇත්තන් උපන්නේ අන්ධ පෘථග ජනයකු ලෙසිනි. එහෙත් පරතෝඝෝෂයෙන් බුදුබණ ඇසීමට සිත් නැමී අපි දැන් කල්‍යාණ පෘථග්ජනයෝ වෙමු. ඒ ඇසූ බුදු බණ පරිදි අපේ කය තුළ ඇත්තේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඤාණ යන ස්කන්ධ පහකි. මේ තමා තථාගත බුදු රජාණන් වහන්සේ අවබෝධ කළ පරමත්ථ ලෝකය. භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට ඇති පරිදි මේ පංචස්කන්ධය ප්‍රහීණ කරන අයුරු අපත් අවබෝධ කළහොත් සසර ගමනින් හෙවත් පුනර්භවයන්ගෙන් මිදී නිවනට පත්වේ.

මේ සඳහා බුදු රජාණන් වහන්සේ සත්ත්ව-පුද්ගල, ස්ත්‍රී-පුරුෂ, දේව-බ්‍රහ්ම, වෘක්ෂ-පර්වත, ගංගා-සමුදුර යන ලෝක ව්‍යවහාරික උපකාර කොට ගෙන දෙසූ සම්මුති දේශනාවක් ද, මේ ලෝක සම්මුතියන්හි නොපිහිටා ස්කන්ධ-ධාතු-ආයතන යනාදී අර්ථ නොපෙරළෙන සුලු පරමත්ථ දේශනාවක් ද වදාළ සේක. පළමු කී පංචස්කන්ධයෝ ස්කන්ධ

ලෙස ද, ඒ ස්කන්ධයෝ ධාතු විවිධත්වයකින් හා ආයතන හයකින් යුක්ත බව ද පැහැදිලි කර ඇත. ස්කන්ධ පහ රූප එකක් ලෙසත් නාම හතරක් ලෙසත් සිත කය යනුවෙන් හැඳින්වේ. මේ පහේ ම ඇත්තේ ධාතු ය. ධාතු ස්වභාවය යනු සත්ත්ව, පුද්ගල හෝ ජීවීන් නොවන, හටගත් ක්ෂණයෙහි ම ඉතිරි නැතුව ශුන්‍ය භාවයට පත් වන ධර්මතාවයන්ට භාවිත නමකි. නැතහොත් අනිත්‍ය ධර්මයකි.

භාග්‍යවතුන් වහන්සේ ව්‍යවහාරික සම්මත ලෝකය පරමත්ථ ලෝකය හා සසඳා බලද්දී එහි ඇති අනිත්‍යය, දුක්ඛ, අනත්ත ස්වභාව ධර්මතා අවබෝධ කළ සේක. මේ අවබෝධය ශ්‍රැතවත් සද්ධා සම්පන්න කල්‍යාණ පෘථග්ජනයා හට මිච්ඡාදිට්ඨියෙන් මිදී සම්මාදිට්ඨිගතව නිවන සාක්ෂාත් කළ හැකි පරිදි දේශනා කොට වදාළ මග කෙටියෙන් මෙසේය.

ශ්‍රද්ධාවත් කල්‍යාණ පෘථග්ජනයකු මේ සඳහා පහත සඳහන් ඤාණ නවය උපදවා ගත යුතු යඃ-

1. සතර සතිපට්ඨානය ඇසුරු කොට තමාගේ සිත හා කයෙහි ක්ෂණයක් ක්ෂණයක් පාසා උදය-ඨිති-භංග (විනාශය) වන වස්තුවක් ලෙස සත්‍ය ස්වභාවය මෙනෙහි කිරීම (උදයබ්බයානුපස්සනා ඤාණය)

2. මේ ක්ෂණ ස්වභාවය නිසා පවත්නා ඨිති කාලයක් නොපෙනේ. (භංගානුපස්සනා ඤාණය)

3. උපන් ක්ෂණයෙහි බිඳී බිඳී යන ස්වභාවය දැන අවබෝධමය දැක බියක් ඇති කර ගැනීම (භයතුපට්ඨානා ඤාණය)

4. ඉහත තුන් ආකාරයට ම මේ සිත කය දෙක ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳි බිඳී යන්නක් බව තීරණය කර ගැනීම (ආදීනවානුපස්සනා ඤාණය)

5. නිත්‍ය-සුබ-ආත්ම වශයෙන් පිළිගෙන තිබූ කයෙහි අනිත්‍ය-දුක්ඛ-අනාත්මතාව එලසින් ම දැක අවබෝධයෙන් කලකිරීම (නිබ්බිදානුපස්සනා ඥානය)

6. මේ පංචස්කන්ධය මෙසේ ඉපිද ක්ෂණයකින් ඉතිරි නැතිව

ක්ෂය වී යන සංස්කාරයක් සේ දැන මෙයින් මිදිය යුතු යැයි යන බලවත් කැමැත්තක් සිතෙහි ඇති කර ගැනීම (මුඤ්චිතුකම්‍යතා ඤාණය).

7. මෙසේ නුවණින් දකින විදර්ශකයා සම්මා දිට්ඨිගත වූවකු වන හෙයින් තමාගේ හා බාහිර වූ රූප කෙරෙහි ඇලීමක් ගැටීමක් බියක් නොගෙන පමණට බැලීමට සිත සකසා ගනී. (පටිසංඛානුපස්සනා ඤාණය)

8. ඉහත සත් ආකාර සිත් ඇති විදර්ශකයාට දැන් මම-මාගේ-මම වෙමි යනුවෙන් ඇලීමට ආධ්‍යාත්මික බාහිර දෙලොවෙහි ම කිසි ම දෙයක් නැති බව වැටහී සියලු සංස්කාරයන් කෙරෙහි මැදිහත් සිතක් ඇති වේ. (සංඛාරුපෙක්ඛා ඤාණය)

9. මේ වන විට විදර්ශකයාට විශේෂයෙන් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නම් වූ පංචස්කන්ධයෙහි ම අනිත්‍යතාව නාමික වශයෙන් වැටහී ඒ වැටහීම බුදු රජාණන් වහන්සේ අනුශාසනා කළ සත්‍ය හා ගැලපෙන බව විශ්වාසයෙන් ම පිළිගනියි. (සච්චානුලෝමික ඤාණය)

මේ නුවණ වනාහි, බුදු රජාණන් වහන්සේ වදාළ චතු ආර්ය සත්‍ය වෙත හඹා යාමට උපකාර වන්නකි. බුදුන් වහන්සේ වදාළ සත්‍යයට අනුලෝම වූවකි. මේ අවස්ථාවට පත්වීම "ධම්මට්ඨිතිඤාණය" ලෙසින් බුදු දහමේ සඳහන් වේ. මෙහි ලා කිසි ම කෙලෙස් ප්‍රහීණයක් නැත, දැක්මක් පමණි. මේ වන විටත් විදර්ශකයා කල්‍යාණ පෘථග්ජනයෙක් ම ය. එනමුත් මේ අවස්ථාව පෘථග්ජන ගෝත්‍රයෙන් මිදී ආර්ය ගෝත්‍රයට ඊළඟට පියවර තබන්නකු හෙයින් ගෝත්‍රයෙන් මිදෙන්නකු (ගෝත්‍රභූ ඤාණය) ලෙස නම් කර ඇත. බුදු දහමේ පූර්ව විදර්ශනා ඥානය ඇත්තෙකි.

දැන් මෙතැන් සිට ආර්ය මාර්ගය මෙසේ දක්වා ඇත. ආර්ය මාර්ග යට පිළිපන්නාහු සියලු දුක් ප්‍රහීණ කොට නිවන් සැපය ලබන්නාහු ම ය. කාම-රූප-අරූප යන තුන් භූමියේ ම ඇත්තේ දුක්ඛ දුක්ඛ ම ය. මේ ත්‍රිවිධ භූමියෙන් ම මිදීම විමුක්තියට පත්වීමයි. එනම් නිර්වාණ සැපය ලැබීමයි. මේ දුක් සසර පුරාම තිබූවක් හෙයින් මේ වන විට පැසෙමින් සැරව (ආසව) ලෙස ගලා යේ. එවැනි ආසව හතරකි. 01. කාමාසව

02. භාවාසව 03. දිට්ඨාසව 04. අවිජ්ජාසව යනුවෙනි. මේ හතර ප්‍රහීණ කිරීම නිවනයි.

මේ හතර නිසා ඇති වූ සසර බැඳ තබන බැම් දහයකි. සංයෝජන නමින් හඳුන්වන මේ බැම් සතර මඟ සතර ඵල ලැබීමෙන් කඩා බිඳ දැමිය හැකි ය. අවසන් අරහත් ඵලය නිවනයි.

මේ තත්ත්වය හඳුන්වන ඉන්ද්‍රිය තුනක් ඉතිවුත්තික පෙළෙහි (ඛු.නි. 1 පි 390) ඉන්ද්‍රිය සූත්‍රයෙහි මෙසේ දක්වයි. 1. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය (සෝවාන් මඟ නුවණ) 2. අඤ්ඤින්ද්‍රිය (සෝවාන් ඵල සිට අරහත් මඟ නුවණ ලත් හය දෙනා) 3. අඤ්ඤාතාවින්ද්‍රය (අරහත් ඵල නුවණ) මෙහි ලා සෝවාන් මඟ නුවණ මෙහෙයවා සසර බැඳ තැබූ සංයෝජන බැම් තුනක් කඩා දමයි.

01. විචිකිච්චාව (බුදු දහම පිළිබඳව ඉතිරිව ඇති සැක ප්‍රහීණය) 02. සීලබ්බතපරාමාස (වෙනත් ශාස්තෲව්‍රත අත් හැරීම) 03. සක්කාය දිට්ඨිය (මම මාගේ අස්මි මානයෙන් මිදීම) මේ තුන ප්‍රහීණයත් සමඟ සෝවාන් ඵලයට පත් වන යෝගාවචරයා සතර අපායෙන් ම මිදේ. සම්බෝධිපරායන (උපරිම ආත්ම හතක් තුළ අරහත් බුදු බවට පත්වීම) වෙයි. ආරද්ධ වීර්යය සතර ඉද්ධිපාද වඩන්නහු අනතුරුව ඉහත දැක්වූ දෙවැනි ඥානය උපදවා ගනිමින් 04. කාමාසව (කාම රාගය) තුනී කර ගන්නේ 05. පටිඝ සංයෝජනය ද සමඟිනි. මේ සකදාගාමී ඵලස්ථයාගේ ස්වභාවයයි. 05. පටිඝ සංයෝජන බැම් දෙක මුළුමනින් ම ප්‍රහීණ කොට අනාගාමී ඵලයට පත් වන්නේ නැවත කිසි දාක කාම ලෝකයට නොයන පරිද්දෙනි. එහෙත් අනාගාමී ඵලස්ථයා තුළ භවරාගය තිබේ. තව දුරටත් අවිද්‍යාව ද ඉතිරිව ඇත. අනතුරුව පිළිවෙළින් ආර්ය මාර්ගයේ උපදවන ත්‍රිවිධ ශික්ෂා වඩන අනාගාමී ඵල සංඛ්‍යාත සේඛ පුද්ගලයාට පළමු කොට රහත් මඟ නුවණ උපදී. ඒ ඥානයෙහි ම අකාලිකව රහත් ඵල නුවණ ද සාක්ෂාත් කෙරේ. මේ වන විට භවරාගය නම් වූ 06. රූපරාග 07. අරූපරාග භව සංයෝජන දෙක ක්ෂය වේ. එසේ ම මේ වන විට කාමරාග භවරාග ක්ෂය වී ඇති හෙයින් ද, කාම තණ්හා, භව තණ්හා (ශාස්වතවාදී) හා විභව තණ්හා (උච්ඡේදවාදී) ප්‍රහාණය වූ හෙයින් ද, ඉතිරි සංයෝජන තුන වූ 08. මාන්නය 09. උද්දච්චය 10. අවිද්‍යා ද ක්ෂය වන්නේ ය. තමන්ගේ විමුක්තිය (නිවන)

ස්ථිර ය, නොනැසෙන්නේ ය (අකෝප්‍ය) යැයි වැටහේ. අවසන් ඉන්ද්‍රිය වූ අඤ්ඤාතාවින්ද්‍රියට පසු විමුක්ති ඥාන දර්ශනයෙන් සිත පවතී.

මේ තුන් ඉන්ද්‍රියයෙන් සමන්විත වූ ශාන්ත නිවනෙහි යන පුද්ගල තෙමේ ස්කන්ධමාර - ක්ලේශමාර - අභිසංඛාරමාර - පුනර්භවයක් ඇති මච්චු මාර හා දේවපුත්ත මාර (කෙලෙස් සාදන නියාමකය) යන පස් මරුන් දිනා අවසන් පංචස්කන්ධය දරන්නේ ය.

අරහත් ඵල සංඛ්‍යාත නිවන ඇත්තේ මෙලොවයි. එයින් පටිපදාඤාණ විශුද්ධිය ලබා මේ ජීවිතයේ දී ම ඒ නිවන (විමුක්තිය- මිදීම) අපි සාක්ෂාත් කරන්නෝ වෙමු. ආරද්ධ සතර වීර්යය මේ සඳහා අපට උපකාර වේ.

සිරිලක බොදු පුනරුදයක් උදාකළ
අමෙරිකානු ජාතික

# කර්නල් හෙන්රි ඕල්කට්තුමා සිදුකළ ජාතික මෙහෙවර 21

**සෝමදාස විජේසුන්දර**
හිටපු අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා විදේශ සේවය

අමෙරිකාවේ නිව් ජර්සි නගරයේ දී කර්නල් හෙන්රි ඕල්කට්තුමා උපත ලැබුවේ 1832 අගෝස්තු 02 දින දී ය. එතුමාගේ මව්පියන් වූයේ හෙන්රි වෙකොෆ් ඕල්කට් සහ එමලි ඇටල් ස්ටීල් යුවලයි. නිව්යෝක්හි සිටි කොලෙජ් වෙතින් මූලික අධ්‍යාපනය ඇරඹූ ඔහුගේ උසස් ප්‍රතිඵල නිසා කොලොම්බියා විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීමේ අනගි අවස්ථාව උදා විය. කෙසේ වුව ද 1851 දී සිය පියාගේ ව්‍යාපාර බංකොළොත් වීම සමඟ ඇති වූ මුදල් හිඟය නිසා කොලොම්බියා විශ්වවිද්‍යාල අධ්‍යාපනය හැර දැමීමට ඔහුට සිදු විය.

ලේඛන කලාවට ලැදි වියතකු වූ ඔහු 1858 සිට 1860 දක්වා නිව්යෝක් ට්‍රයිබන් සහ මාර්ක්ලේන් එක්ස්ප්‍රස් පුවත්පත්වල පුවත්පත් කලාවේදියෙක් විය.

1860 දී හෙන්රි තරුණයා මේරි ඈප්ලි මෝගන් සමඟ විවාහ දිවියට එළඹුණි. ඔවුන්ට එක් ගැහැනු දරුවකු සහ පිරිමි දරුවන් දෙදෙනකු ලැබුණ ද අවාසනාවකට ගැහැනු දරුවා සහ පිරිමි දරුවෙක් ළදරු වියේ දී ම මිය ගියහ.

යුගයේ අවශ්‍යතාව මත හෙන්රි ඕල්කට් මහතා 1865 දී අමෙරිකා සිවිල් යුද සමයේ දී හමුදාවට බැඳුණ අතර ඔහුගේ කාර්යක්ෂම සේවා කැප වීම නිසා අධිකාර ලත් කර්නල්වරයකු තත්ත්වයට උසස් වූයේ ය.

මේ අතරවාරයේ දී ශ්‍රී ලංකාවේ පැවැති සුප්‍රකට පානදුරා වාදය පිළිබඳව පීබල්ස් විසින් රචිත බුදුසමය පිළිබඳ ලේඛන කියැවීමේ අවස්ථාව ඔහුට ලැබිණ. ඒ තුළින් බෞද්ධ දර්ශනය පිළිබඳව මහත් උනන්දුවක් ඔහු තුළ ජනිත විය. බෞද්ධ දර්ශනය තම ජීවන දර්ශනය බවට පත් විය යුතු බවට අදිටන් කර ගත් ඔහු මෙම ගැඹුරු දර්ශනය හැදෑරීමට පෙළඹිණ. බුදුන් වහන්සේ වදාළ සත්‍යවාදී දර්ශනය ඔහුගේ මහත් ගෞරවයට පාත්‍ර විය.

අවාසනාවකට 1871 දී ඔහුගේ විවාහ දිවිය දෙදරා ගිය ද පිරිමි දරුවන් දෙදෙනා පියාගේ අඛණ්ඩ රැකවරණයට ලක් වෙමින් වැඩුණහ.

1874 දී රුසියානු ජාතික හෙලේනා බ්ලැවැට්ස්කි මහත්මිය අමෙරිකාවේ දී ඕල්කට්තුමාට මුණගැසිණ. මේ දෙදෙනා මූලිකව අමෙරිකාවේ දී පරම විඥානාර්ථ සංගමය පිහිටුවා ගත් අතර සංගමයේ සභාපති ඕල්කට්තුමා ද ලේකම් බ්ලැවැට්ස්කි මහත්මිය ද වූහ.

මෙසේ පරිවර්තනයට ලක් වූ ඕල්කට්තුමා 1879 පෙබරවාරි 16 දින ඉන්දියාවට සංක්‍රමණය වීමෙන් අනතුරුව 1879 නොවැම්බර් 29 දින එහි පරම විඥානාර්ථ සංගම් ශාඛාවක් පිහිටුවා ගත්තේ ය.

පානදුරා වාදය කියැවීමෙන් පසුව බෞද්ධ දර්ශනය අධ්‍යයනය එතුමාගේ ඉලක්කය විය. එබැවින් ඔහු ඉන්දියාවේ සිටින අතරතුර ම ලක්දිව බෞද්ධ දර්ශනය පිළිබඳ වියතුන් වූ හික්කඩුවේ සුමංගල හිමි සහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි සමඟ ද සන්නිවේදන සබඳතා ඇති කර ගත්තේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තම දර්ශනයේ ම සහායිකාවක වූ රුසියානු ජාතික බ්ලැවැට්ස්කි මැතිණිය සහ තවත් කිහිපදෙනකු සමඟ ඕල්කට්තුමා 1880 මැයි 17 දින නැව් මඟින් ගාලු වරායට සැපත් වූයේ ය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ප්‍රමුඛ විශාල පිරිසක් විසින් මහත් හරසරින් පිළිගනු ලැබූ මෙම විදේශික පිරිස ගාල්ල විජයානන්ද විහාරයට කැඳවා ගෙන යන ලදි. 1880 මැයි 19 වන දින විජයානන්ද විහාරයේ දී මෙම පිරිස පංචශීලයෙහි පිහිටුවූයේ අක්මීමණ ධම්මරතන ස්වාමීන් වහන්සේ විසිනි.

ඕල්කට්තුමා සහ බ්ලැවැට්ස්කි මැතිණිය බුදුසමය වැළැඳ ගැනීම සිරිලක නව බොදු පුනරුදයක ඇරඹුම සනිටුහන් කළේ ය. මෙතැන්

සිට ඕල්කට්තුමා බෞද්ධ භික්ෂු සංඝයා සහ ගිහි පිරිස් සමඟ ද සබඳතා තර කර ගත්තේ ය. එසේ ම අන්‍ය ආගමික නායකයන් හා අදහන්නන් සමඟ ද කුළුපග සබඳතා අඛණ්ඩව පවත්වා ගෙන ගියේ ය. 1880 ජූනි 17 දින කොළඹ දී බෞද්ධ පරම විඥානාර්ථ සංගමය පිහිටුවන ලදි.

එදා හෙළයා ඉංග්‍රීසි යුරෝපීය අධිරාජ්‍යවාදයේ කෲරතර හස්තයෙන් තම නිජබිම තුළ දී ම තාඩන පීඩන හා හිංසනයට ලක් වීම සියැසින් දැක අත් විඳීමට ඕල්කට්තුමාට හැකි විය. දිවයින සතර දිග්භාගයේ බරබාග කරත්තයකින් සැරිසරමින් හෙළයා නඟා සිටුවීම හා සමගි කරවීමේ අරමුණින් දේශන පැවැත්වූයේ මෙම සංචාරය අතරතුර දී ය. භාෂා පරිවර්තකයකුගේ පූර්ණ සහයෝගයෙන් කළ මෙම දේශනා ශ්‍රවණය කිරීමට දහස් ගණන් හෙළයෝ එක් රොක් වූහ. මෙවන් දේශක පරිවර්තකයකු ලෙසට එදා අනගාරික ධර්මපාලතුමා ද ඕල්කට්තුමාට උපරිම සහයෝගයක් ලබා දුන්නේ ය.

1891 දී ඉන්දියාවේ මහාබෝධි සමාගම පිහිටුවීමට ධර්මපාලතුමාට උදව් කළේ ද ඕල්කට්තුමා ය. එමෙන් ම 1893 දී චිකාගෝහි පැවැති ජාත්‍යන්තර ආගම් සම්මේලනයට ලංකාව නියෝජනය කරමින් ධර්මපාලතුමා සහභාගි කරවූයේ ද ඕල්කට්තුමා විසිනි.

එතකින් නොනැවතුණ ඕල්කට්තුමා බෞද්ධ පරම විඥානාර්ථ සංගමය වෙනුවෙන් මුද්‍රණාලයක් විවෘත කරමින් බෞද්ධයා උදෙසා "සරසවි සඳරැස" පුවත්පත මුද්‍රණය ආරම්භ කළේ ය. බෞද්ධ ජනයා අතර සන්නිවේදන මාධ්‍යයක් ලෙස සරසවි සඳරැස පිහිට විය. ඕල්කට්තුමාගේ මේ අපූරු මැදිහත් වීම ඒකාලෝක කිරීමට එවක බ්ලැවැට්ස්කි මැතිණියගේ සහායට අමතරව හික්කඩුවේ සුමංගල හිමි හා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ද කළ කැප කිරීම් ද මෙහි දී ගෞරව සම්ප්‍රයුක්තව සඳහන් කළ යුත්තේ ම ය.

ඉන් අනතුරුව ධර්මපාලතුමාගේ ද පූර්ණ සහයෝගය ලබා ගනිමින් බෞද්ධ ශාස්ත්‍රශාලා ඇරඹීම ඓතිහාසික සන්ධිස්ථානයකි. බෞද්ධ ශාස්ත්‍රශාලා සංකල්පයේ වර්ධනයක් ලෙස එදා මරදාන ආනන්ද විද්‍යාලයේ ඓතිහාසික ආරම්භය ශ්‍රී ලාංකික අනන්‍යතාවක් සහිත බෞද්ධ නවෝදයකි. ඒ සමඟ ම දිවයිනේ ප්‍රධාන නගරවල ද විශිෂ්ට ගණයේ බෞද්ධ විද්‍යාල ඇරඹුම සමඟ නව අධ්‍යාපන පුනර්ජීවනයක්

ඇරඹිණ. මෙසේ ඇරඹි ප්‍රවීණ විද්‍යාල සමහරක් පහත පළ වේ:-

ආනන්ද විද්‍යාලය, කොළඹ 1886

නාලන්ද විද්‍යාලය, කොළඹ 1886

ධර්මරාජ විද්‍යාලය, මහනුවර 1887

මලියදේව විද්‍යාලය, කුරුණෑගල 1888

Buddhist Boys' School, ගම්පහ 1891

මහින්ද විද්‍යාලය, ගාල්ල 1891

ධර්මදූත විද්‍යාලය, බදුල්ල 1891

මෙම වකවානුවේ දී ඕල්කට්තුමා විසින් ඔයැ ර්මාායදපිඑ ක්එැජයදපිප ග්‍රන්ථය රචනා කරන ලද අතර එය තවත් භාෂා ගණනකට පරිවර්තනය විය. "බෞද්ධ කථෝපකථනය" යනුවෙන් සිංහලයට ද පරිවර්තනය වූ මෙම ග්‍රන්ථය සිංහල බෞද්ධයාට බුදු දහම ඉගෙන ගැනීමේ මූලාශ්‍රයක් විය.

ඊට අමතරව එතුමා සිරිලක් ඉතිහාසයේ ප්‍රථම වරට දහම් පාසල් සංකල්පය පෙරට ගෙන එමින් 1886 දී ගාල්ලේ වැලිවත්ත විජයානන්ද විහාරස්ථානයෙන් ප්‍රථම දහම් පාසල ඇරඹී ය. අනතුරුව එම දහම් පාසල් සංස්කෘතිය අද දක්වා දිවයින පුරා ප්‍රචලිතව ඉදිරියට පැමිණ සිසු දරුවන් යහපත් පුරවැසියන් කිරීමේ මාවතක් බවට පත්ව ඇත.

1888 දෙසැම්බර් මස පැවැත්වූ පරම විඥානාර්ථ සංගම් වාර්ෂික සම්මේලනයේ දී සර් පොන්නම්බලම් අරුනාචලම් මහත්මා ප්‍රකාශ කළේ පරම විඥානාර්ථ සංගමයේ ආදර්ශවත් මෙහෙවර නිසා සිරිලක පැරණි බුදුසමය යළි ස්ථිරව ම ශක්තිමත්ව ප්‍රතිෂ්ඨාපනය වී ඇති බවයි.

වර්තමාන බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමේ දී ඕල්කට්තුමාගේ ඓතිහාසික මෙහෙවර ගෞරවයෙන් සිහිපත් කරමු. 1884 අප්‍රේල් මස බ්‍රිතාන්‍ය යටත්විජිත ලේකම්වරයා හමු වූ ඕල්කට්තුමා ලංකාවේ බෞද්ධ ජනතාව විඳින තාඩන පීඩන පිළිබඳව කරුණු හෙළිදරව් කරමින් සහන සැලසීමේ මං විවර කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස 1885 අප්‍රේල් 28 දින වෙසක් පොහොය දිනය ලක්බිම නිවාඩු දිනයක් ලෙස බ්‍රිතාන්‍ය රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදි. පසු කාලීනව වෙසක් පොහොය

දින ප්‍රසිද්ධ නිවාඩු දිනයක් ලෙස එක්සත් ජාතීන්ගේ මණ්ඩලය (UNO) විසින් ද පිළිගන්නා ලදි.

1967 වසරේ දී ඩඩ්ලි සේනානායක අගමැතිවරයා ලෙස එවක පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරමින් 'හෙන්රි ඕල්කට්' මැතිතුමා ශ්‍රී ලංකා වීරවරයකු ලෙස ජාතික වීර නාමයෙන් ගෞරවයට පාත්‍ර කළේ ය.

පුරා වසර විස්සකට අධික කාලයක් ලංකාවේ රැඳී සිටිමින් බුදු සමයේ චිරස්ථිතිය උදෙසා දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් ද තම ශ්‍රමය, ධනය, දැනුම සහ කාලය පූර්ණකාලීනව පුද කළ ඒ වීර මාර්ගෙ ්පදේශකයා 1907 පෙබරවාරි 17 වන දින ඉන්දියාවේ අඩ්‍යාහි පරම විඥාන කාර්යාලෙයේ පිහිටි එතුමාගේ කුටියේ දී පරලෝ සැපත් වූයේ ය.

දහම් පාසල් ආරම්භ කිරීම, දේශීය බෞද්ධ විද්‍යාල ඇති කිරීම, බෞද්ධ කොඩිය නිර්මාණයට දායක වීම, වෙසක් පොහොය දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රසිද්ධ කරවීම, බෞද්ධ දර්ශනය ජාත්‍යන්තර තලයට ගෙන යාම, සිංහල බෞද්ධයා නඟා සිටුවීමට කටයුතු කිරීම ආදී සුවිසල් මෙහෙයන් රාශියක් කළ යුරෝපා සම්භවයක් සහිත අමෙරිකා ජාතික ඕල්කට්තුමා ශ්‍රී ලංකාවේ සදාතනික වීරවරයකු නොවන්නේ ද!

# Buddha Dhamma – A Teaching for All Times 22

**Siri Vajirārāmaye Ñāṇasīha**
Siri Vajiraramaya,

The teaching of the Buddha is best called Buddha Dhamma rather than Buddhism, because the Buddha Dhamma is not an 'ism'. When the Buddha gained Enlightenment on a Vesak full-moon day 2612 years ago, seated under the Bodhi Tree at Bodh Gaya, India, He found a Way to end the eternal suffering of humankind, a suffering that has no end by itself but has to be ended by each one to himself or herself. Once the Buddha said that it is in this fathom long body that I see the world, the cause for the continuance of the world, the ending of the world and the Path leading to the ending of the world.

Life is not a bed of roses. It was so from the dawn of human history. It is so today and will be so in the future until doomsday, whatever that be. At all times, past, present and future, every one, every nation, every institution or any creation, has to face during its lifetime the vicissitudes of existence, referred as loka-dhamma by the Buddha, the Enlightened One. They are gain and loss, honour and dishonour, happiness and misery, praise and blame and are called loka-dhamma because they arise in connection with worldly life. The teaching of the Buddha is for the development of one's mind to face such situations without anguish or remorse. The highest blessing according to the Buddha's teaching is to reach that state of mind that

does not flutter under any of the aforesaid circumstances.

Although the conditions that are faced are similar, there are differences in magnitude. Moreover, with the world getting closer due to advancement of technology what happens on the other side of the world are known instantaneously. Every moment we hear of the sufferings – wars, floods, tornadoes, avalanches, earthquakes, killings etc. The daily newspapers, television and radio broadcasts carry the distressing news in a moment. With the smartphones one could say the agonies of the world are at our fingertips. Hence, there is enough evidence today to authenticate without belaboring the cardinal teaching of the Buddha that the world is established on dukkha, commonly translated as suffering. Only a blind or deaf person will state that there is no suffering in this world.

The teaching of dukkha is more fundamental than the vicissitudes or vagaries of life that arise in connection with worldly life. The Buddha saw that with birth comes ageing, disease and death. None of these are fanciful. Ageing is a process and no one, whatever the faith, can stop that process. Similarly, there is disease and no one can be assured of or no one even with almighty power can assure a life without disease. The ageing process itself brings about disease and disabilities that one has to live with. Most unpredictable of the three is death. It could come at any moment, whatever be the age. Many are the explanations in the teachings of the Buddha for untimely death. Hence, the clarion call of the Buddha from His deathbed that occurred again on a full-moon day of Vesak 2567 years ago was that everyone should work out one's own liberation with diligence.

A simple question was raised by the Buddha as to what the immediate cause for this unsatisfactory nature of having to undergo ageing, disease and death. The answer was birth. No one can disagree with that contention and if that be so, one has to accept that if there is

no birth, there is no ageing, disease and death. Hence the quest of the Buddha-aspirant seated under the Bodhi tree was to find the cause of the recurrence of birth, which He found when in deep meditation. The cause that he found with his own knowledge and no prompting from outside was the innate desire or craving within. He saw that the whole world is driven by this force, namely, craving for long life, craving for happiness, craving for power, craving for pleasures of the senses, craving for existence when times are good and craving for non-existence when times are bad. The Buddha beckons everyone to come and see for themselves whether this statement is true or not. A deep analysis of all the happenings in the world, whether good, bad or neither good

or bad, would help in realizing the truth therein and its validity.

The effort of every person, every nation and every institution are for the fulfilment of those desires and when oppositions are encountered hatred arises with the 'desire' to eliminate the opposing factors, be it a person, a nation, an ideology or anything else. These tendencies the Buddha explains are due to a deluded notion that by fulfilling the desires there will be permanent happiness not realizing the ever-changing nature of all things.

The Buddha's teaching is to gain permanent happiness in this world itself. It is called Nibbana, the Bliss Supreme and that happiness is achievable by anyone. However, not by prayer but by diligent practice and treading the prescribed path. There are many during the lifetime of the Buddha and after, who have gained that happiness and expressed their glee in peons of joy.

The path to happiness is the Buddha Dhamma - the Teaching of the Buddha. The doors are open to anyone without gender bias and without distinction of colour, faith, ethnicity or any other man-made divisions, to benefit from that teaching. It is a Teaching for all times as it is an antidote for the conditions of worldly life as elucidated

above. The foundation is morality based on the five precepts of abstaining from killing any living being, from stealing, from unchastity, from lying and from the use of intoxicating substances; and practiced in a manner that is dear to the noble ones – unbroken, spotless, unblemished, consistent and leading to concentration. With deep concentration assisted by right mindfulness and right effort, the mind is ready to see for oneself the true nature of things, i.e., the impermanence, the un-satisfactoriness, and the nonexistence of an I, my, and mine. Thereafter, he comprehends the world in its conditionality and dependent nature. With such a mind there is no attachment to the world and worldly things that causes suffering. They could say:

Ah! happily do we live peaceably amongst the hateful;

Amongst the hateful, we live peaceably.

Ah! happily do we live in good health amongst the ailing;

Amongst the ailing, we live in good health.

Ah! happily do we live without yearning (for sensual pleasures) amongst them who yearn;

Amongst those who yearn (for them), we live without yearning.

Ah! happily do we live – we who have no impediments;

Feeders on joy shall we be even as the radiant gods (devas).

(Dhammapada VV 197-200

# AVIJJA (DELUSION) – THE GREAT HINDRANCE! 23

**Dr Mass R. Usuf**

Avijja (Delusion) is one of the three roots of demerits. The other two are Craving and Hatred or Aversion.

Avijja is elucidated in manifold ways within many Buddhist traditions. Intrinsically, however, it is stated as ignorance of the true nature of reality or delusion.

Ignorance should not be misconstrued as a state arising from a mere lack of information or the paucity of knowledge. Avijja is also about misperceptions, misconceptions, looking at delusion as reality, incorrect knowledge, not comprehending the nature of phenomena as Unsatisfactoriness, Impermanence, Not-self (Ti-lakkhana – Dukkha, Anithya and Anathma).

It is a pivotal concept in Buddhism so much so that the initiating cause of Dukkha is attributed to Avijja rather than to sin! Only by the elimination of Avijja can one overcome Dukkha! Those who are steeped in Avijja are prone to create insalubrious actions.

In the Suttanta literature Avijja refers to the non-comprehension of the Four Noble Truths!

Avijjā is also referred to as "bewilderment" (vyaakulathvaya) which is one of the seven Anusayas (latent tendencies). The Anusayas are debasements that have not been eradicated by Magga-Nāṇa (deep knowledge of Dhamma/path). The seven Anusayas are (1) Kāmarāga-anusaya, the seed element of greed, (2) Paṭigha-anusaya, the seed element of hatred, (3) Māna-anusaya, the seed element of conceit (4) Diṭṭhi-anusaya, the seed element of wrong view (5) Bhavarāga-anusaya, the seed element of attachment to existence, (6) Vicikiccha-anusaya, the seed element of uncertainty, (7) Avijjā-anusaya, the seed element of bewilderment.

Understanding cannot dawn on a person in a bewildered state. The Anusayas transform a being into a state where the identity of 'I am' strongly prevails through Avijja!

Monks, but when there is the attitude 'I am',

There, there is descent of the five sense-faculties

Of eye, ear, nose, tongue, body.

Monks, there is the mind organ

There are mental objects

There is the element of knowledge.

Monks, the uninstructed ordinary person

Touched by feeling

Born of stimulation by spiritual ignorance (Avijja)

Thinks 'I am'. (Samyutta Nikaya 111.46)

'Bhikkhus, I do not perceive any single hindrance other than the hindrance of ignorance by which humankind is so obstructed and for so long a time runs on. (Itivuttaka 14)

'Not knowing about dissatisfaction, not knowing about the origin of dissatisfaction, not knowing about the cessation of dissatisfaction, not knowing about the way leading to the cessation of dissatisfaction — this is called the origin of ignorance. When a noble disciple understands ignorance, the origin of ignorance, the cessation of ignorance, and the way leading to the cessation of ignorance is the way of right view, and has arrived at this true Dhamma. (Ven. Sariputta)

Avijja is one of the twelve links of Dependent Origination (Pratītyasamutpāda - twelve Nidanas). Human beings remain trapped in dissatisfaction (discontentment) with the nature of life and the world.

Samyutta Nikaya II.2–4 and Digha Nikaya II.55–63, ascribes the cyclical process of birth, aging and death to the enslavement to the twelve Nidanas - the initiative cause being Avijja. The twelfth link Jarāmaraṇa sets off the process of Dependent Origination commencing with Avijjā - thus initiating the cycle of Dukkha (unsatisfactoriness) perpetually!

Avijja can be banished by embracing correct understanding, correct conception parallelly with Mindfulness (Sati) that will inevitably result in correct perception. Avijja cannot be eradicated by the accumulation of mere book knowledge or by the parrot like recital of scriptures. The true nature of complex phenomena must be understood! Avijja can be removed by the deep understanding of the Four Noble Truths.

The understanding of the path leading to the cessation of Dukkha propels one to the first of eight rungs of the Noble Eightfold Path (Samma Ditthi – Right Understanding). Samma Ditthi is the realisation of the verities of the Four Noble Truths. It is about the understanding of oneself as one really is amidst phenomena in flux; From then on the steps begin leading to Nirvana!

Avijja can also be eliminated through meditation. It can also be eliminated through the practice of Dharma, selflessness and righteousness. This paves the path for wisdom to dawn upon oneself. Avijja is darkness. Darkness can be dispelled only by light! The Buddha said that Avijja can be removed only by cultivating the light of wisdom!

'Monks, ignorance is the leader in the attainment of unskillful qualities, followed by lack of conscience & lack of concern. In an unknowledgeable person, immersed in ignorance, wrong view arises. In one of wrong view, wrong resolve arises. In one of wrong resolve, wrong speech arises. In one of wrong speech, wrong action arises. In one of wrong action, wrong livelihood arises. In one of wrong livelihood, wrong effort arises. In one of wrong effort, wrong mindfulness arises. In one of wrong mindfulness, wrong concentration arises'. (Avijja sutta). These undesirable attributes are contrary to the Noble Eightfold Path!

When one is permeated with wisdom one attains the ability to correctly perceive things breaking through the veil of illusion! One gains an insight into the true nature of metaphysical reality,

One has come home!

In the Avijja sutta, the Buddha has said that everything is unworthy of attachment. If one perceives, with perfect clarity, that everything is unworthy of attachment, one beholds the nature of everything. By knowing everything, understanding dawns upon oneself about everything. This understanding enables oneself to perceive everything as separate!

The Buddha says, one then sees the eye as a separate entity. One perceives the forms generated by eyesight as separate. One sees the conscious thoughts generated by sight as separate. One observes the very eye contact as separate. Moreover, whatever

phenomenon that arises in dependence on eye-contact — felt as either pleasure or pain, or as neither pleasure nor pain - that too one perceives as something separate!

In same manner one perceives the ear, nose, tongue, body and intellect as entities that are separate.

The Buddha states: "This is how a monk knows, this is how a monk sees, so that ignorance is abandoned and clear knowing arises!"

# Buddhism and Crime Prevention 24

**Dr EAD Anusha Edirisinghe,**
Dean, Faculty of Criminal Justice,
General Sir John Kotelawala Defence University

Through the lens of sociological imagination - a concept introduced by C. Wright Mills that connects personal experiences to broader societal structures—the relationship between Buddhism and crime prevention becomes more intelligible. Buddhism offers a comprehensive ethical framework—centered on the Five Precepts, karma, and rebirth—that promotes self-discipline, personal responsibility, and mindfulness. These internalized values align with Emile Durkheim's concept of the collective conscience, which fosters social cohesion and reduces deviance. Buddhist communities, particularly monastic institutions, serve as centers of spiritual support and guidance, offering individuals a sense of belonging and mitigating the alienation often associated with criminal behavior. Ultimately, the Buddha's emphasis on compassion, ethical conduct, and rehabilitation over retribution reflects an early form of restorative justice that continues to resonate in modern criminal justice discourse.

Moreover, Buddhism's emphasis on compassion, forgiveness, and transformation is exemplified by the story of Aṅgulimāla, a notorious bandit who, after encountering the

Buddha, renounced violence and joined the monastic order. His transformation illustrates Buddhism's belief in rehabilitation over retribution (Loy, 2000; *Angulimala Sutta*, MN 86).

## Crime and Punishment in Ancient Indian Society

Despite Buddhism's ethical ideals, the society during the time of Gautama Buddha (circa 6th–5th century BCE) was marked by widespread crime and systemic injustice. The *Jataka Tales* and other early texts reference offenses such as homicide, adultery, theft, and betrayal, indicating the prevalence of moral transgressions and societal challenges (Cowell, 1895).

Secular Punishment Systems Ancient Indian society employed severe punitive measures for serious offenses. Punishments included fines, imprisonment, and capital punishments such as impalement, drowning, or being trampled by elephants. These punishments were often determined by caste and social hierarchy, reflecting the deeply stratified nature of society (Basu, 2013; Studocu, 2022).

Instances of state-sanctioned violence, such as the massacre of the Sakya clan by King Vidudabha, reveal the intersection of political power and violence. This event, reportedly a retaliation for a perceived insult to the Kosalan throne, underscores the brutal realities of ancient political dynamics (Strong, 2001; Facts & Details).

## Buddhist Perspectives on Justice and Discipline

Buddhist teachings offered a stark contrast to the retributive justice systems of the time. The Vinaya Piṭaka, which outlines monastic discipline, categorized transgressions and prescribed corrective measures rather than corporal punishment. For

example:

- Pārājika offenses (e.g., murder, theft, sexual misconduct) led to permanent expulsion.
- Saṅghādisesa offenses required formal community meetings and probation.
- Lesser offenses involved confession, restitution, or temporary penalties.

These disciplinary codes emphasized *rehabilitation*, *self-correction*, and *communal harmony*.

In the *Kūṭ adanta Sutta* (DN 5), the Buddha advised a king to abandon capital punishment and instead implement social welfare and education to reduce crime. This early articulation of restorative justice suggests that addressing the root causes of crime—poverty, ignorance, and alienation—was more effective than punitive measures.

## Alcohol and Ethical Conduct

Alcohol consumption was prevalent in ancient India. Beverages such as *surā* (grain-based), *meraya* (sugarcane-based), and *majja* (honey-based) were common. Recognizing the moral and psychological dangers of intoxication, the Buddha instituted the Fifth Precept: abstention from intoxicants that lead to heedlessness.

This precept aimed to preserve *mental clarity* and *ethical behavior*. In the monastic code, alcohol consumption was a serious offense. Despite its social ubiquity, Buddhism promoted sobriety as essential for mindfulness and spiritual progress. Ancient medical texts like the *Sushruta Samhita* even acknowledged alcohol's use in anesthesia, illustrating its dual role in society.

## Women, Crime, and Social Justice

The status of women in ancient India was shaped by patriarchal norms, yet Buddhism introduced revolutionary concepts of spiritual equality. The establishment of the Bhikkhuni Sangha allowed women to pursue spiritual advancement. Figures such as *Mahapajapati Gotami*, the Buddha's foster mother, played pivotal roles in early Buddhism.

However, broader society remained deeply patriarchal. Practices like child marriage, widow restrictions, and gender-based violence were widespread. The preference for male children often led to the devaluation of female lives and even infanticide.

Though direct references to violence against women in Buddhist texts are limited, the systemic vulnerabilities are evident. Buddhism's emphasis on compassion and non-violence presented a powerful counter-narrative, advocating for dignity and justice—even if implementation was limited by societal structures.

## Comparison with Modern Criminal Justice

- "The Buddha's first sermon went to the root of evil and the system. His thoughts have been described by a Christian commentator as purely ethical, and as never having been surpassed." – *Dudley Wright*
- ස්වභාව ධර්මානුකූලව ලැබිය හැකි පොදු සෞශීල්‍යය පිළිබඳව අන් ආගම්වලට වඩා පිරිසිදු ලෙස බුද්ධාගමේ ශික්ෂා නීති සංග්‍රහයේ කරුණු සඳහන් වේ. - **ඇඩෙල්ප් තෝමස් දේවගැතිතුමා**
- "The moral code of Buddhism has given a purer expression to natural morality." – *Rev. Adolf Thomas*
- බුද්ධාගම සැබෑ සඵල ධර්මයකි. - **පෝල් ඩාල්කේ**
- "Buddhism is the teaching of actuality." – *Dr. Paul Dulky*
- මනුෂ්‍ය වර්ගයා නිත්‍ය සැපයට පූර්ණවීමට මිනිස් සිතෙහිම ඇති ධර්ම ශක්තියම මිස අන්බාහිර දෙවියකුගේ උදව්වක් උවමනා

නොවේ යැයි දක්වමින් ස්වභාව ධර්ම සාගරයෙහි සැඟවී පවත්නා සදාචාරයාගේ ශෝභාවත් පිරිසිදු බවත් අපට බුද්ධගමෙන් හෙළි වූහ. එබැවින් ආගම්වල සක්‍රීක මාතෘ භූමිය වූ පූර්ව දිග ලෝකය තෙමේ ඒ බුද්ධාගම අපට දෙන්නේ ඒකාන්තයෙන්ම පිළිගත යුතු සත්‍ය ප්‍රකාශයක්ම දානය කළේය. - **චාල්ස් ටී. ගෝර්හැම්**

- "Surely the monsѳrous East, that fertile mother of religions, has given us in Buddhism a true revelation, since it makes known to us the moral beauty and purity that lie in the depths of human nature—needing no other divinity than that which abides in the human heart to lead them into the living glory." *– Charles T. Upham*

- බුදුරජාණන් වහන්සේ විසින් දේශිත පාලි භාෂාව වඩ වඩා දුරට තේරුම් ගැනීමේදී ප්‍රතිපත්ති කරුණු ද චිත්ත, ශාස්ත්‍රයාගේ ද ගැඹුරු තැන් විෂය කොට ඇති බුදුරජාණන් වහන්සේගේ දූරදර්ශී ඥානයේ විශාලත්වය වඩා වඩා දුරට තදින් අපට හැඟේ. - **පෝල් කේරස් පඬිතුමා**

- "The more we become acquainted with the original writings of Buddhism, the more we are impressed with the greatness of Buddha's far-seeing comprehension of both the problems of religion and philosophy." *– Dr. Paul Carus*

- බුද්ධාගම කිසිසේත් උච්ඡේද වාදයක් නොවේ. නිර්වානය නාස්තිවීමක් උච්ඡේද මාත්‍රයක් නොදක්වනු ලැබේ. පිරිසිදු බුදු දහම වනාහි අන් සියලු ආගම්වලට වඩා න්‍යාය ශාස්ත්‍රීය ප්‍රඥප්තීන්ගෙන් පනවන ලද්දා වූද, අන් ආගම්වලට වඩා ඒකාන්තයෙන් ප්‍රත්‍යක්ෂ ඵලදායි වූද, තත්වඥාන විෂය වූද ආගමකි. නමුත් බුද්ධාගමේ ප්‍රකාශිත ඒ ධර්මයෝ චිත්ත ශාස්ත්‍රාදි වූ ශාස්ත්‍ර පක්ෂයේ නොහල සිත් ඇත්තා වූ මද නුවන ඇත්තන්ට ශූන්‍යතාවක සේ උච්ඡේදවාදී ඉගැන්වීම් සේ හැඟේ. - **පෝල් කේරස් පඬිතුමා**

- "Buddhism is decidedly not nihilism, and Nirvana does not mean annihilation. Buddhism, in its purest form, is more than

any other religion a statement in philosophical terms, which—because it is positively philosophical—will naturally appear to unphilosophical minds as negation." – *Dr. Paul Carus*

- ක්‍රිස්තු වර්ෂයෙන් අවුරුදු 500කට පමණ පෙර දඹදිව පහළ වූ බුද්ධ ධර්මය නමැති ආශ්චර්ය ධර්මය ක්‍රිස්තියානියටත් වඩා ඈත පැතිර ගියේය. ක්‍රිස්තියානිය පිළිගත් ජනයාට වඩා බුද්ධාගම පිළිගත් ජන සංඛ්‍යාව අධික විය. ඒ සා මහත් ලෙස බුද්ධාගම එකල පහළ වූයේ ආයුධ බලයෙන් හෝ තාඩන පීඩන භක්තියෙන් නොව සංසුන් ක්‍රියා පිටිපාටියෙහි අනුන් ආකර්ෂණය කිරීමේ බලයෙනි. - **පණ්ඩිත පිලිනන්**

- "The very marvellous system of thought called Buddhism, which originated in India about 500 years B.C., has spread over a greater area of the earth and gained more adherents than even Christianity, and by peaceful means—by the power of persuasion, not by the force of arms, not by persecution." – *Dr. Flint*

- බුද්ධාගම වානාහී ක්‍රිස්තියානියත් මහමත් ආගමත් මෙන් නොව අනුනට පීඩා වධ බන්ධන කිරීමක් හෝ එය පිළිගැන්වීමට යුද්ධ කිරීමක් හෝ නොමැතිව පතුරවන ලද්දේය. එය ක්‍රිස්තියානියටත් වඩා වේගයෙන් පැතිර ගියේය. - **පී. විවියන්**

- "Buddhism, on the contrary, unlike Christianity and Mohammedanism, was promulgated without persecution or religious wars, and spread far more rapidly than Christianity." — *P. Vivis*

- බුද්ධාගම ගැන සළකා බැලීමේදී එය දුර්වල වී ගියේ යැයි කිසි කලෙකත් කිව නොහැකිය. මන්ද? කිසි කලෙකත් නොසෙල්විය හැකි ස්ථිර ප්‍රතිපත්ති මත පිහිටුවා ඇති හෙයිනි. - **ගර්ට්‍රූඩ් ගැරට් මැතිනිය**

- "It will never be possible to say, in regard to Buddhism, that it is worn out, because it is rooted in certain fixed principles that can never be altered." — *Garet Garrett*

- අලුත් ගිවිසුමෙහි මැතිව් ආදීන් ලියූ 'සුභාරංචිය' පොත්වල සඳහන් ප්‍රතිපත්ති ධර්ම ඉතා වැඩි හරියක් බෞද්ධ පොත්පත්වල දක්නට ලැබේ. අතීත බුදුවරුන්ගේ අන්තිම තැනැත්තා වූ ගෞතම බුදුන්ගේ චරිතයේ විශේෂ කරුණු කියවීමේදී සිදුවීම් සඳහන් ප්‍රවෘත්ති බුද්ධ ධර්මයෙන් ලුහුඬින් උපුටාගෙන අලුත් ගිවිසුමකට එක් කරන ලද්දක් මෙන් අපට හැඟේ. - **බිගෙන්ඩඩ් බිෂොප් තුමා**

- "Most of the moral truths prescribed by the Gospel are to be found in the Buddhist scriptures. In reading the particulars of the life of the last Buddha, Gautama, it is impossible not to be reminded of many circumstances relating to our Savior's life, as it has been sketched by the Evangelists." — *Bishop Bigandet*

- උදාන නම් පාලි පොත ඉංග්‍රීසියට නැගූ මේජර් ජෙනරාල් ස්ට්‍රෝං මහතා මෙසේ කියයි. "උදාන ග්‍රන්ථයේ මේ ඉංග්‍රීසි පිටපත මා විසින් ප්‍රකාශ කරනු ලබන්නේ පාලි භාෂා විෂයෙහි මාගේ සමර්ථය ඇඟවීමක් වශයෙන් නොව මේ භව නමැති කරදර සහිත හිර ගෙයින් මිදී නිත්‍ය විවේක විමුක්තියට යන මාර්ගය දෙව් මිනිසුන්ට පෙන්වා දෙනු පිණිස මෙලෝ පහළ වූ සින්දු දේශයේ අනාගරික වේශයෙන් හැසිරුණා වූ සසර දුකට පිළියම් කරනු පිණිස ඉදිරියට ආ නිරන්තර වෛද්‍යවරයා වූ භාග්‍යවත් අරහත් සම්මායක් සම්බුද්ධ මහෝත්තම ගෞතමයන් වහන්සේ ගෞරවාදරයෙන් සිහි කිරීමේ ලකුණු වශයෙනි" - **මේජර් ජෙනරල් ඩී. එම්. ස්ට්‍රෝං**

- "I publish this translation not with any pretension to proficiency in Pali, but as a tribute of love to the memory of the noble Gautama, who stands forth as the most prominent among the world's physicians—those who traversed India in monastic garb: the exalted, the holy, the highly illuminated one, who came into the world to show gods and men the way out of this sorrowful prison-house of being, into the freedom of everlasting rest." — *Major General D.M. Strong*

- බුදුරජාණන් වහන්සේ ගැන කියවන්න කියවන්න උන්වහන්සේ කෙරෙහි ඇති මාගේ ගෞරවය වැඩි වේ. හැකිතරම් ඉක්මනින් සෙසු ලෝකයාටත් උන්වහන්සේගේ ධර්මය අසන්නට ලැබුණොත් ඒ ඔවුන්ගේ යහපතට හේතු වේ. - **මහාචාර්ය පොස්බල්**

- නොයෙක් ආගම්වලට මූලස්ථානය වූ පෙරදිග බුද්ධාගම මගින් ඒකාන්ත සත්‍යය හෙළිකර දී ඇත. සෑම මනුස්සයකු තුළම සදාචාරය හා පිරිසිදු බව ඇත්තේය. ඒවා බාහිර දෙවියකුගේ උපකාරයක් නැතිව තමන්ටම මතු කරගෙන ක්‍රියාවේ යෙදවිය හැකිය. - **චාල්ස් ටී. ගෝමර්න්**

- බුද්ධාගම නමැති පැරණි ආගම ආදි කල්පිත යැයි කියමින් සමහරෙක් එය හෙළා දකිති. තවද එහි සඳහන් වන ජාතක කතා දරුවන් නැළැවීමට සුදුසු යැයි ඔවුහු කියති. එහෙත්, බුද්ධාගම කුඩා ළමයාටත් මහල්ලාටත් තරුණියටත් මැහැල්ලටත් ගැලපේ. අහිංසක කුඩා ළමයාටත් මහල්ලාගේ විචාරාත්මක බුද්ධියටත් තරුණියගේ ලාලිත්‍යයටත් මැහැල්ලගේ මේරූ තැන්පත් බවටත් අවශ්‍ය දෑ බුද්ධාගමෙන් ලැබේ. ඒ නිසා බුද්ධාගම ලෝකයේ සෑම දෙනාටම ගැලපෙන එකම ආගම වේ. - **ජෙනෝ ලෙනාඩ්**

- සර්වකාලීන බලාපොරොත්තුව, අමරණීය මෛත්‍රිය, යහපත් නොසැලෙන විශ්වාසය හා ආඩම්බර විය හැකි මිනිස් නිදහස බුද්ධාගම නමැති මෙම උතුම් ආගමේ ඇත්තේය. - **සර් එඩ්වින් ආර්නෝල්**

- කඩුවක් සමග බුදුරජාණන් වහන්සේට කිසිම ගනුදෙනුවක් තිබුණේ නැත. අන්‍යයන්ට හිංසා කිරීමට යුක්ති සහගත හේතුවක් උන්වහන්සේට නැත. කොරතම් අසාධාරණ හේතුවක් වුවත් එය යුක්තිසහගත හේතුවක් බව අප කියන්නේ අපේ වාසියටය. මෙය අප අද ඊයේ දැනගත්තේ වී නමුත් උන්වහන්සේ එය කලින් දැන සිටියහ. - **මහාචාර්ය මොරිස් වින්ටර් නීට්ස්**

- විමසීමෙන් තොර අන්ධ භක්තියෙන් යමක් විශ්වාස නොකළ යුතු බව තමන්ගේ අනුගාමිකයන්ට ඉගැන්වූ ලොව එකම ශාස්තෘවරයා නම් බුදුන් වහන්සේය. ඒ නිසා නවීන කියා කිවහැකි එකම ලෝක

ව්‍යාප්ත ආගම බුද්ධ ධර්මය බව කීම අතිශයෝක්තියක් නොවේ. - **ඩේවිඩ් නීල්**

- බුදුරජාණන් වහන්සේට සලකන්නේ නාම, රූප, ධර්ම බෙදා පෙන්වූ කෙනෙකු හටියට පමණක් නොව, ලෝකයේ ඥානවන්ත කාරුණික මිත්‍රයෙකු හැටියටය. ලෝකයා කෙරෙහි පිළිපදින නිසි පිළිවෙතක් උන්වහන්සේ ගත් මාර්ගයත් සාමාකාමීය. තරහව උන්වහන්සේ තුළ නොතිබුණා පමණක් නොව උන්වහන්සේගේ ධර්මයේවත් ගැවී නැත. - **හෙන්රි කුටාක් වොරන්**

- බුද්ධිමත් ක්‍රිස්තු භක්තිකයනට ඇති ලොකුම ගැටලුව නම් ඔවුන්ගේ ඉගැන්වීම් පරිනාමවාදය හා ගැලපවීමයි. නවීන විද්‍යාත්මක පරීක්ෂණවලින් ඔප්පුවන කරුණු බුදුරජාණන් වහන්සේගේ ප්‍රකාශවලට සමානය. ධම්ම යන වචනයෙන් බුදුරජාණන් වහන්සේ අදහස් කළ දෙය අපට වැටුහුණු විට එය වෙනස් කළ නොහැකි නිතියක් බවත්, ලොකු කුඩා සියල්ලම ඊට යටත්වන බවත් අපට පෙනේ. - **සී. ජිනරාජදාස**

- පරමාණුව හැමවිටම ඒකාකාරව පවතීද? කාලයත් සමඟ එය වෙනස් වේද? පරමාණුව නොසෙල්වී පවතීද? පරමාණුව ක්‍රියා කරයිද? යනුවෙන් යමෙක් පරමුණුව පිළිබඳව ප්‍රශ්න ගණනාවක් ඇසුවහොත් ඒ ප්‍රශ්න සියල්ලටම "නැත" යන පිළිතුර දිය යුතුය. බුදුරජාණන් වහන්සේද මරණින් පසු මිනිසාට සිදුවන දේ ගැන ඇසූවිට මෙවැනි පිළිතුරු දී තිබේ. 17 වෙනි හා 18 වෙනි ශතවර්ෂවල විද්‍යාවට මේ පිළිතුර ගැලපුනේ නැත. - **රොබට් ඕපන් හයිබර්**

- කවර ආගමක් නිසා ලෝක ශාන්තියත් සමාදානයත් දියුණු වී දැයි අපෙන් ප්‍රශ්න කරනු ලැබුවහොත් අන් සියලු ආගම්වලට වඩා බුද්ධාගම ශාන්තියත් සමාදානයත් දියුණු කළ බව අප විසින් අවංක ලෙස ලෝක ඉතිහාසය විමසීමෙන් පසු කිව යුතුය. - **ජේ. ටී. සන්ඩර්ලන් දේවගැතිතුමා**

- බුදුරජාණන් වහන්සේ අවුරුදු 2500කට පෙර දේශනාකොට වදාල මෛත්‍රී - කරුණාව හා ඉවසීම යන ගුණ ධර්මයන් අමතක කළ හෙයින් අද ඉන්දියාවත් යුරෝපයත් භේදභින්න වී ඇත. - **චාල්ස් ඇන්ඩෘස් දේවගැතිතුමා**

- බුදුරජානන් වහන්සේ කුල භේදයට අකුල් හෙළා කුල භේදය නැති කළා සේක. උන්වහන්සේ අනාචාරයත් අතුරුදහන් කළ සේක. තමාගේම ශ්‍රද්ධාව තමා තුළ විය යුතුය. බුදුරජාණන් වහන්සේ ප්‍රාණඝාතය සම්පූර්ණයෙන්ම වැළැක්වූ සේක. බිලිපූජා සඳහා සතුන් මරන්නට ඉඩ නොදුන් සේක. යුධ කොට මිනිසුන් මරන්නට ඉඩ නොදුන් සේක. බුදුරජාණන් වහන්සේ ලෝක ඉතිහාසයෙහි පළමු වරට තමාගේ පිරිසිදු බව හෝ නොපිරිසිදු බව තමා ළඟම යැයිද තමාට තමාම පිහිට විය යුතු යැයිද ලෝකවාසී අන් සියලු දෙනාට නොමඟ යතොත් තමා සුමඟ ගොස් සියසින්ම නිවන් දැක්ක යුතු බවද ප්‍රකාශ කළ සේක. - ***ආතර් ලිලී***

- බුද්ධාගමෙන් වැඩ දෙකක් සිදුවන්නේය. එකක් නම් මිනිසා හැදිමය. අනෙක නම් හැදුන මිනිසා ලවා සමාජය හැදීමය. - **ර්ස් ඩේවිඩ්**

## බුදු රජාණන් වහන්සේගේ චරිතය තුළින් පෙන්නුම් කරන නායකත්ව ගුණාංග

රාජ්‍ය නායකත්වය වූ කලී පිය උරුමයෙන් පමණක් ලැබෙන්නක් නොවේ. ප්‍රතිපත්ති පිරීමෙන් ලැබෙන්නකි. එනිසා නායකයා වූ කලී උසස් ප්‍රතිපත්තින්ගෙන් බැහැර නොවිය යුත්තෙකි.

"න හී තේ තාත දිබ්බං චක්කරතනං පෙත්තිකං දායජ්ජං ඉඩීස ත්වාං තේ තාත අරියේ චක්කවත්තිවත්තේ වත්තාහි"

බොහෝ නායකත්ව ගුණාංග බුදුන් වහන්සේගේ චරිතය, දින චර්යාව හා දේහ ලක්ෂණ තුළින් දැකිය හැකි වේ. එවැනි අවස්ථා ගණනාවකි.

## දෙතිස් මහා පුරුෂ ලක්ෂණ

"මහණෙනි පුරුෂ ලක්ෂණ 32කින් යුතු මහා පුරුෂයෙකුගේ ජීවන ගති 02කි. මහා පුරුෂයා ගිහිගෙහි වාසය කරන්නේ නම් මහා දනව් සතරෙහි නායකත්වය ලැබ සත් රුවනින් හෙබි දැහැමි සක්විති රජෙක් වන්නේය. ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් අරහත් සම්බුදු කෙනෙකු වන්නේය."

යනුවෙන් දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රය බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට දේශනා කළේ අනේපිඬු සිටාණන් පූජා කළ දෙව්රම් වෙහෙරේ සිටය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ලැබීමට හේතුවන කුසල ක්‍රියා මේ නම මහා පුරුෂ ලක්ෂණ ඇති චරිත ලක්ෂණ මෙසේ දැක්විය හැක.

1. සුප්පතිට්ඨිත පාදතා - පෙර භවයෙන් කාය වාග් මනස් ත්‍රිවිධ සුචරිතය නිසා සමපතුල පිහිටින්නේය.

2. හෙට්ඨපාදතලෙසු චක්කානි - පෙර භවයන්හි බොහෝ දෙනාගේ සුව පහසුව පිණිස ආරක්ෂාව සැපයීම හේතුවෙන් පාද කලයන්හි සක් (රෝද) ලකුණු පිහිටා ඇත.

3. ආයාත පණ්හිතා - පෙර භවයන්හි ප්‍රාණ ඝාතයෙන් තොර නිසා දික්වූ විලුඹ පිහිටා ඇත.

4. දීඝංගුලිතා - පෙර භවයන්හි ප්‍රාණ ඝාතයෙන් තොර නිසා දික් ඇඟිලි පිහිටා ඇත.

5. මුදුතලත හත්ථි පාදතා - පෙර භවයන්හි සතර සංග්‍රහ වස්තුවෙන් සැලකූ නිසා මෙලෙක් වූ අතුල් පතුල් පිහිටා ඇත.

6. ජාල හත්ථි පාදතා - පෙර භවයන්හි සතර සංග්‍රහ වස්තුවෙන් සැලකූ නිසා දැල් කවුළුවක් බඳු අත් පා පිහිටයි.

7. උස්සංඛ පාදතා - පෙර සසරේ බොහෝ දෙනාගේ හිතසුව පිණිස ධර්ම දානය කළ නිසා මසිත් පිරුණු සිවියෙන් වැසුණු කෙණ්ඩා පිහිටයි.

8. එණිජංඝතා - පෙර භවයන්හි ඉගෙනුම ලබන අයට ශිල්ප විද්‍යාචරණ ධර්මයන් ලබාදුන් නිසා ඒණි මුවන්ගේ බඳු කෙණ්ඩා පිහිටියි.

9. ආජාණු ලම්බ හත්ථතා - ඒ ඒ පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ විශේෂත්වය තේරුම්ගෙන ඒ අනුව ක්‍රියා කළ නිසා සිටගෙන නොගැටී ස්පර්ශ කළ හැකි පරිදි දණතෙක් එල්ලෙන අත් ඇති වේ.

10. කොසෝහිත වත්ථු ගුය්හතා - පෙර භවයන්හි භේද වූවන් සමගි කොට සතුටු කළ නිසා කොපුවක ගිලිහුණු පුරුෂ ලිංගය පිහිටා ඇත.

11. සවණ්ණවණ්ණතා කඤ්චන සත්තිභවතා - පෙර භවයන්හි නොකිපීම, ක්‍රෝධ නොකිරීම, නිසා රන්වන් සිරුරක් පිහිටියේය.

12. සුධුමච්ඡවිතා - පෙර භවයන්හි මහණ බමුණන් වෙත ගොස් කුසල් අකුසල් හොඳ නරක කළ යුතු දේ නොකළ යුතු දෑ විමසූ හෙයින් සියුම් සිවිය (සම) නිසා දූවිලි රජස් නොබැඳෙයි.

13. එතෙක ලෝමතා - පෙර භවයන්හිදී සත්‍යවාදී වීම නිසා එක් එක් ලෝම කූපයන්හි එක් එක් ලෝම පිහිටා ඇත.

14. උද්ධග්ගලෝමතා - පෙර භවයන්හි බොහෝ දෙනාට හිතසුව පිණිස ධර්ම දානය කළ බැවින් උඩට නැමුණු ලොම් ඇත්තෙක් වෙයි.

15. බ්‍රහ්මුජ්ජුගත්තතා - පෙර සසරෙහි ප්‍රාණ ඝාතයෙන් තොරවන නිසා බඹුන්ගේ මෙන් ඍජු ශරීරය පිහිටා ඇත.

16. සත්තුස්සපාදතා - පෙර සසරෙහි සියලු ප්‍රණීත රසවත් ආහාර බෙදාදුන් හෙයින් දෙඅත් දෙපතුල්, දෙවුර, කර, සන්ධිස්ථාන උස්ව පිරිපුන්ව පිහිටා ඇත.

17. සිහපුබ්බද්ධකායිතා - පෙර භවයෙහි බොහෝ දෙනාගේ හිත සුව පිණිස කැමතිව විසූ බැවින් සිංහයකුගේ මෙන් පිරිණු ශරීරය පිහිටීම.

18. චිතන්තරංසතා - පෙර භවයෙහි බොහෝ දෙනාගේ හිතසුව පිණිස වූ හෙයින් මසින් පිරුනු පිටිකර (පිටදැළවර) ඇති බව.

19. නිග්‍රෝධ පරිමණ්ඩලතා - විවිධ පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ විශේෂත්වය තේරුම්ගෙන ඒ අනුව කටයුතු කළ නිසා සම වූ උස් මහත ඇති නුගරුකක් මෙන් වූ ශරීරයක් ඇති බව.

20. සමවත්තකඛන්ධතා - පෙර ජාතීන්හි ගුණ ධන සම්පත්වලින් අන්‍යයන්ට ඊර්ෂ්‍යා නොකළ හෙයින් සමින් වට වූ ගෙල පිහිටියේය.

21. රසග්ගසග්ගිතා - පෙර සසරේ අතින්, දඬු මුගුරුවලින් කටින්, අවි ආයුධවලින්, තරවටු කිරීමෙන් අන්‍යයන් නොපෙළූ නිසා මනාව රස දැනෙන්නාවූ රස නහර පිහිටියේය.

22. සීහ හනුතා - හිස් වදන් නොපැවසීම නිසා සිංහයයකුගේ මෙන් පිරුණු හනු පිහිටියේය.

23. චත්තාලිය දත්තතා - පෙර භවයෙහි කේලම් නොකීම නිසා සම සතුලිස් දත් පිහිටියේය.

24. සම දන්තතා - කේලම් නොකීම නිසා එකිනෙකට උස් පහත් නොවූ සම දත් පිහිටියේය.

25. අවිවර දත්තතා - පෙර භවයෙහි හොර තරාදි, හොර කිරුම් ආදියෙන් වැරදි දිවි පෙවෙතින් වැලකුණු නිසා දත් අතර විවර නැති විය.

26. සුසුක්කදාඨතා - පෙර භවයන්හි නිවැරදි දිවි පැවැත්ම නිසා සුදුවන් දත් පිහිටියේය.

27. පහුතජිව්හතා - පෙර භවයෙහි මිහිරි වචන, ප්‍රිය වචන, මනස වඩන වචන පැවසීම නිසා දික් වූ දිව පිහිටියේය.

28. බ්‍රහ්මස්සරතා - පෙර භවයේ මිහිරි වචන මනස වඩන වචන, ප්‍රිය වචන, භාවිතා කිරීම නිසා මහා බ්‍රාහ්මයාගේ මෙන් මිහිරි හඬ පිහිටියේය.

29. අභිනිල නෙත්තතා - පෙර භවයන්හි කිසිවකු දෙස කෝපයෙන් රවා බැලීමක්, ඇස් කොණින් බැලීමක්, රහසින් බැලීමක් නොවූ හෙයින් නීලවන් වූ ඇස් පිහිටියේය.

30. ගොපධුමතා - පෙර භවයෙහි කිසිවකු දෙස කෝපයෙන්, රැවීමෙන්, හොරෙන් බැලීමක් නොවූ නිසාම එදිනම උපන් වස්සකුගේ මෙන් ඇස්පිය පිහිටියේය.

31. උණ්ණා ලක්ඛණතා - පෙර භවයෙහි සත්‍යවාදී වීම නිසා දෙබැම අතර උර්ණ රෝම ධාතුවක් පිහිටියේය.

32. උණ්හි සසීසතා - පෙර භවයන්හි යහපත් ක්‍රියාවලින් බොහෝ දෙනාට නායකයා වූ නිසා පිරිපුන් නළල් තලයක් පිහිටියේය.

බුදුන් වහන්සේගේ නායකත්වයේ ශ්‍රේෂ්ඨ ගුණාංග සමකාලීන සමාජයේ ආගමික ශාස්තෘන් විසින් පිළිගෙන තිබුණි. සේල නම් වූ බ්‍රහ්මණයා බුදුන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පරීක්ෂා කර බැලීය. අනතුරුව "ගෞතමයන් වහන්ස ඔබ වහන්සේට දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිහිටා ඇත. ඔබ සක්විති (චක්‍රවර්තී) රජෙක්ව රාජ්‍ය පාලනය නොකරන්නේ මන්ද?" යි විමසීය. එවිට බුදුන් වහන්සේ "බ්‍රහ්මණය මම රජෙක්මි. ශ්‍රේෂ්ඨ ධර්ම රාජ්‍යයෙක්මි. අන් කවරෙකුටත් පවත්වාගෙන යා නොහැකි ධර්ම රාජ්‍යයක් මම පවත්වාගෙන යමි." යි වදාළහ.

# නව අරහාදී බුදුගුණ

ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී, සත්ථා, දේව මනුස්සානං, බුද්ධෝ භගවාති

යනුවෙන් නව අරහාදී බුදුගුණ පැහැදිලි කෙරේ. භාග්‍යවතුන් වහන්සේ අරහත් සේක, සම්‍යක් සම්බුද්ධ සේක, විජ්ජාචරණ සම්පන්න සේක, සුගත සේක, ලෝකවිදූ සේක, අනුත්තර පුරුස ධම්ම සාරථී සේක, දෙවි මිනිසුන්ට ශාස්තෘ සේක, බුද්ධ සේක, භගවත් සේක යනු එහි අර්ථයයි. මෙම බුදුගුණ සිහිපත් කිරීමෙන් නිර්වාණය ලැබිය හැකි බව විශ්වාසයයි. මෙම නව අරහාදී බුදුගුණ සවිස්තරාත්මකව පහත දැක්වේ.

## 1. අරහත් ගුණය

බුද්ධ දේශනාවේ අවසාන විමුක්ති මාර්ගය කෙළවර වන්නේ රහත් භාවයෙනි. එය ලොවට අනාවරණය කළේද බුදුරජානන් වහන්සේය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ වටහාගැනීම අරහත් භාවයට හේතුවේ. රහත් බව කුමක්ද යන්න බුදුන්ගෙන් විමසූ ජම්බුඛාදක

පරිබ්‍රාජකයාට දුන් පිළිතුර වූයේ රහත් භාවය සඳහා ඇති මාර්ග ආර්ය අෂ්ටාංගික මාර්ගය බවයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් සියලු රාගයන්ට මුල් වූ රාග, ද්වේෂ, මෝහ නැසීමෙන් ලබන ශාන්ත භාවය රහත් භාවය වේ. පව් දුරුකිරීම, කෙලෙස් නැසීම මින් අදහස් වේ. උපක ආජීවක වරයා බුදුන්වහන්සේ හමුවූ අවස්ථාවේදී ඔබ කවරෙක්දැයි විමසීය. එයට පිළිතුරු වශයෙන් මම ලොව රහත් වෙමි. (අනංගි අරහං ලොකේ) යනුවෙන් පිළිතුරු ලබාදුන්නේ මෙම අරහත් ගුණය නිසාවෙනි.

## 2. සම්මා සම්බුද්ධ ගුණය

සම්මා සම්බුද්ධ යනු දත යුතු සියල්ල මැනවින් අවබෝධ කරගත් යන අර්ථය වේ. තමන් වහන්සේ ඒ සඳහා සුදුසු බව උපක ආජීවකයාට දුන් පිළිතුරෙන් සඳහන් වේ. "මා සම්මා සම්බුද්ධ වෙමි. (එකොමහි සම්මා සම්බුද්ධො) සම්මා සම්බුද්ධත්වය යන ගුණාංගය මජ්ඣිම නිකායේ අරිය පරියේෂණ සූත්‍රයේ තවදුරටත් පැහැදිලි කරනු ලැබේ. "මහණෙනි දුක්ඛ සමුදය, නිරෝධ හා දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා යනුවෙන් ආර්ය සත්‍ය හතරක් මෙම උතුම් ආර්ය සත්‍ය අවබෝධ කරගැනීම නිසා අරහත් සම්මා සම්බුද්ධ යැයි කියනු ලැබේ." මේ අනුව බුදුරජාණන් වහන්සේ සතර ආර්ය සත්‍ය අවබෝධ කොට භව තණ්හාව සහමුලින්ම සිඳ දමා නැවත ඉපදීම අවසන් කළ සේක. මේ නිසාම අන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වන සේක.

## 3. විජ්ජාචරණ සම්පන්නෝ ගුණය

විජ්ජා යනුවෙන් ප්‍රඥාවද චරණ යන්නෙන් ආකල්පයන්ද නිරූපණය වන බැවින් මේ ගුණාංගයෙන් බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාව සහ ආකල්ප විචාරණය යන තත්ත්වයන් පැහැදිලි කෙරේ. මෙම දෙකරුණු තවදුරටත් පැහැදිලි කළ හැකිවේ. එනම් සංයුක්ත නිකායෙහි විජ්ජා සූත්‍රයේ විද්‍යාව යන්න මෙසේ අර්ථකථනය කෙරේ. "වියත් ආර්ය ශ්‍රාවකයා රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ දන්නේ නම්, නිරෝධ ගාමිණී පටිපදා දන්නේ නම් විජ්ජා ගත වූ වේ." චරණය ලෙස හැඳින්වෙන්නේ හැසිරීම හෙවත් උතුම් වූ ශීල, ඉන්ද්‍රිය, සංවර ආදී ආකල්පයන් වේ. බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ ඉල්ලීම පරිදි උත්තර මානවකයා බුදුන් වහන්සේ වැඩහිටි ප්‍රදේශයට ගොස් මාස 7ක්ම බුදුන් වහන්සේ තුළ විජ්ජාචරණ ගුණ සමුදායක් ඇත්දැයි පරීක්ෂා

කළේය. බුදුන් වහන්සේ කිර්ති රාවය පැතිර ඇත්තේ සත්‍ය වශයෙන්ම විද්‍යාචරණ ගුණාංගයෙන් යුතු නිසා බව ඔහු පැවසීය.

## 4. සුගතෝ ගුණය

සත්‍ය නිසැක වශයෙන් අවබෝධ කරගත් බැවින් බුදු රජාණන් වහන්සේ සුගත නම් වූ සේක. ධම්ම චක්කපවත්වන සූත්‍රයේදී දැක්වෙන පරිදි කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමතානු යෝගය යන මාර්ග දෙකෙන් බැහැරව මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් නිවන් මඟ ලොවට හෙළි කළේය. මෙසේ සුන්දර වූ ආර්ය මාර්ගයේ සත්‍යවබෝධය ලද නිසාත්, සත්‍යාවබෝධයට මඟ දැක්වූ නිසාත් තථාගතයන් වහන්සේ සුගත නම් වෙති. සංයුක්ත නිකායේ සංයුක්ත සූත්‍රයේ දැක්වෙන පරිදි සම්බුදු රජාණන් වහන්සේ නූපන් මඟ උපදවන නොපෙන්වූ මඟ පෙන්වති. මඟ දනිති. මඟ අවබෝධ කළේය. මඟ යහපත්ය, මඟ සුන්දරය, මාර්ගය දැන මාර්ගය පෙන්වූ හෙයින් තථාගතයන් වහන්සේ සුගත නම් වෙති.

## 5. ලෝකවිදූ ගුණය

බුදුන් වහන්සේ ලෝකය පිළිබඳව ගැඹුරින් යථාර්ථවත් ලෙස වටහාගත් බැවින් ලෝකස්වාදය, එහි ආදිනව නිස්සරණ යන සියල්ල දන්නා බැවින්ද ලෝකවිදූ ගුණයෙන් පරිසමාප්ත විය. බුදුරජාණන් වහන්සේට මෙම ගුණය තවදුරටත් මෙසේ විග්‍රහ කර ඇත. "ඇස, රූප, චක්ඛු, විඤ්ඤාණයෙන් දත යුතු ධර්ම තිබේ නම් ද එසේය. මනෝ විඤ්ඤණයෙන් දත යුතු ධර්ම ශබ්දය එහි ලෝකය යන පැනවීමක්ද නැත." ලෝකය හට ගැනීම බුදුන් වහන්සේ මෙසේ තවදුරටත් විස්තර කෙරේ. "ඇසත්, රූපයත් නිසා චක්ඛු, විඤ්ඤානය වේ. මේ තුනෙහි එකතුව ස්පර්ශයයි. ස්පර්ශයෙන් වේදනා ඇති වේ. තණ්හාව නිසා දුක, දොම්නස්, උපායාස හටගනී. තණ්හාව නැතිවුණ කල්හි දුක් දෝම්නස් උපායාය නැති වේ. මේ ලෝක නිරෝධයයි." ගනපති වග්ගයේ ලෝක සූත්‍රයෙහිද මෙසේ සඳහන් වේ. "මහණෙනි තථාගතයන් වහන්සේ ලෝකය අවබෝධ කළා සේක. ලෝකයෙන් වෙන් වූහ. දෙවියන්, මරුන්, බඹුන් සහිත ලොව මහණ බමුණන් දෙවි මිනිසුන් යමක් දක්නා ලද්දේ ද, ලබන ලද්දේද, සොයන ලද ද මේ සියල්ල තථාගතයන් වහන්සේ අවබෝධ කරන ලදහ." මේ අනුව ලෝක සත්වයාට යථා ස්වරූපය හෙළි කළ බැවින් බුදුන් වහන්සේ ලෝකවිදූ නම් වෙති.

## 6. අනුත්තරෝ පුරුසධම්මසාරථී ගුණය

දමනය කළ නොහැකි පුද්ගලයන් හික්මවීමෙහිලා සමත් බැවින් බුදුරජාණන් වහන්සේ පුරුසධම්ම සාරථී නමින් හැඳින්වේ. කුසලා කුසල පෙන්වා දී ශීල සමාධි ප්‍රඥාවෙන් විමුක්ති ලබාගැනීමට මග පෙන්වීම බුදුන්වහන්සේගේ අනුශාසනාව වේ. මෙලෙස පුරිසධම්ම සාරථී ගුණාංගය ප්‍රදර්ශනය වූ අවස්ථා ගණනාවක් බුද්ධ චරිතයේ නිරූපනය වේ.

කේසී සූත්‍රයේ සඳහන් අසුන් හීලෑ කිරීම

කේසී නම් අසුන් හීලෑ කිරීමේ අතිදක්ෂයා බුදුන් වහන්සේ හමුවේ ඔහුගේ දක්ෂතාවය මෙසේ ප්‍රකාශ කරන ලදී.

"ස්වාමිනී මම මොළොක් ලෙසත් රළුවටත් අසුන් හීලෑ කරමි. එසේ හීලෑ නොවන අසුන් මගේ ගුරු පරපුරට හානියක් වන හෙයින් මරමි. ඔබ වහන්සේ දමනය කළ නොහැකි පුද්ගලයන් දමනය කරන්නේ කෙසේද?"

බුදුන් වහන්සේ කේසිට පිළිතුරු සපයන්නෙ මෙසේය. "මම ද ඔබ මෙන් මොළොක්වම හා රළුවට හික්මවමි. මොළොක් බව නම් කාය, වාග්, මනස් සුචරිතයේ පැවැත්මෙන් දෙව් විමන් හිමිවන බව පෙන්වා දෙමි. රළු බව නම් කාය, වාග්, මනස් දුෂ්චරිතයන් නිසා නිරයේ, තිරසන් යෝනියේ උපදින බව පෙන්වා දී යහමගට හරවමි."

"එසේ කළ නොහැකි පුද්ගලයන් දමනය කරන්නේ කෙසේද?" යන කේසිගේ ඊළඟ ප්‍රශ්නයට බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ 'ඔහු නසමි" යන්නයි. එය තවදුරටත් පැහැදිලි කරන්නේ මෙසේය. "දමනය කළ නොහැකි පුද්ගලයාට අනුශාසනා කළ යුතු නොවේ. ඔහු ආගමික නායකයන් පිළි නොගනී. එවැන්නෝ දහමින්, සමාජයෙන් කතා නොකරම ඉවත් කරමි."

ආලවක නම් දරුණු යක්ෂයෙකු අලව්නුවර මිනිසුන්ට පීඩා දුනි. මෙම යක්ෂයා නොමැති අවස්ථාවක බුදුන් වහන්සේ ඔහුගේ විමානයට වැඩම කළ සේක. වහා පැමිණි අලව් යකු බුදුන් වහන්සේට තර්ජනය කරමින් "මහණ වහාම මින් පිටවනු... මහණ මෙහි එනු"

යනුවෙන් තෙවරක්ම බුදුන් වහන්සේ වෙහෙස කිරීමට ක්‍රියා කළහ. සතර වෙනුව ආලවකගේ නියෝගයට ප්‍රතිචාර දැක් වූයේ ආලවක මම මෙතනින් නොසෙල්වෙමි. තොපට හැකි දෙයක් කරව" යන්නයි. ඉන් අනතුරුව බුදුන් වහන්සේ වෙහෙස කරනු වස් "ලොව උසස්ම ධනය කුමක්ද? උසස්ම සැපය කුමක්ද? උසස්ම රසය කුමක්ද? උසස්ම ජීවිතය කුමක්ද?" යනුවෙන් ප්‍රශ්න වැලක් අසන ලදී. නිසි පිළිතුරු දුන් බුදුන් වහන්සේ "ලොව උසස්ම ධනය ශ්‍රද්ධාවයි. එය ලබන්නේ ධර්මයෙනි. සත්‍ය රසය ලොව උසස්ම රසය වන්නේය. නුවණින් ගත කරන ජීවිතය උසස්ම ජීවිතය වන්නේ." යනුවෙන් ගැටලු විසඳා යක්ෂයාට දහම් දේශනා කරන ලදී. ධර්මයේ පැහැදී තෙරුවන් සරණ ගොස් ප්‍රාණඝාත අකුසලයෙන් හේ වැළකුණේය.

සූචිලෝම හා ඛරලෝම නම් වූ දරුණු යක්ෂයන් දෙදෙනෙක් ගයාවෙහි වාසය කළහ. ඉදිකටු මෙන් තියුණු උල් ලොම් නිසා සූචිලෝම ලෙසද කිඹුලෙකු මෙන් ගොරෝසු සිරුරක් වූ හෙයින් ඛරලෝම නමින්ද මෙම යක්ෂයන් හැඳින්වූහ. දිනක් බුදුන්වහන්සේ සූචිලෝම යක්ෂයාගේ භවනට වැඩම ඔහුගේ ශෛලමය යහනේ වැඩ සිටියහ. ඒ බව දුටු ඛරලෝම යක්ෂයා "මුඩු මහණෙක් ඔබගේ ආසනයේ වැඩවසයි" ලෙස සූචිලෝමට කරුණු කීහ. සූචිලෝම කිපී මහා හඬින් තම ඉදිකටු වැනි ලෝම ප්‍රදර්ශනය කොට බුදුන් දෙසට කිට්ටු වී "මහණ මට බිය වන්නේද?" යැයි විමසීය. බුදුන්වහන්සේ "සූචිලෝම මම බිය නොවෙමි. ඔබගේ ස්පර්ෂය මට පිළිකුල්" යැයි පැවසීය. තවදුරටත් කෝපයට පත් යක්ෂයා බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න කිහිපයක්ම අසන ලදී. "මහණ මා ඔබගේ පැන කිහිපයක් අසමි. පිළිතුරු නොදුනහොත්, සිහිය විකෘති කරවා දෙපයින් අල්ලා වීසි කරමි" යි යළිත් ගිගරුවේය.

"ඔබට ඒ කිසිවයක් කළ නොහැකිය. ප්‍රශ්න පමණක් අසව"

"රාගයේ හා ද්වේශයේ හේතුව කොතැනද? කුසලයෙහි නොඇලීමෙටත්, අකුසලයේ ඇලීමටත් හේතු කුමක්ද? බියට හේතුව කුමක්ද? ළමුන් විසින් අල්ලාගත් කපුටකු මෙන් සිත කැළැඹීමට හේතුව කුමක්ද?" යක්ෂයා විමසීය.

සියල්ලට හේතුව උපත බවත් එය වටහාගෙන නැවත උප්පත්තියෙන් තොරව නිසිමග ගමන් කොට සසර දුකින් මිදෙන බවත්

බුදුන් වහන්සේ පැහැදිලි කොට ධර්මය දේශනා කරන ලදී. ධර්මය අසා සූචිලෝම හා ඛරලෝම යන යක්ෂයන් දෙදෙනා සෝවාන් ඵලයට පත්වන ලදී.

විශිෂ්ඨ ඥාන බල දහසකින්, අසමාන කායබල දහසකින් යුතු බුදුන් වහන්සේ කිසිවකුට ළඟා වීමට පවා නොහැකි දරුණු පුද්ගලයන් වෙත ගොස් ඔවුන් දමනය කිරීමට පුරිසධර්ම සාරථී ගුණය හේතු සාධක විය. රහතුන් යැයි කියා පෑ උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යන තුන් බෑ ජටිලයන්, මානයෙන් උඩඟු වී සිටි ශාක්‍යයෝ, නොමග ගිය ගුරු පඬුරු වෙනුවෙන් මිනිසුන් මරාදැමූ අංගුලිමාල, රාමතින් සිටි නාලාගිරි ඇතු දමනය වැනි බොහෝ උදාහරණ පුරුෂ ධර්ම සාරථී ගුණය මනාව පිළිබිඹු කෙරේ.

## 7. සත්ථාදේව මනුස්සානං ගුණය

දෙව් මිනිසුනට අනුශාසනා කිරීමට ඇති හැකියාව මින් අදහස් කෙරේ. දෙවියන් සහිත ලෝකයට ගුරු මුෂ්ටි නොතබා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ හෙයින් බුදුන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා වන්නේය. පලමු ධර්ම දේශනාවේදීම බුදුන් වහන්සේ දෙවියන් සහිත ලෝකයාට අමා බෙරය වන්නේ යැයි පැවසීමෙන් බුදුන්ගේ සියලු දේශනාවන් සීමාවකින් තොරව විශ්ව සාධාරණ බව කියවේ. පලමු ධර්ම සංඝායනාව සියලු දෙව්වරුන් අසා ප්‍රීතිය පළ කළ අයුරු ධම්ම චක්කප්පවත්වන සූත්‍රයේ සඳහන් වේ. පළමුව තම විමුක්තිය ලබාගෙන අනුන්ට විමුක්තිය ලැබීමේ අරමුණින් ධර්ම දේශනා කිරීම බුදුවරුන්ගේ ආදර්ශය වේ. සියලු පව් නොකිරීම කුසල් රැස්කිරීම, තම සිත පවිත්‍රව තබාගැනීම යන මෙම කරුණු සියලු බුදුවරුන්ගේ අනුශාසනාවන් යැයි ඛුද්ධක නිකායේ ධම්මපදයේ බුද්ධ වග්ගයේ සඳහන් වේ.

## 8. බුද්ධෝ ගුණය

තමා විසින්ම සියල්ල අවබෝධ කරගත් හෙයින් බුද්ධ, සම්මා සම්බුද්ධ, අභිසම්බුද්ධ යන නාමවලින්ද බුදුරජාණන් වහන්සේ හැඳින්වේ. බුද්ධ යන්නෙහි අර්ථය ලෞකිකත්වය ඉක්මවා විශිෂ්ටත්වයට පත්වීමයි. ඒ බව අංගුත්තර නිකායේ දොණ සූත්‍රයෙන් පැහැදිලි වේ. දෝණ බමුණා

බුදුන්වහන්සෙගෙන් "ඔබ දෙවියෙක්ද? ගාන්ධර්වයෙක්ද? යක්ෂයෙක්ද? මනුෂ්‍යයෙක්දැයි" විමසීය. එයට පිළිතුරු දුන් බුදුන් වහන්සේ තමා ඒ කිසිවෙකු නොවන බවත් ඒ සියලු දෙනා තුළට කෙලෙස් පවතින බවත් තමා කෙලෙස් නැසූ බුද්ධත්වයට පත් වූ තැනැත්තෙක් බව ප්‍රකාශ කළ සේක. කරටිය කැඩූ තල්ගස මෙන් කෙලෙස් නැසූ උත්තරීතර මනුෂ්‍යයෙකු බවට බුදුන් වහන්සේ තමන් වහන්සේව හැඳින්වූහ.

### 9. භගවා ගුණය

කෙලෙසුන් බිඳ දැමූ අර්ථයෙන් භගවා යන්න භාග්‍යවත් වූ බුදුන් වහන්සේ හැඳින්වීමට යොදා ඇත. තථාගතයන් වහන්සේට පෙර පින් තිබූ නිසා බුදු සිරුරේ විශේෂ ලකුණු පිහිටියේය. මෙයින් උත්තම පුරුෂයන්ගේ ශ්‍රේෂ්ඨත්වය මතුකෙරේ. කෙලෙසුන් බිඳ දැමූ බුදුන් වහන්සේ භාග්‍යවත් නමින් හැඳින්වීමට යොදන සුදුසුම නාමය වේ.

## නායකත්වයට මග පෙන්වන මහා ප්‍රඥාව

බුදුරජාණන් වහන්සේ විශිෂ්ට ඥාන දර්ශනයෙන් යුතු මහා ප්‍රඥාවන්තයෙකි. උන්වහන්සේ මෙතෙක් ලොව පහළ වූ මහා ප්‍රඥාවන්තයා බව අවිවාදයෙන්ම පිළිගැනේ. ශ්‍රේෂ්ඨ දාර්ශනිකයකු වන බර්ට්‍රම් රසල් බුදුන් වහන්සේ හඳුන්වන්නේ ඓතිහාසික පුද්ගලයන් අතර මහා ප්‍රඥාවෙන් හා ශීලයෙන් ඉහළම ස්ථානයේ සිටින තැනැත්තා වශයෙනි.

බුදුන්වහන්සේගේ සසුනෙහි ලිච්ඡවි වංශිකයකු වූ සුනක්ඛත්ත නම් තැනැත්තෙක් මහණව සිටියේය. "බුදුන් වහන්සේ තමනට ඊර්ෂයා කරති" යනුවෙන් දොස් කියමින් බුදුන් වහන්සේට මිනිස් බව ඉක් වූ ආර්ය භාවයක් පෙන්වීමට තරම් ගුණ විශේෂයක් නැත. එහෙත් නුවණින් විමසා වැටහෙන්නා වූ ධර්මයක් ප්‍රකාශ කරන්නේ යැයි ආදී වශයෙන් දොස් කියමින් ඇවිදින්නට විය. සුනක්ඛත්ත භික්ෂුවගේ මෙම දෝෂරෝපණ පිළිබඳව සැරියුත් හිමියන් බුදුන් වහන්සේට සැළකර සිටින ලදී. "සාරිපුත්තයෙනි, සුනක්ඛත්ත නම් හිස් පුරුෂයා කෝපවන්නෙකි. එබැවින් කෝප සිතින් මෙම අදහස් ප්‍රකාශ කර තිබේ. මෙයින් මගේ ගුණ ප්‍රකාශ වී ඇතැයි ඔහු නොදනී"යි පැහැදිලි කරමින් බුදුන් වහන්සේ තුළ වූ විශිෂ්ඨ ඥාන දර්ශනය පැහැදිලි කළ සේක. එම

උත්තරීතර වූ මානුෂික ඥානය මෙසේ පැහැදිලි කළ හැකිවේ.

I නව අරහාදි බුදු ගුණයෙන් පිරුණු සර්වඥතා ඥානය

සම්මා සම්බුද්ධ නම් වූ බුදුරජාණන් වහන්සේ අෂ්ඨ විද්‍යා පසළොස්චරණ ධර්මාදි නව අරහාදි බුදු ගුණයෙන් යුතු සර්වඥතා ඥාණයෙන් යුතු වේ.

II ඍද්ධි විධ ඥානය

බුදුන් වහන්සේ එක් පුද්ගලයෙකු බොහෝ දෙනකු වීම බොහෝ දෙනා එක් අයකු බවට පත්වීම, බිත්ති පර්වත, ප්‍රකාර අතුරින් නොගැටී ගමන් කිරීම, පක්ෂියකු මෙන් අහසේ පියැඹීම, මත්සයෙකු මෙන් දියෙන් යාම, පොළොවෙහිද ඇතුළට කිමිදීම ආදී මහා ඍද්ධි ප්‍රතිහාරයයන් පෑමේ විශේෂ ඍද්ධිමය ඥානයෙන් යුක්ත වූහ.

III දිබ්බසෝත ඥානය

බුදුන් වහන්සේගේ මිනිස් කන ඉක්මවා සිට පිරිසිදු දිව කනින් දෙවියන් හා මිනිසුන් පිළිබඳ වූ දේවල් ඇසිය හැකිය. එසේ දුර වුවද, සමීපයෙන් ද විවිධ ශබ්දවලින් මැනවින් ඇසිය හැකි දිව්බසෝත ඥානයෙන් යුක්ත විය.

IV චෙතෝපරිය ඥනය

බුදුන් වහයන්සේ අන්‍ය සත්වයන්ගේද පුද්ගලයන්ගේද සිත් පිළිසිඳ දැනගත්තා වූ චෙතෝපරිය ඥානයෙන් යුක්ත විය.

V දශබල ඥානය

බුදුරජාණන් වන්සේ දශබල ඥානයෙන් යුක්ත විය. එම ඥානය මෙසේය.

- ඨාන ඨාන ඥානය - කාරණය කාරණය වශයෙන්ද ආකාරණය ආකාරණය වශයෙන් ද, සත්‍ය ඇති සැටියෙන්ද දන්නා නුවණින් යුක්ත වීම.

- යථාභූත විපාක ඥානය - අතීත, අනාගත හා වර්තමාන යන සියලු කාලයන්ට අදාළ කර්මයන්ගේ විපාක ප්‍රත්‍ය වශයෙන්ද. හේතු වශයෙන්ද ඇති සැටියෙන්ම දන්නා නුවණින් යුක්ත වීම.

- සබ්බත්ථ ගාමිණී පටිපදාය ඥානය - සත්වයන් සියලු ගතිවලට යන්නා වූ නොයන්නා වූ මාර්ගයන් ඇති සැටියෙන් දන්නා නුවණින් යුක්ත වීම.

- අනේක ධාතු නානා ලෝක ධාතු ඥානය - බොහෝ ස්වභාව ධාතු ඇත්තා ද, නොයෙක් ස්වභාව ධාතු ඇත්තා වූ ලෝකය පිළිබඳව ඇති සැටියෙන් දන්නා නුවණින් යුක්ත වීම.

- නානාධිමුක්තිකත්ව ඥානය - සත්වයන්ගේ නොයෙක් අදහස් හි ස්වභාවය සත්‍ය වශයෙන්ම දන්නා නුවණින් යුක්ත වීම

- ඉන්ද්‍රිය පරොපරියන්හි ඥනය - ඉන්ද්‍රියන්හි තියුණු බව මෘදු බව දන්නා නුවණින් යුක්ත වීම.

- ධ්‍යානය විමෝක්ෂා සමාධි සමාපත්ති ඥානය - ධ්‍යානයන්ගෙන් ද විමෝක්ෂයන්ගෙන්ද, සමාධියන්ගෙන්ද, සමාපත්තියන්ගෙන්ද, කෙලෙසීම, පිරිසිදු බව, නැගී සිටීම ඇති සැටියෙන් දක්නා නුවණින් යුක්ත වීම.

- පුබ්බේ නිවාසානුස්සති ඥානය - පෙර විසූ තැන් සිහි කරන්නා වූ නොයෙක් කල්පයන්හි විසූ තැන් සිහිකළ හැකි නුවනින් යුක්ත වීම.

- චුතුපාතඥානය - සත්වයන්ගේ චුති උප්පත්ති, මියයන, උපදින තැන් පිළිබඳ දක්නා නුවනින් යුක්තවීම.

- ආසවක්ඛ්‍යා ඥානය - කෙලෙස් නැති කිරීමෙන් අරහත්ඵළය තමාට දැක ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නෙමියි දන්නා නුවණින් යුක්ත වීම.

මෙම ශ්‍රේෂ්ඨ ඥාන 10 බුදුන් වහන්සේ තුළ විද්‍යාමාන විය. ඒවා දසබල ඥාන ලෙස හැඳින්වෙන අතර මේ නිසා බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨ

යැයි පිරිස් මධ්‍යයේ සිංහනාද පවත්වති.

VI චතුර් වෛශාරද්‍ය ඥානය

මෙම ඥානය වනාහි විශාරදත්වය ප්‍රකට කරන සතුට උපදවන බුදුන් තුළ පැවති චතුර් වෛශාරාද්‍ය ඥානය වේ.

- බුදුන් වහන්සේ "මම සම්‍යක් සම්බුද්ධ වෙමි" යි ලොවට ප්‍රකාශ කළ විට එය එසේ නොවේ යැයි පැවසීමට ලොව කිසිවෙක් සමත් නොවූහ.
- "බුදුන් මම ක්ෂීණශ්‍රමයෙකි" යි ප්‍රකාශ කළ විට එසේ නොවේ යැයි ප්‍රකාශ කිරිමට කිසිවකු සමත් වූයේ නැත.
- "මේ ධර්මයෝ ස්වර්ග - මෝක්ෂයට අනතුරකි. මේ ධර්මයෝ අන්තරාකාරී නොවේ" යි ප්‍රකාශ කළ විට එය එසේ නොවේ යැයි ප්‍රකාශ කිරීමට සමතෙකු නැත.
- "මේ ධර්මයෝ නෛයයාර්ණිකය" යි කී කළ මේ ධර්මයෝ එසේ නොවේ යැයි කියන්නට සමතකු නැත.

බුදුරජාණන් වහන්සේ වෙත පැමිණෙන ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර් මහා රාජික, තව්තිසා, මාර සහ බ්‍රහ්ම යන පිරිස් කිසිදු බියක් චකිතයක් නැතිව චතුර් වෛශාරද්‍යතා ඥානයෙන් යුතුව පරාජය කිරීමට උන්වහන්සේට හැකිය. මේ නිසා බුදුන් වහන්සේ අෂ්ඨ පර්ෂද්හි අකම්ප්‍ය ඥානයෙන්ද යුක්ත යැයි ප්‍රකාශ කෙරේ.

එමෙන්ම බුදුන් වහන්සේ චතුර්යෝති පරිච්ඡේද ඥානයෙන් ද යුක්ත වේ. ලොව උපත ලබා සත්වයෝ කොටස් හතරකින් යුක්ත වේ. බිත්තරවලින් හට ගැනීම (අණ්ඩජ) ගර්භ කෝෂවලින් හටගැනීම (ජලාබුජ) තෙත් ස්ථානවල හටගන්නා සත්වයන් (සංසේදජ) හා ඕපපාතික හෙවත් ඉබේ හටගන්නා සත්ව වර්ග වැනි සතර යෝනිවල උපදින සතුන් පිළිබඳ යහපත් දැකීම බුදුන් වහන්සේ සතුවේ.

එපමණක් ද නොව නිරය, තිරිසන්. ප්‍රෙත, මනුෂ්‍ය හා දිව්‍ය ලෙසින් උපදින සත්වයන් පිළිබඳව හා ඔවුන් නිවන ලබන අයුරු

දැකීමේ ඥානයද බුදුන් වහන්සේ සතුවන බැවින් පංච ගති පරිච්ඡේදක භූතයෙන් යුතු බවද සඳහන් වේ.

VII දස කාය බල

කාල වකංච ගංගෙය්‍යං - පණ්ඩරං තුම්බ පිංගලං

ගණ්ධ මංගල හේමංච - උපෝසථ ඡද්දත්ති මේ දස

බුදුන් වහන්සේ තුළ වූ කාය බල දහයකි. එම කායබල සැකවින් පහත දැක්වේ.

| | |
|---|---|
| 1. කාලවක | 6. ගන්ධ |
| 2. ගංගෙය්‍ය | 7. මංගල |
| 3. පණ්ඩර | 8. හේම |
| 4. තාම්බු | 9. උපෝසථ |
| 5. පිංගල | 10. ඡද්දත්ත |

ආදී වශයෙනි. කාලවක නම් ඇතුට පුරුෂයෝ දස දෙනෙකුගේ ශක්තිය ඇත. එබඳු ඇතුන් දහයකගේ බලය ගංගෙය්‍ය ඇතුට ඇත. ගංගෙය්‍ය ඇතුන් දස දෙනෙකුගේ බලය පණ්ඩර ඇතකුට ඇත. පණ්ඩර ඇතුන් දස දෙනෙකුගේ බලය තාම්බු ඇතුටද, තාම්බු ඇතුන් දහයකගේ බලය පිංගල ඇතුටද, පිංගල ඇතුන් දහයකගේ බලය ගන්ධ ඇතුටද, ගන්ධ ඇතුන් දහයකගේ බලය මංගල ඇතුටද, මංගල ඇතුන් දහයකගේ බලය උපෝසථ ඇතුටද, උපෝසථ ඇතුන් දහයකගේ බලය ඡද්දන්ත මහා කුලයේ ඇතුටද තිබේ. මේ නිසා බුදුන් වහන්සේ ඡද්දත්ත ඇතුන් දස දෙනෙකුගේ අසමාන කාය බලශක්තියනේ යුක්ත වේ. රාවලින් මත්ව තමා ඉදිරියට පැමිණි නාලාගිරි ඇතු ක්ෂණිකව දමනය වූයේ බුදුන් තුළ වූ මෙම ශ්‍රේෂ්ඨ ශක්තිය නිසාමය.

VIII අෂ්ඨ විද්‍යා ගුණ හා පසොළොස්චරණ ධර්ම

බුදුන් වහන්සේ පහත සඳහන් අෂ්ඨ විද්‍යා ගුණයන්ගෙන් යුක්ත විය. එනම්,

1. විදර්ශනා ඥානය

2. මනෝමය ඍද්ධි ඥානය
3. ඍද්ධිවිධ ඥානය
4. දිබ්බසෝත ඥානය
5. පරචිත්ත විජානන ඥානය
6. පුබ්බේ නිවාසානුස්සති ඥානය
7. දිබ්බචක්ඛු ඥානය
8. ආසවක්ඛය ඥානය

එමෙන්ම උන්වහන්සේ පහත සඳහන් පසොළොස්වරණ ධර්මයන්ගෙන් පරිසමාප්ත වේ.

1. සීල සංවර
2. ඉන්ද්‍රිය සංවර
3. භෝජන මත්තඤ්ඤුතා
4. ජාගාරියානුයුක්ත
5. ශ්‍රද්ධා
6. හිරි
7. ඔත්තප්ප
8. බහුස්සුත්තා
9. පරාක්‍රම
10. සති
11. පඤ්ඤා
12. ප්‍රතම ධ්‍යාන
13. ද්විතිය ධ්‍යාන
14. තෘතීය ධ්‍යාන
15. චතුර්ථ ධ්‍යාන

මෙම උත්තරීතර ඥාන සම්භාරය හා ගුණධර්ම නිසා බුදුන් වහන්සේ ලොව කිසිදු මනුෂ්‍යයකුට හෝ දෙවි බඹෙකුට නොමැති උදාර ශ්‍රේෂ්ට ගුණාංගවලින් යුක්ත වේ.

**(ලොවට මග පෙන්වන බොදු නායකත්වය නමැති මෙම ලිපියේ ඉතිරි කොටස ඊළඟ වෙසක් සිරිසර සඟරාවෙන් බලාපොරොත්තු වන්න)**

## සංකල්පනා 29

### 1. THE LEAF

I sat under a tree
Bewitched
……..by the allure
Of the rustle and breeze
When
- a leaf fell over me
…….a leaf so dry
- so withered!
Its time has come!
To part from the tree
To which
- it was tethered!

Once a curled baby
…..when In sprout
It never thought
It would one day
In decay….be fraught!

But……..
It has done its work!

Shade it did provide
…. shelter too!

It soaked up sunshine
….to give life
- to the tree too!

Content to the end
Dancing to the breeze
…..blissfully it fell
To another reality
- to dwell!

You too were once….
A curled baby
…now withering?
You will fall too
…..someday soon
- doddering!

But……….
Will you blissfully fall
Like the leaf did
……dancing
To the thum of life
….. content to the end?

**Dr. Mass R. Usuf**

## 2. පූජා

**ස්ථූප, කරඬු, වෙහෙරාරාම ආදී මෙන්ම සුගන්ධ, අලෝක, පුෂ්පාදී ප්‍රමුඛ කොටගත් නේක වූ පූජෝපහාරයෙන් ලොව්තුරු බුදුරජාණන් වහන්සේ පිදීමේ අනුහස්-**

**බුදු හිමියන්ගේ ශ්‍රී මුඛ දේශනාවන්හි දාගැබ් නිර්මාණය කිරීමේ ආනිසංස මෙසේ දැක්වේ:**

"ආනන්දයෙනි, කවර කරුණක් නිසා තථාගත අරහත් සම්බුදු රජහු ස්තූප තනවා පිදීමට සුදුසු වෙත්ද? මේ ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජුන්ගේ ස්ථූපයයැ'යි ආනන්දයෙනි, බොහෝ ජනයා සිත පහදවා ගනිති. ඔවුහු ඒ කෙරෙහි සිත පහදවාගෙන, මරණින් මතු සුගති සංඛ්‍යාත දෙව් ලොවෙහි උපදිති. සිව් මංසලෙහි තථාගතයන්ගේ ස්ථූපයක් කළ යුත්තේය. යම් කෙනෙක් එහි මලින්, ගඳින් පුද පූජා පවත්වන්නාහු ද, වන්දනා කරන්නාහු ද, සිත පහදවා ගන්නාහු ද, එය ඔවුනට බොහෝ කල් හිත සුව පිණිස වන්නේය."

**(මහා පරිනිබ්බාන සූත්‍රය - දී. නි. 2)**

**ගාථා:**

"නයිමස්මිං ලෝකේ පරස්මිං වා පන
බුද්ධේන සෙට්ඨෝ ච සමෝ ච විජ්ජති
ආහුනෙය්‍යා තං පරමාහුතිං ගතෝ
පුඤ්ඤත්ථිකානං විපුල ඵලේ සිතන්ති."

"මෙලොව හෝ පරලොව හෝ පිනෙන් ප්‍රයෝජන ඇති මහත් වූ පින් පල කැමැත්තවුන්හට, පුද පූජා පැවැත්විය යුතු උතුමන් අතර පරම පූජනීය භාවයට පැමිණි බුදුරජාණන් වහන්සේම ශ්‍රේෂ්ඨ වන සේක. බුදුරජුන් හා පූජනීය භාවයෙන් සම වූ කෙනෙක් නැත්තේමය."

**(මහාරථ විමාන - විමාන වත්ථුපාළි)**

## කවි නිමිත්ත:

**පුන්නාගපුප්පිය රහතන් වහන්සේගේ ථේර ගාථා:**

"මෙයින් කල්ප අනූ දෙකකට පෙර මනුෂ්‍ය ලෝකයේ වැද්දෙකු වූ මම එක්තරා දිනක මහා වනයට පිවිසියෙමි. පිපුණු මලින් පිරී ගිය

දොඹ ගසක් දැක බුදුරජාණන් වහන්සේව සිහි කළෙමි. බුදු රජාණන් වහන්සේ උදෙසා වැලිවලින් සෑයක් කොට, දොඹ මල් නෙලා සෑයට පූජා කළෙමි. එදා මම බුදු රජාණන් වහන්සේ උදෙසා සිදු කළ ඒ උතුම් පූජාවෙහි අනුහසින් කිසි කලෙක දුගතියක (කල්ප අනු දෙකක්) නොඉපදුනෙමි. ඒ කුසලයෙන්, මෙයින් අනූ එක්වෙනි කල්පයෙහි සක්විති රජ කෙනෙක් වුනෙමි. මේ ජීවිතයේදී සිව් පිළිසිඹියාවන් සහිත අරහත්භාවයට පත්වුණෙමි."

**(අපදාන පාලිය ඇසුරෙනි)**

⋆සිවු පිළිසිඹියා හෙවත් (චතුෂ්ප්‍රතිසම්භිදා - සංස්කෘත / චතුපටිසම්භිදා - පාලි) බුද්ධත්වයට පත් වූ විට සාක්ෂාත් කරගනු ලබන චතුර්විධ ඤාණ:

1. අත්ථ 2. ධම්ම 3. නිරුත්ති 4. පටිභාන

## පූජා

වැදි තෙම පිවිසියේ වනයට උදෑසනේ
හිඳි වග වලස් වන සපුවන් දිවා රැයේ
සිඳි දඩ රැහැන් නොම වූයෙන් එදා දිනේ
බිඳි සිත දරන් සැරි සැරුවේ විමානයේ

පය නොසිතාම වන අරණේ දුරට ගියේ
බිය නොහැරාම වුව අරුණළු නැගෙන පැයේ
ලිය තඹරාම නොවුන ද වනලියගෙ ලයේ
පියමල් දාම අතරින් බිඟු කවි ද ගැයේ

දසුනකි දුරින් බැබළෙන තුරු හිසක රුවේ
උළෙලකි නුවන් සනහන දොඹ මලින මැවේ
සුවයකි පවන් තවරන මුදු සුවඳ මුවේ
පුදුමෙකි දැහැන් ගතවිණි සිත සහන් සුවේ

පර පන නසා රැකුමට දිවි පුරුදු පෙර
හැර යනු දමා සවි නැති විට, උරුම නිර
කුර හඬ හඹා දිව යන කළ, කරුම බර
වෙර ගෙන නිමා කරනට අද සිතයි තිර

නුදුරින් දිලෙන සුදුවන් වැලි තලාවේ
තනමින් වෙහෙර වැලියෙන් හුදෙකලාවේ
නෙලමින් සුසුදු දොඹ මල් පිපි ගුලාවේ
නිවනින් නිවෙන පැතුමින් පිදි වෙලාවේ

අනුහස ලැබී හද තුටිනා පිදුව පිනේ
සරතැස නිවී සිත දැමෙනා අයුරු දැනේ
පුරපස මැවී සඳ නැගුනා විලස වනේ
නුවණැස පෙනී වැදි බැඳුණා සමිඳු බනේ

කල්පෙන් කල්ප දෙඅනූවක් සුගති විඳී
අවසන් වත්ම සක්විති රජ කම ද ලදී
කෙළෙසුන් ඉක්ම අරහත් මහ රහත් හිමී
සසරින් නික්ම වැඩියයි පිරිනිවන් නිවී

නීතිඥ, ආචාර්ය
**තමාරා රූපිකා කන්දේපේලිආරච්චි**

## 3. වෙසක් සිරිසර

ඉඳු දින වෙසඟ පෝ දා නුබ කැලුම් දිදී
සම්බුදු තෙ මඟුලට ආසිරි පවන් පිදී
රන් කඳ ලෙ සින් මව් බිසවුන් කුසින් මිදී
පින් කඳ එසිදුහත් කුමරුන් උපත ලදී

පුරපස වැඩෙන සිසි මෙ න් පුතු සුකුමාර
හැර සැක නැතිව ගුණ නුවණින් පිරිසාර
හරබර රජ සිරිත් ලෙස කර කරකාර
සැරසුණි, පිය රජුන් දඹදිව දෙති බාර

හරසුන් දිවි ගමන මේ යැයි කියන නියා
පෙර නිමිතියෙන් වැටහුණි ලොව දුකකි කියා
නලඟන නිඳන'තර රඟහල, නිවන සොයා
කුමරුන් පුතුන් දැක, ගිහිගෙන් නික්ම ගියා

සීත සොම් රැස් ඇත හිමගිර පීත සළු පැළඳුවාවේ
ගීත හෙමිහිට ගය ගයා දිය තලා මත මල් ගුලාවේ
ඈත හිමවත කුරවි කූජන විහඟ ගී බට නලාවේ
වීතරාගික බවුන් වැඩුවා නොම වැටී මංමුලාවේ

පිරුණු පෝ දින උදෑසන රුක් ගොමුව තුළ වැඩ වදාරා
දරුණු මරසෙන් පරාජය වී ගියෝ මලිනව දුර හැරා
තියුණු නුවණින් කෙලෙස් නැසුයෙන් දෙව් බඹුන් මැද පිරිවරා
තුරුණු බෝ සත් සිදුහතාණෝ ලැබූ බුදු බව ලොව්තුරා

බුදු බවින් කල්පයක් වුව දිවි ගෙවීමට මේ මනු ලොවේ
හුදු පමාවක් වත් නොවී පිළිගතී ඇරයුම මරු මුවේ
මනු දනන් දෙව් බඹුන් වැලපී කළත් ඇරයුම් සිත් සොවේ
බුදුපියාණෝ පිරිනිවන් පා වදාළෝ වෙසගේ සුවේ

විශ්‍රාමලත් පාඨශාලාචාරිනි
**සුමනා වික්‍රමනායක කරුණාරත්න**

## මමත්වය

(2020 වෙසක් සිරිසර කලාපයට වෛද්‍ය මාස් ආර්. යූසුෆ් විසින් I know not යන හිසින් ලියන ලද පැදිපෙළ සිංහල පාඨකයන්ගේ රසාස්වාදය උදෙසා සිංහල බසින් පළ කරමි.)

මා කවරෙක් දැයි මම නොදනිමි

කිසිවකුට වැඳීමෙන් පිහිට නොපතමි
කිසිදු වත්පිළිවෙතක් නොපුරමි
ආදම්ගේ සහ ඒවගේ නොවෙමි
පොළොවෙන් සහ ජලයෙන් නූපන්නෙමි
සුළඟින් සහ ගින්නෙන් ද නොසැදුණෙමි

මා කවරෙක් දැයි මම නොදනිමි

අන්ධ ඇඳහිල්ලේ මළපුඩුව දිරාපත්ව ඇත
එහි පාෂයට ඉතිං නම් හසු නොවෙමි

ශුද්ධ වූ ග්‍රන්ථයේ වහලකු නොවෙමි
සාධුවරයකුගේ ගැත්තකු නොවෙමි
නිරය මා උදෙසා නොවේ
ස්වර්ගය මා උදෙසා නොවේ

මා කවරෙක් දැයි මම නොදනිමි

දුක තුළ දරණ ගසා සිටින සතුට දකිමි
සතුට තුළ සැඟවී ඇති දුක දකිමි
එහෙත් සාන්තුවරයන් සහ පව්කාරයන් නොදකිමි
ප්‍රහර්ෂය සහ වැළපිල්ල නොදකිමි
සන්තෝෂය හෝ සන්තාපය
සංවේගය හෝ දැඩි ප්‍රීතිය
සංත්‍රාසය හෝ කෝපය
මේ කිසිවකින් මම නොසැලෙමි
මේ කිසිවකින් මම නොපෙළෙමි



මා කවරෙක් දැයි මම නොදනිමි

ජීවිතය මම නොදකිමි
මරණය මම නොදකිමි
මම මගේ නම ද නොවන කල
මම මා ද නොවෙමි

මා කවරෙක් දැයි මම නොදනිමි

**මාස් ආර්. යූසුෆ්**
**(අනුවාදය: දුලනි සකලසූරිය ගරු ලේකම්, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය)**

# 4. වෙසක් සිරිසර හරස්පද ප්‍රහේලිකාව

වෙසක් සිරිසර 90 වන විශේෂ කලාපයේ පළ වී ඇති ලිපි ඇසුරින් සකස් කර ඇති මෙම හරස්පද ප්‍රහේලිකාව පිරවීමට ඔබට හැකි දැයි බලන්න. උපකාරක පද අනිත් පිටේ ඇත. පුරවන ලද හරස්පද ප්‍රහේලිකාව සඟරාවෙන් වෙන් කර තැපෑලෙන් අප වෙත එවන්න. නැතහොත් 071-4393007 අංකයට whatsapp මඟින් වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුවේ ලේකම් වෙත එවන්න.

අප වෙත පිළිතුරු එවන සියලු දෙනාට ම වෙසක් සිරිසර 91 වන කලාපයේ පිටපතක් බැගින් එවන අතර නිවැරදි පිළිතුරු එවා ඇති සියලු දෙනාට අපගේ 71 වන මහා සභා රැස්වීමට සහභාගි වීමට අවස්ථාවක් හිමි වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ජ | 2 | | | 3 | | ■ | 4 |
| ■ | | ■ | ■ | | ■ | ■ | |
| 5 | | 6 | ■ | 7 | ජ් | | |
| 8 දූ | | | ■ | | ■ | ■ | |
| 9 | | ■ | 10 | | 11 | ■ | |
| ■ | 12 | 13 | | | ■ | 14 | ■ |
| 15 | ■ | නෝ | ■ | ■ | ■ | 16 | |
| 17 ණ | | ■ | 18 | | | | ■ |

# උපකාරක පද

## හරහට

1. වෙසක් සිරිසර සඟරාව ආරම්භ කළ සහෝදරයන්ගේ පවුල් නාමය
5. මෙය රැකීම මඟින් සමාජ හිතකාමී පුද්ගලයෙක් නිර්මාණය වේ.
7. අම්බලට්ඨිත රාහුලෝවාද සූත්‍රය අයත් වන්නේ මෙම නිකාය කොටසට ය.
8. තණ්හා, රතී, රගා යන අය මාරයාට ඇති නෑකම
9. උපසම්පන්න භික්ෂූන් විසින් රකින ශීලයකි.
10. ගද්‍ය පද්‍ය දෙආකාරයෙන් ම දැකිය හැකි ය.
12. භාවනා ක්‍රමයකි.
14. තමා ඉදිරියෙන් සිටින පුද්ගලයා හඳුන්වන අභාවිතයට ගිය වචනයකි.
16. අත් හළ යුතු අන්ත ගණන
17. අශන සුබ යනුවෙන් හැඳින්වූයේ මෙයින් වැළකීම ය.
18. දුර බැහැර සිට පැමිණ වැඳුම් පිදුම් ලැබීමට සුදුසු

## පහළට

2. මහානාග යුවරජුගේ පුතා
3. බොජ්ඣංගයකි
4. "බුද්ද පුත්තාම්හි සමණ, පෝසමන්ති" යැයි කීවේ කාට ද?
5. ගම්පහ දිස්ත්‍රික්කයේ ගමකි.
6. ආලවක හඳුන්වන්නේ මෙනමිනි.
10. තැනකින් තැනකට යාමට භාවිත කරයි.
11. ලක්දිව පෙර කල විසූ ගෝත්‍රයකි.
13. සියලු ම ධර්මයන් පෙරටු කොට සිටියි.
14. සුභ මානවකයාගේ පියා
15. "ඔබ දෙවියෙක් දැ?"යි බුදු රජාණන් වහන්සේගෙන් ඇසූ බ්‍රාහ්මණයා

# 5. සාමාජික අයදුම්පත

(උප ලේඛනය - ව්‍යවස්ථා අංක 4 II)

## රාජ්‍ය සේවා බෞද්ධ සංගමය - සාමාජික අයදුම්පත

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ගරු ප්‍රධාන ලේකම් වෙත,

(හඳුන්වා දුන්නේ ........................................................................................)

...................................................... අමාත්‍යංශයෙහි / දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු / නියුතුව සිටි ..................................................................... වන මම

(අ) බෞද්ධයෙකු බවත්,

(ආ) රාජ්‍ය සේවා බෞද්ධ සංගමයට බැඳී ව්‍යවස්ථානුකූලව කටයුතු කිරීමට එකඟ බවත්,

(ඇ) ස්ථාන මාරුවක් ලැබූ විට හෝ රාජය සේවයෙන් විශ්‍රාම ලැබූ විට හෝ ඒ වග දැනුම්දීමට පොරොන්දු වෙන වගත්, ප්‍රකාශ කරන අතර, රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ සාමාජිකයකු ලෙස බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටිමි. ඇතුළත්වීමේ ගාස්තු වන රුපියල් 10/- සහ යාවජීව සාමාජික ගාස්තු මුදල වන රුපියල් 250/- සඳහා අංක .......................................... මුදල් ඇණවුම / තැපැල් ඇණවුම / චෙක්පත / මුදල් මේ සමඟ එවමි.

නම : ....................................... මයා / මිය / මෙනවිය

ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

ලිපිනය ..................................................................

..................................................................

(i) රාජකාරි (දැනට / කලින්) :

(ii) පෞද්ගලික : රැකියාව (දැනට / කලින්) :..........................................................

දුරකථන අංකය : ..................................................................

සේවයට බැඳුණු / විශ්‍රාම ලැබූ දිනය :..........................................................................

සාමාජිකත්වය දරන වෙනත් සමිති :..........................................................................

මෙයට, ශාසනාලයැති

දිනය :........................ අත්සන් : .............................

# 6 වෙසක් සිරිසර කලාපය සඳහා දායකත්වය

## 2025 වසරේ වෙසක් සිරිසර සංග්‍රහය සඳහා මූල්‍ය පරිත්‍යාග එවන ලද අයගේ නාමලේඛණය

| නම | මුදල |
|---|---|
| 01. සී.ජේ. සමරවික්‍රම මහතා,<br>25/14, ගල්පොත්ත පාර, නාවල, රාජගිරිය. | රු.20,000.00 |
| 02. ජයතිස්ස කාරියවසම් මහතා,<br>''ජයකෙහෙළි'', මා ඔය, හඟුරන්කෙත. | රු.10,000.00 |
| 03. ඩී.අයි. පද්මසේන මහත්මිය,<br>43/2, වැකඩ පාර, රුක්මලේ, පන්නිපිටිය. | රු.3,000.00 |
| 04. එස්.එල්. කුරුප්පු මහත්මිය,<br>22/4, කළ්‍යාණි පාර, කොළඹ 06. | රු.5,000.00 |
| 05. එම්.ඒ. ප්‍රේමසිරි මහතා,<br>ඒ-133, මද්දුමගේ වත්ත, හයිලෙවල් පාර, නුගේගොඩ. | රු.3,000.00 |
| 06. එල්.එන්. ජයසේකර මහතා,<br>123/11, පන්නිපිටිය පාර, බත්තරමුල්ල. | රු.3,000.00 |
| 07. ජී.ජී. වික්‍රමනායක මහතා,<br>801/4, ප්‍රගති මාවත, පන්නිපිටිය. | රු.3,000.00 |
| 08. එච්.ඒ. අමරතුංග මහතා,<br>''ශ්‍රියාණි'', වල්පිට පාර, තෙලිජ්ජවිල. | රු.2,500.00 |
| 09. ඒ.අයි. පතිරගේ මහත්මිය,<br>43/2, වැකඩ පාර, රුක්මලේ, පන්නිපිටිය. | රු.2,500.00 |
| 10. ග්ලැඩිස් විජයවර්ධන මහත්මිය,<br>59, හොරකැටිය, කුඩා උඩුව, හොරණ. | රු.2,500.00 |
| 11. ආචාර්ය සිරිපාල මාදුවගේ මහතා,<br>17/6, රොබට් වික්‍රමසූරිය පාර, අම්බලන්ගොඩ. | රු.2,150.00 |

12. එම්.ජී. මානන්ගොඩ මහතා, රු.2,000.00
පුවත්පත් අලෙවි නියෝජිත, 01, චාර්ල්ස් පෙදෙස,
රාවතාවත්ත, මොරටුව

13. ඉන්දුමතී කැටිපේආරච්චි මහත්මිය, රු.2000.00
162/4-සී/4, කඩවල පාර, පන්නිපිටිය.

14. එස්. අබේනායක මහතා, රු. 1500.00
142/48, සමගි වත්ත, වලව්වත්ත, වැකඩ, පානදුර.

15. ඩබ්. චන්ද්‍රා පෙරේරා මහත්මිය, රු. 1,500.00
3 වන පටුමග, සුභූති මාවත, සුභූතිපුර, බත්තරමුල්ල.

16. ජී. ඉන්ද්‍රාණි පෙරේරා මහත්මිය, රු.1,000.00
585, ජයන්ති මාවත, සිංහාරමුල්ල, කැළණිය.

17. පියසීලි නූපහේවා මහත්මිය. රු.1,000.00
49/11, කුමාරගේ වත්ත, බත්තරමුල්ල.

18. රමණී කළෙහෙවත්ත මහත්මිය, රු.1000.00
7/1, කාවින්දයා පෙදෙස, කිරුළපන.

19. එච්.එම්. දයාරත්න මහතා, රු.1000.00
විශ්‍රාමලත් රෙජිස්ට්‍රාර්, වීරගිරි, පුරුදුවැල්ල, කුඩාවැව.

20. එස්.පී.කේ. බුලත් සිංහල මහත්මිය, රු.1000.00
රජරට සේයා, පාට සිලිපිලි කන්ද පාර, මින්නේරිය.

21. එල්. ජයවර්ධන මහත්මා, 300.00
61/23 මහාමේඝ පටුමග මහරගම.

**එකතුව** **රු.70,950.00**

## ආයාචනයයි

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුවේ සුබ පැතුම් සමගින් වෙසක් සිරිසර වාර්ෂික ධර්ම සංග්‍රහයේ 90 වැනි කලාපය ඔබ අතට පත් වෙයි.

ඔබ එය කියවා අවසන් වූ පසු ඉතා සුලු ප්‍රමාණයකින් හෝ ඔබේ දහම් දැනුම වැඩි වේ යැයි විශ්වාස කරන අතර, බුදුන් වහන්සේගේ උතුම් ධර්මයෙන් තවත් අයෙකුට ප්‍රයෝජනයක් වන පරිදි ඔබේ මිතුරෙකු අතට එය පත් කරන්න.

"ධර්ම දානය සියලු දානයන් දිනයි" යන බුද්ධ වචනය ප්‍රකාර මෙම "ධර්මදාන" පුණ්‍ය කර්මයට ඔබත් දායක වීමට කැමැත්තේ නම් ඒ සඳහා ඔබට ආධාර කළ හැකි වග සඳහන් කරමි.

සියලුම ආධාර ඒ සඳහා නිකුත් කරන ලදුපත්වලට අමතරව මෙම වාර්ෂික සංග්‍රහය මගින්ද ප්‍රකාශයට පත් කෙරේ.

ඔබේ ආධාර "රාජ්‍ය සේවා බෞද්ධ සංගමය" නමින් ලියූ චෙක්පතක් හෝ මුදල් ඇණවුමක් මගින් පහත සඳහන් පරිදි යොමු කරනු මැනවි. මුදල් ඇණවුම් ටොරින්ටන් චතුරශ්‍රය උප තැපැල් කාර්යාලයෙන් මාරුකර ගැනීමට හැකි වන සේ එවන්න.

---

| | |
|---|---|
| ගරු ලේකම් | ලිපිනය |
| වෙසක් සිරිසර ප්‍රකාශන කමිටුව | ............................................................ |
| අංක 115, | ............................................................ |
| විජේරාම මාවත, | ............................................................ |
| කොළඹ 07. | ............................................................ |

හිතවත් මහතාණෙනි,

ඔබේ ධර්මදාන කටයුතු සඳහා මගේ දායක මුදල වශයෙන් "රාජ්‍ය සේවා බෞද්ධ සංගමය" නමින් ලියූ රු. ................................ චෙක්පතක් / මුද් ඇණවුමක් මේ සමග එවමි. කරුණාකර එය ලැබුණු බව දන්වන්න. මේ වර්ෂයේ වෙසක් සිරිසර කලාපයේ පිටපතක් පහත සඳහන් ලිපිනයට එවන්නේ නම් කෘතඥවෙමි.

තෙරුවන් සරණයි.

මෙයට
ශාසනාලයැති,
(අත්සන) ......................................
(නම) ......................................